විගණකාධිපතිවරයාගේ
ත්‍රෛවාර්ෂික වාර්තාව
2021-2023

පරිසර විගණන සහ කාර්යසාධන විගණන

පටුන

			පිටු අංක.
1.	විධායක සාරාංශය		3
2.	පරිසර විගණන සහ කාර්යසාධන විගණනයෙහි නිරීක්ෂණ		
	2.1	නැව් මගින් සිදුවන සමුද්‍ර දූෂණය වැළැක්වීම සඳහා ක්‍රියාත්මක මාර්පෝල් සම්මුතිය ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය	5
	2.2	ශ්‍රී ලංකාවේ අපජල කළමනාකරණයේ කාර්යක්‍ෂමතාවය ඇගයීම	23
	2.3	ශ්‍රී ලංකාවේ වෙරළ හා සමුද්‍රීය ජාතික උද්‍යාන සංරක්ෂණය	42
	2.4	ශ්‍රී ලංකාවේ භූගත ජල කළමනාකරණයේ නීතිමය යාන්ත්‍රණය හා එහි ක්‍රියාකාරීත්වය ඇගයීම ම	50
	2.5	හම්බන්තොට, අනුරාධපුර, වව්නියාව, සහ කුරුණෑගල යන දිස්ත්‍රික්කයන්හි ඛණිජ ද්‍රව්‍ය (කළුගල්) කැණීම සඳහා රජයේ ඉඩම් බදුදීම, පාලනය සහ රාජ්‍ය භාගය අයකිරීම පිලිබඳ කාර්යසාධන විගණනය.	60
	2.6	සුළු හා මධ්‍ය පරිමාණ සහල් මෝල් හිමිකරුවන් සඳහා ණය සහන ලබාදීමේ වැඩසටහනේ කාර්යසාධනය	64
	2.7	ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව විසින් ආරක්ෂිත සහල් සංචිත පවත්වාගෙන යාම හා ගබඩා උපයෝජනයේ කාර්යසාධනය ඇගයීම.	66
	2.8	මහා භාරකාර තැන වෙත පවරා ඇති බූදල් දේපළ කළමනාකරණය සම්බන්ධව ඇගයීම.	69
	2.9	ඕස්ට්‍රේලියානු ණය හා දේශීය ණය අධාර යටතේ සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරන ලද රජයේ රෝහල්වල සායනික අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතියේ කාර්යසාධනය ඇගයීම.	81
	2.10	එළවළු බීජ දේශීය වශයෙන් නිෂ්පාදනය කිරීමේ ක්‍රියාවලියේ කාර්ය සාධනය ඇගයීම	89
	2.11	නව පුනර්ජනනීය බලශක්ති මූලාශ්‍ර සංවර්ධනය කිරීමේ ක්‍රියාවලිය ඇගයීම.	93
	2.12	දේශීය වෙළඳපොල තුළ ගුණාත්මක භාණ්ඩ අලෙවිය පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ කාර්යභාරය	96
	2.13	පළාත් පාලන ආයතන වැඩිදියුණු කිරීමේ ආංශික ව්‍යාපෘතියෙන් (පුරනැගුම) අපේක්ෂිත ප්‍රතිලාභ ලැබීමේ ප්‍රගතිය ඇගයීම.	102
	2.14	ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන යටතේ ග්‍රාමීය ප්‍රජාව සහ සමාජ ආර්ථික මධ්‍යස්ථාන අතර මාර්ග ප්‍රවේශතාවය වැඩිදියුණු වීමේ කාර්යසාධන වාර්තාව.	105
	2.15	කඳුරට නවගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය මඟින් වතුකර ප්‍රජාවට නිවාස පහසුකම් ලබාදීමේ ව්‍යාපෘතියේ කාර්යසාධනය	112

	2.16	කොළඹ නගරය සහ අවට ප්‍රවේශ මාර්ගයන්හි රථවාහන තදබදය අවම කිරීම සඳහා අදාළ රාජ්‍ය ආයතනයන් විසින සිදුකරන කාර්යභාරය ඇගයීම	122
	2.17	රජයේ ආයතන සඳහා ගොඩනැගිලි අවශ්‍යතා සපුරා ගැනීම හා උපයෝජනය.	134
	2.18	රජයේ නොවන පාසල් සම්බන්ධයෙන් වන නියාමන ක්‍රියාවලිය	141
	2.19	ශ්‍රී ලංකාවේ බෝ නොවන රෝග වැළැක්වීම හා පාලන ක්‍රියාවලිය නියාමනය	148
	2.20	බහාලුම්ගත ජංගම ඩීසල් විදුලිජනක යන්ත්‍ර මිලදී ගැනීමේ කාර්යසාධනය	153
	2.21	බන්ධනාගාරය තුල පවත්නා තදබදය කළමනාකරණය කිරීම පිලිබඳ කාර්යසාධන විගණනය	155
	2.22	ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ බස්රථ ඇණිය උපරිම ධාරිතාවයෙන් උපයෝජනය කිරීම.	162
	2.23	අපනයන කෘෂිකාර්මික බෝග නිෂ්පාදනය හා ප්‍රවර්ධනය සම්බන්ධ රාජ්‍ය ආයතනවල කාර්යභාරය ඇගයීම	168
	2.24	තිරසර සංවර්ධන ඉලක්ක ක්‍රියාත්මක කිරීම - ශ්‍රී ලංකාවේ ශක්තිමත් සහ සුවපහසු ජාතික මහජන සෞඛ්‍ය පද්ධතිය (තිරසර සංවර්ධන ඉලක්ක 3 (ඇ) සම්බන්ධ)	171

1. විධායක සාරාංශය

පරිසර විගණනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 13 වගන්තියේ ප්‍රතිපාදන ප්‍රකාරව ජාතික විගණන කාර්යාලය විසින් පරිසර විගණනය සිදුකරනු ලබයි.

යම් කිසි විශේෂිත පාරිසරික ගැටළුවක් හෝ ආර්ථික ප්‍රතිපත්තීන් හෝ වැඩසටහන් මෙන්ම පාරිසරික ගැටළු කළමනාකරණය කිරීමේදී ඒවායේ කාර්යසාධනය සම්බන්ධයෙන් වගකිව යුතු ආයතන ක්‍රියාත්මක කර ඇති ප්‍රවේශය කෙරෙහි අවධානය යොමු කරමින් සිදු කර ඇති කාර්යසාධන, අනුකූලතා හෝ මූල්‍ය විගණනය පරිසර විගණනය ලෙස හැඳින්වේ

අපද්‍රව්‍ය, ජලය, වාතය, ජෛව විවිධත්වය ක්ෂේත්‍ර මෙන්ම පාංශු ඛාදනය , භූ ගත ජලය අඩු වීම, ජල දූෂණය, සමුද්‍ර හා වෙරළ දූෂණය, වනාන්තර විනාශය, වායු ගුණත්වය සහ අපද්‍රව්‍ය හා උපද්‍රවකාරී අපද්‍රව්‍ය වැනි ගැටළු මේ යටතේ සාකච්ඡා කරනු ලබන අතර පරිසර විගණනයන් සිදු කිරීමේදී කාර්යසාධන විගණනයක් සඳහා ලැබී ඇති නෛතික ප්‍රතිපාදන මෙන්ම ජාත්‍යන්තර විගණන ප්‍රමිතීන් යටතේ වන ISSAI 5110, 5120, 5130 හා 5140 පදනම් ලෙස යොදා ගනු ලැබේ.

පරිසර විගණනයන්හිදී හඳුනා ගන්නා ලද අඩුපාඩු නිවැරදි කිරීම සඳහා නිර්දේශයන් විගණනය විසින් ලබා දෙනු ලබන අතර ඒවා ක්‍රියාත්මක කිරීමේ වගකීම කළමනාකරණය සතුවේ. 2021, 2022 හා 2023 වර්ෂයන්හිදී පරිසර විගණන වාර්තා 04 ක් පාර්ලිමේන්තුවේ සභාගත කර ඇති අතර එම වාර්තාවන් මගින් ලබා දී ඇති නිර්දේශවලින් 2024 දෙසැම්බර් 31 වන විටත් ක්‍රියාත්මක කර නොමැති නිරීක්ෂණ හා නිර්දේශයන් පිළිබඳව මෙම ත්‍රෛයිවාර්ෂික වාර්තාවෙහිදී අවධානය යොමුකර ඇත.

කාර්යසාධන විගණනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාරව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ හිමි 13 වගන්තියේ ප්‍රතිපාදන ප්‍රකාරව කාර්යසාධන විගණනය සිදුකරනු ලැබේ.

සම්ප්‍රදායික මූල්‍ය විගණනය මගින් රජයේ ආයතන පිහිටුවීමේදී අපේක්ෂිත අරමුණු ඉටු වීම සම්බන්ධයෙන් පුළුල්ව පරීක්ෂාවට ලක් නොකෙරෙන බැවින් කාර්යසාධන විගණනය මගින් එක් එක් ආයතනයන් සතු සම්පත් ආර්ථික වශයෙන් කාර්යක්ෂමව හා ඵලදායීව උපයෝජනය කර එකී ආයතනයේ අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීමට ආයතනය මෙහෙයවා තිබේද යන්න පරීක්ෂාවට ලක් කෙරේ.

ඒ අනුව කාර්ය සාධන විගණනයේදී, INTOSAI ආයතනය විසින් යාවත්කාලීනව ඉදිරිපත් කරනු ලබන කාර්ය සාධන විගණන ප්‍රමිතීන්වලට අනුකූලව ආයතනය විසින් ස්වාධීන විගණනයක් ලෙස සිදුකෙරෙන අතර විගණනයේදී කළමනාකරණය විසින් වඩාත් උචිත ලෙස ආයතනයේ සම්පත් කාර්යක්ෂමව හා ඵලදායීව උපයෝගී කර ගනිමින් ආයතනය අපේක්ෂිත අරමුණු කරා මෙහෙයවා තිබේද යන්න ස්වාධීන විගණනයක් තුළින් පරීක්ෂාවට ලක් කරනු ලබයි.

කාර්යසාධන විගණනයන්හිදී හඳුනා ගන්නා ලද අඩුපාඩු නිවැරදි කර ගැනීමට අවශ්‍ය නිර්දේශයන් විගණනය විසින් ලබා දෙනු ලබන අතර ඒවා ක්‍රියාත්මක කිරීමේ වගකීම කළමනාකරණය සතුවේ. 2021,2022 හා 2023 වර්ෂයන්හිදී තෝරාගත් විවිධ මාතෘකා යටතේ සිදුකරන ලද කාර්යසාධන විගණනයන් සම්බන්ධව නිකුත් කරන ලද විගණන වාර්තා 20 ක් පාර්ලිමේන්තුවේ සභාගත කර ඇති අතර එම වාර්තාවන් මගින් ලබා දී ඇති නිරීක්ෂණ හා නිර්දේශයන් වලින් 2024 දෙසැම්බර් 31 වන විටත් ක්‍රියාත්මක වී නොමැති නිරීක්ෂණ හා ඒ නිර්දේශයන් පිළිබඳව මෙම ත්‍රෛයිවාර්ෂික වාර්තාවේදී අවධානය යොමු කර ඇත.

2. පරිසර විගණන සහ කාර්යසාධන විගණනයෙහි නිරීක්ෂණ

2.1 නැව් මගින් සිදුවන සමුද්‍ර දූෂණය වැළැක්වීම සඳහා ක්‍රියාත්මක මාර්පෝල් සම්මුතිය ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
1	**මාර්පෝල් සම්මුතිය ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කිරීමේ නෛතික තත්ත්වය** 1978 සංධානය මගින් සංශෝධිත 1973 නැව් මගින් සාගරය අපවිත්‍රවීම් වැළැක්වීම සඳහා වන ජාත්‍යන්තර සම්මුතිය (MARPOL) ශ්‍රී ලංකාව තුළ පිළිගැනීම හා මෙම සම්මුතියේ ප්‍රතිපාදන දේශීය වශයෙන් ශ්‍රී ලංකාව තුල බලාත්මක කිරීම සඳහා අවශ්‍ය නීති සම්පාදනය සඳහා නීති කෙටුම්පත් සම්පාදක වෙත ඉදිරිපත් කිරීමේ අරමුණින් 1997 ජනවාරි 10 දින නාවික, වරාය, පුනරුත්ථාපන හා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින් අමාත්‍යමණ්ඩල සංදේශයක් ඉදිරිපත් කර තිබූ අතර එකී සංදේශය සඳහා අංක අමප/97/0113/116/005 දරන හා 1997	2021	නැව් මගින් සිදුවන සමුද්‍ර දූෂණය වැළැක්වීම සඳහා වන මාර්පෝල් සම්මුතිය ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් දේශීය නීති ප්‍රතිපාදන ඇති කිරීම සම්බන්ධව විශේෂ ප්‍රමුඛතාවයක් ලබා දීම හා එම නීති ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ආයතන නිශ්චිතව හඳුනාගනිමින් සම්මුතිය බලාත්මක කර එම ක්‍රියාවලිය පසුවිපරම් කිරීම.	මාර්පෝල් සම්මුතියේ හා සංධානයේ ප්‍රතිපාදන සම්පූර්ණයෙන් මෙම අධිකාරියේ පනතට එකතු කිරීම සඳහා අධිකාරිය මගින් අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කල අතර ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය නොලැබුණ අතර වරාය විෂයභාර අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කල අමාත්‍ය මණ්ඩල පත්‍රිකා සම්බන්ධයෙන් ඉදිරිපත් කොට තිබූ නිරීක්ෂණ අනුව මේ සඳහා අදාල වන ආයතන කිහිපයක් සමඟ සාකච්ජා කොට නැවත අමාත්‍ය මණ්ඩල	පනතේ මූලික කෙටුම්පත සකස් කර ඇත. ඉදිරි කෙටුම්පත් කිරීමේ කටයුතු සඳහා කමිටුවක් පත් කොට ඇත.

පෙබරවාරි 06 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයේ පහත සඳහන් යෝජනා 02 සඳහා අනුමැතිය ලබා දී තිබුණි. i. 1978 සංධානය මගින් සංශෝධිත 1973 නෞකා වලින් අපවිත්‍රවීම් වැළැක්වීම් සඳහා වන ජාත්‍යන්තර සම්මුතිය පිළිගැනීම. ii. මෙම සම්මුතියේ ප්‍රතිපාදන බලාත්මක කිරීම සඳහා අවශ්‍ය නීති සම්පාදන කෙටුම්පත් කිරීම සඳහා නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවට නියම කිරීම. එකී අමාත්‍ය මණ්ඩල තීරණය අනුව නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව විසින් පනත සංශෝධනය සඳහා කටයුතු කරන ලෙස දැනුම් දී තිබූ අතර ඒ අනුව සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනත සංශෝධනය කිරීමේ කටයුතු 1997 වර්ෂයේ සිට 2008 වර්ෂය දක්වා සිදු කර තිබේ. ඒ අනුව 2008 අංක 35 දරණ සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනත නව පනතක් ලෙස 2009 වර්ෂයේ ජනවාරි 01 වනදා සිට ක්‍රියාත්මක කර තිබුණි. කෙසේ වුවද මාර්පෝල් සම්මුතිය සම්පූර්ණයෙන්	පතිකාවක් ඉදිරිපත් කරන ලෙස අමාත්‍යාංශයෙන් උපදෙස් ලබා දෙන ලදි. අභ්‍යන්තරව මූලික කෙටුම්පත සකස් කරන ලද පනත තව දුරටත් කෙටුම්පත් කිරීම සඳහා 07 දෙනෙකුගෙන් යුත් කමිටුවක් පත් කිරීමට කටයුතු කරන ලදි. ඒ අනුව කෙටුම්පත් කරන ලද පනත අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කිරීමට නියමිතය. අමාත්‍ය මණ්ඩල විෂය පතය හා ආයතන වෙන් කිරීම සිදු කරනු ලබන්නේ රජයේ ප්‍රතිපත්තිමය තීරණ මත වන අතර ඒ සඳහා මෙම අධිකාරියේ අදහස් විමසීමක් හෝ නිර්දේශ ලබා ගැනිමක් සිදු නොවේ. කෙසේ වුවද පනතේ විධිවිධාන අනුව එම කාලසීමාව තුළ ද අධිකාරිය විසින් සමුද්‍ර දූෂණය වැළැක්වීමට කටයුතු සිදු කරනු

	ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය නීති ප්‍රතිපාදන පනතට එක් කොට නොමැති බව නිරීක්ෂණය විය.			ලැබීය.	
2	**ජාත්‍යන්තර සමුද්‍රීය සංවිධානයේ (IMO) ක්‍රියාකාරී සාමාජිකයෙකු ලෙස කටයුතු කිරීම** මෙම ආයතනයේ ක්‍රියාකාරී සාමාජිකත්වය දැරීම තුලින් කලාපීය හා දේශීය වශයෙන් නාවික ගමනාගමනය තුලින් ඇති කරනු ලබන ගැටලු හා අභියෝග සම්බන්ධව ජාත්‍යන්තර අවධානය යොමු කිරීම තුලින් ඒ සඳහා පොදු එකඟතාවයක් ඇති කර ගැනීම තුලින්ද ජාත්‍යන්තර ප්‍රඥප්තීන් හා සම්මුතීන් පිළියෙල කිරීමේදී ඊට දේශීය දායකත්වය ලබා දීමේදී වේදිකාවක් ලෙස එකී ආයතනයේ සාමාජිකත්වය වැදගත් වන අතරම ශ්‍රී ලංකාව සාමාජිකත්වය ලැබුවද ක්‍රියාකාරීව දායක වීම තුල සේද මාවත තුල පිහිටි නාවික මධ්‍යස්ථානයක් ලෙස ශ්‍රී ලංකාව මුහුණ දෙන ගැටලු හා අනාගතයේදී ශ්‍රී ලංකාවේ නාවික ගමනාගමනය තුලින් ප්‍රමුඛ කාර්යයන් ඉටු කර ගැනීමට අවශ්‍ය පිළිගැනීම ඇති කර ගැනීමට රුකුලක් වේ. එසේ වුවද පසුගිය	2021	ජාත්‍යන්තර සමුද්‍රීය ආයතනයේ (IMO) සක්‍රීය සාමාජිකයෙකු බවට ශ්‍රී ලංකාව පත් කිරීමට කටයුතු කිරීම.	අන්තර් ජාතික සමුද්‍රීය සංවිධානයේ සාමාජිකත්වය ශ්‍රී ලංකාව ලබාගෙන ඇති අතර එහි ශ්‍රී ලංකාවේ කේන්ද්‍රීය ආයතනය (Focal point) වන්නේ වරාය හා නාවික අමාත්‍යාංශය යටතේ තිබෙන වෙළඳ නැව් අධ්‍යක්ෂ ලේකම් කාර්යාලයයි. එයට අමතරව සමුද්‍ර දූෂණය වැළැක්වීම, සමුද්‍ර පරිසරය ආරක්ෂාව සඳහා වන ශ්‍රී ලංකාව අන්තර්ජාතික සමුද්‍රීය සංවිධානයේ සාමාජිකයෙකු ලෙස එම සංවිධානය මඟින් හඳුන්වා දී ඇති අන්තර් ජාතික සමුද්‍රීන් සහා සංධාන ක්‍රියාත්මක කිරිම ශ්‍රී ලංකාවේ නාවික කර්මාන්තයේ සංවර්ධනය මෙන්ම සමුද්‍ර	අන්තර්ජාතික සමුද්‍රීය සංවිධානය මගින් හඳුන්වා දෙන නැව් මගින් සිදු වන සමුද්‍ර දූෂණය වැළැක්වීමට අදාල සම්මුති හා සංධාන හඳුනා ගෙන ඒවායේ සාමාජිකත්වය ලබා ගැනිමට මෙම අධිකාරිය කටයුතු කරනු ලැබුවද ඒවායේ ප්‍රතිපාදන දේශිය නිතියට ඇතුලත් නොකොට එම සම්මුති හා සංධාන වල පාර්ශවකරුවෙකු විය නොහැක. ඒ අනුව අදාල ප්‍රතිපාදන සහිත පනත සංශෝධනයට අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ඉල්ලුවද ඒ සඳහා අනුමැතිය නොලැබුනු අතර නැවත වරක් අදාල ආයතන සම්බන්ධ සාකච්ජා කර අමාත්‍ය මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත් කොට අනුමැතිය

කාලය තුල මෙම ආයතනයේ සාමාජිකයෙකු ලෙස සක්‍රියව දායක වෙමින් පවතින ගැටලු හා අවශ්‍ය වැඩිදියුණු කිරීම් සම්බන්ධව ශ්‍රී ලංකාවේ දායකත්වය ලබා දීමේ තත්ත්වය සතුටුදායක නොවන බව නිරීක්ෂණය විය.

පරිසරයේ ආරක්ෂාව සම්බන්ධව ඉතා වැදගත් වේ. කෙසේ වු වද අන්තර්ජාතික සමුද්‍රීය සංවිධානය මගින් හඳුන්වා දෙන නැව් මගින් සිදු වන සමුද්‍ර දූෂණය වැළැක්වීමට අදාල සම්මුති හා සංධාන හඳුනා ගෙන ඒවායේ සාමාජිකත්වය ලබා ගැනිම සඳහා ද ඒවායේ ප්‍රතිපාදන දේශිය නිතියට ඇතුලත් කළ යුතුය. ඒ අනුව අදාල ප්‍රතිපාදන සහිත පනත සංශෝධනයට අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය මෙතෙක් ලැබී නොමැති අතර නැවත වරක් අදාල ආයතන සම්බන්ධ සාකච්ජා කර අමාත්‍ය මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත් කොට අනුමැතිය ලබගැනිමෙන් පසුව එ සඳහා කටයුතු කරනු ඇත. එමෙන්ම අන්තර්ජාතික සමුද්‍රීය සංවිධානය

ලබගැනිමෙන් පසුව එ සඳහා කටයුතු කරනු ඇත.

				සමග ඇති සම්බන්ධතාවය වැඩි දියුණු කර ගැනිම සඳහා එම සංවිධානය මගින් පවත්වනු ලබන කමිටු රැස්වීම් වලට සහභාගී වී එම සංවිධානයේ අලුත් කටයුතු පිළිබඳ දැනුවත් වීම් හා සම්බන්ධතා තර කර ගැනිම සිදු කළ යුතුය. එහෙත් එවැනි කටයුතු සඳහා මුදල් වියදම් කිරිමට පවතින චක්‍ර ලේඛ අනුව සිදු කල නොහැක.	
3	**ගිවිසුම්ගත බේරා ගන්නකු ලෙස කටයුතු කිරීම (Contractual Salvor)** නැවක් සම්බන්ධයෙන් හදිසි අනතුරකදී නැව බේරා ගැනීමේ කටයුතු වලදී ගිවිසුම්ගත බේරාගන්නකු ලෙස සහභාගී වූයේ නම් නෞකාවේ Hull and Machinery Insurance යටතේ ගලවා ගැනීමේ කටයුතු සඳහා වන වියදම පූර්ණය කරගත හැකි වේ. එහෙත් ශ්‍රී ලංකාව බේරාගැනීමේ සම්මුතියේ (Salvage Convention) පාර්ශවකරුවකු වී නොතිබුණි. ව්‍යාස්ථාපිත බේරා ගන්නකු ලෙස කටයුතු කිරීම තුල	2021	ව්‍යවස්ථාපිත බේරුම්කරුවකු (Statutory Salvage) ලෙස කටයුතුකිරීමට ඇති හැකියාව සලකා බලා විපරම හා බේරාගැනීම් (Search and Rescue) පිණිස එම කර්මාන්තයන් පිහිටුවීමට ඇති හැකියාව පිළිබඳ අවධානය යොමු කිරීම.	අන්තර් ජාතික සමුද්‍රීය සංවිධානයේ සම්මුති හා සංවිධාන ප්‍රධාන කණ්ඩ 3 කට බෙදේ. 1. ආරක්ෂාව සහ සුරක්ෂිතතාවය 2. සමුද්‍ර පරිසරය ආරක්ෂණය හා සමුද්‍ර පරිසර දූෂණය වැළැක්වීම. 3. සමුද්‍ර පරිසර දූෂණය සඳහා වන්දි ලබා ගැනීම. ඉහත එවායින් මේ ආයතනයේ විෂය පථයට අයත්	Salvage Convention හා Search and Rescue සම්මුති සම්බධන්ද වන්නේ ආරක්ෂාව සහ සුරක්ෂිතතාවය වන අතර ඒවා ක්‍රියාත්මක කිරීම වෙළඳ නෞකා ලේකම් කාර්යාලයේ කාර්යය භාර්යක් වේ. ඒ අනුව එම සම්මුති සඳහා පර්ශවකාරයෙකුවීම සඳහා කටයුතු කිරීම හා ඒවා ක්‍රියාත්මක කිරීම එම ලේකම් කාර්යාලය මඟින් සිදු කල යුතුය.

	ඇතිවන අවදානම් තත්ත්වයකදී වඩාත් ක්‍රියාශීලීව හා පාරිසරික තත්ත්වය, දේපළ ආරක්ෂා වන පරිදි කටයුතු කිරීම සඳහා ව්‍යවස්ථාපිත බේරුම්කරුවකු ලෙස ශ්‍රී ලංකාවට කටයුතු කිරීමට ඇති මූලික කටයුතු සම්පූර්ණ කිරීම වැදගත් වේ. වෙළඳ නැව් කටයුතු පනතේ විධි විධාන අනුව ශ්‍රී ලංකාව ව්‍යවස්ථාපිත බේරුම්කරුවකු ලෙස කටයුතු කිරීම සඳහා ප්‍රතිපාදන අනාගත සැලැසුම් වල ඇතුලත් කිරීම මූලික කාර්යයක් වන නමුත් එවැනි දැක්මක් සහිතව කටයුතු කර නොතිබුණ බව නිරීක්ෂණය විය.			වන්නේ සමුද්‍ර පරිසරය ආරක්ෂාව හා සමුද්‍ර දූෂණය වැළැක්වීම හා ඒවා සඳහා වන්දි ලබා ගැනීම අදාල සම්මුති හා සංධාන වේ. Salvage Convention හා Search and Rescue සම්මුති සම්බධන්ද වන්නේ ආරක්ෂාව සහ සුරක්ෂිතතාවය වන අතර ඒවා ක්‍රියාත්මක කිරීම වෙළඳ නෞකා ලේකම් කාර්යාලයේ කාර්යය භාර්යක් වේ. ඒ අනුව එම සම්මුති සඳහා පර්ශවකාරයෙකුවී ම සඳහා කටයුතු කිරීම හා ඒවා ක්‍රියාත්මක කිරීම එම ලේකම් කාර්යාලය මඟින් සිදු කල යුතුය.	
4	**සමුද්‍රීය පරිසර අධිකාරියේ භෞතික හා මානව සම්පත්** පළාත් 05 ක් සහ දිස්ත්‍රික්ක 14 ක් ආවරණය වන පරිදි සමුද්‍රීය ආරක්ෂණ අධිකාරියේ වෙරළබඩ දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි ප්‍රාදේශීය කාර්යාල	2021	ආයතනික ශක්තිමත්භාවය සඳහා අවශ්‍ය මානව හා භෞතික පහසුකම් වැඩිදියුණු කිරීම.	අධිකාරියේ සංවිධාන ව්‍යුහය අනුව බඳවා ගැනීම හා ඒ ඒ දිස්ත්‍රික්ක වලට සේවයකයන් අනුයුක්ත කිරීම සිදු කෙරේ. ඒ අනුව පවතින සංඛ්‍යාව හා	පවතින තත්වය අනුව සිටින සේවක සංඛ්‍යාව කළමනාකරණය කර ගෙන ඇති අතර කඩිනමින් සේවකයින් බඳවා ගැනීමට කටයුතු කරමින් පවතී.

14 ක් ස්ථාපිත කර තිබූ අතර ඒ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) මුලතිව් ප්‍රාදේශීය කාර්යාලය සඳහා සේවකයින් නොමැති අතර පුත්තලම ප්‍රාදේශීය කාර්යාලය සඳහා එක් සේවකයෙකු පමණක් යොදවා ඇති බව නිරීක්ෂණය විය.

(ආ) ඉහත ප්‍රාදේශීය කාර්යාල 14 ක් සතුව හදිසි තෙල් විසිරුම් සඳහා අවශ්‍ය උපකරණ කිසිවක් නොමැති බව නිරීක්ෂණය විය.

(ඇ) ප්‍රාදේශීය කාර්යාල 14 අතුරින් ගාල්ල ප්‍රාදේශීය කාර්යාලය සතුව පමණක් රසායනාගාර පහසුකම් පවතින අතර අනෙකුත් කිසිඳු කාර්යාලයකට රසායනාගාර පහසුකම් නොමැති බව නිරීක්ෂණය විය. ගාල්ල රසායනාගාරයේ වුවද සාගර ජලයේ දූෂණයට අදාල වන සියළු දූෂ්‍ය කාරකයන් (සාගර ජලයේ අවලම්භිත අංශු, රසායනික ද්‍රව්‍යන්, තෙල් ආදී) පරීක්ෂා කිරීමේ පහසුකම් නොතිබුණි.

අවශ්‍යතාවය මත සේවකයින් අනුයුක්ත කර ඇත. අධිකාරියේ පනතට අනුව කටයුතු සිදු කිරිම සඳහා අදාල සේවය අවශ්‍යතාවය සඳහන් කර අදාල ආයතන වෙත ලිපි යොමු කර ඇති වුවද එලෙස අළුතින් සේවකයින් බඳවා ගැනීම සඳහා මේ වනතුරු අදාල ආයතන වලින් අනුමැතිය ලැබී නොමැත එම නිසා පවතින සේවක සංඛ්‍යාව අවශ්‍යතාවය මත ස්ථාන ගත කර ඇත.

තෙල් විසිරීමේදී ක්‍රියාත්මක උපකරණ යම් ප්‍රමාණයක් සෑම කාර්යාලයකටම ලබා දීම යෝග්‍ය වුවද ඒ සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන නොමැති බැවින් උපකරණ සැපයීමට හැකියාවක් නොමැත.

රසායනාගාර සෑම ප්‍රාදේශීය කාර්යාලයක් මට්ටමින් ඇති කිරිම ප්‍රයෝගික

හා ආර්ථිකමය වශයෙන් ඵලදායී නොවේ. දකුණු පළාතේ හා බස්නාහිර පළාතට අදාලව කටයුතු කිරීම සඳහා හා අවශ්‍ය අවස්ථාවලදී අනෙකුත් දිස්ත්‍රික්කවලට පහසුකම් සැපයීම සඳහා ගාල්ල පළාත් කාර්යාලයේ අධිකාරියේ රසායනාගාරය විවෘත කර ඇත. එලෙසම මෙම රසායනාගාරයේ සමහර පහසුකම් ස්ථාපිත කර ඇති අතර අවශ්‍ය තරම් සේවක සංඛ්‍යාවක් අනුයුක්ත කිරීමට හැකියාවක් මේ වන විට අධිකාරියේ සේවක සංඛ්‍යාව අනුව නොමැති බැවින් අධිකාරියේ විද්‍යාගාරයේ කටයුතු පුළුල් කිරීමේ හැකියාවක් අධිකාරියට මේ වන විට නොමැත. ඉදිරියේදී අවශ්‍ය සේවක සංඛ්‍යාව ලබා ගැනීමෙන් පසු අදාල පරිදි කටයුතු පුළුල් කිරීම සිදු කරනු ඇත.

5	**2008 අංක 35 දරන සමුද්‍ර දූෂණය වැලැක්වීමේ පනතේ ප්‍රතිපාදන** තෙල් දූෂණ හානිපූර්ණය සඳහා වූ අන්තර්ජාතික අරමුදල මගින් දූෂණ හානි ලෙස අර්ථදක්වා ඇති ප්‍රධාන අවස්ථා 04 ලෙස පිරිසිදු කිරීමේ මෙහෙයුම් හා දේපොල හානි වියදම්, ආනුශංගීය අලාභ හා ශුද්ධ ආර්ථික අලාභ හිමිකම්, දූෂණය වලක්වා ගැනීම හෝ අවම කරගැනීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග සඳහා වන්දි හා පාරිසරික හායනයෙන් සිදු වූ ආර්ථික අලාභ හැර අනෙකුත් පාරිසරික හානි සඳහා වන්දි ගෙවීම් ආවරණය වේ. මෙම හානිපූර්ණයන් අයකරගැනීම සඳහා විධිමත් ව්‍යවස්ථාවන් සම්පාදනය කොට නොතිබුණි.	2021	සමුද්‍රීය හානි පූර්ණනයන් අයකරගැනීම සඳහා විධිමත් ව්‍යවස්ථාවන් සම්පාදනය කොට නීතිගත වීම කඩිනමින් සිදු කිරීම.	සමුද්‍ර දූෂණ පනත සංශෝධනය කිරීමේදී අරමුදල් සම්මුතිය අනුව ශ්‍රී ලංකාව තුල සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කිරීම හැකි වන ලෙස සියළුම නීති ප්‍රතිපාදන එකතු කරනු ඇත.	පනත සංශෝධනය කිරීමේදී මේ සඳහා අදාල ප්‍රතිපාදන ඇතුලත් කිරීමට නියමිතය.
6	**ශ්‍රී ලංකා සමුද්‍රීය කලාපය තුල සිදු වූ නාවික අනතුරු** ජාතික තෙල් විසිරුම් සැලැස්ම (NOSCOP) අනුව තෙල් විසිරුමක් කළමනාකරණය සඳහා හඳුනාගෙන ඇති Tier 1 යටතේ ශ්‍රී ලංකාව තුළ පවතින භෞතික සම්පත් ප්‍රමාණය මෙට්‍රික් ටොන් 50ක් දක්වා වූ තෙල් විසිරුමක් සඳහා ප්‍රමාණවත් වේ. එහෙත් ඉහත තොරතුරු පරීක්ෂාවේදී	2021	නාවික අනතුරු වලදී ක්ෂණයෙන් ක්‍රියාත්මක විය හැකි බහු අරමුණු සහිත යාත්‍රාවක් (Multi Purpose Vessel) ඊට අවශ්‍ය පුහුණු මානව සම්පත් සහිතව ශ්‍රී ලංකා ධජය යටතේ ස්ථාපිත කිරීමේ හැකියාව සලකා බැලීම.	ශ්‍රී ලංකාව අවට විශාල නෞකා ප්‍රමාණයක් ගමන් කරන නිසා විශාල තෙල් හා රසායනික ද්‍රව්‍ය විසිරීමට හැකියාවක් පවතී.මෙම අවධානමට මුහුණදීම සඳහා ප්‍රමාණවත් උපකරණ ශ්‍රී ලංකාව සතුව නොපවතී.කෙසේ වුවද අධිකාරිය	අධිකාරිය මඟින් අනෙකුත් රටවල සහය යටතේ බහු අරමුණු සහිත නෞකාවක් හා අනෙකුත් උපකරණ ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කලද එය සාර්ථක කර ගැනීමට නොහැකි විය.

	අනාගතයේදී ඇතිවිය හැකි අවධානම අවම කර ගැනීමටත් සමුද්‍රීය පරිසරයට වන්නා වූ හානිය අවම කර ගැනීමටත් පවතින මානව හා භෞතික සම්පත් ප්‍රමාණවත් නොවන බව නිරීක්ෂණය විය.			මඟින් අනෙකුත් රටවල සහය යටතේ බහු අරමුණු සහිත නෞකාවක් හා අනෙකුත් උපකරණ ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කලද එය සාර්ථක කර ගැනීමට නොහැකි විය.	
7	**සමුද්‍ර දූෂණය අවම කිරීම උදෙසා පෙර සූදානම් වීම පිළිබඳ ජාතික වැඩමුළුව** සමුද්‍ර දූෂණය අවම කිරීම උදෙසා පෙර සූදානම් වීම පිළිබඳ ජාතික වැඩමුළුවක් 2014 දෙසැම්බර් 16 සහ 17 යන දිනයන් වලදී පවත්වා ඇති අතර මේ සඳහා ජාත්‍යන්තර සමුද්‍රීය සංවිධානය (IMO) හා දකුණු ආසියානු සහයෝගිතා පාරිසරික වැඩසටහන (SACEP) යන ආයතනද සහභාගී වී තිබුණි. මෙහිදී දකුණු ආසියානු තෙල් රසායන ද්‍රව්‍යය විසිරීමකදී ක්‍රියාත්මක සැලැස්මක් සකස් කර තිබූ අතර ශ්‍රී ලංකාවද මෙම සැලැස්ම සඳහා පාර්ශවකරුවකු වේ. එවැනි සැලැස්මක් පැවතියද දකුණු ආසියානු සහයෝගිතා පාරිසරික වැඩසටහනක් යටතේ එම කටයුතු සම්පූර්ණයෙන්	2021	සමුද්‍රීය දූෂණයට අදාල සමුද්‍රීය තොරතුරු චන්ද්‍රිකා තාක්ෂණය මඟින් නියමිත වෙලාව තුළ(Real Time) ලබා ගැනීමට අවශ්‍ය පහසුකම් ඇති කිරීම හා ඒවා නියාමනය කිරීම.	ශ්‍රී ලංකාව වටා වූ සමුද්‍ර කලාපයේ සිදුවන තෙල් විසිරීම් නිරීක්ෂණය සඳහා ප්‍රංශයේ CLS ආයතනය සමග සහයෝගිතාවයෙන් චන්ද්‍රිකා තොරතුරු ලබා ගැනීමේ මූලික ව්‍යාපෘතියක් 2023 සැප්තැම්බර් සිට 2024 සැප්තැම්බර් දක්වා සාර්ථකව සිදු කෙරිණි. CLS ආයතනය වෙතින් මේ සම්බන්ධව රාජකාරී සිදු කරන සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකරියේ නිලධාරීන් සඳහා න්‍යායාත්මක සහ ප්‍රායෝගික පුහුණුවක් ලබා දෙන ලදී. තවද මේ සම්බන්ධව ක්‍රියා කරන ශ්‍රී	මෙම චන්ද්‍රිකා ව්‍යාපෘතිය තවදුරටත් සිදුකිරීම සහ තෙල් විසිරීම් හඳුනා ගැනීමට අමතරව ධීවර, නෞකා, පරිසර ආරක්ෂණ, ආපදා ආදී විෂය ක්ෂේත්‍රයන් සඳහා මෙම ව්‍යාපෘතිය මගින් තොරතුරු ලබා ගනිමින් ව්‍යාපෘතිය ඉදිරියට කරගෙන යාමත් චන්ද්‍රිකා දත්ත නිවැරදි සහ ඉක්මනින් ලබා ගැනීම සඳහා Ground Station ඉදිකිරීමට අදාලව සාකච්ඡා ශ්‍රී ලංකාවේ අදාළ රාජ්‍ය ආයතන සමග සිදුකරමින් පවතී.

සම්බන්ධීකරණය කර නොතිබීම හේතුවෙන් දකුණු ආසියානු කලාපය තුල විශාල ප්‍රමාණයේ තෙල් විසිරීමකදී ක්‍රියාත්මක කල යුතු ආකාරය පිළිබඳ ක්‍රමවත් වැඩපිළිවෙලක් නොමැති බව අනාවරණය විය.

ලංකාවේ පාර්ශවකාර ආයතනය දැනුවත් කිරීමද සිදු කරන ලදී.මෙම ව්‍යපෘති කාලසීමාව තුල ශ්‍රී ලංකාව අවට සාගර කලාපයේ නැව් මගින් සිදු කරන ලද තෙල් විසිරීම් අවස්ථා නිරීක්ෂණය කර අදාළ දූෂක ප්‍රභවය පිළිබද නිවැරදි වාර්තාවක් සමුද්‍රීය ආරක්ෂණ අධිකාරිය වෙත ලබා දීම CLS ආයතනය සිදු කරන ලදී. එම වාර්ථා පදනම් කර සමුද්‍ර දූෂණ වැළක්වීමේ පනතට අනුව සමුද්‍ර දූෂණය සිදු කරන නෞකා වලින් දඩ ලබා ගැනීම සිදු කරන ලදී. තවද ශ්‍රී ලංකාවේ සාගර කලාපය හරහා ගමන් කරමින් තෙල් මුදා හැරීම සිදුකල නෞකා වෙත අදාළ සිදුවීම් පිළිබද දැනුවත් කිරීම හා අදාළ ජාත්‍යන්තර ආයතන දැනුවත් කිරීම CLS ආයතනය ලබා දෙන චන්ද්‍රිකා දත්ත පදනම් කරගෙන සිදුකරන

					ලදී.
8	**සමුද්‍ර දූෂණය අවම කිරීම උදෙසා පෙර සූදානම් වීම පිළිබඳ ජාතික වැඩමුළුව** සමුද්‍ර දූෂණය අවම කිරීම උදෙසා පෙර සූදානම් වීම පිළිබඳ ජාතික වැඩමුළුවක් 2014 දෙසැම්බර් 16 සහ 17 යන දිනයන් වලදී පවත්වා ඇති අතර මේ සඳහා ජාත්‍යන්තර සමුද්‍රීය සංවිධානය (IMO) හා දකුණු ආසියානු සහයෝගිතා පාරිසරික වැඩසටහන (SACEP) යන ආයතනද සහභාගී වී තිබුණි. මෙහිදී දකුණු ආසියානු තෙල් රසායන ද්‍රව්‍යය විසිරීමකදී ක්‍රියාත්මක සැලැස්මක් සකස් කර තිබූ අතර ශ්‍රී ලංකාවද මෙම සැලැස්ම සඳහා පාර්ශවකරුවකු වේ. එවැනි සැලැස්මක් පැවතියද දකුණු ආසියානු සහයෝගිතා පාරිසරික වැඩසටහනක් යටතේ එම කටයුතු සම්පූර්ණයෙන් සම්බන්ධීකරණය කර නොතිබීම හේතුවෙන් දකුණු ආසියානු කලාපය තුල විශාල ප්‍රමාණයේ තෙල් විසිරීමකදී ක්‍රියාත්මක කල යුතු ආකාරය පිළිබඳ ක්‍රමවත් වැඩපිළිවෙලක් නොමැති බව අනාවරණය විය.	2021	වරායන් ආශ්‍රිතව තෙල් හා රසායන විසිරුම් වලට අදාල ඒවා පාලනය සම්බන්ධයෙන් ධාරිතා සංවර්ධනය.	2012 අංක 01 දරණ හදිසි තෙල් විසිරීමකදි ක්‍රියාත්මක සැලැස්මේ රෙගුලාසියට අනුව ශ්‍රී ලංකාවේ ප්‍රධාන වාණිජ වරායන් වන කොළඹ ,ගාල්ල, ත්‍රිකුණාමලය සහ හම්බන්තොට යන වරායන් විසින් ඉහත රෙගුලාසියට අනුව හදිසි තෙල් විසිරීමකදි ක්‍රියාත්මක සැලැස්මක් සකස් කර සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ අනුමතිය ලබාගෙන ඇත. මෙම සැලැස්ම වසර 2 කට වරක් වරායන් මගින් යාවත්කාලීන කිරීම, උපකරණ සංචිතයන් පවත්වාගෙන යාම, පුහුණු වැඩමුළු පැවැත්වීම මෙම අධිකාරියේ අධික්ෂණය යටතේ සිදු කරයි.	රසායනික ද්‍රව්‍ය විසිරීමකදි ප්‍රතිචාර දක්වීමට අවශ්‍ය උපකරණ සංචිත, පුහුණු කණ්ඩායම් ඇති කිරිම සඳහා වරායන් දැනුවත් කිරිමට සැලසුම් කර ඇත. තවද වරායන් සහ එහි ක්‍රියාත්මක වරාය පර්යන්තවල මේ සම්බන්ධව කටයුතු කරන නිළධාරීන් දැනුවත් කිරීමේ වැඩමුළුවක් 2024 නොවැම්බර් මස පැවැත්විමට සැලසුම් කර ඇත. තවද යාවත්කාලීන කරන ලද ජාතික තෙල් හා රසායනික ද්‍රව්‍ය විසිරීමකදී ක්‍රියාත්මක සැලැස්ම් Digital dash board සඳහා වරායන් වල හා තෙල් විසිරීමක් සහිත වරායන් පිළිබඳ තොරතුරු අඩංගු කර ඇති අතර ඒවා යාවත්කාලීන කිරීමද සිදු කරයි. OPRC- HNS සම්මුතිය සඳහා ශ්‍රී ලංකාව පාර්ශවකරුවකු වීමට අදාලව සංශෝධනය කරමින් පවතින
9	**රසායන ද්‍රව්‍යය විසිරීමේදී ප්‍රතිචාර දැක්වීම පිළිබඳ වැඩමුළුව** රසායන ද්‍රව්‍යය				

විසිරීමේදී ප්‍රතිචාර දැක්වීමේ ධාරිතා වර්ධනය සඳහා දෙදිනක වැඩමුළුවක් 2015 මැයි මස 14 සහ 15 දින වලදී මධ්‍යම පරිසර අධිකාරියේදී පවත්වා තිබේ. එහිදී රසායනික ද්‍රව්‍යය විසිරීමකදී ක්‍රියාත්මක කල යුතු ආකාරය ඇතුලත් කොට ජාතික සැලැස්ම නැවත සකස් කල යුතු බවත්, රසායන ද්‍රව්‍යය විසිරීමකදී ක්‍රියාත්මක වීම සඳහා පෙර පුහුණු වීම් සිදු කල යුතු බවත් සහ රසායන ද්‍රව්‍යය විසිරීමේදී ක්‍රියා කිරීම සඳහා පිරිස් පුහුණු කල යුතු බවත් තීරණය කර තිබුණි. එසේම රසායන ද්‍රව්‍යය විසිරීමේදී ක්‍රියාත්මක වීම සඳහා පවතින OPRC- HNS ප්‍රොටෝකෝලය සඳහා ශ්‍රී ලංකාව පාර්ශවකරුවකු විය යුතු බවට ද තීරණය කර තිබුණි. කෙසේ වුවද රසායන ද්‍රව්‍යය විසිරීමකදී ක්‍රියාත්මක වීම සඳහා පවතින OPRC- HNS ප්‍රොටෝකෝලය සඳහා පාර්ශවකරුවකු වීම සහ ඒ සඳහා නීති සැදීම සඳහා අවශ්‍යය කටයුතු 2020 දෙසැම්බර් 31 දින වන විටත් අවසන් කර නොමැති බව නිරීක්ෂණය විය.

සමුද්‍ර දූෂණ වැළැක්වීමේ පනතට OPRC- HNS සම්මුතියට අත්සන් කිරීම පිළිබඳව ප්‍රතිපාදන ඇතුලත් කොට ඇති අතර පනත සඳහා අනුමැතිය ලැබීමෙන් පසුව OPRC- HNS සම්මුතියට ශ්‍රී ලංකාව පාර්ශවකරුවකු විය හැක.

10	**ශ්‍රී ලංකාවේ සමුද්‍ර කලාපය තුල නැව් මගින් සිදු වූ සමුද්‍ර විපත් එම්.ටී. නිව් ඩයමන්ඩ් නෞකාව සම්බන්ධ සමුද්‍ර විපත** 2008 අංක 35 දරන සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනතේ IX කොටසේ 34 වගන්තිය මගින් දූෂණය වැලැක්වීමේ සිවිල් වගකීම දක්වා ඇත. මේ වගන්තිය අනුව යම් ක්‍රියාවක් හේතුවෙන් ශ්‍රී ලංකා ජල තීරය හෝ වෙනත් යම් සමුද්‍රීය කලාප දූෂණය වන අවස්ථාවක එම නැවේ අයිතිකරු, නෞකාව භාරව සිටින තැනැත්තකු හෝ එවැනි යම් උපකරණයක අයිතිකරු යම් තෙල් හෝ වෙනත් දූෂක ද්‍රව්‍යක් පිට කිරීමෙන් හෝ පිටවීමෙන් සිදු වන යම් හානියක් සම්බන්ධයෙන් හා එවැනි හානියක් වැළැක්වීමේ, අඩු කිරීමේ හෝ ඉවත් කිරීමේ කාර්යය සඳහා දරන ලද වියදම් සම්බන්ධයෙන් වගකීමට යටත් විය යුතු වේ. එසේම මෙම වගන්තිය යටතේ ධීවර කටයුතු ඇතුළු සමුද්‍රික, වෙරළබඩ වරාය හෝ මෝදර කටයුතු , සංචාරක කටයුතු ප්‍රවර්ධනය, වෙරළ හා කොරල් ගල්පර	2021	මුහුදු ජීවීන්ගේ අනතුරු හා මරණ සම්බන්ධයෙන් හේතු කාරකයන් අනාවරණය කර ගැනීම පිණිස වෝහාරික (Forensic) රසායනාගාර පහසුකම් ඇති කිරීම කෙරෙහි අවධානය යොමු කිරීම.	මෙම විෂය යටතේ කටුයුතු කිරීමේ බලතල හිමිව පවතින්නේ වනජීවී දෙපර්තුමේන්තුව වෙතය.	ජාතික තෙල් හා රසායනික ද්‍රව්‍ය විසිරීමේ සැලැස්මේ හදිසි අවස්ථා කණ්ඩායමේ සාමාජික ආයතනයක් ලෙස වනජීවී දෙපාර්තුමේන්තුව හදිසි තෙල් විසිරීමක් වැනි සමුද්‍ර විපත් අවස්ථාවලදී සමුද්‍ර ජීවීන් සම්බන්ධව පරීක්ෂණ කිරීමට අවශ්‍ය රසායනාගාර පහසුකම් වැඩි දියුනු කල යුතු බව ජාතික තෙල් හා රසායනික ද්‍රව්‍ය විසිරීමේදී ක්‍රියාත්මක සැලැස්මේ වනජීවී දෙපාර්තුමේන්තුවට අදාල රාජකාරී ලැයිස්තුවට ඇතුලත් කර ඇත ඒ පිලිබදව එම දෙපාර්තමේන්තුව දැනුවත් කර ඇත.

ආරක්ෂාව හා සංවර්ධනය, වෙරළබඩ ජනතාවගේ සෞඛ්‍ය හා යහපත හා සජීවී මුහුදු සම්පත් හා වන සතුන්ගේ ආරක්ෂාව හා සංරක්ෂණය ඇතුළත් වේ.

කෙසේ වුවද ඒ සම්බන්ධව පහත සඳහන් නිරීක්ෂණයන් විය.

i. 2020 සැප්තැම්බර් 03 වන දින ශ්‍රී ලංකාවේ අනන්‍ය ආර්ථික කලාපය තුළ අනතුරට පත් වූ නිව් ඩයමන්ඩ් නෞකාව මඟින් සිදු වූ සමුද්‍රීය විපත හේතුවෙන් සමුද්‍රීය පරිසරයට වූ හානිය සම්බන්ධයෙන් පනතේ 34 වගන්තිය යටතේ හානි අයකර ගැනීම 2021 අප්‍රේල් 30 දක්වාම සිදු කර නොතිබුණි.

ii. පනතේ 34 වගන්තිය මඟින් සජීවී මුහුදු සම්පත් සහ වන සතුන් ආරක්ෂණය හා සංරක්ෂණය කිරීම ද ඇතුළත් වන නමුත් මෙම එම්.ටී. නිව් ඩයමන්ඩ් නෞකාවෙන් සිදු වූ අනතුරට අදාලව උක්ත කරුණ යටතේ වූ අලාභය අයකරගැනීමට කටයුතු කර

	නොතිබුණි. iii. සජීවී මුහුදු සම්පත් සහ වන සතුන් ආරක්ෂණය හා සංරක්ෂණය කිරීම සඳහා සමුද්‍රීය සංවේදී කලාප හඳුනාගෙන ගැසට් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කලයුතු වුවත් විගණිත දිනය වන විටත් ඒ සඳහා කටයුතු කර නොතිබුණු බව නිරීක්ෂණය විය.				
11	**මාර්පෝල් සම්මුතිය ක්‍රියාත්මක කිරීමේ රාජ්‍ය වගකීම** නැව් අධීක්ෂණය සහ සහතිකකරණය සඳහා විධිමත් නෛතික පද්ධතියක් භාවිත කිරීම, සමුද්‍රීය විපත් වැළැක්වීම, නැව් වල පවතින ඉවතලන අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා අවශ්‍ය වරාය ප්‍රතිග්‍රහණ පහසුකම් සැලසීම සඳහා වූත් රාජ්‍ය වගකීම ඉටු කිරීම සිදු කල යුතුය. 2016 වර්ෂයේ ඉදිරිපත් කරන ලද අයවැය කතාව අනුව වර්ෂ 2025 වන විට ලෝකයේ ප්‍රධාන ප්‍රතිනැව්ගත කිරීමේ වරායවල් 20 අතරට ශ්‍රී ලංකාව පැමිණීම ඉලක්ක ගත වීම හා 2018 වර්ෂයේ ඉදිරිපත් කරන ලද අයවැය කතාව අනුව සමුද්‍රාශ්‍රිත වර්ධන උපායමාර්ගයට	2021	මහා භාණ්ඩාගාරයට වැය බරක් නොවන පරිදි යම් සමුද්‍රීය අනතුරකදී මුහුණ දීමට හැකිවන පරිදි දූෂකයා ගෙවිය යුතුය යන සංකල්පය යටතේ අරමුදල් යාන්ත්‍රණයක් ඇති කිරීමේ හැකියාව සලකා බැලීම.	මේ සම්බන්ධව ක්‍රියාත්මකවීම සඳහා අවශ්‍ය නීතිමය ප්‍රතිපාදන සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනතට ඇතුලත් කලයුතුය.	වර්තමානයේ සංශෝධනය කරමින් පවතින සමුද්‍ර දූෂනය වැළැක්වීමේ පනතට දූෂකයා ගෙවිය යුතු යන සංකල්පය ඇතුලත් කර ඇත. ඒ අනුව පනත සඳහා අනුමැතිය ලැබුනු පසුව අදාල ක්‍රියාමාර්ග ගත හැකිවේ.

අනුකූලව මහද්වීප තටකය (continental Shell) පුළුල් කිරීමට අපේක්ෂා කිරීම දක්වා ඇත.
මෙයට අමතරව සාගර නීති පිළිබඳව සම්මුතියේ පරිච්ඡේද XII හි වගන්ති 192 හා 194 මගින්ද 235 මගින්ද දක්වා ඇති පරිදි නාවික යාත්‍රා නිසා සිදුවන සාගර දූෂණයන් මගින් සාගරයට හා ජෛව පරිසරයට ඇතිවිය හැකි අලාභ හානි සම්බන්ධයෙන් අයකර ගැනීම සඳහා අවශ්‍ය නෛතික පසුබිම කාර්යක්ෂම ලෙස හෝ අන්තර්ජාතික නෛතික ප්‍රතිපාදන වලට අනුකූල අයුරින් දේශීය ප්‍රතිපාදන ඇතිකර ගැනීම රාජ්‍යක වගකීම වේ.
මේ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) උක්ත විෂයට අදාලව ශ්‍රී ලංකාව තුල මෙම සම්මුතියේ වර්තමානය වන විට පවතින සියලු තාක්ෂණික ඇමුණුම් ක්‍රියාත්මක කිරීම සඳහා සමස්ථයක් ලෙස වගකිව යුතු එක් නිශ්චිත ආයතනයක් දේශීය යාන්ත්‍රණය තුළ නොමැති බව නිරීක්ෂණය විය.

(ආ) 2016 වර්ෂයේදී

ජාත්‍යන්තර සමුද්‍රීය සංවිධානය (IMO) විසින් ශ්‍රී ලංකාවේ සිදු කරන ලද සමුද්‍රීය කටයුතු විගණනයන්ට අදාල වාර්තාවේ නිර්දේශයන්ට අනුව ජාත්‍යන්තර සමුද්‍රීය සංවිධානයේ අනිවාර්ය ප්‍රඥාප්තීන් දේශීය නීතියට ඇතුළත් කිරීම අනිවාර්ය බවත් එය 2018 දෙසැම්බර් 31 දිනට පෙර සිදු කල යුතු බවත් දක්වා තිබුණ ද ඒ අනුව කටයුතු කර නොතිබුණි.

2.2 ශ්‍රී ලංකාවේ අපජල කළමනාකරණයේ කාර්යක්ෂමතාවය ඇගයීම

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
1	**පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබා ගැනීම** විගණනයේදී භෞතික පරීක්ෂාවට ලක් කරන ලද රෝහල් 17ක් අතුරෙන් ත්‍රිකුණාමලය දිස්ත්‍රික් රෝහල, පොළොන්නරුව යන රෝහල් 02 විසින් පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. එසේම කතරගම අපජල පිරිපහදු මධ්‍යස්ථානය, මත්තේගොඩ නිවාස යෝජනා ක්‍රමය ආශ්‍රිත අපජල පිරිපහදු පද්ධති සඳහා ද පරිසර ආරක්ෂණ බලපත්‍රය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. අපජල පිරිපහදු මධ්‍යස්ථාන සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබා නොගැනීම හා එවැනි ස්ථාන මගින් බාහිර පරිසරයට මුදා හරින අපජලය නිසා පරිසරයට සිදුවන බලපෑම සම්බන්ධයෙන් මධ්‍යම පරිසර අධිකාරිය විසින් ප්‍රමාණවත් පසු	2021	සියළුම රෝහල් සහ සියළුම අපජල පිරිපහදු මධ්‍යස්ථාන සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍රය ලබාගැනීමට කටයුතු කිරීම.	<u>සෞඛ්‍ය අමාත්‍යාංශය</u> පේරාදෙණිය ශික්ෂණ රෝහල, මහනුවර ශික්ෂණ රෝහල,කන්ත ලේ මූලික රෝහල, නුවරඑළිය දිස්ත්‍රික් රෝහල, මාතර දිස්ත්‍රික් මහරෝහල, බදුල්ල මහ රෝහල සහ තිස්සමහාරාම මූලික රෝහල පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාගැනීමට කටයුතු කර ඇත. ත්‍රිකුණාමල දිස්ත්‍රික් රෝහලේ පල්දෝරු පද්ධතියේ ගැටළුක් නිසා පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාගෙන නොමැත. පොලොන්නරුව දිස්ත්‍රික් මහ රෝහලේ පරිසර ආරක්ෂණ බලපත්‍රය කසල දාහකයේ	2023.12.31 දින වන විට රජයේ රෝහල් 362 ක් සඳහා පාරිසරික ආරක්ෂණ බලපත්‍ර නිකුත්කර ඇත. එසේම පාරිසරික ආරක්ෂණ බලපත්‍රය ලබා ගැනීම සඳහා අලුතින් අයදුම් කරන ලද තවත් රජයේ රෝහල් 17 ක් සඳහා පාරිසරික ආරක්ෂණ බලපත්‍රය නිකුත් කිරීමට අදාලව කටයුතු සිදුකරමින් පවතී.

විපරමක් සිදු කර නොතිබුණි. පුරවැසියන්ගේ සෞඛ්‍යමය සුරක්ෂිතතාවය හා නීරෝගීභාවය කෙරෙහි ඉහල දායකත්වයක් ලබා දෙනු ලබන ශ්‍රී ලංකාවේ රෝහල් පද්ධතිය පරිසරයේ සුරක්ෂිතතාවය සුරැකීම සඳහාද සිදු කරන දායකත්වය තුලින් අන්තර් ජාතික ප්‍රමිති තලයට ගෙන ඒමට අවශ්‍ය අවකාශය සලසා දීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග වලට යොමු කිරීමට මධ්‍යම පරිසර අධිකාරියේ දායකත්වය හා රෝහල් බලධාරීන්ගේ අවධානය ප්‍රමාණවත් නොවන බව නිරීක්ෂණය විය.

ගැටළුක් නිසා ලබාදී නොමැත.

<u>මධ්‍යම පරිසර අධිකාරිය</u>

1. රජයේ රෝහල් සඳහා පාරිසරික ආරක්ෂණ බලපත්‍රය සහ උපලේඛනගත අපද්‍රව්‍ය කළමනාකරණ බලපත්‍රය ලබාගැනීම සඳහා රජයේ රෝහල් යොමු කරවීමට අවශ්‍ය කටයුතු සිදුකරදෙන මෙන් ඉල්ලා අංක ernv/epcm/04/03/06/890 YD සහ 2022.02.29 දිනැති ලිපිය සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්තුමා වෙත යොමු කිරීම.
2. පාරිසරික ආරක්ෂණ බලපත්‍රය හා උපලේඛන අපද්‍රව්‍ය කළමනාකරණ බලපත්‍රය ලබානොගත් හා එසේ බලපත්‍ර නිකුත් කිරීමට අවශ්‍ය අවශ්‍යතා සම්පූර්ණ නොකරන ලද

රාගම රෝහල, උතුරු කොළඹ ශික්ෂණ රෝහල, අනුරාධපුර ශික්ෂණ රෝහල යන රෝහල් සම්බන්ධයෙන් මැදිහත් වී කටයුතු කිරීම.

i. අනුරාධපුර ශික්ෂණරෝහල වෙත පාරිසරික ආරක්ෂණ බලපත්‍රය නිකුත්කිරීමට අදාලව මැදිහත්වී කටයුතුකිරීම.

ii. පාරිසරික ආරක්ෂණ බලපත්‍රය හා අපද්‍රව්‍ය කළමනාකරණ බලපත්‍රය ලබානොගෙන රෝහල පවත්වාගෙන යාමට එරෙහිව හලාවත රෝහල වෙත නඩු පැවරීම.

iii. පේරාදෙණිය ශික්ෂණ රෝහලත් මහනුවර ශික්ෂණ රෝහලෙත් ජනනය වන අපජලය

මහනුවර නාගරික අපජල කළමනාකරණ පද්ධතිය වෙත යොමුකිරිම.

iv. පොළොන්න රුව දිස්ත්‍රික් රෝහලේ සායනික අපද්‍රව්‍ය කළමනාකරණයේ ගැටලුකාරී තත්වය හා සායනික අපද්‍රව්‍ය දහනය කිරීම සඳහා ස්ථාපිත දාහකයේ ක්‍රියාකාරීත්වය පිළිබඳව මහජන පැමිණිලි නිසා පරිසර ආරක්ෂණ බලපත්‍රය ලබා දී නොමැත. 2024.06.25 දින ක්ෂේත්‍ර පරීක්ෂණයක් සිදුකර ඇත. රෝහලෙන් ජනනය වන අපජලය පිරිපහදු පද්ධතිය වෙත යොමු කර ඇත. මාතර මහරෝහල, කන්තලේ මූලික රෝහල

වෙත පාරිසරික ආරක්ෂණ බලපත්‍ර නිකුත් කර ඇත.

v. කතරගම අපජල පිරිපහදු පද්ධතියෙන් බැහැර කරනු ලබන අපජලය සම්බන්ධ විශ්ලේෂණ වාර්තාවක් කැඳවා ඇත.

vi. බදුල්ල මහ රෝහලේ පාරිසරික ආරක්ෂණ බලපත්‍රයට අදාල කොන්දේසි සම්පූර්ණ කළ යුතුව පවතින බැවින් එහි පාරිසරික ආරක්ෂණ බලපත්‍රය අළුත් කර නොමැත.නමුත් ඒ සඳහා අවශ්‍ය නිර්දේශ හා උපදෙස් ලබා දීමට මෙම අධිකාරිය විසින් කටයුතු කර ඇත.

2	අපජලය තුල විෂබීජ නාශක, රසායනාගාර ක්‍රියාකාරකම් සඳහා භාවිතා වන්නා වූ රසායනික ද්‍රව්‍යයන්, අවශෝෂණය කල හැකි කාබනික සංවේදන අඩංගු එක්ස් කිරණ ප්‍රතිවිරුද්ධ මාධ්‍ය සංයෝග, දන්ත අමල්ගම් හෝ විද්‍යාගාර රසායනික ද්‍රව්‍ය වලින් රසදිය, ප්‍රතිජීවක ඖෂධ, විකිරණශීලී අපද්‍රව්‍ය හා බැක්ටීරියා, වෛරස් හා පරපෝෂිතයන් ඇතුළු බෝවනකාරක ඇතුලත් විය හැකි වීමේ අවධානමක් පවතී. මේ නිසා රසායනාගාර මගින් උත්පාදනය වන අපජලය පූර්ව ප්‍රතිකාර සඳහා යොමු කිරීමට නිර්දේශිත තත්ත්වයන් ලෙස හඳුනාගත යුතු වුවත් ඒ අනුව කටයුතු නොකිරීම.	2021	රෝහල් රසායනාගාර මඟින් බැහැර කරන සායනික ද්‍රව්‍ය හා රසායනික තරල අපද්‍රව්‍ය පූර්ව ප්‍රතිකාර කිරීමෙන් පසුව අපජල පිරිපහදු පද්ධතියට සම්බන්ධ කිරීමට කටයුතු කිරීම.	පාරිසරික ආරක්ෂණ බලපත්‍රය හා උපලේඛනගත කළමනාකරන බලපත්‍රය නිකුත්කිරීමේ දී අදාල කොන්දේසි වලට අදාලව කටයුතු කරන්නේද යන්න පරික්ෂා කිරීම සිදු කරන බව මධ්‍යම පරිසර අධිකාරිය විසින් දන්වා තිබුණි. අමාත්‍යාංශය විසින් රේඛීය අමාත්‍යාංශය යටතේ වන රෝහල් සඳහා හා පළාත් සභා යටතේ වන රෝහල් සඳහා අපජල කළමනාකරණය සම්බන්ධයෙන් වන මාර්ගෝපදේශ ලබා දීමට හා කටයුතු කරන ලෙස මේ හා සම්බන්ධ අමාත්‍යාංශයේ පාරිසරික, වෘත්තීය සෞඛ්‍ය හා ආහාර ආරක්ෂණ අංශය වෙත උපදෙස් ලබා දී ඇති බව සෞඛ්‍ය අමාත්‍යාංශය	රෝහල් රසායනාගාර තරලමය අපද්‍රව්‍ය බැහැර කිරීමේ දී එක් එක් අපද්‍රව්‍ය කාණ්ඩ සඳහා උපලේඛන ගත අපද්‍රව්‍ය කළමනාකරණ බලපත්‍රයේ සහ පාරිසරික ආරක්ෂණ බලපත්‍රයේ කොන්දේසි වලට අදාල වන සේ බැහැර කිරීමේ නිසි ක්‍රමවේදයන් අනුගමනය කිරීමට බොහෝ රෝහල් යොමු වී ඇත.

				විසින් දන්වා ඇත.	
3	අපජල කළමනාකරණයට අදාලව විශේෂිත වූ අවධානයක් යොමු කිරීම ඉතා වැදගත් වන අතර රෝහල් සංවර්ධනයට සමගාමීව ඇති කල යුතු අපජල මධ්‍යස්ථාන වල ධාරිතා වර්ධනයන් සඳහා නිවැරදි දත්ත පවත්වා ගැනීම අත්‍යවශ්‍ය විය. ඒ අනුව වර්තමානයේ අපජල මධ්‍යස්ථාන වල පවතින ධාරිතාවයන් ප්‍රමාණවත් නොවීම සම්බන්ධයෙන් වගකිව යුතු පාර්ශවයන්ගේ අවධානය යොමු වීමත් ඒ සඳහා අවශ්‍ය මූල්‍ය හා භෞතික සැලැසුම් පිලියෙල කර ඒවා ක්‍රියාත්මක කර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සිදු කල යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබීම.	2021	රෝහල් වල ඉදිරි වැඩිදියුණු කිරීම් වලට ගැළපෙන පරිදි අපජල පිරිපහදු පද්ධතියේ ධාරිතාවය වැඩි කිරීමට කටයුතු කිරීම.	රෝහල් වල ඉදිරි වැඩිදියුණු කිරීම් වලදී මෙම නිර්දේශය සම්බන්ධයෙන් අවධානය යොමුකර අවශ්‍ය සැළසුම් සකස් කිරීමට හා ඒ සම්බන්ධ අනුමැතීන් ලබා ගැනීමට කටයුතු කරන ලෙසත් මේ සම්බන්ධයෙන් රෝහල් දැණුවත් කරන ලෙසත් අමාත්‍යාංශයේ අදාල නිලධාරීන් වෙත උපදෙස් ලබා දී ඇත.	විගණන නිර්දේශ අනුව කටයුතු කිරිමට උපදෙස් ලබා දී ඇත.
4	**අපජල පිරිපහදු මධ්‍යස්ථාන වල ක්‍රියාකාරීත්වයේ ස්වාභාවය හා අපජලය බාහිර පරිසරයට එකතු වීම.** කන්තලේ රෝහලේ අළුතින් ඉදිකරන ලද	2021	විශේෂයෙන් රෝහල් අපජල අපහරණය සම්බන්ධයෙන් ජාතික ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම.	කන්තලේ රෝහලේ අපජලය පොදු අපජල පිරිපහදු මධ්‍යස්ථානයට සම්බන්ධ කර ඇත.	කන්තලේ රෝහලේ අපජලය පොදු අපජල පිරිපහදු මධ්‍යස්ථානයට සම්බන්ධ කර ඇත. **මධ්‍යම පරිසර අධිකාරිය** මෙම

ස්වභාවික අපජල පිරිපහදු පද්ධතිය වෙත මල අපජලයද සම්බන්ධ කිරීමට නියමිතව තිබේ. එසේ වුවද, පිරිපහදුවෙන් පසු කෝලිෆෝම් බැක්ටීරියා මට්ටම ධාරණ සීමාවේ රඳවා ගැනීම සඳහා නිශ්චිත ක්‍රමවේදයක් වෙත අවධානය යොමු කර නොතිබුණි. සියලුම වැසිකිළි මළ අපද්‍රව්‍ය උරාගැනීමේ වලවල් වලට යොමු කර තිබුණද, එම වලවල් වල ධාරිතාවය ප්‍රමාණවත් නොමැති නිසා ඒවා පිටාර ගැලීමට ලක්ව තිබුණි. රෝහලේ වාට්ටු 2 කින් බැහැර වන අපජලය කිසිදු පිරිපහදුවකින් තොරව ඇළ මාර්ග ඔස්සේ බැහැර වන බවද, නිරීක්ෂණය විය.

අප ජලය රෝහල් භූමිය තුළම අනාරක්ෂිතව පිටාර ගැලීම මඟින් රෝගීන් හා බාහිර පාර්ශවයන්ට ඇති විය හැකි අවදානම් තත්ත්වයන් අවම කිරීම සඳහා අතිරික්තය ගලි බවුසර් මඟින් ඉවත් කිරිම සිදු වේ.

පොදු පිරිපහදු පද්ධතියට සම්බන්ධ නොවූ එක් ඒකකයක් පමණක් දැනට පවතින අතර එය පොදු පිරිපහදු පද්ධතියට සම්බන්ධ කරන තුරු ගලි මඟින් ඉවත් කිරිම සිදු වේ.

<u>මධ්‍යම පරිසර අධිකාරිය</u>

මේ වන විට සෞඛ්‍ය අමාත්‍යාංශය හා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය හා එක්ව රෝහල් ඇතුලත්ව අනෙකුත් සෞඛ්‍ය සේවා පහසුකම් සපයන ආයතන වලින් මාර්ගෝපදේශ සකස් කිරීමට අදාලව සෞඛ්‍ය අමාත්‍යාංශය සහ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය එක්ව කටයුතු කරයි.

<u>සෞඛ්‍ය අමාත්‍යාංශය</u>

ඉදිරියේදී අපජල අපහරණය සම්බන්ධයෙන් ජාතික ප්‍රතිපත්තියක් අනුගමනය කිරීමට උපදෙස් දෙන ලදී.

				ජනනය වන උපද්‍රවකාරී අපජලය කළමනාකරණ මාර්ගෝපදේශ සකස් කරමින් පවතින අතර ඒ සඳහා මධ්‍යම පරිසර අධිකාරිය පාර්ශවකරුවෙකු ලෙස සහභාගී වේ.	
5	**මඩිති බැහැර කිරීම** 2008 අංක 01 දරන ජාතික පාරිසරික (ආරක්ෂණ හා තත්ත්ව) රෙගුලාසි වගු අංක 2.3 මගින් ඉදිරිපත් කර ඇති පරිදි අපජල පිරිපහදු මධ්‍යස්ථානවල ඉතිරි වන්නා වූ මඩිති තෙත් ස්වාභාවයෙන් (Wet) පවතින අවස්ථාවක විෂ සහිත වන අතර පරිසර හිතකාමී ලෙස බැහැර කිරීමේ අවශ්‍යතාවය පවතී. පහත සඳහන් අවස්ථා වලදී පාරිසරික හා සෞඛ්‍යමය හිතකරභාවයෙන් තොරව මඩිති බැහැර වීම් සිදු වී ඇති බව නිරීක්ෂණය විය.	2021			
	i. පොළොන්නරුව රෝහලේ අපජල පිරිපහදු ක්‍රියාවලියෙන් පසු ඉතිරිවන මඩිති (Sludge) සඳහා ඉදිකර තිබූ වියලුම්		පිරිපහදුවෙන් පසු ඉතිරිවන මඩිති වැසි ජලය සමඟ මිශ්‍ර වීම වැළැක්වීමට අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීම සහ මඩිති ආරක්ෂිතව හා ක්‍රමවත්ව බැහැර	**මධ්‍යම පරිසර අධිකාරිය** පාරිසරික ආරක්ෂණ බලපත්‍රය හා උපලේඛනගත අපද්‍රව්‍ය	බොහෝමයක් රෝහල්/ පොදු මල අපජල පිරිපහදු පද්ධතිවලින් ජනනය වන මඩිති වියලා පොහොර ලෙස භාවිතා කරයි.

අංගන (drying beds) වර්ෂා කාලයේදී ජල ගැලීම් හේතුවෙන් සම්පූර්ණයෙන්ම යට වන බව හා වර්ෂාවත් සමඟ මඩිති ජලය සමඟ මිශ්‍ර වී කානු පද්ධති ඔස්සේ ඇළ මාර්ගයට එකතු වීමෙන් ජල මූලාශ්‍ර දූෂණය වීමක් සිදු විය හැකි බව නිරීක්ෂණය විය. ii. මාතර මහ රෝහලේ අපජලය පිරිපහදු කිරීමෙන් පසු ඉතිරි වන මඩිති විවෘත භූමියට බැහැර කර තිබුණි.	කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.	කළමනාකරණ බලපත්‍රය මඩිති බැහැරලීමට අදාලව කොන්දේසි ඇතුලත් කර ඇත. **සෞඛ්‍ය අමාත්‍යාංශය** මේ සම්බන්ධයෙන් අවශ්‍ය තාක්ෂණික උපදෙස් රේඛීය අමාත්‍යාංශය යටතේ පවතින රෝහල් හා පළාත් සභා යටතේ පවතින රෝහල් සඳහා ලබා දීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස මෙම විෂය පථය සම්බන්ධ අමාත්‍යාංශයේ පාරිසරික, වෘත්තීය සෞඛ්‍ය හා ආහාර ආරක්ෂණ අංශය වෙත උපදෙස් ලබා දී ඇත. 2024 වර්ෂයේදී අපජල පද්ධතිය අළුතවැඩියා කර ඇත. එහිදී ජල ගැලීම මඟින් සිදුවන හානිය වළක්වා ගැනීමට හැකිවන ආකාරයට පිරිපහදුවෙන් පසු ඉතිරිවන මඩිති (Sludge) එකතු වන වියළුම්

අංගනය සකස් කරන ලදී. මේ හේතුවෙන් ඉතිරි වන මඩිති ආරක්ෂිතව ක්‍රමානුකූලව බැහැර කිරීමට හැකියාව ලැබී ඇත.
1975 වර්ෂයේ ස්ථාපිත මෙම පද්ධතියේ මඩිති බැහැර කිරිම සඳහා වියළුම් අංගන (Drying Bed) 03 ක් ඉදිකර ඇති අතර ඒවා වේලීම සඳහා ස්වභාවික සූර්යාලෝකනය යොදා ගැනීමක් සිදු කෙරේ. වියළුම් අංගන සඳහා වර්ෂා ජලය වැටිම වැළැක්වීම සඳහා වැසි ආවරණ හෝ වහලක් නොමැති අතර එම වැසි ජලය පෙරහන් මඟින් නැවත ප්‍රධාන අපජල එක්රැස්කරන ටැංකි වෙත එකතුවිමක් සිදු වේ.
මඩිති වියළුම් අංගන වෙත බැහැර කිරිම තවදුරටත් පහසුවන පරිදි 2024 මාර්තු මාසයේදී

				කොන්ක්‍රීට් සිලින්ඩර යොදා නල මාර්ගයක් ඉදිකර පවත්වාගෙන යනු ලබයි.	
6	කතරගම රෝහල මඟින් බැහැර කරනු ලබන අපජලය පිරිපහදු කිරීම සඳහා අපජල පිරිපහදු මධ්‍යස්ථානයක් ක්‍රියාත්මක නොවන බව නිරීක්ෂණය විය. ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය යටතේ ක්‍රියාත්මක වන පොදු අපජල පිරිපහදු මධ්‍යස්ථානයට මෙම රෝහලේ අපජලය සම්බන්ධ කිරීමට සැලසුම් සකස් කර තිබුණු නමුත් 2020 ජූනි 26 දිනය වන විටත් එම කාර්යය ඉටුවී නොතිබුණි. කතරගම රෝහල් පරිශ්‍රයේ එක් එක් ස්ථානවල අපජලය උතුරා පිටාර ගලා ඇති බව නිරීක්ෂණය වූ අතර රෝහලේ ජනනය වන්නා වූ අපජලය පරිසර හිතකාමී නොවන ආකාරයෙන් බැහැර වීම තුල එමඟින් භූගත ජලයට සහ මතුපිට පරිසරයට සිදු විය හැකි අවධානම වැඩි වී තිබුණි.	2021	ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය මඟින් ලබා දීමට සැලසුම් කර ඇති අපජල නල සම්බන්ධතාවයන් කඩිනමින් ලබා දීමට කටයුතු කිරීම.	කතරගම ජාතික ජල සම්පාදන මණ්ඩලය මඟින් ක්‍රියාත්මක වන බාහිර මලාපවාහන පද්ධතියක් ක්‍රියාත්මක වන අතර එම පද්ධතිය සමඟ රෝහලේ අභ්‍යන්තර මලාපවාහන පද්ධතිය සම්බන්ධ කර දෙන ලෙස මොණරාගල ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය වෙතින් ඉල්ලීම් කර ඇත. <u>**ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය**</u> නව අපජල සම්බන්ධනය ලබා ගැනීම සඳහා අයදුම් පත්‍රයක් ඉදිරිපත් කරන මෙන් රෝහල වෙත දැනුම් දී තිබුණි. අමාත්‍යාංශ මට්ටමින්ද මේ සම්බන්ධයෙන්	මෙතෙක් අයදුම් පත්‍රයක් ලැබී නොමැති බැවින් කතරගම රෝහල, අපජල පද්ධතිය වෙත සම්බන්ධ කර නොමැති බව ජාතික ජල සම්පාදන හා ජලාප්‍රවාහන මණ්ඩලය විසින් දන්වා ඇත.

				අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙස මොණරාගල ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ දැණුවත් කිරීමට පියවර ගෙන ඇත. කෙසේ වෙතත් රෝහලේ ගලි වලවල් උතුරා යන අවස්ථාවන්හිදී මොණරාගල ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ ගලි බවුසර් සේවාව රෝහල වෙත ලබා ගනිමින් ඉවත් කිරිම සිදු කරන බවද වැඩිදුරටත් දන්වා සිටිමි.	
7	**කුරුණෑගල අපජල පිරිපහදු මධ්‍යස්ථානය** 2018 අගෝස්තු 16 දින සිට මෙහෙයුම් කටයුතු ආරම්භ කරන ලද කුරුණෑගල අපජල පිරිපහදු මධ්‍යස්ථානය මඟින් ආවරණය කිරීමට බලාපොරොත්තු වන ප්‍රතිලාභීන් සංඛ්‍යාව 43,000 ක් වුවද එමඟින් අපේක්ෂිත පිරිපහදු ධාරිතාවය දිනකට ඝන මීටර් 4500 පමණ වන අතර කොළඹින් පිට ඉදිකරන ලද විශාලතම මළාපවහන	2021	අපජල පිරිපහදු මධ්‍යස්ථානවල ධාරිතාවයෙන් උපරිම ප්‍රයෝජන ගැනීමට කටයුතු කිරීම.	ධාරිතානවයෙන් උපරිම ප්‍රයෝජන ලබා ගැනීම සඳහා සැලසුම් කර ඇති සියළු සම්බන්ධතා ලබා දීම ධාරිතාව වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියට ඇතුලත් කර ඇති බව ජාතික ජලසම්පාදන හා ප්‍රවාහන මණ්ඩලය විසින් පවසා ඇත.	එක් එක් ව්‍යාපෘති සඳහා වෙන වෙනම NPD අනුමැතිය ලබා ගැනීම අවශ්‍ය බැවින් ප්‍රතිපාදන වැය කිරීම කල නොහැකි නිසා මෙතෙක් එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොමැත. එසේ වුනත් 2020 සිට 2024 දක්වා කාලය තුල මලාපවහන සම්බන්ධතා 302 ක් ලබා දී ඇත.

	ව්‍යාපෘතිය විය. එහිදී අපජලය පිරිපහදු කිරීම සඳහා ජීව විද්‍යාත්මක ක්‍රමවේදයක් අනුගමනය කරනු ලබන අතර වාතනය හරහා ක්ෂුද්‍ර ජීවී ක්‍රියාකාරීත්වයෙන් පිරිපහදු කරනු ලබයි. මෙම පවිත්‍රාගාරය මඟින් පිරිපහදු කිරීමට අපේක්ෂිත ජල පරිමාව දිනකට 4500m^3 වුවද, 2020 ජූනි 26 දිනය වනවිට සත්‍ය වශයෙන් පිරිපහදුවට ලක්වන ප්‍රමාණය 2600 m^3 ක් පමණ විය. මෙම අපජල මධ්‍යස්ථාන කළමනාකරණය සඳහා මාසිකව රු.මිලියන 5 ක මුදලක් වැය වන අතර එහි ධාරිතාවය ඌන උපයෝජනය වන බව නිරීක්ෂණය විය.				
8	**පද්ධති අක්‍රීය වීම** i. වැල්ලවත්ත සහ මාදම්පිටිය යන අපජල පිරිපහදු පද්ධති දෙකම අක්‍රීයව පවතින බැවින් අපජලය කිසිඳු ප්‍රතිකාරකයකින් තොරව මුහුදට මුදාහරින බව නිරීක්ෂණය විය. මෙසේ මළ අපද්‍රව්‍ය සහ අපජලය සෘජුවම මුහුදට බැහැර කිරීම මගින්	2021	දැනට අක්‍රීය තත්ත්වයේ පවතින පොම්පාගාර සහ නිසි අයුරින් ක්‍රියාත්මක නොවන පොම්පාගාර අළුත්වැඩියා කර කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය කටයුතු කිරීම.	මෙම නිරීක්ෂණ සම්බන්ධයෙන් මධ්‍යම පරිසර අධිකාරිය හා කොළඹ මහ නගර සභාවේ රජයේ විගණන අංශය විසින් විගණන නිරීක්ෂණ සම්බන්ධව පහත තොරතුරු ලබා දෙන ලදී. වැල්ලවත්ත සහ මාදම්පිටිය යන පොම්පාගාර	2024 නොවැම්බර් 30 වන විට මෙම පොම්පාගාර දෙකෙහිම මූලික පිරිපහදු ක්‍රියාවලිය සිදු නොවේ.

සමුද්‍ර දූෂණය වන අතර පැවතිය යුතු ගුණාත්මක තත්ත්වයෙන් බැහැරවීම, සාගර පරිසරයට හා සෞඛ්‍යමය වශයෙන් ද අහිතකර බලපෑම් ඇතිවිය හැකි අතරම එය සංචාරක කර්මාන්තයටද සෘජු බලපෑමක් එල්ල කෙරෙන බව නිරීක්ෂණය විය.

ii. **කොළඹ නගරයේ අපජල කළමනාකරණ**

පොම්පාගාර සම්බන්ධ නිරීක්ෂණය වූ කරුණු අනුව මාලිගාවත්ත සහ බොරැල්ල පොම්පාගාර විගණිත දිනය වන විට අක්‍රීය තත්තවයේ පැවතුණි. පොල්වත්ත, වැල්ලවත්ත, S8 පීටර්සන් ලේන්, මාදම්පිටිය, හෙට්ටියාවත්ත, ස්වේස් පාර, කාක දූපත, ඇව්ලන් ස්කෙයාර්, වොක්ෂෝල් වීදිය සහ මාලිගාවත්ත යන පොම්පාගාර වලට අයත් පොම්ප නියමිත පරිදි ක්‍රියාත්මක නොවන

දෙකෙහිම මූලික පිරිපහදු ක්‍රියාවලියක් සිදු නොවේ. ඉහත පොම්පාගාර දෙක සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍ර සම්බන්ධයෙන් හා අපජල පිරිපහදු පද්ධතිය සම්බන්ධයෙන් මධ්‍යම පරිසර අධිකාරිය විසින් සිදු කල විමසීම් සඳහා 2024/03/13 දිනැති ලිපිය මගින් යෝජිත අපජල පිරිපහදු පද්ධති සැලසුම් පිළිබඳ සමාලෝචන කරමින් පවතින බවත් අනාගතයේදී එම පිරිපහදු පද්ධති ස්ථාපනය කිරිමට පියවර ගන්නා බවත් සඳහන් තර ඇත. 2024 නොවැම්බර් 30 වනතෙක් ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් බඳවා ගැනීමට කටයුතු කර නොතිබු අතර අප ජලය හා අවදානම්කාරී කාර්මික අපද්‍රව්‍ය නියැදි සාම්පල

	බව නිරීක්ෂණය විය. අපජල පොම්පාගාර නිසි ආකාරව ක්‍රියාත්මක නොවන නිසා ඝන අපද්‍රව්‍යද සෘජුවම මුහුදට බැහැර කෙරෙන බව අනාවරණය විය.			වල සීමිත පරාමිතින් පමණක් පරික්ෂා කරනු ලබයි.	
9	**රසායනාගාර පහසුකම් නොමැති වීම** මාදම්පිටිය පොම්පාගාරය යටතේ ක්‍රියාත්මක රසායනාගාරයේ රසායනාගාර පහසුකම් හා කාර්ය මණ්ඩලය ප්‍රමාණවත් නොවන බැවින් පිටතින් රැගෙන එන අපජලය (ගලිබවුසර්) සියල්ල ප්‍රතිකාර වලින් පසු මුහුදට බැහැර කිරීමට ප්‍රථම අදාළ පරාමිතීන්ට අනුකූලව පවතීද යන්න පරීක්‍ෂා කිරීමක් සිදු නොවන බව අනාවරණය විය. ඒ හේතුවෙන් මල අපද්‍රව්‍ය සෘජුව මුහුදට බැහැර කිරීමට ඉඩ ප්‍රස්ථා සැලසී තිබුණි.	2021	කොළඹ මහ නගර සභාවේ අපජල පද්ධතිය මඟින් මුහුදට බැහැර කරනු ලබන අපජලයේ ගුණාත්මකභාවය අඛණ්ඩව පරීක්‍ෂා කිරීම හා ඒ සඳහා අවශ්‍ය රසායනාගාර පහසුකම් සහ කාර්ය මණ්ඩල අවශ්‍යතා සපුරාලීමට කටයුතු කිරීම.	2024 නොවැම්බර් 30 වන විටත් නියමිත කාර්ය මණ්ඩලය බඳවා ගැනිමට කටයුතු කර නොමැත.එම නිසා අප ජලය මුහුදට බැහැර කිරිමට ප්‍රථම පෙර නියැදි පරික්ෂාවක් පමණක් සිදුකරනු ලබයි.	නිර්දේශ ක්‍රියාත්මක කිරීම තව දුරටත් සිදු නොවේ.
10	**සමුද්‍රීය පරිසර ආරක්ෂණ බලපත්‍රය ලබා ගැනීම** සමුද්‍රීය පරිසර ආරක්‍ෂණ අධිකාරිය මඟින් 2019 දෙසැම්බර් 31 දින වන විට ආයතන 315 ක් මඟින් මුහුදට අප ජලය බැහැර කරනු	2021	අවසර පත්‍රයකින් තොරව මුහුදට අපජලය බැහැර කරනු ලබන කර්මාන්ත සම්බන්ධයෙන් සමුද්‍ර දූෂණය වැලැක්වීමේ පනතට අනුව ක්‍රියාමාර්ග ගැනීම.	පිරිපහදු කරන ලද අපද්‍රව්‍ය මුහුදට බැහැර කිරිමේ බලපත්‍ර නිකුත් කිරිම මෙම අධිකාරිය මගින් සිදු කරන අතර 2019 සිට මේ වන විට බලපත්‍ර ලබා ගැනිම වැඩි වී	2004 ඔක්තෝම්බර් මස 6 වන දින වන විට හෝටල් 200 සඳහා පමණක් බලපත්‍ර නිකුත් කර ඇත.

ලබන බවට හඳුනාගෙන තිබුණද, ඉන් ආයතන 115 ක් අදාළ අවසර පත්‍රය ලබානොගෙන අපජලය මුහුදට බැහැර කරන බව නිරීක්ෂණය විය. සමුද්‍රීය කලාප කළමනාකරණයේ ප්‍රධාන අරමුණක් වූ තිරසාර ලෙස සාගර සම්පත් කළමනාරණය කිරීමත් ඒ තුලින් ආර්ථික හා සමාජයීය ප්‍රතිලාභ ජනතාවට අත්කර දීම වුවත් අපජලය සාගරයට මුදා හැරීම සම්බන්ධයෙන් හඳුනාගෙන තිබූ මුළු ආයතන සංඛ්‍යාවෙන් සියයට 50ට වැඩි ප්‍රමාණයක් උක්ත නෛතික විධි විධාන අනුගමනය නොකිරීම තුල සමුද්‍ර දූෂණය වැලැක්වීම මගින් අපේක්ෂිත තිරසාර භාවය අත්පත් වී නොමැති බව නිරීක්ෂණය විය.

ඇත. මේ සඳහා අධිකාරියේ දිස්ත්‍රික් කාර්යාල මගින් වෙරළ කළාපයේ පිහිටි හෝටල් හා කර්මාන්ත නිරික්ෂණය කරමින් බලපත්‍ර ලබා ගැනිම පිළිබදව අධික්ෂණය කරනු ලබයි. කෙසේ නමුත් පාස්කු ප්‍රහාරය හා පසු කාලීනව ඇතිවූ ආර්ථික අර්බුදය හේතුවෙන් සංචාරක ක්ෂේත්‍රයේ ඇති වූ පසුබෑම නිසා සංචාරක හෝටල් වසා දැමීම 2021,2022 වසර වල වැඩි වශයෙන් සිදු විය.මේ වන විට යම් තරමක් දුරට තත්ත්වය යථා තත්ත්වයට පත්ව ඇති අතර ඉදිරියේදි බලපත්‍ර ලබා ගැනිම වැඩිවනු ඇත. මෙම වකවානුව තුළ බලපත්‍ර ලබා ගැනිම පැහැර හැරීම හා සමුද්‍ර දූෂණයට අදාලව හෝටල් වලට එරෙහිව නීතිමය කටයුතු සිදු කිරිමට

				සම්බන්ධව නිතිපති දෙපාර්තමේන්තුවේ උපදෙස් පතා ඇත.	
11	**පිරිපහදුවෙන් තොරව කෙරෙන බැහැර කිරීම** 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ හා 2008 අංක 35 දරන සමුද්‍රීය දූෂණය වැළැක්වීමේ පනතේ වගන්ති මුළුමනින්ම උල්ලංඝනය කිරීමෙන් විශාල වශයෙන් කොළඹ නගරයේ උත්පාදනය වන මල අපද්‍රව්‍ය පරිසරයට මුදා හැරෙන අතර මෙම පිරිපහදු නොකරන ලද මල අපද්‍රව්‍යයන් මුහුදු වෙරළේ සිට කිලෝමීටරයකට වඩා වැඩි දුරකට බැහැර කරනු ලැබුවද, මුහුදේ ස්වභාවික ක්‍රියාකාරීත්වය හා මුහුදු රළ නිසා ඉහත රෝග කාරක ව්‍යාධිකාරකයන් මුහුදු වෙරළට එක් වීමේ අවදානමක් පවතී. එසේ වුවද මුහුදු ජලයේ පවිත්‍රතාවය මුහුදු ජලයේ සංයුතිය පිළිබඳ පරික්ෂා කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු නොකිරීම නිසා අහිතකර වශයෙන් ඇති කරන පාරිසරික,	2021	අපජල අපහරණය මූලික වශයෙන් අභ්‍යන්තරිකව ගංගා ඇතුළු අනෙකුත් ඇළ මාර්ග වලට යොමු කිරීම විශේෂයෙන් කොළඹ නගරය ඇතුළු වෙරළබඩ ආසන්න නගර වල අපජලය නිසි ක්‍රමවේදයකින් තොරව බැහැර කිරීමේදී සැලකිලිමත් වීම හා එවැනි කටයුතු නිසි ප්‍රමිතියකින් ඉටු කිරීමට වගබලා ගැනීම.	කොළඹ නගර සහා ප්‍රදේශයේ පාරිසරික තත්වය සංවර්ධනය කිරීමට අදාලව ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කිරීම සහ අප ජල කළමනාකරණය සම්බන්ධයෙන් කොළඹ නගර සභාව වෙත අවශ්‍ය සම්බන්ධීකරණ සහයෝගය ලබා දීම. ගාලුමුවදොර, කැළණි ගංමෝය හා බේරේ වැව ආශ්‍රිත පාරිසරික තත්වය වැඩි දියුණු කිරීමට අදාල ලිපිය.	කොළඹ නගර සභාව විසින් අවශ්‍ය ප්‍රතිපාදන ලබාගෙන ප්‍රධාන මලාපවාහන පද්ධතිය පිළිසකර කිරීමට සැලසුම් කරමින් පවතී.

සෞඛ්‍යමය හා ජන ජීවිතයට වන බලපෑම ඉවත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග වගකිව යුතු ආයතන විසින් ගෙන නොතිබුණි.

2.3 ශ්‍රී ලංකාවේ වෙරළ හා සමුද්‍රීය ජාතික උද්‍යාන සංරක්ෂණය

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
1	**වෙරළ සංරක්ෂණ පනත - නෛතික ප්‍රතිපාදන** 2011 අංක 49 දරන වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ පනතේ III ඇ. කොටසේ 22 (ඉ) ප්‍රකාරව 2018 මැයි 25 දිනැති අංක 2072/58 දරන ගැසට් පත්‍රය මඟින් විශේෂ කළමනාකරණ ප්‍රදේශ ලෙස යෝජිත ස්ථාන 45 න් දිස්ත්‍රික්ක 12 ක් හඳුනාගෙන තිබුණද එකී ප්‍රදේශ විශේෂ කළමනාකරණ ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත් කර එම ප්‍රදේශ සංරක්ෂණය සම්බන්ධයෙන් අවධානයක් කර නොතිබුණි.	2022	වෙරළ සංරක්ෂණ පනතේ විධිවිධාන අනුව විශේෂ වෙරළ කළමනාකරණ ප්‍රදේශ ලෙස යෝජිත ස්ථාන ප්‍රකාශයට පත් කිරීම .	වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ සැලැස්ම යනු ඒකාබද්ධ සැලැස්මක් වන අතර එමගින් විශේෂ කළමණාකරන ප්‍රදේශ හඳුනාගනු ලැබුවද අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන නොලැබීම, අනෙකුත් ආයතන මගින් ඒ සඳහා වාර්ෂික සැළසුම් ඇතුලත් නොකිරීම සහ මුදල් වෙන් නොවීම හේතුවෙන් විශේෂ කළමනාකරණ ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත් කිරීමට නොහැකි වී ඇත.	හඳුනාගෙන ඇති විශේෂ කළමනාකරණ ප්‍රදේශ ප්‍රකාශයට පත් කිරීමට නොහැකි වී ඇත.
2	**1940 අංක 09 දරන පුරාවස්තු අඥා පනත** i. වෙරළ කලාපය තුළ පිහිටා තිබුණු පුරාවිද්‍යාත්මක	2022	වෙරළ කලාපයේ පිහිටා ඇති පුරා වස්තු සංරක්ෂණය සඳහා අවශ්‍ය කටයුතු කිරීම.	ස්ථානීය නාම වශයෙන් ප්‍රදේශ නාම ඇතුළත් කර තිබීම සහ හඳුනා ගත නොහැකි ස්මාරක	වෙරළ සම්පත් කළමනාකරණ සැලැස්ම අනුව හඳුනාගත් ස්ථාන අතුරින් ස්ථාන 68 ක් ගැසට් කර ඇති අතර

වටිනාකමක් සහිත ස්ථාන සියල්ල හඳුනාගෙන ගැසට් පත්‍රයක් මගින් ප්‍රකාශයට පත්කිරීමට කටයුතු කර නොතිබුණි. ii. ශ්‍රී ලංකා වෙරළ කලාප හා වෙරළ සම්පත් කළමනාකරණ සැලැස්ම අනුව වෙරළ කලාප තුල පවතින පුරාවිද්‍යාත්මක, ඓතිහාසික, ආගමික හා සංස්කෘතික වටිනාකමකින් යුතු ස්ථාන 259 හඳුනාගෙන තිබුනද එකී ස්ථාන අතරින් 2020 නොවැම්බර් 30 වන විට පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් පුරාවිද්‍යාත්මක ස්ථාන වශයෙන් හඳුනාගෙන ගැසට් පත්‍රයක් මගින් ප්‍රකාශයට පත් කර නොතිබුණි. iii. ත්‍රිකුණාමලය ප්‍රාදේශීය කාර්යාලය මගින් ලබාදුන් පිලිතුරු අනුව		ඇතුළත් වීම නිසා ඇතැම් ස්ථාන සම්බන්ධයෙන් නිවැරදි තොරතුරු ලබා දීම අපහසු විය. ඒ අතුරින් ස්ථාන 68 ක් ගැසට් කර ඇති අතර ස්ථාන 86 ක් ගැසට් කිරීමට යෝජිතව පවතී. ස්ථාන 66 ක් පරීක්ෂා කිරීමට නියමිතව ඇති අතර හඳුනානොගත් ස්ථාන 30 ක් පවතී.	ස්ථාන 86 ක් ගැසට් කිරීමට යෝජිතව පවතී. ස්ථාන 66 ක් පරීක්ෂා කිරීමට නියමිතව ඇති අතර හඳුනානොගත් ස්ථාන 30 ක් පවතී.

	පුරාවිද්‍යාත්මක ස්ථාන 05 ක මායිම් ලකුණු කිරීම හෝ ගැසට් පත්‍රයක් මගින් ප්‍රකාශයට පත් කිරීම සිදු කර නොතිබු අගර සෙන්බිමලෙයි පුරාවිද්‍යා ස්ථානය සඳහා සැලැස්මක් සකස් කර ඇති අතර ඉදිරියේ වෙන් කල පුරාවිද්‍යා භූමියක් ලෙස ගැසට් කිරීමට යෝජනා කර තිබුණි.				
3	**සමුද්‍රීය ජලයේ ගුණත්වය අනුව වර්ගීකරණය සඳහා ප්‍රමිත** 1991 වර්ෂයේදී මධ්‍යම පරිසර අධිකාරිය විසින් නෙදර්ලන්ත රජය සඳහා යෝජනා කරන ලද ව්‍යාපෘතිය තුල උක්ත කරුණට අදාලව ප්‍රධාන අවස්ථා 04 ක් ඇතුලත් කරමින් සමුද්‍රීය ජලයේ ගුණත්වයට අදාලව ප්‍රමිතීන් යෝජනා කර තිබුණද එම ප්‍රමිතීන් පිළියෙල කොට ගැසට් පත්‍රයේ පළකර ප්‍රසිද්ධ කර නොතිබුණි.	2022	සමුද්‍රීය ජලයේ ගුණත්වය පරීක්ෂා කිරීමේ ප්‍රමිතීන් නිකුත් කිරීම හා ඒ අනුව කටයුතු කිරීම.	ජලයේ ගුණාත්මක භාවය පිළිබඳව ප්‍රමිතීන් මේ වනතෙක් නිකුත් කර නොමැති බැවින් දැනට සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය විසින් ASEAN Marian Quality ප්‍රමිතීන් භාවිතා කරනු ලැබේ.	වාර්ෂිකව අඛණ්ඩව වෙරළබඩ නාන ස්ථාන කිහිපයක ජලයේ pH අගය ඇතුළුව පරාමිතීන් කීපයක් පරීක්ෂා කර එම අගයන් තිරසර සංවර්ධන කවුන්සිලයේ දත්ත පද්ධතියට ඇතුලත් කිරීම සඳහා යොමු කරනු ලබයි.

4	**මුහුදු කැස්බෑ සංරක්ෂණය** පහත කරුණු නිරීක්ෂණය විය. පෞද්ගලික අංශය විසින් පවත්වාගෙන යනු ලබන කැස්බෑ සංරක්ෂණ මධ්‍යස්ථාන, 15 ක් පමණ දැනට දකුණු වෙරළ තීරය ආශ්‍රිතව ක්‍රියාත්මක වන අතර මෙම පෞද්ගලික කැස්බෑ සංරක්ෂණ මධ්‍යස්ථාන පවත්වාගෙන යෑම තවදුරටත් විධිමත් කර, එම මධ්‍යස්ථාන වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි කර වාර්ෂික බලපත්‍ර යටතේ පවත්වාගෙන යාමට අවසර දීම මගින් නියාමනය කිරීම සඳහා විධිවිධාන සැකසෙමින් වනජීවී හා වෘක්ෂලතා ආඥා පනත යටතේ සකස් කරනු ලැබ ඇති නියෝග පත්‍ර මගින් ප්‍රකාශයට පත් කිරීම පිණිස වනජීවී අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කල යෝජනා අමාත්‍ය මණ්ඩල අනුමත කර තිබුණද එම අමාත්‍ය මණ්ඩල තීරණය ගෙන වර්ෂ 04 ක් ගතවී ඇතත් එම යෝජනාව ක්‍රියාත්මක කිරීමට	කැස්බෑ සංරක්ෂණ මධ්‍යස්ථාන ලියාපදිංචි කිරීම හා නිසි පරිදි නියාමන කටයුතු සිදු කිරීම.	කැස්බෑ සංරක්ෂණ කටයුතු නියාමනය කිරීම සඳහා වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක පනත යටතේ රෙගුලාසි ප්‍රකාශයට පත් කිරීමට වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් කටයුතු අරඹන ලද අතර, එම කෙටුම්පත් අවස්ථා රාශිකයකදී සංශෝධනය කිරීමට සිදු වූ බැවින් හා අමාත්‍යාංශවල විෂය පථයන් වෙනස් වීම නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් දැනුවත් කිරීමේ කාර්යයට අමතර කාලසීමාවක් ගත වූ බැවින්ද අනපේක්ෂිතව මෙම කාර්යය සඳහා දිගු කාලයක් වැය වී ඇත.	කැස්බෑ සංරක්ෂණ කටයුතු නියාමනය කිරීමට අදාළ රෙගුලාසිවල අවසන් කෙටුම්පත විෂයභාර අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවති.

	කටයුතු කර නොතිබුණි.				
5	**ධීවර වරායන් වල අපද්‍රව්‍ය කළමනාකරණය** **(අ) ඝන අපද්‍රව්‍ය - දික්ඕවිට** **i. ෆයිබර් අපද්‍රව්‍ය එක්රැස් වීම** වරාය තුල විශාල වශයෙන් එක්රැස් වන ෆයිබර් අපද්‍රව්‍ය අපහරණය කල යුත්තේ, අධික උෂ්ණත්වයෙන් යුත් දහන යන්ත්‍ර (Incinerator) මගින් පිළිස්සීමෙන් පමණක් වන බැවින් මෙම අපද්‍රව්‍ය වරායෙන් ඉවත් කලද ඉන්පසු එම අපද්‍රව්‍ය අවසාන වශයෙන් බැහැර කරන ක්‍රමවේදයන් පිළිබඳව පසුවිපරම් කිරීමක් අදාල වගකිව යුතු ආයතන වලින් සිදු වී නොතිබුණි. ii. **අත්හැර දැමූ යාත්‍රා** අළුත්වැඩියාව අත්හැර දැමූ ෆයිබර් යාත්‍රා 06 ක් සම්බන්ධයෙන් විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. iii. **ඉවතලන සෘජුෆෝම්**	2022	ධීවර වරායන් වල ඉවත් කරනු ලබන බෝට්ටු, ෆයිබර් හා වෙනත් අපද්‍රව්‍ය ඉවත් කිරීමේ ක්‍රමවේදයන් පිළියෙල කිරීම හා ඒ අනුව කටයුතු කිරීම.	ධීවර වරායන්හි ගොඩගැසී ඇති ෆයිබර් ග්ලාස් අපද්‍රව්‍ය (පරණ යාත්‍රා) හා එහි කොටස් ඉවත් කිරීම හා ප්‍රතිචක්‍රීකරණයට ලක් කිරීම සඳහා ව්‍යාපෘති කීපයක් සමඟ සාකච්ඡා කර ඇති අතර, දහන යන්ත්‍ර මිලදී ගැනීමට ඉතාම අධික වියදමක් නිසා මෙතෙක් එය සාර්ථක වී නොමැත.	ෆයිබර් අපද්‍රව්‍ය නිසි පරිදි අපහරණය සිදු නොකෙරේ.

	යාත්‍රා වල ශීත කාමර අළුත්වැඩියා කිරීම මත විශාල ලෙස ජනනය වන මෙම අපද්‍රව්‍ය යාත්‍රා හිමිකරුවන් වෙත වරායෙන් බැහැර කිරීම අනිවාර්යකර තිබුණ ද ඔවුන් බැහැර කරන්නේ කුමන ආකාරයටද යන්න පසු විපරම් කිරීමේ යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කර නොතිබුණි.				
6	**ධීවර වරායන් වලින් වැලි ඉවත් කිරීම් මගින් වෙරළ ස්ථායිතාවයට සිදු වන බලපෑම** වෙරළ කලාපයේ වරායවල් හා ඊට අනුබද්ධ යටිතල පහසුකම් ඊට අදාල විශේෂිත ස්ථානයේ හෝ යාබද වෙරළබඩ කොටස් තුල සැලකිය යුතු දැඩි බලපෑම් තත්ත්වයන් ඇති නොවන්නේ නම් එම ක්‍රියාකාරකම් රක්ෂිත කලාපයක් තුල අනුමත කල හැකි භාවිතයන් ලෙස සැලකෙන අතර එම කාර්යයට අදාල ක්‍රියාවලීන් සංවර්ධන බලපත්‍ර මගින් පාලනය වේ. ධීවර වරායවල් ඉදි කිරීමේදී වෙරළින්	2022	ධීවර වරායන් මඟින් වැලි ඉවත් කිරීමේ ක්‍රමවේදයන් සම්බන්ධයෙන් මාර්ගෝපදේශ පිළියෙල කිරීම, ඒ අනුව කටයුතු කිරීම හා නියාමනය කිරීම.	ධීවර වරායන් තුල සිදුවන මෙහෙයුම් අඩපන වන පරිදී සිදුවන වැලි පිරීම් ඉවත්කිරීමට අවසර දෙන අතර එම ඉවත්කරන වැලි සම්පූර්ණයෙන් ආසන්න වෙරළ තීරයන්වලට හෝ අප විසින් නියම කරන වෙරළ තීරයන් වෙත මුදා හැරීමට දැනුම් දෙනු ලබයි. එනමුත් එහිදී පැනනගින ගැටලු වන්නේ අදාළ වරාය සංස්ථාවට වරාය තුලට එක්වන වැලි ඉවත් කිරීමට මුදල් නොමැතිවීම හේතුවෙන් කැනීම් කරන ලද වැලි වලින් කොටසක් වාණිජ මට්ටමින්	මාර්ගෝපදේශ සකස්කිරීම ප්‍රායෝගික නොවන බව දක්වමින් ධීවර වරායන්හි මෙහෙයුම් අඩපනවන පරිදි වරාය තුල එක්වන වැලි කැණීම් කර එම සියලුම වැලි ආසන්න වෙරලට මුදාහැරීමට නිර්දේශ ලබා දි ඇත.

	ලබා ගන්නා වැලි ඉවත් කළ යුතු ආකාරය සම්බන්ධයෙන් මාර්ගෝපදේශ පිළියෙල කර නොතිබුණි.			අලෙවිකර මුදල් ලබාගැනිම සඳහා අදාළ විෂය භාර අමාත්‍ය ඇතුලු ආයතන සකච්ඡා මගින් තිරණය කිරීම හේතුවෙන් ඉවත් කරන වැලි වලින් කොටසක් වාණිජ මට්ටමින් අලෙවි කර මුදල් සපයාගැනීම සිදු කරයි. එසේ ඉවත්කරන වැලි සහ අලෙවිකරන වැලි ප්‍රමාණයන් සම්බන්ධයේ අවස්ථානුකූලව නියමිත ගාස්තු අයකර අවසර ලබා දීම සිදුකරයි.	
7	යම් සංවර්ධන කාර්යයක් සම්බන්ධයෙන් තහනමක් හෝ සැලකිය යුතු පරිදි සීමාවක් හෝ පනවන ලද්දා වූ ද වෙරළ කලාපය තුළ පිහිටියා වූ ද භූගෝලීය තීරුව හෝ බිම් පටිය වෙරළ පසසිටු ප්‍රදේශය ලෙස හැඳින්වේ. කෙසේ වුවද මොරටුව ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලය විසින් 2018 වර්ෂයේ සිට 2020 අගෝස්තු මස 26 දින දක්වා මෙම කලාපයන් තුල අනවසර ඉදිකිරීම්		වෙරළ පසසිටු පවත්වා ගැනීම හා වෙරළ ප්‍රවේශ ප්‍රකාශයට පත් කිරීම.	පසසිටුවා පවත්වා ගැනීමට නිරන්තරයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත. වෙරළ ප්‍රවේශ ප්‍රකාශයට පත්කර ඇත.	අනවසර ඉදිකිරීම් අඳුනාගෙන ඒවා සඳහා මුල් අවස්ථාවේදීම කඩා ඉවත් කිරීමේ නියෝග ලබා දී ඒ සඳහා පොලිස් පැමිණිලි ද දමා ඇත. නමුත් සමහර අනවසර ඉදිකිරීම් ඉවත්කිරීමට යාමේදී මහජන නියෝජිතයන්ගේ බලපෑම් හේතුවෙන් කඩා ඉවත් කිරීම් සිදු කිරීමට නොහැකි වී ඇත. එබැවින් මේ වන විට ඊට සමාන්තරව ඇති අනවසර ඉදිකිරීම් ඉවත් කිරීම ගැටලු සහගත වී ඇත.

සම්බන්ධයෙන් වන පැමිණිලි 110 ක් සම්බන්ධයෙන් පරීක්ෂා කිරීම් සිදු කර තිබුණද ඒ පිළිබඳව ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. වෙරළ පසසිටු සීමාව නිසි ලෙස නඩත්තු නොකිරීම නිසා ඉහත පරිදි අනවසර ඉදිකිරීම් සිදු කිරීමට හේතු වී ඇති බව නිරීක්ෂණය විය.

2.4 ශ්‍රී ලංකාවේ භූගත ජල කළමනාකරණයේ නීතිමය යාන්ත්‍රණය හා එහි ක්‍රියාකාරීත්වය ඇගයීම

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
1	**භූගත ජලය ආරක්ෂා කිරීම හා සංරක්ෂණය කිරීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය** ශ්‍රී ලංකාවේ තිබෙන ජලාශ සහ ජල තලයන් පමණක් නොව භූගත ජල සම්පතේ ද තිරසාර පැවැත්මට ගංඟා, ඇළදොල ආරක්ෂා කර ගැනීම මූලික අවශ්‍යතාවයකි. ඒ අනුව 1992 වර්ෂයේදී ආසියානු සංවර්ධන බැංකුවේ ආධාරයෙන් ක්‍රියාත්මක වූ ජල සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය මගින් ජල ප්‍රතිපත්තියක් ශ්‍රී ලංකාව සඳහා ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවය දක්වා තිබුණ අතර එවැනි ජල ප්‍රතිපත්තියකින් අපේක්ෂා කරන ලද මූලික අරමුණු 2014 වර්ෂය දක්වා ඉටුකර ගැනීමට නොහැකි වී තිබුණි. කෙසේ වුවද 2014 වර්ෂයේදී ඉඩම් හා ඉඩම් සංවර්ධන	2022	ශ්‍රී ලංකාවේ පළාත් අනුව භූගත ජල ප්‍රමාණය ස්වභාවය හා ගුණාත්මකභාවය මත පදනම් වූ භූගත ජල ප්‍රතිපත්තියක් ඇති කිරීම හා ක්‍රියාත්මක කිරීම.	1. අග්‍රාමාත්‍ය කාර්යාලයේ මැදිහත්වීමෙන්, 2023 වර්ෂයේ අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද "ශ්‍රී ලංකාවේ ජල සම්පත් ප්‍රතිපත්තිය" තවදුරටත් සමාලෝචනය කිරීමේදී භූගත ජලය සම්බන්ධයෙන් එහි ඇතුළත්විය යුතු කරුණු පිළිබඳව අවශ්‍ය දායකත්වය ලබාදෙන ලදී. 2. ජල සම්පාදන අමාත්‍යාංශය හා අදාල ආයතන මූලිකත්වය දරමින් කෙටුම්පත් කරන ලද භූගත ජල ප්‍රතිපත්තිය සැකසීම සඳහා වන මූලධර්ම ඇතුලත් වාර්තාව සම්පූර්ණ කර ඉදිරි කටයුතු සඳහා අමාත්‍යාංශය වෙත ලබා දී ඇත. 3. නිශ්චිත විද්‍යාත්මක පදනමක් මත ශ්‍රී ලංකාවේ භූගත	1. ජාතික ජල සම්පත් ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් ඉදිරි කටයුතු අග්‍රාමාත්‍ය කාර්යාලය මඟින් සිදු කරමින් පැවතිණි. 2. ජාතික ජල සම්පත් ප්‍රතිපත්තිය හා සමගාමීව භූගත ජල ප්‍රතිපත්තිය සකස් විය යුතු හෙයින් ඒ පිළිබඳව අමාත්‍යාංශය මගින් ඉදිරි කටයුතු සඳහා සමාලෝචනය කරමින් පවතී. 3. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් වර්තමානය වන විට භූගත ජල

අමාත්‍යාංශය මගින් ජාතික ජල ප්‍රතිපත්තියක කෙටුම්පත සකස් කර තිබුණි. එය ජල සම්පත හා ජල පෝෂක ප්‍රදේශ ආරක්ෂාව හා සංරක්ෂණය සඳහා මූලික කර තිබුණි. එසේම 2008 හා 2010 වර්ෂ වල ශ්‍රී ලංකා ජාතික විද්‍යා පදනම පවත්වන ලද වැඩමුළු වලදී ද ජල ප්‍රතිපත්තියක් පිළියෙල කිරීමේ අවශ්‍යතාවය මතු කර තිබුනද ශ්‍රී ලංකාවේ පළාත් අනුව භූගත ජලයේ ප්‍රමාණාත්මකභාවය හා ගුණාත්මකභාවය මත පදනම් වූ භූගත ජල ප්‍රතිපත්තියක් පිළියෙල කර සම්මත කර නොතිබීම හේතුවෙන් භූගත ජල කළමනාකරණයට අදාල සැලැසුම් හා වැඩසටහන් සකස් කිරීමට නොහැකි වී තිබූ බැවින් තවදුරටත් භූගත ජලය නිසි කළමනාකරණයකින් තොරව යොදා ගැනීමට පසුබිමක් සැකසී තිබුණි.			ජල බෙදුම් කලාප හඳුනාගෙන භූගත ජාල ප්‍රතිපත්තියක් සැකසීමේදී ඒ සඳහා අවශ්‍ය වන ජල මූලාශ්‍ර වල තොරතුරු එක්රැස් කිරීම සඳහා අවශ්‍ය ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.		මූලාශ්‍ර ලක්ෂ තුනක පමණ තොරතුරු ලැබී ඇති අතර තවදුරටත් එම කටයුතු සිදු කරමින් පවතී.
		4.	සංවේදී භූගත ජල කලාප වල (groundwater sensitive areas) භූගත ජලයේ ගුණාත්මකභාවය හා ප්‍රමාණාත්මකතාව යන් පිළිබඳව තොරතුරු එක්රැස් කිරීම සඳහා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.	**4.**	භූගත ජලයේ ගුණාත්මක භාවයේ හා ප්‍රමාණාත්ම කභාවයන්වල කෙටිකාලීන හා දීර්ඝකාලීන වෙනස්කම් අධ්‍යනය කිරීම සඳහා නියමිත කාල පරාසයන් වලදී නිමානන කටයුතු සිදු කරමින් පවතී.

2	**වගකීම් බෙදා දීම හා භූගත ජලයේ අයිතිය** 1987 අංක 42 දරන පළාත් පාලන පනත 13 වන සංශෝධනය මගින් ඇති කිරීමෙන් පසු භූගත ජල ප්‍රදේශ කළමනාකරණ වගකීම අදාල පළාත් සභා යටතට පැවරී ඇති අතර ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනය මගින් අනෙකුත් ඛනිජ සම්පත් සඳහා කළමනාකරණ වගකීම පවරා තිබුණි. උක්ත පනතේ 13 වන සංශෝධනය මගින් භූගත ජලයේ කළමනාකරණ වගකීම නිශ්චිතව පවරා නොමැති අතර බොහෝ ඉඩම් හිමියන් තමා යටතේ ඇති භූගත ජලය ලබා ගැනීමේ ප්‍රමාණය තීරණය කිරීම ඔවුන් විසින්ම සිදු කරන බව නිරීක්ෂණය විය. ඒ අනුව ඉඩම් හිමියන්, ආයෝජකයින් හා පොදු ස්ථාන වල කෙරෙන භූගත ජලය උපයෝජනය කිරීම අසීමාන්තිකව හා පිලිගත් කොන්දේසි හා නිර්ණායකයන් පදනම් කර ගැනීමකින් තොරව සිදු කිරීම නිසා භූගත ජල පරිභෝජනය සම්බන්ධව අනාගතයේදී ඇතිවිය	2022	භූගත ජල කළමනාකරණය පිළිබඳ වගකීම නිශ්චිත වශයෙන් තහවුරු කර ගැනීම.	199 අංක 42 දරන ජල සම්පත් මණ්ඩල (සංශෝධන) පනත හා 2017 අංක 2010/23 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය (ඇමුණුම 1) ප්‍රකාරව භූගත ජල කළමනාකරණය පිළිබඳව වගකීම ජල සම්පත් මණ්ඩලය වෙත පැවරී ඇති අතර පවතින නීතිමය ප්‍රතිපාදනවලට අනුකූලව භූගත ජල නියාමන කටයුතු සිදු කරනු ලබයි.	1999 අංක 42 දරන ජල සම්පත් මණ්ඩල (සංශෝධන) පනතෙහි පවතින අඩුපාඩු හේතුවෙන් දැනට සිදු කරමින් පවතින නියාමනය කිරීමේ කටයුතු සඳහා ගැටළු සහගත තත්ත්වයන් පැන නැගී ඇත. එබැවින් එම පනත සංශෝධනය කර ඇති අතර අමාත්‍යමණ්ඩල අනුමැතිය ලබා ගැනීම සඳහා ජල සම්පාදන අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇත.

	හැකි පාරිසරික බලපෑම් පිළිබඳ අවධානයකින් තොරව භාවිතා කිරීමට ඉඩ ප්‍රස්ථා ලැබී තිබුණි.				
3	**1964 අංක 29 දරන ජල සම්පත් මණ්ඩල සංශෝධන පනත සහ 1999 අංක 42 දරන (සංශෝධන) පනතේ ප්‍රතිපාදන** **(අ)** මේ අනුව වන වගාව දියුණු කිරීම, පාංශු ස්තරයේ ස්ථායිතාවය ආරක්ෂා කිරීම යන කරුණු පනතෙන් බැහැර වීම තුල ජල සම්පත් මණ්ඩලයේ ප්‍රධාන කාර්යභාරයක් වන භූගත ජල සංරක්ෂණයට වඩා භූගත ජල සංවර්ධනය සඳහා ප්‍රමුඛතාවයක් ලබා දී ඇති බව නිරීක්ෂණය විය. **(ආ)** විවිධ අවශ්‍යතාවයන් සඳහා භූගත ජලය උකහාගත හැකි ආකාරය හා ප්‍රමාණයන් තීරණය කිරීම ඒ සමඟම පාංශු ස්තර ජල පෝෂක ආරක්ෂා කර ගනිමින් භූගත ජල උකහා ගැනීමට ප්‍රතිපාදන සැලසීමක් සිදු වී නොමැති බව	2022	භූගත ජලයේ සංවර්ධනය හා සංරක්ෂණය මත පදනම් වූ අරමුණු ඇති කර ගනිමින් ක්‍රියාත්මක කිරීම.	භූගත ජලය සංවර්ධනය, සංරක්ෂණය හා තිරසාර කළමනාකරණය මත පදනම්ව එම අරමුණු හා ඉලක්ක ළඟා කර ගැනීම සඳහා ආයතනික ප්‍රතිපත්ති රාමුවක් (ORF) සකස් කර ඇති අතර ඊට අනුරූපව සංවර්ධන, සංරක්ෂණ හා කළමනාකරණ කටයුතු සිදු කරගෙන යනු ලබයි.	භූගත ජලය සංවර්ධනය, සංරක්ෂණය හා තිරසාර කළමනාකරණය මත පදනම්ව එම ඉලක්ක ලඟා කර ගැනීම සඳහා අදාල කටයුතු සිදු කරගෙන යනු ලබයි. කෙසේ වෙතත්, කළමනාකරණ හා නියාමන කටයුතු සිදුකරගෙන යාමේදී ප්‍රායෝගික ගැටළු පැන නැඟී ඇති අතර දැනට පවතින පනත ප්‍රකාරව නෛතික ක්‍රියාමාර්ග ගත නොහැකි තත්ත්වයක් පවතී. එබැවින් ඒ සඳහා වන සංශෝධනයන් සිදු කර ඉදිරිපත් කර ඇත.

	නිරීක්ෂණය විය. මේ හේතුව නිසා භූගත ජලය කළමනාකරණය සම්බන්ධව කටයුතු කිරීමට හැකියාව තිබූ ආසන්නම බලයලත් රාජ්‍ය ආයතනය ලෙස ජල සම්පත් මණ්ඩලය මීට අදාල සිය වගකීමෙන් බැහැර වී ඇති බව නිරීක්ෂණය වන අතර එමඟින් භූගත ජලය තවදුරටත් ලිහිල් හා වගකීම් විරහිත ලෙස භාවිතා කිරීමට ඉඩකඩ සැලසි තිබුණි.				
4	**ජල සම්පත් මණ්ඩලයේ දායකත්වය** 2014 වර්ෂයේ දෙසැම්බර් 22 නිකුත් කර තිබූ අංක 1894/3 දරන ගැසට් පත්‍රය මගින් ශ්‍රී ලංකාවේ ජල මූලාශ්‍ර ඒවායේ පෝෂක ප්‍රදේශ හා රක්ෂිත ආරක්ෂා කිරීම හා සංරක්ෂණය කිරීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ප්‍රසිද්ධ කර තිබුණි. මෙම ප්‍රතිපත්තියට අනුව භූගත හෝ භූතල ජල සම්පත් පානීය ජල ව්‍යාපෘති සහ හෝ කෘෂිකාර්මික කටයුතු සඳහා භාවිතා කිරීම සම්බන්ධයෙන් මූලික වගකීම් දරන	2022	භූගත ජල කළමනාකරණය සම්බන්ධයෙන් ජල සම්පත් මණ්ඩලයේ දායකත්වය වැදගත් බැවින් භූගත ජල සංරක්ෂණය සඳහා දක්වා ඇති අවධානය වැඩි කිරීම.	1. භූගත ජල කළමනාකරණය හා සංරක්ෂණය සම්බන්ධයෙන් තීරණ ලබා ගැනීම සඳහා අදාල භූගත ජලය ලබාගන්නා මූලාශ්‍ර වල තොරතුරු ලබාගනිමින් පවතී. 2. සංවේදී භූගත ජල කලාප වල භූගත ජලයේ ගුණාත්මකභාවය හා ප්‍රමාණාත්මකතාවයන් පිළිබඳව තොරතුරු එක්රැස් කිරීම හා නියාමන කටයුතු සිදු කරමින් අදාල කළමනාකරණ ක්‍රියාවලින්ට අදාළ	පවතින කාර්යමණ්ඩලය යොදාගනිමින් අදාල කාර්යයන් විධිමත්ව සිදු කිරීමට කටයුතු කරමින් පවතී.

	ආයතනය ලෙස ජල සම්පත් මණ්ඩලය ප්‍රධාන වශයෙන් හඳුනාගෙන තිබුණද ක්‍රියාත්මක යාන්ත්‍රණයේදී භූගත ජලය සංරක්ෂණය සඳහා ප්‍රමාණවත් අවධානයක් යොමු වී නොතිබූ බව නිරීක්ෂණය විය.			නිර්දේශ ලබාදෙමින් කටයුතු කරනු ලබයි. 3. භූගත ජල කළමනාකරණය හා සංරක්ෂණ කටයුතු මනා විධිමත්ව සිදු කිරීම සඳහා 2017 අංක 2010/23 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය ප්‍රකාශනයට පත්කර ඇති අතර පවතින පනත ශක්තිමත් කිරීමට අදාල සංශෝධන සිදු කර අනුමැතියට ඉදිරිපත් කර ඇත.	
5	**වර්ෂපාතනය වෙනස්වීම** ශ්‍රී ලංකාවේ පළාත් 09 සඳහා පසුගිය වර්ෂ 30 ක වර්ෂාපතන රටා නිරීක්ෂණයේදී උතුර , වයඹ, ඌව හා උතුරු මැද යන ප්‍රධාන පළාත් 04 වාර්ෂික වර්ෂාපතනය පහළ අගයක් ගන්නා අතර 2009 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා අඛණ්ඩ අඩුම වර්ෂා පතනයක් වයඹ පළාත තුලද 2018, 2019 වර්ෂ වල අඩුම වර්ෂාපතනය උතුරු මැද පළාතේ බවද නිරීක්ෂණය විය.	2022	භූගත ජල සංරක්ෂණ ක්‍රියාමාර්ග සැලැසුම් කිරීමේදී උතුර , වයඹ, ඌව හා උතුරු මැද යන පළාත් කෙරෙහි ප්‍රමුඛතාවය ලබා දීම.	1. භූගත ජල සම්පත් සංරක්ෂණය හා කළමනාකරණය උදෙසා මේ වන විට පළාත් නියෝජනය වන පරිදි භූගත ජාල සංවේදී කලාප ආවරණය වෙන ලෙස ප්‍රතිස්ථාපනයකොට ඇති භූගත ජල නිමානන පද්ධතිය (Automated and Manual Monitoring Network) මඟින් ජලයේ ගුණාත්මකභාවය හා ප්‍රමාණාත්මකතාවයන් පිළිබඳව තොරතුරු එක්රැස් කර කළමනාකරණයට අවශ්‍ය තොරතුරු	තොරතුරු එක්රැස් කිරීම හරහා කළමනාකරණ උපදෙස් ලබාදීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.

				විශ්ලේෂණ කටයුතු සිදුකරමින් පවතී. 2. තවද උතුරුමැද, වයඹ හා උතුර නියෝජනය වන පරිදි පිලිවෙලින් මල්වතු ඔය, දැදුරු ඔය හා යාපනය භූ කලාප සඳහා භූ ජල කළමනාකරණ සැලසුම් සකස් කිරීම සඳහා ලෝක බැංකු අරමුදල් යටතේ ව්‍යාපෘතියක් සිදු කරගෙන යනු ලබයි.	
6	**භූගත ජලයේ රසායනික විශ්ලේෂණයක් ලබා ගැනීම** 2014 දෙසැම්බර් 22 දිනැති අංක 1894/3 දරණ අති විශේෂ ගැසට් පත්‍රයට අනුව ශ්‍රී ලංකාවේ ජල මූලාශ්‍ර, ඒවායේ පෝෂක ප්‍රදේශ හා රක්ෂිත ආරක්ෂා කිරීම හා සංරක්ෂණය කිරීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තියේ 1.8 ඡේදයට අනුව කල්පිටිය අර්ධද්වීපයේ පිහිටි නොගැඹුරු භූගත ජල නිධි වල ධාරිතාවය විශාල ජන සංඛ්‍යාවකගේ පානීය ජල අවශ්‍යතාවය සම්පූර්ණ කිරීමට ප්‍රමාණවත් වූවත්, රසායනික පොහොර,	2022	භූගත ජලයේ රසායනික සංයුතිය වෙනස් කරන විවිධ මානව ක්‍රියාකාරකම් වර්ධනය වීමක් දක්නට ඇති බැවින් භූගත ජලයේ රසායනික විශ්ලේෂණයන් ලබා ගෙන ඊට අදාළ නිර්දේශ ක්‍රියාත්මක කිරීම.	1. කලපිටිය අර්ධද්වීපයේ මානව ක්‍රියාකාරකම් නිසා බලපෑමට ලක්ව ඇති හා එසේ නොමැති සංරක්ෂණය කල හැකි ජලධරයන් හඳුනාගෙන එම ස්ථානයන්වල නිමානන පද්ධතියක් (Automated and Manual Monitoring Network) ස්ථාපිත කර ඇති අතර ඒ මඟින් තවදුරටත් බූගත ජලය සඳහා ඇතිවන බලපෑම් නිරීක්ෂණය කරමින් පවතී. **2.** වෙළි ආරක්ෂණ ව්‍යාපෘතිය මඟින් හඳුනාගත්	ප්‍රදේශයේ භූගත ජලයේ ගුණාත්මකභාවය න් හා ප්‍රමාණාත්මකභා වයන් පිළිබඳව තවදුරයත් නිමානන ක්‍රියාවලිය සිදුකරගෙන යනු ලබන අතර අදාල අවස්ථා වලදී අවශ්‍ය නිර්දේශ අදාල ආයතන සඳහා ලබාදීමට කටයුතු කරමින් පවතී.

	කෘෂි රසායන හා පළිබෝධනාශක පසට එකතු වීමෙන් සිදු වී ඇති භූගත ජල දූෂණය හේතුවෙන් මෙම ජලය නැවත පිරිසිදු කල නොහැකි මට්ටමකට පත් වී ඇත. 2014/ 2015 වර්ෂයේ සහ ඉන්පසු මෙම ප්‍රදේශයේ භූගත ජල සම්පතෙහි රසායනික විශ්ලේෂණයන් "වෙලි ආරක්ෂණ ව්‍යාපෘතිය" යටතේ 2019 දක්වා සිදු කර තිබුණි. මේ සම්බන්ධයෙන් රසායනික විශ්ලේෂණයක් සිදු කර මෙම තත්ත්වය අවම කර ගැනීම සඳහා 2015 වර්ෂයේදී ජල සම්පත් මණ්ඩලය මඟින් නිර්දේශයක් ද ලබා දී ඇත. එහෙත් අනාගතයේදී ඇතිවන භූගත ජල ඉල්ලුමට සාපේක්ෂව එම අවශ්‍යතාවයන් සපුරාලීමේ විකල්ප ක්‍රමවේදයන් හඳුනාගැනීම සහ ඒ සඳහා සූදානම් වීම ප්‍රමාණවත් නොවන බව නිරීක්ෂණය විය.			ප්‍රදේශවල මහජනතාව පරිභෝජනය කරන ජල මූලාශ්‍ර වල ජල නියදි පරීක්ෂා කර ඒවායේ පවතින ගුණාත්මකභාවයන් හා පවතින තත්ත්වයන් යටතේ පරිහරණය කල හැකි හා නොහැකි මූලාශ්‍ර පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත. එසේම අදාල රසායනික විශ්ලේෂණ ප්‍රතිඵල අනුව සංරක්ෂණය කළ යුතු ජාල මූලාශ්‍ර හා එම ක්‍රමවේදයන් පිළිබඳව නිර්දේශ ලබා දී ඇත.	
7	**තිරසර භූගත ජල කළමනාකරණය** ජාත්‍යන්තර ජල කළමනාකරණ ආයතන විසින්	2022	රජයේ දෙපාර්තමේන්තු, පළාත් පාලන ආයතන සහ රාජ්‍ය සංස්ථා වල	1. 1999 අංක 42 දරන ජල සම්පත් මණ්ඩල (සංශෝධන)	මෙම කරුණට අදාලව ආයතනය විසින් සිදු කරගෙන යනු ලබන ක්‍රියාමාර්ග

(IWMI) තිරසර භූගත ජල කළමනාකරණයක් සඳහා ශ්‍රී ලංකාවට පහත නිර්දේශයන් ඉදිරිපත් කර තිබුණි.

- භූගත ජල ළිං සියල්ලම ලියාපදිංචි කිරීම
- ලවණ මුසුවීමේ හැකියාවක් පවතින බැවින් වෙරළ බඩ ජලධාරාවන් සුපරික්ෂාකාරීව අධීක්ෂණය කිරීම
- ජලධාරාවන්ගේ කෘෂිරසායනික දූෂණය අධීක්ෂණය හා ඒ සඳහා ගත හැකි නිවැරදි කිරීම් හඳුනා ගැනීම සහ භූගත ජලය පානීය ජලය ලෙස භාවිත කරන ප්‍රදේශ වල විශේෂයෙන්ම පාංශු ලවණ ඉවත් කිරීම.
- භූගත ජලය පුනර්ජනනීය වන ප්‍රදේශ වල මූලික කළමනාකරණය සහ ජල භාවිත රටාවන් පිළිබඳ උපාය මාර්ග සහ සමාජ ආර්ථික සබඳතා ධෛර්මත් හා වැඩිදියුණු කිරීම.
- විවිධ රාජ්‍ය ආයතන හා රාජ්‍ය නොවන සංවිධාන සම්බන්ධීකරණය කිරීමට හා වැඩිදියුණු කිරීමට අවශ්‍ය කටයුතු සම්බන්ධීකරණයක් ඇති කොට ජල භූ විද්‍යාව සම්බන්ධ මූලික දත්ත සමීක්ෂණය කිරීම, ඒ සම්බන්ධ පර්යේෂණ, සංඛ්‍යාත්මක සමීක්ෂණ සැලැසුම් සහ යෝජනා මත පදනම් වූ වාර්තා විශ්ලේෂණය කිරීම, රටේ භූගත ජල සම්පත් සංරක්ෂණය, උපයෝගීකරණය සහ සංවර්ධනයට අදාලව ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති සම්බන්ධීකරණය සහ එම ව්‍යාපෘති පවත්වා ගැනීමේ හැකියාව ප්‍රයෝජන සහ ආර්ථික ශක්‍යතාව තක්සේරු කිරීම.

පනත හා 2017 අංක 2010/23 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය ප්‍රකාරව භූගත ජල කළමනාකරණය හා නියාමන කටයුතු සිදු කරනු ලබයි.

2. භූගත ජලය ලබාගන්නා මූලාශ්‍ර වල තොරතුරු ලබා ගැනීම, භූජල විද්‍යාත්මක පර්යේෂණ මඟින් ලබා ගන්නා දත්ත එක්රැස් කිරීම ආදී සංරක්ෂණයට හා කළමනාකරණයට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.
3. සංවේදී භූගත ජල කලාප වල, භූගත ජලයේ ගුණාත්මකභාවය හා ප්‍රමාණාත්මකතාව යන් පිළිබඳව තොරතුරු එක්රැස් කිරීම හා නිමානනය කටයුතු සිදු කරමින් අදාල සිදු කරමින් පවතින අතර නියාමන කටයුතු සඳහා අවශ්‍ය නෛතික රාමුව සකසා ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග සිදු කරමින් පවතී.

කිරීම.

- ජල හිඟ පලාත් වල ජලධර ධාරිතාව, ජල භාවිතය හා පරිසර දූෂණයට ඇති අවදානම් පිළිබඳ මහජන අවබෝධය ඉහළ දැමීමට කටයුතු සම්පාදනය කිරීම. (iwmi.cgiar.org/publications/water/policy briefs/PDF/wpb 14.pdf)

ඉහත කරුණු කෙරෙහි අවධානය යොමු කිරීම තව දුරටත් සිදුවිය යුතු බව නිරීක්ෂණය විය.

කළමනාකරණ ක්‍රියාවලීන්ට අදාළ නිර්දේශ ලබාදෙමින් කටයුතු කරනු ලබයි.

4. භූගත ජලය සඳහා බලපෑමක් ඇතිවිය හැකි ව්‍යාපෘති හා සංවර්ධන යෝජනා ක්‍රමවලට අදාලව අනෙකුත් රජයේ ආයතන සමඟ සම්බන්ධීකරණයෙන් යුතුව කටයුතු කරගෙන යනු ලබයි.

2.5 හම්බන්තොට, අනුරාධපුර, වව්නියාව, සහ කුරුණෑගල යන දිස්ත්‍රික්කයන්හි ඛණිජ ද්‍රව්‍ය (කළුගල්) කැණීම සඳහා රජයේ ඉඩම් බදුදීම, පාලනය සහ රාජ්‍ය භාගය අයකිරීම පිලිබඳ කාර්යසාධන විගණනය.

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
1	කාර්මික කැණීම් බලපත්‍රයක් ලබාදීමේදී, ඉඩමේ කැණීම් සඳහා අනුමැතිය ලද ප්‍රදේශයේ පිහිටීම අනුව අනුරේඛනයේ පරිදි මායිම් රේඛාවේ සෑම නැමෙන ස්ථානයකටම සීමා කණුවක් යෙදිය යුතු වුවත්, එසේ සිදු කර නොතිබූ අවස්ථා නිරීක්ෂණය විය.	2021	රජය සතු ඉඩමක් කළුගල් වැඩබිමක් සඳහා බදු දීමේදී මිනින්දෝරු සැලැස්මේ (Survey Plan) දැක්වෙන පරිදි මායිමේ සෑම නැවෙන ස්ථානයක් සඳහාම සීමා කණු යෙදීම සුදුසු අතර, එම ස්ථානයන්හි භූගෝල ස්ථානීය පිහිටීම ඛණ්ඩාංක නොගැලවෙන සේ සවිකර තැබීම සුදුසු බව.	සීමා කණු දැමීම සඳහා දැනුවත් කර ඇත.	නිර්දේශය නිසි පරිදි ක්‍රියාත්මක කර නොතිබුණි.

2	අභ්‍යන්තර ආරක්ෂක අමාත්‍යාංශ අතිරේක ලේකම්ගේ 2004 අප්‍රේල් 14 දිනැති අංක 04/සීඑස්/3/1/10/1/ පොදු දරන ලිපිය ප්‍රකාරව ඩයිනමයිට් කි.ග්‍රෑ. 01 කින් කඩා ගත හැකි කළුගල් ප්‍රමාණය කියුබ් 02 ½ ලෙස ගණනය කර, වන ආඥා පනත යටතේ ගාස්තු අයකිරීම සඳහා උපදෙස් ලබාදී තිබූ නමුත් කළුගල් කැණීම සඳහා භාවිතා කරන වෝටර් ජෙල් සහ ගල් වෙඩි බෙහෙත් ආදිය පිලිබඳව මෙහිදී අවධානය යොමු කර නොතිබුණි.	2021	1. විද්‍යුත් දුර මැනුම් උපකරණ හෝ වෙනත් තාක්ෂනික ක්‍රමවේදයක් භාවිතා කර කළුගල් නිධිවල කැණිය හැකි කළුගල් පරිමාව සහ එහි ආර්ථික වටිනාකම ගණනය කිරීම විද්‍යාත්මක ක්‍රමවේදයක් බව නිරීක්ෂණය කෙරේ. තවද වර්ෂයෙන් වර්ෂයට හෝ කාලීන සත්‍ය වශයෙන්ම නිකුත් කරන පුපුරණ ද්‍රව්‍යවලට සාපේක්ෂව කළුගල් කැණීම් කර තිබේද රාජ්‍ය භාගය අය වී තිබේද යන්න පරීක්ෂා කිරීම සුදුසු බව.	නිර්දේශ ක්‍රියාත්මක කිරිමට පියවර ගෙන ඇත.	විද්‍යාත්මක ක්‍රමවේදයක් අනුගමනය කිරිමට සැලසුම් කර ක්‍රියාත්මක කරමින් පවතී.
			2. රාජ්‍ය භාගය අයකිරීමේදී, කැණීම් කරන කළුගල්වල වෙළඳපොල මිල නිවැරදි සමීක්ෂණයක් සිදුකර කාලීනව වෙනස්වන පරිදි ගලපා ගැනීම.	සාකච්ඡා මට්ටමේ පවතී.	නිර්දේශ ක්‍රියාත්මක කර නොමැත.
3	හම්බන්තොට දිස්ත්‍රික්කයේ කාර්මික කැණීම් බලපත්‍ර අංක IML/B/HO/115/LR/09	2021	පුපුරණ ද්‍රව්‍ය අනවසර භාවිතා කිරීම සහ වැඩබිම් සඳහා අතිරික්ත පුපුරණ ද්‍රව්‍ය	මෙම ස්ථානීය පරීක්ෂණයේදී වැඩිපුර සිදු කර ඇති කලුගල්	2019 කාර්යසාධන විගණනයේ පෙන්වා දී ඇති හිඟ මුදල්

	යටතේ, අංක 276389 දරණ පුපුරණ ද්‍රව්‍ය බලපත්‍රය ලබාගෙන තිබූ තිස්සමහාරාම ජූල්පල්ලම කළුගල් වැඩබිම සඳහා 2007 වර්ෂයේ සිට 2019 සැප්තැම්බර් මාසය දක්වා නිකුත් කරන ලද පුපුරණ ද්‍රව්‍ය ප්‍රමාණය අනුව කළුගල් කියුබ් 11,803 ක් පමණ කැණිය යුතුය.එසේ වුවද භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාරයාංශයේ නිලධාරීන් 2019 ඔක්තෝම්බර් 16 දින සිදු කරන ලද ස්ථානීය පරීක්ෂයේදී ලබාගත් මිනුම් පදනම් කර සිදු කල ගණනය කිරීම අනුව කළුගල් කියුබ් 17,514 ක් පමණ කැණීම් සිදුකර තිබුණු බව දන්වා තිබුණි. ඒ අනුව කැණීම් කල කළුගල් කියුබ් නිකුත් කල පුපුරණ ද්‍රව්‍ය පදනමින් සහ භූ විද්‍යා සමික්ෂණ හා පතල් කැණීම් කාර්යාංශයේ ගණනය කිරීම අනුව කියුබ් 5,711 ක වැඩිපුර කැණීමක් නිරීක්ෂණය විය.		නිකුත් කිරීම මඟින් ජාතික ආරක්ෂාව සම්බන්ධයෙන්ද තර්ජනයක් සිදු විය හැකි බැවින් ඒ පිළිබඳව අවධානය යොමු කිරීම සහ පුපුරණ ද්‍රව්‍ය භාවිතය පිළිබඳව වගකිව යුතු ආයතන ඒකාබද්ධව පවතින අධීක්ෂණ ක්‍රමවේදය වඩා විධිමත් කිරීම සුදුසු බව.	කැණීම් සම්බන්ධයෙන් භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් නිසි දැනුවත් කිරීමක් කර නොමැති බැවින් ඒ සම්බන්ධයෙන් තොරතුරු ඇතුලත් වාර්තාවක් ලබා දෙන ලෙස දන්වා 2024.11.05 දිනැතිව භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ ප්‍රාදේශීය කැණීම් ඉංජිනේරු වෙත ලිපියක් යවා ඇත.	සම්බන්ධයෙන් වන ගැටළුව නිසා 2020 වර්ෂයේ සිට කළුගල් කැණීම් කටයුතු සිදු කර නොමැති අතර මෙම ගල් වල දැනට ක්‍රියාත්මක තත්වයේ නොමැත. සැළකිය යුතු ප්‍රදේශයක ජලය පිරී ඇති බැවින් ඉතා අවදානම් මෙම ගල් වල සම්බන්ධයෙන් සුදුසු ක්‍රියා මාර්ග ගන්නා ලෙස 2024.08.22 දිනැති ලිපිය මඟින් භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය වෙත දන්වා යවා ඇත.
4	පරීක්ෂාවට ලක් කරන ලද කැණීම් කටයුතු සිදු කරන සහ අත්හැර දමා තිබූ කළුගල් වැඩබිම්වල විශාල ප්‍රමාණයේ වතුර වලවල් සෑදී තිබූ අතර, ගවයන් සහ වල් අලින් වැනි සතුන් ජලය සොයා පැමිණීමේදී එම වලවල් තුලට ඇද වැටීමට ඇති අවදානම සහ එම	2021	රජය සතු ඉඩම්වල ඛණිජ ද්‍රව්‍ය කැණීම් සිදුකර දැනට අත්හැර ඇති සහ ජලය පිරී ඇති කළුගල් නිධි ගවේශණය කර හඳුනාගෙන ඒවා පරිසරයට වන සතුනට පිටුවහලක් වන පරිදි භාවිතයට අවශ්‍ය කටයුතු	සාකච්ඡා මට්ටමේ පවතී.	නිර්දේශ ක්‍රියාත්මක කර නොමැත.

වලවල්වල මදුරුවන් බෝවීම තුලින් සෞඛ්‍ය ගැටළුද ඇති වීමේ ඉඩ ප්‍රස්ථා තිබුණි.	සම්පාදනය කිරීම.

2.6 සුළු හා මධ්‍ය පරිමාණ සහල් මෝල් හිමිකරුවන් සඳහා ණය සහන ලබාදීමේ වැඩසටහනේ කාර්යසාධනය

	විගණන නිරික්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
1	සුළු හා මධ්‍ය පරිමාණ සහල් මෝල් හිමියන් සඳහා ණය සහන ලබාදීමේ වැඩසටහන යටතේ පළාත් 5 ක පිහිටි දිස්ත්‍රික්ක 8 ක සහල් නිෂ්පාදකයන්ගේ සමූපකාර සමිතිවල සාමාජිකයන් 228 ක් සඳහා රු.මිලියන 434.87 ක මුදලක් ලබා දී තිබූ අතර එම නිදහස් කරන ලද මුදල මාස 06 ක් කල් පිරුණු පසු දිස්ත්‍රික් ලේකම්වරු වෙත ආපසු ගෙවීමට අදාල දිස්ත්‍රික් සමිති කටයුතු කළ යුතු වුවත් රු.මිලියන 99.38 ක් හෙවත් නිකුත් කළ ණය මුදලින් සියයට 23 ක මුදලක් නියමිත කාල වකවානු තුල දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත ගෙවීමට දිස්ත්‍රික් සමිති විසින් කටයුතු කර නොතිබුණු අතර මාස 06 ඉක්මවූ පසු එහි ප්‍රමාද කාලය අවම දින 05 සිට උපරිමය දින 35 ක් විය.	2021	1. පළමු අදියරේදී ලබාදුන් ණය චක්‍රීය අරමුදලක් ලෙස භාවිතා කරමින් වී සහල් බවට පත් කිරීමේ කාර්යය කාර්යක්ෂමව ඉටු කල හා පෙර මුදල් නැවත පියවීමට කටයුතු කල සාමාජිකයන් සඳහා පමණක් අනෙකුත් අදියරයන්හිදී ණය මුදල් නිකුත් කිරීමට කටයුතු කිරීම හා එමඟින් වැඩසටහන මඟින් ලබාදෙන ණය මුදල් නිකුත් කිරීමට කටයුතු කිරීම හා වැඩසටහන යටතේ තෝරාගත් කණ්ඩායම සම්බන්ධයෙන් දත්ත පද්ධතියක් පවත්වාගෙන යාම. 2. දිස්ත්‍රික් සමිති සඳහා ලබාදෙන ණය මුදල් ගිවිසුම් කාලය අවසානයේදී නැවත පියවීමට කටයුතු නොකරන මෝල් හිමියන් සඳහා අවශ්‍ය	මෙම ව්‍යාපෘතිය අසාර්ථක ව්‍යාපෘතියක් බැවින් ව්‍යාපෘතිය ඉදිරියට ක්‍රියාත්මක නොකිරීමට ප්‍රතිපත්තිමය තීරණයක් ගැනීමට නියමිත බවත් හිඟ මුදල්අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමටත් තීරණය කර තිබුණි.	ආහාර කොමසාරිස් විසින් ලබාදුන් තොරතුරු අනුව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට පළාත් සමූපකාරවරුන්ට උපදෙස් ලබාදී තිබුණද ණය අයකර ගැනීමට අවශ්‍ය නීතිමව ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

නීතිමය ක්‍රියාමාර්ග
ගැනීම

2.7 ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව විසින් ආරක්ෂිත සහල් සංචිත පවත්වාගෙන යාම හා ගබඩා උපයෝජනයේ කාර්යසාධනය ඇගයීම.

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
1	විද්‍යාත්මක ගබඩාවල ආරක්ෂිත සහල් තොග පවත්වා ගැනීම සඳහා 2012 වර්ෂයේදී ව්‍යාපෘති වාර්තාවක් සකස් කර තිබුණද එය විධිමත්ව අනුමත කර ගැනීමට කටයුතු කර නොතිබුණු අතර නියමු ගබඩා උපයෝජනය සඳහා ප්‍රතිපාදන ලබා නොදීම හේතුවෙන් ගබඩා 02 ක් ඌණ උපයෝජිතව පැවතියද ඒ සම්බන්ධයෙන් අවධානය යොමු නොකර තවදුරටත් විද්‍යාත්මත ගබඩා 4 ක් නවීකරණය කර තිබුණි.	2021	අමාත්‍ය මණ්ඩල තීරණ අනුව සහල් මෙට්‍රික් ටොන් 100,000ක ආරක්ෂිත තොග ගබඩා කර තබා ගැනීම සඳහා වන නීතිමය ප්‍රතිපාදන ඇති කිරීම.	අනුමත කරන ලද ව්‍යාපෘති වාර්තාව පදනම් කරගෙන නියුමු ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර ඇත.	නීතිමය ප්‍රතිපාදන ඇති කර නොමැත.
2	වේයන්ගොඩ අංක 10 ගබඩාවේ ධාරිතාවය මෙට්‍රික් ටොන් 5400 ක් වුවද නියමු ව්‍යාපෘතියේ සාර්ථකත්වය ඇගයීම සඳහා තෝරාගත් ගබඩාවල සම්පූර්ණ ධාරිතාවය උපයෝගී නොකර මුළු ධාරිතාවයෙන් සියයට 12 ක පමණක් සහල් ගබඩා කර තිබුණි. මෙහි ප්‍රතිඵලයක් ලෙස සහල් කිලෝ ග්‍රෑම් 1 ක විදුලි පිරිවැය ඉහල අගයක්		විද්‍යාත්මක ක්‍රමවේදය අනුව සකස් කල ගබඩාවල ඊට අනුකූල දේ පමණක් ගබඩා කිරීමට කටයුතු කිරීම හා ගබඩා ධාරිතාවය උපරිම ප්‍රයෝජනයට ගැනීම සඳහා ගබඩා නවීකරණය කිරීමේ සැපයුම් ඇති කිරීම.	එම අවස්ථාවේ පැවති වාතාවරණය යටතේ වී අලෙවි මණ්ඩලයේ සම්පූර්ණ ගබඩාවන් පිරවීමට සහල් මෙ.ටො. 5400ක් පමණ අවශ්‍ය වුවද, එම ආයතනයට ලැබුණු වී, ලියාපදිංචි වී මෝල් හිමියන්ට	විද්‍යාත්මක ක්‍රමවේදයන්ට අනුකූල දේ පමණක් ගබඩා කිරීමට සිදුව නැත. ගබඩා නවීකරණය සඳහා මුදල් ප්‍රතිපාදන ලබා දී නොමැත.

	ගැණිනි.			ලබා දී තිබූ අතර එම මෝල් හිමියන්ගෙන් ලැබුණු සහල් තොගය පමණක් නියමු ව්‍යාපෘතිය සඳහා භාවිතයට ගෙන තිබේ. එය පදනම් කරගෙන නියමු ව්‍යාපෘතිය ඉදිරියට ක්‍රියාත්මක කර ඇත. මෙහිදී ඉහළ විදුලි අගයක් වැයවීමට හේතුව ගබඩාවේ ධාරිතාවයෙන් 12% ක ප්‍රමාණයක් පමණක් මෙම පර්යේෂණය සඳහා භාවිතයට ගැනීමය. ඒහේතුවෙන් ඒකක පිරිවැය ඉහළ ගොස් ඇත.	
3	2015 වර්ෂයේ සිට 2019 දෙසැම්බර් 31 දක්වා මාසික තක්සේරු ගත ගබඩා කුලී ආදායම හා සැසඳීමේදී අයකරගත් ගබඩා කුලී ආදායම දුර්වල තත්වයක පැවතුනි.	2021	ගබඩා කුලී මාස 03 ක් ප්‍රමාද වූ විට තැන්පතු කුලියෙන් එය හිලව් කර ගැනීමට හැකි වන පරිදි හා ගබඩාව දෙපාර්තමේන්තුවට ලබා ගත හැකි පරිදි අදාල ගිවිසුම්වලට එළඹීම හා හිඟ ගබඩා කුලී කඩිනමින් අයකර ගැනීමට ක්‍රමවත් වැඩ පිළිවෙලක් සැකසීම.	ගබඩා රාජ්‍ය හා පෞද්ගලික ආයතන 53 ක් බදු කුලී පදනම මත ලබා දී ඇති අතර ඒ සඳහා එම ආයතන සමඟ ගිවිසුම්ගතව බදු කුලී ලබා ගැනීම සිදු කරන බව දන්වමි	හිඟකුලී අයකර ගනිමින් පවතී.

4	2007 වර්ෂයේ සිට දෙපාර්තමේන්තුවට අයත් ගබඩා 17 ක් වී අලෙවි මණ්ඩලයට වී ගබඩා කිරීම සඳහා කුලී රහිතව ලබා දී තිබුණු අතර ඉන් ගබඩා 10 ක් 2019 දෙසැම්බර් 31 දින වන විටත් පරිහරණය කරමින් පැවතුනි. මෙම ගබඩා වලින් උපරිම ප්‍රයෝජන ගැනීමට කටයුතු නොකර නිෂ්ක්‍රීයව පවතින ගබඩා රජයට වඩාත් වාසිදායක අකාරයෙන් කටයුතු කිරීමට අවශ්‍ය ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි.	2021	රාජ්‍ය ආයතනවලට කුලී රහිතව ලබා දෙන ලද ගබඩා උපයෝජනයෙන් තොරව පවතී නම් ඒවා නැවත ලබා ගැනීමට කටයුතු කිරීම.	බදුකුලී පදනම මත ලබා දී තිබූ ගබඩා 17න් ගබඩා 08 ක් දෙපාර්තමේන්තුව වෙත ලබාගෙන ඇත.	නැවත ලබා ගැනීමට කටයුතු සිදු කර නොමැත.

2.8 මහා භාරකාර තැන වෙත පවරා ඇති බූදල් දේපළ කළමනාකරණය සම්බන්ධව ඇගයීම.

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
1	ජෝන් වීරසිංහ බේබි ඇන්ජී අබේනායක යුවලට අයත් දේපල වලින් වාර්ෂිකව ලැබෙන ආදායමින් අරමුදලක් පිහිටුවා රුවන්වැලි සෑයේ චෛත්‍ය වර්ධන සමිතියටත්, ඉන්දියාවේ මහා බෝධි සමාගමටත් සමසේ බෙදා යවන ලෙස අන්තිම අන්තිම කැමති පත්‍රයේ අරමුණු ලෙස දක්වා තිබුණද මාතර ගඩබා වීදියේ පුංචිපතහෙවත්ත ‘බී’ අක්ෂරය දරන කැබැල්ලෙහි බෙදූ අංක 03 දරන පර්චස් 32 ක් විශාල ඉඩම හා ගොඩනැගිල්ල 2013 වර්ෂය දක්වා ඵලදායී අයුරින් කළමනාකරණය කර නොතිබුණු අතර 2013 පෙබරවාරි 05 දින අංක 312 දරන බදු ගිවිසුම මත Y.T.K. හරිස්චන්ද්‍ර නැමැත්තෙකුට මාසිකව රු.8,000 කට බදු දී තිබුණි. උක්ත බදු ගිවිසුම 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වී තිබුණි.මෙම දේපළ විකිණීම සඳහා නඩු අංක 97/16 යටතේ 2016 සැප්තැම්බර් 29 දින කොළඹ දිසා අධිකරණයේ දිසා විනිසුරුවරයාගේ	2021	(අ) බාහිර පාර්ශවයන්ට බූදල් දේපළ බදු පදනමින් ලබා දෙන අවස්ථාවලදී දේපළවල ආරක්ෂාවත්, දේපළවලින් සාධාරණ ආදායමක් ලැබීමත් තහවුරු කිරීම සඳහා විධිමත් බදු ගිවිසුම්වලට එළඹිය යුතු වීම හා බදු පැහැර හැර ඇති දේපළ නැවත ලබා ගැනීම සඳහා අවශ්‍ය නීතිමය කටයුතු කළ යුතු වීම. (ආ) නෛතික බලපත්‍ර ලබාගෙන ඇත්නම් පමණක් බූදල් සම්බන්ධයෙන් කටයුතු කල යුතු වීම, බූදල්කරුවන්ගේ අරමුණුවලට පටහැනි කාර්යන් සඳහා බූදල් දේපළ	වීරසිංහ අබේනායක බූදලයට අයත් මාතර,වල්පොල, 1වන හරස් පාර,නො 07 දේපළෙහි අනවසරයෙන් රැඳී සිටින පදිංචිකරුවන් ඉවත් කිරිම සඳහා අංක 13736/LA දරණ මාතර දිසා අධිකරණයේ පවතින නඩුකරය 2024.12.03 දින කැඳවීමට නියමිත අතර එදිනට විත්තිකරුවන් වෙත භාර දී ඇති සිතාසි සඳහා උත්තර විමසීම සිදු කරනු ලැබේ. 2024.05.10 දින මෙම දේපල මහා භාරකාරතැන භාරයට අත්පත් වූ අතර 2024.05.14 හෝ ආසන්න දිනකදි එකී විත්තිකරුවන් විසින් දොරගුලු කඩා බිද දමා දේපලට	ඉදිරියේදී දේපල අයිතිය තහවුරු වූ පසු නිර්දේශ ක්‍රියාත්මක කරන බව එවා තිබුණි..

	අවසරය ලබාගෙන තිබුණද දේපළ විකුණා අරමුදලට බැර කිරීම වෙනුවට විධිමත් බදු ගිවිසුමකට එළඹීමෙන් තොරව ඉහත බදුකරුටම මාසිකව රු.10,000 ක මුදලකට බදු දී තිබුණි.			උපයෝජනය නොකල යුතු වීම හා දේපළවලට අගතියක් නොවන අයුරින් දේපළ කළමනාකරණ ය කල යුතු වීම.	බලහත්කාරයෙන් ඇතුළු වීම හේතුවෙන් අංක BR 2821/24 දරණ මාතර මහේස්ත්‍රාත් අධිකරණයේ නඩුව ගොනු කිරීම සිදු කරන ලදි. ඒ අනුව අංක BR 2821/24 දරණ නඩුකරය 2024.10.21 දින කැඳවන අතර එදිනට වැඩිදුර වාර්තා කැඳවීමට නියමිත වේ.	
2	උතුරුමැද පළාතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ, අනුරාධපුර නගරයේ පදිංචිව සිටි 1998 පෙබරවාරි 22 දින මිය ගිය ආර්. එල්. එච්. චන්ද්‍රසේකර යන අයගේ 1993 සැප්තැම්බර් 09 දිනැති අන්තිම කැමති පත්‍රය ප්‍රකාරව දේපළ පාලනය සම්බන්ධයෙන් 2003 ජුනි 04 දින සීමිත ප්‍රොබේට් බලපත්‍රයක් මහා භාරකාරතැන වෙත ප්‍රදානය කර තිබුණි. I. බලපත්‍රය ලැබී වසර 16 ක් ගත වුවද, මෙම බුදලයට අයත් ඉඩම් ප්‍රමාණය මැණීම් කර මායිම් වෙන් කර දේපළ ආරක්ෂා කිරීමටත්, අන්තිම කැමති පත්‍රයෙහි සඳහන් අරමුණු ඉටු කිරීමටත් කටයුතු කර	2021			මෙම බුදලයට අදාළව පැවති අංක 1/99/T නඩුකරයෙන් මහා භාරකාරතැනට අවාසිදායක ලෙස තීන්දුව ලැබීම නිසා අභියාචනයක් අනුරාධපුර සිවිල් අභියාචනාධිකර ණයේ ගොනු කරන ලදි.එකී නඩුවේ ඇති වූ සමථය ප්‍රකාරව මහා භාරකාරතැන වෙත ගොඩ ඉඩමේ පර්.30 ක් හා කුඹුරු ඉඩමෙන් අක්කර 5 කි හිමි විය.නඩුව පැවති අවධියේ දී කුඹුරු ඉඩම	මේ වන විට ප්‍රවේණිය ලබා ගැනීමට යටත්ව බදු ගිවිසුමකට ඇතුලත් වී ඇත.

	නොතිබුණි. මෙම බුදලය සම්බන්ධයෙන් වූ බුදල් නඩුවක් හේතුවෙන් මෙලෙස ප්‍රමාදයන් සිදු වූ බව දෙපාර්තමේන්තුව විසින් සඳහන් කළ අතර 2019 සැප්තැම්බර් 30 දින අදාල නඩුවෙහි තීන්දුව ප්‍රකාශකර තිබුණද, ඒ අනුව කටයුතු නොකර අභියාචනා ගොනු කිරීම හේතුවෙන් අරමුණු ඉටු කිරීම තව දුරටත් ප්‍රමාද වී තිබුණි.	බදුකරුවකුට ලබා දී සම්මත ප්‍රමාණය අනුව ප්‍රවේණිය ගෙවා ඇත.
II.	මෙම බුදලයට අයත් අනුරාධපුර දිස්ත්‍රික්කයේ, නුවරගම් පළාතේ නුවරගම් කෝරළයේ, රත්මලේතුලානේ, පොතානේගම පිහිටි ලොට් අංක 1 සහ 2 වශයෙන් දැක්වෙන අක්කර 18 රූඩ් 03 පර්චස් 01 ක් විශාල ඉඩම හා ලොට් අංක 3 වශයෙන් දැක්වෙන අක්කර 17 රූඩ් 02 පර්චස් 23 විශාල ඉඩම සඳහා මහා භාරකාරතැන විසින් 2000 ජූලි 04 දින තාවකාලික බදුකරුවෙකු පත් කර තිබුණි. එහෙත් දේපළ ආරක්ෂාව, වගා කටයුතු, බදු ආදායම් හා බදු කොන්දේසි සඳහා විධිමත් බදු ගිවිසුමකට එළඹීමට 2020 ජනවාරි වනවිටත් කටයුතු කර	මෙම බුදලයේ කුඹුරු ඉඩම නව ගැණුම්කරුවකු වෙත 2024/25 මහා කන්නයේ වගා කිරීම සඳහා රජයේ සම්මත ප්‍රමාණයන් අය කරමින් අවබෝධතා ගිවිසුම් මත ලබා දී ඇත.

නොතිබුණි. නිශ්චිත වශයෙන්ම අඳ ගොවියා විසින් වගාකළ කුඹුරු අක්කර ගණන කොතෙක්ද, අදාළ කන්නයේ වී සඳහා වූ සහතික මිල කොතෙක්ද හා පොල් ඉඩමෙන් වගා කළ ප්‍රමාණය හා අස්වැන්න කොතෙක්ද ඒ අනුව ප්‍රවේණි ලැබීම නිවැරදි ද යන්න සම්බන්ධයෙන් මහාභාරකාර දෙපාර්තමේන්තුව විසින් කිසිදු අවස්ථාවක අධීක්ෂණයක් හෝ පසු විපරමක් කර නොතිබුණු අතර අඳ ගොවියා විසින් ඔහුගේ මනාපය පරිදි ගෙවන ප්‍රවේණිය, භාරගෙන ගිණුම්ගත කර තිබුණි. ඒ අනුව 2000 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා අක්කර 36 රූඩ් 1 පර්චස් 24 කින් ලද ආදායම රු.3,575,542 ක් පමණි.

III. මෙම බූදලයට අයත් අනුරාධපුර පැරණි නගරයේ කුරුණෑගල පාරේ අංක 238 හා 239 දරන වෙළෙඳ ගොඩනැගිල්ල හා පිහිටි භූමිය විධිමත් ගිවිසුමකින් තොරව බදු දී තිබුණු අතර 2000 වර්ෂයේ මාර්තු සිට බදුකරු බදු මුදල් ගෙවීම පැහැර හැර තිබු අතර ඉන් අනතුරුව එම දේපළ

	කළමනාකරණය සම්බන්ධයෙන් අවධානය යොමුකර නොතිබුණි. IV. අනුරාධපුර නව නගරයේ හරිස්චන්ද්‍ර මාවතේ අංක 48/388 දරන ස්ථානයේ පිහිටි ව්‍යාපාරික ගොඩනැගිල්ල හා ඉඩම සම්බන්ධයෙන් වූ අංක 14289/එල් දරන නඩුවේ තීන්දුව ප්‍රකාරව දේපළ නිරවුල් කර ගෙන විධිමත්ව බදු දී බූදලය නමින් ආදායම් ඉපයීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.				
3	ශ්‍රීමා ඉන්ද්‍රානි ද සොයිසා මහත්මියගේඅන්තිම කැමති පත්‍රය ප්‍රකාරව නුගේගොඩ ලංකා බැංකු අධිශ්‍රේණි ශාඛාවේ ලොකර් අංක 738 හි තැන්පත් කර තිබූ ස්වර්ණාභරණ 2007 සැප්තැම්බර් 17 දින දෙපාර්තමේන්තුවේ නීති හා විමර්ෂණ නිලධාරී විසින් පරීක්ෂා කර ලැයිස්තුගත කර තිබුණු අතර එම ලැයිස්තුවේ සඳහන් ස්වර්ණාභරණ හා අන්තිම කැමති පත්‍රයේ සඳහන් ස්වර්ණාභරණ වර්ග, ප්‍රමාණයන් හා ලෝහ වර්ගයන්අතර වෙනස්කම් නිරීක්ෂණය විය.	2021	ආරක්ෂිත සේප්පුවල පවතින භාණ්ඩ හා ලියවිලි අතරින් හිමිකරුවන් හඳුනාගත හැකි භාණ්ඩ සම්බන්ධයෙන් බූදලයෙහි අරමුණු ප්‍රකාරව කටයුතු කළ යුතු අතර හඳුනාගත නොහැකි භාණ්ඩ අධිකරණයට ඉදිරිපත් කර අධිකරණ අවසරය සහිතව සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය.	ශ්‍රීමා ඉන්ද්‍රානි ද සොයිසා මහත්මිය විසින් 2002.10.02 දින අංක 4115 දරණ අන්තිම කැමති පත්‍රය ලියා ඇති අතර 2007.04.14 දින ඇය මියගොස් ඇත. ඒ අනුව දෙපාර්තමේන්තු නිලධාරි ලබා ගන්නා ලද දේපල ලැයිස්තුවේ මිය යාමට පෙර ඇය විසින් ලියා තැබූ අන්තිම කැමති පත්‍රයේ සඳහන් ස්වර්ණාභරණ නොතිබුණි. නැසී ගිය ශ්‍රීමා ඉන්ද්‍රානි ද සොයිසා	අන්තිම කැමති පත්‍රය අනුව කටයුතු කිරීම සිදු කර නොතිබුණි.

				මහත්මිය විසින් ජීවත් ව සිටි කාලයේ ස්වර්ණාභරණ පරිහරණය කර තිබිය හැක. ඒ අනුව දේපල ලැයිස්තුව ලබා ගන්නේ මිය යාමෙන් පසුව වන බැවින් අන්තිම කැමති පත්‍රයේ සඳහන් ස්වර්ණාභරණ ඒ ආකාරයෙන්ම තිබිය නොහැක.	
4	එන්.ඩී.ඒ.සිල්වා විජේසිංහ මුදලිතුමාගේ අන්තිම කැමති පත්‍රයෙහි පෞරාණික වටිනාකමකින් යුත් කෞතුක භාණ්ඩ ලැයිස්තුවක් දක්වා තිබුණු අතර එම කෞතුකභාණ්ඩ එතුමාගේ මන්දිරයෙහි තැන්පත්කර සංරක්ෂණය කළයුතු බව සඳහන් කර තිබුණි. එහෙත් එම කෞතුක භාණ්ඩ අතරින් කෞතුක භාණ්ඩ කිහිපයක් පමණක් දෙපාර්තමේන්තුවේ සේප්පුවක තබා ඇති බව නිරීක්ෂණය වූ අතර අනෙකුත් කෞතුක භාණ්ඩ පවතින ස්ථානය පිළිබඳව දෙපාර්තමේන්තුව සතුව වාර්තා නොතිබුණි. එම සේප්පුවෙහි තැන්පත් කර තිබූ බාපනයද අබලන් වී තිබුණු අතර ඓතිහාසික වටිනාකමක් ඇති භාණ්ඩ	2021	ඓතිහාසික වටිනාකමකින් යුත් භාණ්ඩ සංරක්ෂණය කිරීමට පියවර ගත යුතු අතර දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන සියලුම බූදල්වලට අදාල ඉඩම්වල දෙපාර්තමේන්තුවේ නම සඳහන් නාම පුවරු ප්‍රදර්ශනය කලයුතුය.	අන්තිම කැමති පත්‍රයෙහි සඳහන් කර තිබුණු කෞතුක භාණ්ඩ දෙපාර්තමේන්තුවේ සේප්පුවක තබා ඇති අතර පුරා විද්‍යා දෙපාර්තමේන්තුවේ සහාය ඇතිව ඒවා හඳුනා ගැනීමට කටයුතු කරමින් පවතී.	මේ වන විට බොහෝ ඉඩම් වල නාම පුවරු ප්‍රදර්ශනයට කිරීමට කටයුතු කර ඇත. ඉදිරියේදී භාණ්ඩ සංරක්ෂණය කිරීම සඳහා ක්‍රියා කිරීමට කටයුතු කරන බව ප්‍රකාශ කරන ලදී.

	සංරක්ෂණය සඳහා ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි. ඒ අනුව බූදල් හිමිකරු සිය දේපළ මහාභාරකාරතැන වෙත පැවරීමෙන් එම අරමුණ ඉටු වී නොමැති බව නිරීක්ෂණය කෙරේ.				
5	කොළඹ දිස්ත්‍රික්කයේ වැල්ලවත්ත ප්‍රදේශයෙහි පදිංචිව සිට 1999 නොවැම්බර් 28 දින මියගිය සී. ඊ. වනිගසූරිය මහතාගේ දේපළ විකුණා ලැබෙන මුදල් "සිසිල් වනිගසූරිය" නමින් වූ භාරයක තැන්පත් කිරීම සඳහා මහාභාරකාරතැන වෙත 2005 නොවැම්බර් 10 දින අද්මිනිස්ත්‍රාසි බලතල ලැබී තිබුණි. එහෙත් 2019 දෙසැම්බර් වන විට වර්ෂ 14 ක කාලයක් ගත වී තිබුණද, ප්‍රදේශ 07ක පිහිටා තිබූ ඉඩම් හා ගොඩනැඟිලි විකුණා බූදල්කරුගේ අරමුණු විශ්වාසනීයව හා කාර්යක්ෂමව ඉටුකිරීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි. තවද, එම ඉඩම් හඳුනාගෙන මහාභාරකාරතැනගේ අයිතිය තහවුරුවන පරිදි ආරක්ෂා කිරීමට වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණි.	2021	විකිණීම සඳහා අධිකරණ අවසරය ලද ඉඩම් හා ගොඩනැඟිලි විකුණා බූදලයේ අරමුණු ඉටුකිරීමට කටයුතු කළ යුතු අතර හඳුනානොගත් ඉඩම් හඳුනාගෙන මැනීම් කටයුතු සිදුකර මහා භාරකාරතැනගේ අයිතිය තහවුරුවන පරිදි ආරක්ෂා කිරීමට වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කළ යුතුය.	මෙම බූදලයට අයත් වැල්ලවත්ත, දුම්රියපල පටුමඟ, අංක 25 දරණ ස්ථානයේ පිහිටි දේපල නොබෙදූ අයිතියක් ඇති බැවින් ඉඩමේ අනෙකුත් කොටසේ පදිංචිකරුවන් හට විකිණීම සඳහා රජයේ තක්සේරුවක් ලබා ගැනීමට යොමු කර ඇත. අනිකුත් ඉඩම් හඳුනාගෙන මහා භාරකාරතැනගේ අයිතිය තහවුරු කිරිම සඳහා විශේෂ කමිටුවක් පත් කර ඇත.	හඳුනා ගත් ඉඩම් කොටස් වල නාම පුවරු සවි කර ඇති අතර අනෙක් ඉඩම් කොටස් හඳුනා ගැනීමට කටයුතු කරමින් පවතී.
6	දොන් සයිමන් විජේවික්‍රම මහතා විසින් 1950 පෙබරවාරි 10 දින ලියන ලද අංක 3911 දරන	2021		දොන් සයිමන් විජේවික්‍රම මහතා විසින් 1947 ලියන ලද	පිලියන්දල රෝහලෙහි වාට්ටුවක් ඉදි කිරීමේ කටයුතු

අන්තිම කැමති පත්‍රයේ 8 වන වගන්තිය ප්‍රකාරව පිළියන්දල නගරයේ ඉදිකිරීමට යෝජිත රෝහලෙහි වාට්ටුවක් ඉදිකිරීමටත් එය ඔහුගේ නැසීගිය මවගේ නමින් නම් කිරීමටත් මහාභාරකාරතැන වෙත පවරා තිබුණු නමුත් එවැනි වාට්ටුවක් පිළියන්දල මූලික රෝහලෙහි ඉදිකිරීම වෙනුවට රු.1,014,275 ක් වටිනා වෛද්‍ය උපකරණ පරිත්‍යාග කිරීම පමණක් සිදුකර ඇති බව රෝහලෙන් ලබාගත් වාර්තා අනුව තහවුරු විය.	අන්තිම කැමති පත්‍රය ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රොබේට් බලපත්‍රය 1960 දී ලැබී ඇත. ඒ අනුව රු.20,000.00 නොවැඩි මුදලක් වැයකර එවකට පිළියන්දල නගරයේ ඉදිකිරීමට යෝජිත රෝහලෙහි වාට්ටුවක් වෙන්කර එය ඔහුගේ මව වන ඩී. සී. ඩබ්. සමරකෝන් නමින් නම් කරන ලෙස දන්වා ඇත. මෙම කාර්ය සඳහා රෝහල ආරම්භ කරන අවස්ථාවේ දී කිසියම් දායකත්වයක් ලබා දී තිබේදැයි සොයා බැලීමට තොරතුරු දෙපාර්තමේන්තුව සතුව නොමැත. එම අන්තිම කැමති පත්‍රයේ 4.1 අනුව ඒ මහතාට හිමි නිශ්චල හා චංචල දේපල යොදවා සමරකෝන් භාර අරමුදල නමින් ගිණුමක් විවෘත කර ලැබෙන කුලී	ඉටු වී නොතිබුණි.

ආදායම් හා ලාභය යොදාගෙන අන්තිම කැමති පත්‍රයේ සඳහන් කර ඇති අරමුණ ඉටුකල යුතු බව දන්වා ඇත.
ඒ අනුව මෙම දෙපාර්තමේන්තු වේ සමරකෝන් භාරය නමින් භාරයක් ආරම්භ කර ඇති අතර එම භාරයෙන් ලැබෙන ආදායම දිවයින පුරා ආධාර අවැසි අය සඳහා ශිෂ්‍යාධාර, වෛද්‍යාධාර, අසරණාධාර, හා ආගමික ආධාර ලබා දීමට භාවිතා කරනු ලබයි.
වර්තමානය වන විට පිළියන්දල රෝහල සඳහා භාරය මගින් රු. 1,700,000/- ක මුදලක් උපකරණ හා අලුත්වැඩියා කටයුතු සඳහා ලබා දී ඇත.
2017/2018 කාලය තුල පැවති ඩෙංගු වසංගත තත්වයට රෝහල සූදානම් කිරීමේ අවශ්‍යතාවය මත හදිසි ප්‍රතිකාර ඒකකය නවීකරණය කිරීම වෙනුවට

එම රෝහලට අදාල වෛද්‍ය උපකරණ හා වායුසමීකරණ යන්ත්‍ර ලබා දී ඇත. එමෙන්ම දෙමහල් වාට්ටුවේ වහලය අළුත්වැඩියා කර ඇත. ඉහත තත්වය අනුව අදාල අරමුණ නිසි ආකාරයෙන් ඉටුවි නොමැති බැවින් එම කාර්ය ඉටුකිරීම සඳහා පිඹුරුපත් සකසා සෘජුවම අප වෙත එවන ලෙස පිළියන්දල රජයේ රෝහලේ දිස්ත්‍රික් වෛද්‍ය නිලධාරී වෙත දන්වා යවා ඇත. නැවත එය ඉටුකිරීමට පිළියන්දල රෝහල වෙත ගොස් සාකච්ඡා ආරම්භ කර 2019 නොවැම්බර් මාසයේදී ඒ සඳහා ලිපි යොමුකර ඇත. ඉන් පසුව ඇතිවූ කෝවිඩ් තත්වය හා රටේ පැවති අර්බුධකාරී තත්වය හමුවේ මෙය යටපත් වී ඇත. වර්තමානයේ සාකච්ඡා නැවත

				ආරම්භ කිරීමට පියවර ගෙන ඇත.	
7	නානායක්කාර රජවාසල අප්පුහාමිලාගේ දොන් ආතර් සිල්වා විජේසිංහ සිරිවර්ධන නම්වූ දකුණු කළුතර රිච්මන්ඩ් මන්දිරයේ සිටි පඬිකාර මුදලිතුමා තම අවසන් කැමති පත්‍රයෙන් මහාභාරකාරවරයා තම බූදලයේ අද්මිනිස්ත්‍රාසිකරු ලෙස පත්කොට 1947 ජූලි 08 දින මිය ගොස් තිබු අතර 1947 ජූලි 30 දින සිට බූදලයේ භාරකාරත්වය මහාභාරකාරවරයා සතු වී තිබුණි. අසරණ ලාංකික පිරිමි ළමුන් සඳහා "සිල්වා විජේසිංහ ජාතික ළමා නිවාසය" නමින් වූ නිවහනක් ඇති කර අධ්‍යාපනය මඟින් ලබන පුහුණුව තුළින් නියම පුරවැසියන් වීමට ළමයින්ගේ ජීවිත හැඩගැස්වීම හා එය එංගලන්තයේ ආචාර්ය බර්නාඩෝන්ගේ නිවස ආදර්ශයට ගෙන දේශීය අවශ්‍යතාවයන්ට සරිලන අයුරින් පිහිටුවා පවත්වාගෙන යාම බූදල්කරුගේ ප්‍රධාන අරමුණ වී තිබුණි. එම අරමුණු ඉටුකිරීම සඳහා අන්තිම කැමති පත්‍රයෙන් පවරා තිබූ දේපළ වශයෙන් රිච්මන්ඩ් මන්දිරය පිහිටි රබර් හා පොල් වගාව සහිත	2021	රිච්මන්ඩ් මන්දිරයේ ශිෂ්‍ය නේවාසිකාගාරය පිළිසකර කිරීම සඳහා ඇස්තමේන්තු සකස් කර එය පිළිසකර කිරීමේ කටයුතු සඳහා ප්‍රමුඛත්වය ලබාදිය යුතු අතර මන්දිරයේ වහලය සහ අනෙකුත් අබලන්වූ ස්ථාන පිළිසකර කර ආකර්ශනීය ස්ථානයක් බවට පත් කළ යුතුය.	කොළඹ අගරදගුරු උතුමානන්ගේ මැදිහත් වීම මත ළමා නිවාසය සඳහා වෙනමම ගොඩනැගිල්ලක් ඉදි කිරීමට මූලික කටයුතු ආරම්භ කර ඇත.	අන්තිම කැමති පත්‍රයේ සඳහන් පරිදි බූදල් කරුගේ අරමුණ ඉටු වී නොතිබුණි.

අක්කර 42 ක භූමියේ ආදායම හා ගම්පහ දිස්ත්‍රික්කයේ හේනේගම පිහිටි “ඉරහඳයාව” නම් වූ අක්කර 81 ක පොල් වත්තෙන් ලැබෙන ආදායමද යොදවා ගතයුතු බව දක්වා තිබුණි.

2.9 ඕස්ට්‍රේලියානු ණය හා දේශීය ණය අධාර යටතේ සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරන ලද රජයේ රෝහල්වල සායනික අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතියේ කාර්යසාධනය ඇගයීම.

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
1	Meta Miser යන්ත්‍ර හා Incinerator යන්ත්‍ර මඟින් ජීවානුහරණය කර හා දහනය කර ඉවතලන අපද්‍රව්‍ය විධිමත් පරිදි ඉවත් කිරීම සඳහා ක්‍රමවත් වැඩපිළිවෙලක් සෞඛ්‍ය අමාත්‍යාංශය හා පළාත් පාලන ආයතන එක්ව පිළියෙල කර නොතිබීම හේතුවෙන් ඇතැම් රෝහල් ප්‍රතිකර්මිත අපද්‍රව්‍ය ලෙස ඉවතලන අපද්‍රව්‍ය රෝහල් භූමිය තුලම ගිනි තැබීමට කටයුතු කර තිබුණි. සියළුම අපද්‍රව්‍ය ජීවානුහරණ ක්‍රියාවලියේදී පරිසරයට එකතුවන අධික කළු දුම මඟින් හා වාතයට වන අධික දුර්ගන්ධය මඟින් පාරිසරික බලපෑම් ඇති වී තිබුණි.	2021	1. මධ්‍යම රජයේ රෝහල් හා පළාත් සභා රෝහල් ආවරණය වන පරිදි සායනික අපද්‍රව්‍ය කළමනාකරණය ජාතික සැලැස්මක් සකස් කර ක්‍රියාත්මක කල යුතුය. 2. ඇතැම් රෝහල් විසින් Meta Miser යන්ත්‍රයෙන් බැහැර කරන ප්‍රතිකර්මිත අපද්‍රව්‍ය නැවත පිළිස්සීමට ලක් කිරීම මඟින් හා රෝහල් භූමිය තුල බොහෝ කාලයක් ගොඩගසා තැබීමෙන් වැසි කාලයේදී එකී අපද්‍රව්‍ය ජල පෝෂක හා මුසුවීමේ අවධානම වැළැක්වීමටත්, අතිරේක පිරිවැයක් දරමින් වෙනත් සැපයුම්කරුවන් ලවා එම ප්‍රතිකර්මිත අපද්‍රව්‍ය ඉවත් කිරීම සඳහා වැයවන නිෂ්කාර්ය වියදම්	සෞඛ්‍ය ආරක්ෂණ අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ ජාතික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම අවසන් කර ඇති බව, එමෙන්ම ජාතික ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව පළාත් සෞඛ්‍ය ආරක්ෂණ අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාකාරී සැලැස්ම පළාත් 09ට අදාළව සකස් කිරිම පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන් හරහා සිදු වූ අතර එයද අවසන් කර ඇත.	2024 ඔක්තෝබර් දක්වා නිර්දේශය ක්‍රියාත්මක කර නොතිබුණි.

			වැලැක්වීමටත් පරිසරයට සිදුවන හානිය අවම කර ගැනීමටත් නිසි පියවර ගත යුතුය.		
			3. සියළුම රෝහල් අධිකාරීන් විසින් සායනික අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍රයක් වාර්ෂිකව ලබා ගත යුතුය.	මේ සම්බන්ධයෙන් අදාළ රෝහල් බලධාරීන් දැණුවත් කර ඇති අතර 2024 වර්ෂය වන විටත් සතුටුදායක ප්‍රගතියක් ලගාකරගෙන නොතිබුණි.	2024 ඔක්තෝබර් දක්වා නිර්දේශය ක්‍රියාත්මක කර නොතිබුණි.
			4. සියළු සායනික අපද්‍රව්‍ය උපද්‍රවකාරී අපද්‍රවකාරී අපද්‍රව්‍ය වන බැවින් එම අපද්‍රව්‍ය උත්පාදනය වී පැය 48 ක් ඇතුලත ජීවානුහරණය කිරීමට හැකි වන ආකාරයේ යාන්ත්‍රණයක් ස්ථාපිත කල යුතුය.	පවතින සම්පත් අනුව ප්‍රායෝගිකව ක්‍රියාත්මක කළ නොහැකි යාන්ත්‍රණයක් බව.	2024 ඔක්තෝබර් දක්වා නිර්දේශය ක්‍රියාත්මක කර නොතිබුණි.
2	විගණන පරීක්ෂාවට ලක් වු රෝහල් 09 ක නියැදියක් අතරින් මාරවිල, හලාවත, කුලියාපිටිය, පොළොන්නරුව, කෑගල්ල, කරවනැල්ල, ඇඹිලිපිටිය හා කුරුණෑගල යන රෝහල් 08 හි පොකුරු ක්‍රමය ගිවිසුමේ සඳහන් ආකාරයට නියමිත පරිදි ක්‍රියාත්මක වී නොතිබුණු අතර එම රෝහල්වල ජීවානුහරණය කරන ලද සායනික අපද්‍රව්‍ය හා දහනය කරන ලද	2021	ඇතැම් රෝහල් විසින් Meta Mizer යන්ත්‍රයෙන් කරන ප්‍රති කර්මිත අපද්‍රව්‍ය නැවත පිළිස්සීමට ලක් කිරීම මගින් හා රෝහල් භූමිය තුල බොහෝ කාලයක් ගොඩ ගසා තැබීමෙන් වැසි කාලයේදී එකී අපද්‍රව්‍ය ජල පෝෂක හා මුසුවීමේ අවධානම වැළැක්වීමටත්, අතිරේක පිරිවැයක් දරමින් වෙනත් සැපයුම්කරුවන් ලවා එම ප්‍රතිකර්මිත	රෝහල් විසින් භාවිතා කරනු ලබන Meta Mizer යන්ත්‍ර සේවා හි නඩත්තු ගිවිසුම් අවසන් වී ඇති බැවින් වර්තමානය වන විට මෙම Meta Mizer යන්ත්‍ර ආසාධිත අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා භාවිතා නොවන අතර ඒ සඳහා රෝහල් විසින් විකල්ප ක්‍රම භාවිතයට	මෙම තත්ත්වය තුළ ව්‍යාපෘතිය සම්පූර්ණයෙන්ම අසාර්ථක වි තිබුණි.

	සායනික අපද්‍රව්‍ය පළාත් පාලන ආයතන මඟින් ගෙන යාමේ වැඩ පිළිවෙලක් අමාත්‍යාංශය මැදිහත් වීමෙන් පිළියෙල කර නොතිබුණු බැවින් අදාල අපද්‍රව්‍ය රෝහල් භූමිය තුලම ගොඩගසා තිබුණි.		අපද්‍රව්‍ය ඉවත් කිරීම සඳහා වැයවන නිශ්කාර්ය වියදම් වැළැක්වීමටත් පරිසරයට සිදු වන හානිය අවම කර ගැනීමටත් නිසි පියවර ගත යුතුය.	ගනු ලබයි.	
3	මාරවිල මූලික රෝහලෙන් බැහැර කරනු ලබන තියුණු අපද්‍රව්‍ය (Sharp Waste) රෝහල් භූමිය තුල ගිනි තබා තිබු අතර ගිනිබත් නොවුණු සිරින්ජර්වල ප්ලාස්ටික් හා තියුණු කොටස් රෝහල් භූමිය තුල දමා තිබුණි.	2021	ඇතැම් රෝහල් විසින් Meta Mizer හා Incinerator යන්ත්‍ර පැවතියදී සිරින්ජර් කටු හා හිස් ඖෂධ කුප්පි රෝහල් භූමිය තුල අවිධිමත් ලෙස බැහැර කර තිබුණු බැවින් ඒ සම්බන්ධයෙන් සොයා බලා නිසි පියවර ගත යුතුය.	සියළු රෝහල් සඳහා සායනික අපද්‍රව්‍ය බැහැර කිරිම හා දහනය සම්බන්ධ නිසි උපදෙස් ලබා දීමට කටයුතු කරන ලෙස උපදෙස් ලබා දී ඇති බව.	ප්‍රමාණවත් ප්‍රගතියක් ලබාගෙන නොතිබුණි.
4	අමාත්‍ය මණ්ඩලය පත් කල ස්ථාවර සමාලෝචන කමිටුව විසින් පත් කල ව්‍යාපෘති කමිටු සාමාජිකයින් දෙදෙනෙකු විසින් ඕස්ට්‍රේලියාවට ගොස් Meta Mizer යන්ත්‍ර පිලිබඳව සිදු කල භෞතික පරීක්ෂාවට අදාලව නිකුත් කර තිබුණු 2012 මාර්තු 12 දිනැති පලමු වාර්තාව ප්‍රකාරව, මෙම ව්‍යාපෘතිය මඟින් ආනයනය කරන Meta Mizer Incinerator යන්ත්‍ර මඟින් සායනික අපද්‍රව්‍ය ජීවානුහරණය හා පිළිස්සීමට වැය වන පිරිවැය (recurrent Expenditure) අපද්‍රව්‍ය කිලෝවකට රු.23 ක් බවත්, බාහිරින් සේවාව	2021	ඕස්ට්‍රේලියානු ණය ආධාර හා දේශීය ණය ආධාර ව්‍යාපෘතියේ සැලසුම් කල විෂය පථයෙන් සියයට 50 ක් පමණ වෙනස් කරමින් වෙනත් පුද්ගලික ආයතනයක් සමඟ සායනික අපද්‍රව්‍ය බැහැර කිරීමේ ගිවිසුම්වලට එළඹීම හේතුවෙන් මෙම ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණු අපද්‍රව්‍ය කළමනාකරණය කිරීමේ පොකුරුගත සැලැස්ම අඩාල වී තිබුණි. මුල් සැලැස්ම අනුව යන්ත්‍ර සවි කිරීමට යෝජිත	අතිරේක ලේකම් (ඉංජිනේරු) ප්‍රධානත්වයෙන් කමිටුවක් පත් කර ඇති අතර කමිටුවේ නිර්දේශ මත ඉදිරි ක්‍රියාමාර්ග ගත යුතු බව.	2024 ඔක්තෝබර් දක්වා නිර්දේශය ක්‍රියාත්මක කර නොතිබුණි.

ලබා ගැනීම සඳහා අපද්‍රව්‍ය කිලෝවකට රු.62.50 ක් වැය වන බවත් ඒ අනුව ඕස්ට්‍රේලියානු ණය හා දේශීය ණය ආධාර ව්‍යාපෘතිය ඉතා ඵලදායීත්වයකින් යුතු බවත් සඳහන් කර තිබූ නමුත් සෞඛ්‍ය අමාත්‍යවරයා විසින් අමාත්‍ය මණ්ඩලය වෙත 2018 ජුනි 22 දිනැතිව ඉදිරිපත් කර තිබුණු අමාත්‍ය මණ්ඩල සංදේශය මඟින් මෙම ඕස්ට්‍රේලියානු ණය හා දේශීය ණය ආධාර ව්‍යාපෘතිය යටතේ අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා කිලෝවකට රු.212 ක් වැයවන බවත් සායනික අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා බාහිර පාර්ශවයන්ට කිලෝවක් රු.103 කට ලබා දීමට හැකි බවත් ඒ අනුව රජයට රු.109 ක ඉතිරියක් සිදු වන බවත් දන්වා තිබුනි.

එම කරුණු සලකා බලා බස්නාහිර, දකුණ හා මධ්‍යම පළාත්වල සායනික අපද්‍රව්‍ය බැහැර කිරීමේ කොන්ත්‍රාත්තුව සඳහා පෞද්ගලික සමාගමක් වන සිසිලි හනාරෝ එන්කෙයා සමාගම සමඟ වාණිජ ගිවිසුමකට එළඹීමට 2018 ජුනි 26 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී තිබීමෙන් ඔස්ට්‍රේලියානු ණය හා දේශීය ණය රෝහල්වලින් බැහැරව විධිමත් අනුමැතියක් රහිතව වෙනත් රෝහල්වල යන්ත්‍ර සවි කිරීමත්, යන්ත්‍ර සවි කරන ලද රෝහල් අනුව නව පොකුරු සැලැස්මක් ස්ථාපිත නොකිරීමත් මත ව්‍යාපෘතිය මඟින් අපේක්ෂිත අරමුණු සාර්ථකව ඉටුකර ගැනීමට නොහැකි වීම පිළිබඳව අවධානය යොමු කර අවශ්‍ය නිවැරදි කිරීම් සිදු කිරීමට කටයුතු කල යුතුය.

	ආධාර ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමෙන් කිසිදු පිරිවැය ඉතිරියක් ලබා ගත නොහැකි වී තිබුණු බව නිරීක්ෂණය විය.				
5	මෙම ව්‍යාපෘතිය යටතේ 2017 පෙබරවාරි 27 දින අම්පාර මහ රෝහලේ ස්ථාපිත කර තිබුණු Meta Mizer යන්ත්‍රයෙන් බැහැර වන අපද්‍රව්‍ය කොටස් කැබලි සහිත වීම හා ඒවා බැහැර කිරීමට ක්‍රමවේදයක් නොතිබීම හේතුවෙන්ස්ථාපිත කල දින සිට ක්‍රියාත්මක නොකර නිෂ්කාර්යව තිබුණි. මීට අමතරව අනෙකුත් රෝහල්වල සවි කරන ලද Meta Mizer යන්ත්‍ර ස්ථාපිත කල දින සිට මෙම වාර්තාවේ දිනය දක්වා අවස්ථා ගණනාවකදී ක්‍රියා විරහිතව පැවති බව නිරීක්ෂණය විය.	2021	අම්පාර දිස්ත්‍රික් මහ රෝහලේ සවි කර ඇති Meta Mizer යන්ත්‍රය කඩිනමින් ක්‍රියාත්මක තත්වයට පත් කිරීමට කටයුතු කල යුතුය.	අතිරේක ලේකම් (ඉංජිනේරු) ප්‍රධානත්වයෙන් කමිටුවක් පත් කර ඇති අතර කමිටුවේ නිර්දේශ මත ඉදිරි ක්‍රියාමාර්ග ගත යුතු බව.	2024 ඔක්තෝබර් දක්වා නිර්දේශය ක්‍රියාත්මක කර නොතිබුණි.
6	මාරවිල මුලික රෝහලේ Meta Mizer යන්ත්‍රයට අවශ්‍ය ජල ප්‍රමාණය අවශ්‍ය පීඩනයෙන් නොලැබීම හේතුවෙන් යන්ත්‍රය වරින්වර සංඥා (Alam) නිකුත් කර නවතින බැවින් යන්ත්‍ර වාරයකට ගත වන කාලය මිනිත්තු 51 ක් පමණ විය.	2021	1. යන්ත්‍ර ක්‍රියාවිරහිතවීම් හා දෝෂ සහිත තත්වයන් උද්ගතවන අවස්ථාවලදී එම යන්ත්‍ර කඩිනමින් යථා තත්වයට පත් කිරීම සඳහා සුදුසු යාන්ත්‍රණයක් හඳුන්වා දිය යුතුය.	සායනික අපද්‍රව්‍ය කළමනාකණය සම්බන්ධයෙන් වන ගැටළු පිළිබඳව රේඛීය අමාත්‍යාංශය හා පළාත් සභා යටතේ පවතින රෝහල් ද ආවරණය වන අයුරින් මෙම විගණන නිර්දේශ ක්‍රියාත්මක විය යුතු බවත් ඒ සම්බන්ධ	2024 ඔක්තෝබර් දක්වා නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.
7	Meta Mizer යන්ත්‍රයේ ක්‍රියාකාරීත්වය සඳහා අත්‍යාවශ්‍ය කොටසක් වන හයිඩ්‍රොලික් පද්ධතියේ ක්‍රියාකාරීත්වය		2. ඉන්සිනරේටර් යන්ත්‍රවල නිසි ක්‍රියාකාරීත්වය සඳහා අවශ්‍ය ප්‍රශස්ථ		

	සඳහා අවශ්‍ය හයිඩ්‍රොලික් තෙල් සපයන තෙල් ටැංකියේ අසාමාන්‍ය ලෙස තෙල් අඩුවීමක් සිදුවන නිසා හලාවත දිස්ත්‍රික් මහ රෝහලේ සවි කරන ලද යන්ත්‍රයෙන් සංඥා නිකුත්වීමත් අපද්‍රව්‍ය ජීවානුහරණ ක්‍රියාවලියේදී නිතර යන්ත්‍රය නැවතීමත් සිදුවන බව නිරීක්ෂනය විය. ඒ හේතුවෙන් යන්ත්‍ර ක්‍රියාකරු විසින් යන්ත්‍රයේ හයිඩ්‍රොලික් පද්ධතියට අදාල සංවේදකයේ (Sensor) යන්ත්‍රය සමඟ ඇති සම්බන්ධතාවය විසන්ධි කර යන්ත්‍රය ක්‍රියාත්මක කරන බව නිරික්ෂණය විය.		උෂ්ණත්වය පවත්වාගෙන යාමට බලපාන තාක්ෂණික ගැටළු නිරාකරණය කර ගැනීමට කටයුතු කල යුතුය	අධීක්ෂණය නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාරිසරික, වෘත්තීය සෞඛ්‍ය හා ආහාර ආරක්ෂණ) හරහා සිදු කරන ලෙසත් උපදෙස් ලබා දී ඇති බව.	
8	Meta Mizer යන්ත්‍රයට ඇතුලත් කරන සායනික අපද්‍රව්‍ය ජීවානුහරණය කිරීමෙන් පසු කුඩා කොටස්වලට කැපී ඉතිරිවන ද්‍රව්‍යවල බැක්ටීරියා හෝ වෙනත් විෂබීජ නොමැති බවටත්, එම ද්‍රව්‍ය සාමාන්‍ය අපද්‍රව්‍ය බැහැර කිරීමේ ක්‍රමවේදයට බැහැර කිරීමට සුදුසු තත්වයේ පවතින බවටත් අමාත්‍යාංශය විසින් ස්වාධින පරීක්ෂණයක් මඟින් තහවුරු කරගෙන නොතිබුණි. එසේම රෝහල විසින් සිලින්ජර් වැනි ප්ලාස්ටික් අපද්‍රව්‍ය හා එන්නත් කටු වැනි අපද්‍රව්‍යද මෙම Meta Mizer යන්ත්‍රයට ඇතුලත්	2021	Meta Mizer යන්ත්‍රයට ඇතුලත් කරන සායනික අපද්‍රව්‍ය ජීවානුහරණය කිරීමෙන් පසු ඉතිරිවන ද්‍රව්‍යවල බැක්ටීරියා හෝ වෙනත් විෂබීජ නොමැති බවට ස්වාධීන පරීක්ෂණයක් මඟින් තහවුරු කිරීමට හා ඒ පිලිබඳව පළාත් පාලන ආයතනය දැනුවත් කිරීමට කටයුතු කල යුතුය.	සායනික අපද්‍රව්‍ය කළමනාකණය සම්බන්ධයෙන් වන ගැටළු පිළිබඳව රේඛීය අමාත්‍යාංශය හා පළාත් සභා යටතේ පවතින රෝහල් ද ආවරණය වන අයුරින් මෙම විගණන නිර්දේශ ක්‍රියාත්මක විය යුතු බවත් ඒ සම්බන්ධ අධීක්ෂණය නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාරිසරික, වෘත්තීය සෞඛ්‍ය හා ආහාර ආරක්ෂණ) හරහා	2024 ඔක්තෝබර් දක්වා නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

	කිරීම හේතුවෙන් එයින් ජනිත වන ප්‍රතිකර්මිත අපද්‍රව්‍ය තුල ප්ලාස්ටික් හා එන්නත් කටු කැබලි ඉගිරිව තිබුණි. මේ හේතුවෙන් පළාත් පාලන ආයතන විසින් එම ද්‍රව්‍ය රැගෙන යාම සෘජුවම ප්‍රතික්ෂේප කල අවස්ථා පැවති අතර රෝහල් භූමිය තුල එම ද්‍රව්‍ය ගොඩගසා තිබීම හේතුවෙන් රෝගී සත්කාරක සේවා වෙත අහිතකර බලපෑම් සිදු විය.			සිදු කරන ලෙසත් උපදෙස් ලබා දී ඇති බව.	
9	අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 13/0416/509/021/ටීබීආර් හා 2013 මැයි 09 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී ගන්නා ලද තීරණවලට අනුව ව්‍යාපෘතියේ කාර්ය මණ්ඩල අවශ්‍යතාවයන් හා පරිශ්‍රමික ගෙවීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමටත්, අනුමත කාර්ය මණ්ඩලය අමාත්‍යාංශයේ දෛනික වැඩ කටයුතුවලට කිසිදු බාධාවක් ඇති නොවන පරිදි අර්ධ කාලීන පදනමින් සේවයේ යොදා ගැනීමටත් කටයුතු කල යුතු විය. නමුත් එලෙස අනුමැතියක් ලබා ගැනීමකින් තොරව ඉහත සඳහන් අමාත්‍ය මණ්ඩල තීරණයට අනුකූල නොවන පරිදි මෙන්ම	2021	කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව පත් කරන ලද කාර්ය මණ්ඩලය සඳහා ගෙවන ලද පරිශ්‍රමික වගකිව යුතු පාර්ශවයන්ගෙන් අය කර ගත යුතුය.	විගණකාධිපති විසින් ලබා දි ඇති නිර්දේශ සම්බන්ධයෙන් අදාළ අංශ දැණුවත් කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් පවතින බව.	2024 ඔක්තෝබර් දක්වා නිර්දේශය ක්‍රියාත්මක කර නොතිබුණි.

2007 අප්‍රේල් 05 දිනැති අංක 33 හා 2016 මාර්තු 24 දිනැති අංක 01/2016 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛවලට අනුකූල නොවන පරිදි ව්‍යාපෘති කාර්ය මණ්ඩලයේ 5 දෙනෙකු සඳහා පරිශ්‍රමික ලෙස 2016 සැප්තැම්බර් සිට 2019 ඔක්තෝම්බර් දක්වා කාලපරිච්ඡේදය තුළදී රු.3,945,476 ක් ගෙවා තිබුණි.ව්‍යාපෘති කාර්ය මණ්ඩලය සඳහා අනුමැතිය ලබා ගත් බව අමාත්‍යාංශ ලේකම්වරයා විසින් 2020 ජුලි 23 දින දන්වා තිබුණු නමුත් ඒ බව සනාථ කරන ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

2.10 එළවළු බීජ දේශීය වශයෙන් නිෂ්පාදනය කිරීමේ ක්‍රියාවලියේ කාර්ය සාධනය ඇගයීම

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
1	කෘෂිකර්ම දෙපාර්තමේන්තුව යටතේ පවතින බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන මධ්‍යස්ථානයට අයත් පරිපාලන කටයුතු, බීජ නිෂ්පාදන ගොවිපල, බීජ ගබඩා, බීජ අලෙවිසැල් සහ බීජ නිෂ්පාදන යන්ත්‍ර නඩත්තු කිරීමට සහ වර්ධනය කිරීමට මෙන්ම සේවක වැටුප් සඳහා ආයතනය විසින් දරන ලද පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම් වල එකතුව 2017 වර්ෂයේ සිට 2019 දක්වා පිළිවෙලින් රුපියල් මිලියන 75 ක්, රු. මිලියන 115 ක් සහ රු. මිලියන 127 ක් වැය කර තිබුණද බීජ නිෂ්පාදනය සහ සම්බන්ධ බීජ නිෂ්පාදන ගොවිපල 27 හි නිෂ්පාදන ගොවිපලවල් වල කාර්ය සාධනය පහළ මට්ටමක පැවතුණි. තවද, බීජ නිෂ්පාදන වැඩසටහන අනුව රජයේ බීජ නිෂ්පාදන ගොවිපල මගින් එළවළු බීජ නිෂ්පාදනය කිරීම පිළිබඳව බීජ ගොවිපළ 09 ක තොරතුරු අනුව බීජ නිෂ්පාදන ඉලක්ක සපුරා ගැනීම දුර්වල මට්ටමක	2021	බීජ හා රෝපණ ද්‍රව්‍ය මධ්‍යස්ථානය විසින් රටේ අවශ්‍යතාවයට ප්‍රමාණවත් බීජ සැපයීම සඳහා වගා කන්න පදනම මත සකස් කරන ලද බීජ නිෂ්පාදන වැඩසටහන නිවැරදි සහ කාලීන තොරතුරු පදනම් කරගෙන සැලසුම් කළ යුතුය. එම බීජ නිෂ්පාදන වැඩසටහන තථ්‍ය තොරතුරු සමඟ සසඳා විචලතාවයන් අවම කිරීමට ඉදිරි පියවර ගත යුතුය.	කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මඟින් නිර්දේශිත එළවළු බෝග 19 ක ප්‍රභේද 72 ක බීජ රජයේ ගොවිපළ වල නිෂ්පාදනය කරනු ලබන අතර, කොන්ත්‍රාත් ගොවීන් සමඟ ඇති කරගත් ගිවිසුම්ගත ක්‍රමයක් මඟින් හා පුද්ගලික අංශයේ නිෂ්පාදන දායකත්වය මඟින් දේශීය එළවළු බීජ අවශ්‍යතාවය සපුරා ගනී.	කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ රජයේ බීජ නිෂ්පාදන ගොවිපල හා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ගිවිසුම්ගත කොන්ත්‍රාත් ගොවීන් සහ පෞද්ගලික අංශයේදී දායකත්වය මගින් දේශීය එළවළු බීජ නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා පියවර ගෙන ඇත. පූර්ණ ආරක්ෂිත පොලිතීන් ගෘහ වැසි ආවරණ 80 කට වැඩි ප්‍රමාණයක් මාළු මිරිස්, වම්බටු, තක්කාලි, කරවිල යන බීජ වර්ග නිෂ්පාදනයට යොදාගෙන ඇත. වර්තමානයේ ගොවීන් වැඩි අස්වැන්නක් ලබා දෙන දෙමුහුම් ප්‍රභේද වගාවට යොමු වී ඇති බැවින් දෙමුහුම් බීජ විශාල

	පවතින බව නිරීක්ෂණය විය.				ප්‍රමාණයක් ආනයනය කිරීම වර්තමානය වන විටද සිදුවේ.
2	කෘෂිකර්ම දෙපාර්තමේන්තුව බීජ සහතික කිරීමේ සේවය මඟින් බීජ වල ගුණත්වය තහවුරු කිරීම සඳහා බීජ සහතික කරන සේවාව ලබාදීම සහ බීජ පනත ක්‍රියාත්මක කිරීම යන ප්‍රධාන ආකාර 2කට ක්‍රියාත්මකය. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිෂ්පාදිත සියළුම අභිජනන බීජ තොග වල සෞඛ්‍ය තත්ත්වය පරීක්ෂා කිරීම 2017 වර්ෂයේ සිට ආරම්භ කර තිබෙන අතර, වී අතිරේක ආහාර බෝග සහ එළවළු බෝග ඇතුළු බාණ්ඩ වලට අයත් අභිජනන බීජ වල සෞඛ්‍ය තත්ත්වය පරීක්ෂා කිරීම බීජ සහතික කිරීමේ සේවය මඟින් සිදු කරනු ලබයි. එළවළු බීජ වල අනෙකුත් බීජ පන්ති වලට අයත් බීජ වල බීජ සෞඛ්‍යය පරීක්ෂා කිරීම සිදු කිරීම බීජ සහතික කිරීමේ සේවයේ සහතික කරන නිලධාරීන් ක්ෂේත්‍ර පරීක්ෂාවන් හිදී රෝග ආසාධන සහ ගැටළු සහගත තත්ත්ව ක්ෂේත්‍රයේදී නිරීක්ෂණය කරනු ලබන වගාවන්ට පමණක් සිදු කරනු ලබයි. එසේම කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ	2021	උද්‍යාන බෝග පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය විසින් ගැටළු ඇතිවිය හැකි බීජ ප්‍රභේද හඳුනාගෙන එම ගැවළු නිරාකරණය කිරීම සඳහා නිශ්චිත ක්‍රමවේදයක් සකස් කර ක්‍රියාත්මක කිරීම සහ ඉහළ පාරිභෝගික ඉල්ලුමක් පවතින කැරට් වැනි එළවළු සඳහා ප්‍රභේද වැඩි දියුණු කර ගොවීන්ට ලබා දීම.	ලංකා කැරට් ප්‍රභේදයේ පවතින දුර්වලතා හේතුවෙන් වානිජ වගාවක් ලෙස ගොවීන් අතර ප්‍රචලිත නොවුණි. ප්‍රභේදය වැඩි දියුණු කිරීමේ පර්යේෂණ නිලධාරීන් හිඟය හේතුවෙන් මන්දගාමීව සිදුවේ. තවද වාණිජ වගාවන් සඳහා නිව් කුඩෝරා කැරට් ප්‍රභේදයේ බීජ නිෂ්පාදන කටයුතු ආරම්භ තිබුණි.	

	සමාජ ආර්ථික සැලසුම් මධ්‍යස්ථානය සහ බීජ සහතික කිරීමේ සේවය 2017 වර්ෂයේදී සිදු කරන ලද “ ශ්‍රී ලංකාවේ වෙළෙඳපොළ මට්ටමේදී බීජ වල ගුණාත්මකභාවය සම්බන්ධයෙන් සිදුවන අවධානයන් ” පිළිබඳ පර්යේෂණය අනුවද වෙළෙඳපොළ තුළ අලෙවිය සඳහා ඉදිරිපත් කර තිබෙන එළවළු බීජ වල ගුණාත්මකභාවය සම්බන්ධයෙන් ගැටළු පවතින බව නිගමනය කර තිබුණි.				
3	බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන මධ්‍යස්ථානය සතුව පවතින බීජ නිෂ්පාදන ගොවිපළ 10කින් ලබාගත් තොරතුරු අනුව ගොවිපළ 05කට අදාළ ඉඩම් වල නීත්‍යානුකූල අයිතිය ලබා ගැනීමට කටයුතු කර නොතිබූ අතර, එකී ගොවිපළවල් වල පවතින භූමි ප්‍රමාණයෙන් වැඩි කොටසක් බීජ නිෂ්පාදන කටයුතු සඳහා උපරිම වශයෙන් යොදාගෙන නොමැති බව නිරීක්ෂණය විය.	2021	බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන මධ්‍යස්ථානයට අයත් බීජ නිෂ්පාදන ගොවිපළවල් 27 තුළ පවතින ප්‍රයෝජනයට නොගත් භූමි ප්‍රමාණය සංවර්ධනය කර බීජ නිෂ්පාදනය සඳහා යොදා ගැනීමට කටයුතු කිරීම සහ ගොවිපළවල් වල පවතින ජල ගැටළුව විසඳීමට අවශ්‍ය ක්‍රමවේද සකස් කිරීම.	බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන මධ්‍යස්ථානයට අයත් අලුත්තරම, අඹේපුස්ස, කුණ්ඩසාලේ යන ගොවිපලවල්වල වගාවන් සඳහා භූමිය සංවර්ධනය කර ඇත. ජල ගැටලුව සඳහා ක්‍රමවේද සකස් කරමින් පවතී. පොළොන්නරුව, මල්වත්ත, වල්පිට, කුණ්ඩසාලේ, යන බීජ නිෂ්පාදන ගොවිපළවල් තුළ බින්දු ජල සම්පාදන පද්ධති සම්පාදන පද්ධති ස්ථාපිත කිරීම. තෙලිජ්ජවිල, එළුවන්කුලම	බීජ නිෂ්පාදන ගොවිපළවල් 3 ක හෙක්ටයාර 8 ක් වගාව සඳහා සංවර්ධනය කර තිබුණි. බීජ ගොවිපළ 4 ක විසුරුම් ජල සම්පාදන පද්ධති ස්ථාපිත කිරීම, බීජ ගොවිපළ දෙකක නළ ළිං ස්ථාපනය, වගා ළිං ස්ථාපනය, බීජ නිෂ්පාදන ගොවිපළ තුළ පවතින වැව් ප්‍රතිසංස්කරණය කිරීම් ඇතුළු සංවර්ධන කටයුතු සිදුකරමින් පවතී.

		රජයේ බීජ නිෂ්පාදන ගොවිපළවල නළ ළිං ස්ථාපනය කිරීම. කුණ්ඩසාලේ බීජ ගොවිපළ තුල වගා ළිඳක් ප්‍රතිසංස්කරණය, පොළොන්නරුව, අළුත්තරම, බටඅත, කරදියන් ආරු රජයේ බීජ ගොවිපළවල ජලාශ ප්‍රතිසංස්කරණය කිරීම. මහ ඉලුප්පල්ලම, පරන්තන්, මුරුන්කන් රජයේ බීජ ගොවිපළවලට අදාල ජල මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම.

2.11 නව පුනර්ජනනීය බලශක්ති මූලාශ්‍ර සංවර්ධනය කිරීමේ ක්‍රියාවලිය ඇගයීම.

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
1	කේන්ද්‍රීය සම්බන්ධීකරණ යාන්ත්‍රණයක් මඟින් පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති අනුමැතිය සඳහා වැයවන වසර 02 ටද වැඩි දීර්ඝකාලය අවම කෙරෙනු ඇති බවට ජාතික ප්‍රතිපත්තිය තුළ ඇතුළත්වුවද මෙතෙක් ඒ සඳහා අවශ්‍ය පියවර ගෙන නොතිබුණි. මේ හේතුවෙන් ව්‍යවසායකයින්ගේ වටිනා කාලය, ධනය, ශ්‍රමය අනවශ්‍ය පරිදි වැයවීම හේතුවෙන් ඔවුන් අධෛර්යමත් වී ව්‍යාපෘති අතහැර දැමීමට සිදුවීම හා නව බලශක්ති ප්‍රභවයන් ජාතික විදුලිබල ජාලයට එක්කර ගැනීමේ අවස්ථා එමගින් මගහැරී තිබුණි.	2022	ජාතික විදුලිබල ප්‍රතිපත්තියෙහි පුනර්ජනනීය බලශක්තියෙහි දායකත්වය ඉහළ නැංවීම යටතේ, සම්මත මිල ක්‍රමවේදය සක්‍රියව පැවති අවධියේ සුනිත්‍ය බලශක්ති අධිකාරිය වෙත ඉදිරිපත් වූ එනමුත් එම ක්‍රමවේදය නතරවූ බැවින් ප්‍රගතියක් නොලද දැනට අනුමැති ක්‍රියාවලියේ විවිධ අවස්ථාවල ඇති අයදුම්පත් සුදුසු අන්තර්කාලීන වැඩ පිළිවෙලක් මඟින් තරඟකාරී ක්‍රමවේදයකට යොමු කිරීම තුලින් සංවර්ධනයට පියවර ගැනිම.	මෙම ව්‍යාපෘතීන් සඳහා අදාල නිර්දේශයන් දීර්ඝ කර ගැනීමේ නියමිත ආයතනයන් සමඟ සාකච්ඡා පවත්වා මෙම නිර්දේශයන් නිකුත් කිරීමට අදාල ඉල්ලීම් යොමු කරන ලදී.	මෙම ව්‍යාපෘතීන් අතරින් පරිසර අධිකාරියේ අනුමැතීන් දීර්ඝ කර ගත් ව්‍යාපෘතීන් සඳහා බලශක්ති බලපත්‍ර දීර්ඝ කර ලබා දී ඇති අතර ඊට අදාල විදුලි මිලදී ගැනීමේ ගිවිසුම ලංකා විදුලි බල මණ්ඩලය සමඟ අත්සන් කර ඉදි කිරීමේ කටයුතු සිදුකර ගෙන යයි.
2	සුනිත්‍ය බලශක්ති අධිකාරියේ කාර්යභාරය යටතේ ව්‍යාපෘති අනුමත කිරීමේ කමිටුවේ (PAC) අනුමත වූ 2017 ජනවාරි 01 දින සිට 2019 දෙසැම්බර් 31 දක්වා සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් බලපත්‍ර	2022	2017 ජනවාරි 01 දින සිට ලංවීම සමග සම්මත අයක්‍රමය යටතේ විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම් අත්සන් කිරීමට නියමිත දැනට උත්පාදන බලපත්‍ර හිමි හා අභිප්‍රාය ලිපි නිකුත්	මෙලෙස නතර වී ඇති ව්‍යාපෘතීන් සඳහා අදාල බලශක්ති බලපත්‍ර දීර්ඝ කිරීමට අදාල අනුමැතීන් ලබා ගැනීමට ව්‍යාපෘති යෝජකයින්	අදාල ආයතනයන්හි අනුමැතීන් ලබා ගත් ව්‍යාපෘතීන් සඳහා බලශක්ති බලපත්‍ර දීර්ඝ කර විදුලි මිලදී ගැනීමේ ගිවිසුම් අත්සන් කරනු

	සහ තාවකාලික අනුමැතිය ලබාදී ඇති සහ ජාල එකඟතාවයට ඉදිරිපත් කර ඇති මෙගා වොට් 4,014.84 ක ව්‍යාපෘති 1,374 ක ක්‍රියාකාරිත්වය තරගකාරි මිල කැඳවුම් ක්‍රමයට අවතීර්ණ වීම නිසා ලං.වී.ම විදුලි බලය මිලදී ගැනීමේ ගිවිසුම් අත්සන් නොකිරීම හේතුවෙන් නතරවී තිබුණි.		කළ ව්‍යාපෘති 1,374 ක් වර්ෂ 03 දක්වා ප්‍රමාද වී ඇති බැවින් සංවර්ධන කටයුතු ආරම්භ කිරීම සඳහා යෝග්‍ය කටයුතු කඩිනමින් සම්පාදනය කිරීම සුදුසු වේ.	යොමු කර අදාල ආයතන සමඟ එසේ අනුමැතීන් ලබා ගැනීමට ඇති ගැටළු නිරාකරණය කිරීමට පියවර ගන්නා ලදී.	ඇත.
3	නව පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති සංවර්ධනය සඳහා හඳුන්වා දී ඇති මාර්ගෝපදේශය ඉතා සංකීර්ණ ක්‍රියාදාමයකින් යුක්ත වේ. එය වඩාත් සරල ඵලදායී ක්‍රමවේදයක් විය යුතුයි. මෙය ආයෝජකයින්ට අවශ්‍ය අනුමැතින් සහ බලපත්‍ර ලබාගැනීමට නොහැකි වන පරිදි අධික වෙහෙසක් හා කාලයක් ගත වන ක්‍රියාවලියක් බවට පත් වී ඇත. සංවර්ධකයින්ට උත්පාදන බලපත්‍රය ලබාගැනීමේදී අදාළ රාජ්‍ය ආයතන 10න් (Line Agencies) අනුමැතිය ලබා ගත යුතු වේ. බලශක්ති බලපත්‍රය ලබාදෙන අවස්ථාව වන විට මධ්‍යම පරිසර අධිකාරිය, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව හා වනජීවි දෙපාර්තමේන්තුව වැනි ආයතන වලින්	2022	1. 2007 අංක 35 දරන ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරි පනතේ 21 වගන්තිය ප්‍රකාරව ව්‍යාපෘතිය පටන් ගැනීමට හා විදුලිය ජනනයට වසර 02 කාලයක් තුළදී අපොහොසත් වන විට හෝ නියම හා කොන්දේසි උල්ලංඝනය කරන විට අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ඇතිව අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අනෙකුත් සම්බන්ධිත ආයතන සමඟ සාකච්ඡා කර කඩිනමින් සුදුසු පියවර ගැනීම. 2. පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘතීන්ට අදාළව විවිධ	පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති සංවර්ධනයට අදාලව විවිධ ආයතනවලින් ලබා ගත යුතු අනුමැතීන් ලබා ගැනීමට පැන නැඟී ඇති ගැටළු විසඳීම සඳහා අදාල ආයතන නියෝජිතයින්ගෙන් සැඳුම්ලත් කමිටුවක් පවත්වා එම කමිටුව තුලින් ආයතනික ගැටළු නිරාකරණයට පියවර ගන්නා ලදී.	ඒ අනුව අදාල ආයතන මඟින් අනුමැතීන් ලබා ගත් ව්‍යාපෘතීන් සඳහා අදාල බලශක්ති බලපත්‍ර නිකුත් කර ඇත.

ලබාගෙන ඇති අනුමැතීන්ගේ කාලය ඉකුත්වීම නිසා නැවත එම අනුමැතීන් දීර්ඝ කරගැනීමට ව්‍යාපෘති සංවර්ධනකරුට සිදු වේ. එමනිසා උත්පාදන බලපත්‍ර ලබා ගැනීමට වසර 02 සිට වසර 05 දක්වා කාලයක් ගත කිරීමට සංවර්ධකයෙකුට සිදුවන බව නිරීක්ෂණය වේ.	ආයතනවලින් අනුමැතීන් ලබාගැනීමේ ප්‍රමාදයන් හේතුවෙන් බොහෝ ව්‍යාපෘතීන් ආරම්භ කිරීම ප්‍රමාදවී ඇති බැවින් අදාළ ආයතනයන් සම්බන්ධිකරණය කර ගනිමින් එකී ප්‍රමාදයන් වලක්වා ගැනීමට යාන්ත්‍රනයක් සකස් කිරීම.

2.12 දේශීය වෙළඳපොල තුළ ගුණාත්මක භාණ්ඩ අලෙවිය පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ කාර්යභාරය

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
1	ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය, පාරිභෝගික ආරක්ෂණ අධිකාරිය හා ශ්‍රී ලංකා රේගුව යන ආයතන අතර ආනයනය කරනු ලබන සෑම භාණ්ඩ තොගයක් සම්බන්ධයෙන්ම මනා අන්තර් සම්බන්ධයක් පැවතිය යුතු වුවත් ඒ සඳහා සකස් කළ ක්‍රමවේදයක් නොමැති බව නිරීක්ෂණය වූ අතර ඒ හේතුවෙන් ගුණාත්මක බවින් තොර භාණ්ඩ වෙළඳපොළට නිකුත් වීමේ වැඩි අවධානමක් පවතින අතර එවැනි ප්‍රමිතියෙන් තොර භාණ්ඩ වෙළඳපොළට නිකුත් වූ අවස්ථාද ශ්‍රී ලංකා රේගුවේ ලිපිගොනු පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. ඒ සම්බන්ධයෙන් පසු විපරම් කිරීමට සුදුසු ක්‍රමවේදයක් ප්‍රමිති ආයතනය විසින් සකස් කර නොතිබුණි.	2022	තත්ත්වයෙන් උසස් සෞඛ්‍යය ආරක්ෂිත ආනයනික භාණ්ඩ වෙළඳපොළට නිකුත් වන බවට සහතික වීම සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය, පාරිභෝගික ආරක්ෂණ අධිකාරිය හා ශ්‍රී ලංකා රේගුව යන ආයතන අතර මනා අන්තර් සම්බන්ධයක් පවත්වා ගැනීමට වැඩපිළිවෙළක් ක්‍රියාවට නැංවීම.	ආනයන පරීක්ෂාව සඳහා නව භාණ්ඩ 34ක් හඳුන්වා දෙන ලදී. (අංක 2384/35, 2024-05-17 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මගින්) ආනයනික භාණ්ඩ ශ්‍රී ලංකා ප්‍රමිතිවලට අනුකූලතාවය සත්‍යාපනය කිරීම සඳහා අවශ්‍ය ක්‍රමවේද ආනයන හා අපනයන පාලන පනත යටතේ පනවා ඇති ඉහත නව රෙගුලාසියෙහි , රෙගුලාසි අංක 5 මගින් විස්තරාත්මකව දක්වා ඇත. සෑම ආනයන දැනුම්දීමක් සමගම පුද්ගලික ඇපකරයක් ඉදිරිපත් කිරීම, ක්‍රියාවලිය ආරම්භයේ සිටම	නිර්දේශ ක්‍රියාත්මක කරමින් පවතී.

	අනිවාර්ය කර ඇත. මෙම වසර තුළදී ආනයනකරුවන් දැනුවත් කිරීමේ වැඩසටහන් දෙකක් පැවත්වූ අතර, එවැනි වැඩසටහන් 3ක් වෙළඳ සංගම් (Chamber) හා Export Development Board වෙත සිදු කිරීමට කටයුතු කරන ලදී.	
	ආනයන පරීක්ෂාව සම්බන්ධ තොග පිළිබඳව තීරණය ශ්‍රී ලංකා රේගුව වෙත පද්ධතිය හරහා දැනුවත් කෙරේ. ප්‍රතික්ෂේප වන තොග සම්බන්ධව රේගුව මෙන්ම අදාල අනෙකුත් ආයතන, පාරිභෝගික අධිකාරිය වෙතද දැනුම් දෙනු ලබයි. ප්‍රතික්ෂේපිත භාණ්ඩ පිළිබද පසු විපරම සිදු කරනුයේ ආනයන අපනයන පාලකවරයා විසිනි. ඉහත නව	නිර්දේශ ක්‍රියාත්මක කරමින් පවතී.

රෙගුලාසියෙහි 8 (b) මගින් ආනයන හා අපනයන පාලකවරයා වෙත මාසිකව වාර්තා කිරීම ශ්‍රී ලංකා රේගු අධ්‍යක්ෂජනරාල් වරයාට නියෝග කොට තිබේ. ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය ආනයන අපනයන පාලකවරයාට ප්‍රතික්ෂේප වූ තොග පිළිබඳ වාර්තා අවශ්‍ය විට ලබා දීමට කටයුතු කර ඇත. තවද, ආනයනික භාණ්ඩ සම්බන්ධව යම් ගැටළුකාරී අවස්ථාවලදී පාරිභෝගික ආරක්ෂණ අධිකාරිය, ශ්‍රී ලංකා රේගුව යන ආයතන රැස්වීම් පවත්වන අතර එමගින් අදාල ආයතන අතර මනා සම්බන්ධතාවය තහවුරු කරයි. නව ගැසට් පත්‍රය හා ශ්‍රී ලංකා ප්‍රමිති ආයතන ආනයන ක්‍රියාවලිය සම්බන්ධව ශ්‍රී ලංකා රේගු නිලධාරීන්

				දැනුවත් කිරීමේ වැඩසටහන් සූදානම් කර ඇත.	
2	වෙළඳපල තුළ අලෙවි වන දුඹුරු සීනි සඳහා වූ වෙළඳ සන්නම් නාමයන් පිළිබඳ තොරතුරු පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය සතු නොවන බව දන්වා එවූ අතර ශ්‍රී ලංකාව තුළ දුඹුරු සීනි නිපදවන දේශීය නිෂ්පාදකයන් විසින් නිෂ්පාදන සහතික ලාංඡනය (SLS සහතිකය) ලබා ගත් තුන්දෙනෙකු ඇතත් ශ්‍රී ලංකා ප්‍රමිති සහතිකය එම කිසිදු ආයතනයක් විසින් ලබා ගෙන නොමැති බව නිරීක්ෂණය විය. ඒ අනුව පෙනී යන්නේ ප්‍රමිතිය අනිවාර්ය කර ඇති භාණ්ඩ වල පවා ගුණාත්මක තත්ත්වය පිළිබඳව පරීක්ෂාවක් ප්‍රමිති ආයතනය මගින් සිදු නොවන බවයි	2022	1. ප්‍රමිති ලාංඡනය අනිවාර්ය කර ඇති සහ ප්‍රමිති ලාංඡනය ලබා ඇති භාණ්ඩ සන්නාමයන් සම්බන්ධයෙන් SLS ලාංඡනය යටතේ ලියාපදිංචි වී ඇති ද, ලාංඡනය තහනම් කර ඇති ද, ලියාපදිංචිය කල් ඉකුත් වී ඇති ද , ලියාපදිංචියකින් තොරව ලාංඡනය භාවිතා කරන්නේ ද යන්න පිළිබඳව කලින් කලට වෙළඳපොළ තුළ පරීක්ෂා කර ඒ පිළිබඳ මහජනතාව දැනුවත් කිරීමට සුදුසු ක්‍රමවේදයක් පාරිභෝගික ආරක්ෂණ අධිකාරිය හා එක්ව ක්‍රියාත්මක කිරීම. 2. වාර්ෂිකව ප්‍රමිති සහතිකය ලබාගත් භාණ්ඩ වර්ග මොනවාද සහ ප්‍රමිති සහතිකය ලබාගැනීම අත්‍යාවශ්‍ය භාණ්ඩ මොනවාද , අතවශ්‍ය නමුත් ප්‍රමිති සහතිකය ලබාගැනීමට අපොහොසත් වූ භාණ්ඩ වර්ග	දේශීය දුඹුරු සීනි නිෂ්පදනාගාර හතරේම විගණනයන් සිදු කර ඇති අතර පහත නිෂ්පාදනාගාර තුනෙහි අවසන් අදියර විගණනය සම්පූර්ණ කර ඇත. 1.ගල් ඔය ප්ලාන්ටේෂන් (පුද්) සමාගම 2.ලංකා සීනි පුද් සමාගම මෙම සමාගමේ SLS සහතික සඳහා අනුමැතිය ලබා ඇත. අදාල ගාස්තු ආයතනය විසින් ගෙවූ විට SLS සහතික ලබාදිය හැක. 3.ඇතිමලේ වැව්ලි (පුද්) සමාගම (අවසාන අදියර විගණන සම්පූර්ණ කර ඇත.) සෙවනගල සීනි	නිර්දේශ ක්‍රියාත්මක කරමින් පවතී.

			මොනවාද යන්න කලින් කළට මහජනතාව දැනුවත් කිරිම සඳහා සුදුසු ක්‍රමවේදයක් ඇති කිරීම. 3. ප්‍රමිති ලාංඡනය (SLS) අනිවාර්ය භාණ්ඩ වෙළඳපොළ තුළ සුළභ කිරීමට අදාල වගකිව යුතු ආයතන වෙත යෝජනා හා නිර්දේශයන් ඉදිරිපත් කිරීමට හා බලපෑම් කිරීමට අවශ්‍ය නීතිමය බලයක් ප්‍රමිති ආයතනයට ලබා ගැනීමට කටයුතු කිරීම.	කර්මාන්ත ශාලාවේ මූලික (Pre-SLS) අදියර විගණන සිදුකර ඇත. මෙම ආයතන විසින් SLS සහතිකය ලබා ගැනීමේදී සම්පූර්ණ කලයුතු අවශ්‍යතා හැකි ඉක්මනින් සම්පූර්ණ කරන්නේ නම්, ඒ සඳහා ප්‍රමිති ආයතනය මගින් පූර්ණ සහයෝගය ලබාදී අදාල SLS සහතිකය නිෂ්පාදනාගාරව ලට කඩිනමින් ලබාදීමට කටයුතු කල හැක.	
3	රසායනාගාර ගොඩනැගිල්ලක් ඉදිකිරීම වෙනුවෙන් ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය හල්බරාවත්ත මාලඹේ ප්‍රදේශයෙන් අක්කර 03 ක ඉඩමක් මිලදි ගැනීමට සම්පූර්ණ මුදල ලෙස නාගරික සංවර්ධන අධිකාරියට රු. 168,000,000 ක් ද මීට අමතරව ඉඩම වටා වැටක් සකස් කිරීමට රු.1,165,333 ක් ද ලෙස රු. 169,165,333 ක් 2018 වර්ෂය අවසන් වන විට ගෙවීම් සිදුකර ඇතත් ඉඩමේ අයිතිය ආයතනය වෙත පවරා ගැනීමට	2022	රසායනාගාර වාර්තා නිකුත් කිරීම ප්‍රමාද වීම මත ආනයනකරුගේ ගබඩාවේ පවතින භාණ්ඩ වෙළඳ පොළට නිකුත් වීමේ අවධානමක් පවතින අතර ඇතැම් භාණ්ඩ කල්ඉකුත් වීමේ අවධානමක් ද , ඇතැම් භාණ්ඩයන්ගේ තත්ත්වයේ වෙනස්වීම් ද ඇතිවිය හැක. ඒ හේතුවෙන් තත්වයෙන් බාල භාණ්ඩ වෙළඳ පොළට නිකුත් වීමේ අවධානම අඩු කිරීම සඳහා රසායනාගාර වාර්ථා	මාලඹේ, හල්බරාවත්ත ඉඩමෙන් අක්කර 3 ක ඉඩම් කොටසක් මිලදී ගැනීමට රු 168,000,000.00 ගෙවා ඇති අතර ඉඩමේ අයිතිය ලබා දීම සම්බන්ධයෙන් නාගරික සංවර්ධන අධිකාරියට අවශ්‍ය අනුමැතිය ලබා ගැනීමේ ප්‍රමාදය හේතුවෙන් ඉඩමේ ඔප්පුව	නිර්දේශ අනුව ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත.

2021 ජූලි 31 වන විට ද නොහැකි වී තිබුණි. ඒ හේතුවෙන් ආයතන කටයුතු කරගෙන යාමේ මූලික අංගයක් වන රසායනික පරීක්ෂාවන් කාර්යක්ෂමව ඉටු කරගෙන යාම සඳහා රසායනාගාර ගොඩනැගිල්ලක් ඉදිකිරීම යන අරමුණද ඉටුවී නොතිබුණි. එසේම පවතින සීමිත අඩු පහසුකම් යටතේ රසායනාගාර පරීක්ෂණ කිරීමට ආයතනයට සිදුව තිබුණ අතර ඒ හේතුවෙන් ස්වාධීන රසායනාගාර වාර්තා ලබා ගැනීමට සීමාවන් හා ප්‍රමාදයන් පැවතීම නිරීක්ෂණය විය. තවද, රසායනාගාර පරීක්ෂාවන් සිදුකිරීම සඳහා තාවකාලික විසඳුමක් ලෙස බාහිර ගොඩනැඟිල්ලක් බද්දට ගෙන තිබූ අතර මේ සඳහා වාර්ෂිකව රු. 11,400,000 ක මුදලක් වැය කිරීමට සිදුවී තිබුණි.	ප්‍රමාදයකින් තොරව නිකුත් කිරීමට කටයුතු කිරීම.	ලබා ගැනීමට යම් ප්‍රමාදයක් පැවතිණි .මේ වන විට අදාල අනුමැතීන් ලබාගෙන ඉඩමේ අයිතිය ලබා දීම සම්බන්ධයෙන් කටයුතු අවසන් අදියරේ පවතින අතර ඔප්පුව ලබාගැනීමේ කටයුතු සිදුකරමින් පවතී. විදුලි හා විද්‍යුත් පරීක්ෂණාගාර ඒකකයේ පවත්වා ගෙන යාම සඳහා කොළඹ 08 ඩඩ්ලි සේනානායක මාවත නො:02 ස්ථානයේ පිහිටි ගොඩනැගිල්ල මාසිකව 1,300,000.00 ක් ගෙවීමේ පදනම මත මහා මණ්ඩලයේ අනුමැතිය ඇතිව ලබා ගෙන තිබේ.

2. 13 පළාත් පාලන ආයතන වැඩිදියුණු කිරීමේ ආංශික ව්‍යාපෘතියෙන් (පුරනැගුම) අපේක්ෂිත ප්‍රතිලාභ ලැබීමේ ප්‍රගතිය ඇගයීම.

	විගණන නිරික්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
1	මෙම ව්‍යාපෘතිය යටතේ රු.මිලියන 332.19ක වියදමෙන් ඉදිකරන ලද බස් නැවතුම් පොළවල් 04ක්, ජල සම්පාදන ව්‍යාපෘති 04ක්, බහුකාර්ය ගොඩනැගිලි 02ක් සහ සනීපාරක්ෂක මධ්‍යස්ථාන 03ක් අදාළ පළාත් පාලන ආයතන වෙත භාර දී තිබූ අතර සම්පූර්ණයෙන් ම නිශ්ක්‍රීයව පැවතුණු එම ව්‍යාපෘති පහත පරිදි වේ.	2022	අතහැර දමා ඇති ගොඩනැගිලි වෙනත් ඵලදායී කාර්යයන් සඳහා යොදා ගැනීමේ හැකියාව සොයා බැලිය යුතුය.	මෙහි දැක්වෙන වියදමෙන් රු.මිලියන 156.61 ක වියදමෙන් සිදුකරන ලද ජල සම්ප්‍රාදන ව්‍යාපෘති 4 ක්, රු.මිලියන 64.62 ක වියදමෙන් ඉදිකරන ලද බස් නැවතුම්පොළව ල් 02 සහ රු.මිලියන 2.81 ක වියදමෙන් ඉදිකරන ලද සනීපාරක්ෂක මධ්‍යස්ථානයක් මේ වන විට ක්‍රියාත්මක වේ. මුළු උපයෝජනය රු.මි.224.04 මෙම උප ව්‍යාපෘති නිශ්කාර්යය හෝ ඌන උපයෝජන ලෙස හෝ 2022 හා 2023 කළමණාකරණ වාර්තාවල දක්වා නොමැත.	අනෙකුත් උප ව්‍යාපෘති නිශ්කාර්යය හෝ ඌන උපයෝජන ලෙස හෝ 2022 හා 2023 කළමණාකරණ වාර්තාවල දක්වා නොමැත. මේ වන විට ව්‍යාපෘතිය වැඩ අවසන් කර වසා දමා ඇත.

අනු අංක	උප ව්‍යාපෘතිය	වියදම (රු.මි)
1	වනාත විල්ලුව ජල යෝජනා ක්‍රමය	57.97
2	විල්ගමුව ජල යෝජනා ක්‍රමය	57.19
3	මදුරාවල ප්‍රාදේශීය සභාවේ දික්ලන්ද ජල යෝජනා ක්‍රමය	26.83
4	මහව පොල්පිතිගම ජල යෝජනා ක්‍රමය	14.62
5	රිදීගම බස් නැවතුම්පොළ	43.49
6	මිගහකිවුල බස් නැවතුම්පොළ	33.51
7	කිරම බස් නැවතුම්පොළ	31.11
8	ලංකාපුර බස් නැවතුම්පොළ	11.33
9	ඉඹුල්පේ බහුකාර්ය ගොඩනැගිල්ල	34.08
10	හල්දුම්මුල්ල බහුකාර්ය ගොඩනැගිල්ල	12.46
11	ඉපලෝගම, පලාගල, තිරප්පනේ, සතිපාරක්ෂක මධ්‍යස්ථාන	9.60 --------
	එකතුව	332.19

2	රු.මිලියන 513.73ක වියදමෙන් ඉදිකරන ලද බහුකාර්ය ගොඩනැගිලි 12ක් ද, රු.මිලියන18.90ක වියදමෙන් ඉදිකරන ලද පුස්තකාලයක් ද, රු.මිලියන 105.06ක වියදමෙන් ඉදිකරන ලද සතිපොළවල් 03ක් ද විවිධ හේතු මත ඌන උපයෝජිතව පැවතුණි.	2022
3	මෙම ව්‍යාපෘතිය යටතේ ඉදිකිරීම් නිමකර පළාත් පාලන ආයතනවලට භාර දෙන ලද උප ව්‍යාපෘති අතුරින් උපව්‍යාපෘති 16කින් අපේක්ෂිත ප්‍රතිලාභ අත්කර ගැනීමට	2022

	නොහැකි වී තිබූ බව විගණන නියැදි පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.	
4	මාතෘ සායන, වෛද්‍ය සායන, පෙර පාසල්, දිවා සුරැකුම් මධ්‍යස්ථාන, පුස්තකාල, ශ්‍රවණාගාර ආදී අංගවලින් සමන්විතව ඉදිකරන ලද බහුකාර්යය ගොඩනැගිලි අපේක්ෂිත කාර්යයන්වලට භාවිත නොකර ප්‍රාදේශීය සභා කාර්යාල ලෙස භාවිත කරනු ලබන බව නියැදි විගණන පරීක්ෂාවේදී තහවුරු විය.	2022

2.14 ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන යටතේ ග්‍රාමීය ප්‍රජාව සහ සමාජ ආර්ථික මධ්‍යස්ථාන අතර මාර්ග ප්‍රවේශතාවය වැඩිදියුණු වීමේ කාර්යසාධන වාර්තාව.

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
1	ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩ සටහන යටතේ ව්‍යාපෘති 05 ක් ඔස්සේ දකුණ, සබරගමුව, මධ්‍යම, වයඹ, උතුරුමැද පළාතේ සහ කළුතර දිස්ත්‍රික්කයේ ග්‍රාමීය මාර්ග කි.මී. 3,143 සහ ජාතික මාර්ග කි.මී. 400 ක් පුනරුත්ථාපනය කිරීමට සැලසුම් කර තිබූ අතර ආසියානු සංවර්ධන බැංකුව විසින් බහු අදියර මූල්‍යයන පහසුකම යටතේ අදියර 06 කින් මූල්‍යයනය කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේවෙතත්, මෙලෙස ආසියානු සංවර්ධන බැංකුව මඟින් ඉදිරිපත් කරන ලද මූල්‍ය සැලසුම් වලට අනුව එම එක් එක් අදියරයෙන් කොපමණ මුදලක් එක් එක් ගිණුම් වර්ෂයන්ට එක් එක් පළාත්වල මාර්ග පුනරුත්ථාපනය සඳහා වැය කිරීමට අපේක්ෂා කරන්නේද, එලෙස වෙන්කරන ලද මුදල් කාර්යක්ෂමව හා ඵලදායීව අදාල මාර්ග පුනරුත්ථාපනය කිරීම සඳහා උපයෝජනය කර	2022	අදියර වශයෙන් ලබාගන්නා ණය මුදල් වලින් උපයෝජනය කරන ලද ණය ගිවිසුම් තුලින් ජනනය වූ වත්කම් නිශ්චිතව හඳුනාගැනීමට ක්‍රමවේදයක් සකස් කල යුතුය.	එක් එක් මාර්ග හෝ පැකේජ වෙනුවෙන් ණය අදියරයන් වෙන්කොට නොතිබීම නිසා ඒ අනුව වෙන් වශයෙන් ගිණුම් තැබීමට නොහැකි නමුත් භාරගැනීමේ සහතික (Taking over Certificate) නිකුත් කර ඇති මාර්ග වෙනුවෙන් වැය කරන ලද සත්‍ය පිරිවැය ගණනය කොට වත්කම් ලෙස ගිණුම් ගත කරනු ලබන අතර එතෙක් පැකේජ අනුව මාර්ග පුනුරුත්ථාපනය ට අදාල සියළු ගෙවීම් කෙරිගෙන යන වැඩ ලෙස ගිණුම් ගත කොට වාර්ෂික මූල්‍ය ප්‍රකාශන පිළියල කරනු ලැබේ	මාර්ග වැඩ අවසන් කරන තෙක් එහි පිරිවැය ප්‍රාග්ධනිත කළ නොහැකි තත්ත්වයක් පවතී. මෙම නිසා වාර්තාවේ නිර්දේශ වශයෙන් ක්‍රියාත්මක කර නොතිබුණි.

	ඇත්ද යන්න තහවුරුවක් ලබාගැනීම අවශ්‍ය මුදල් උපයෝජනය කිරීම පිළිබඳ සැලැස්මක් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. තවද, ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන යටතේ අදියර 02 යටතේ අංක 3222-SRI(SF) දරන ණය ගිවිසුමද, අදියර III යටතේ ලබාගන්නා ලද අංක 3326SRI(SF) රු. මිලියන 1,199 සහ රු. මිලියන 3,572 ක ණය ගිවිසුමද පිළිවෙලින් 2017 අප්‍රේල් 07 සහ 2017 මාර්තු 27 දින වසා තිබුණ බවට නිරීක්ෂණය විය. මෙම ණය ගිවිසුම තුලින් ලබා ගන්නා ලද මුදල් තුලින් ජනනය වූ වත්කම් නිශ්චිතව හදුනා ගත නොහැකි වූ අතර එම ණය මුදල් ආපසු ගෙවීමේ කටයුතු 2020 ජනවාරි මස සිට ක්‍රියාත්මක විය යුතු බව දක්වා තිබුණි.				
2	වැඩසටහන සඳහා කොන්ත්‍රාත්කරුවන් තෝරාගැනීමේදී ඔවුන්ගේ මූල්‍ය ශක්තිය හා ද්‍රවශීලතාවය පිළිබඳව ප්‍රමාණවත් අවධානයක් යොමුකර නොතිබීම හේතුවෙන් මෙම වැඩ සටහන යටතේ මාර්ග පුනරුත්ථාපන කටයුතු වල නිරතවී සිටින කොන්ත්‍රාත්කරුවන් බොහොමයක් මූල්‍ය දුෂ්කරතා හා ද්‍රවශීලතා	2022	අත්හැර දමන ලද කොන්ත්‍රාත් පැකේජ අවසන් කිරීම හේතුවෙන් වූ අලාභයන් අදාල පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කල යුතුය.	අනාගතයේදි කොන්ත්‍රත් ප්‍රදානය කිරිමේ ක්‍රියාවලියේදි මූල්‍යමය හැකියාවන් පිළිබඳව ගැඹුරින් පරික්ෂා කර තොරාගැනිමට කටයුතු කර ඇත. සේවා	අවසන් කරන ලද කොන්ත්‍රාත් පැකේජ සම්බන්ධයෙන් කොන්ත්‍රාත්කරුවන්ගෙන් අයකර ගත යුතු මුදල් මේ දක්වා අය වී නොතිබුණි.

ගැටළු වලට මුහුණ දී තිබුණු අතර මාර්ග පුනරුත්ථාපන කටයුතු නියමිත දිනට ඉටුකිරීමට අපොහොසත්වී තිබුණු බව නිරීක්ෂණය විය. ඒ අනුව ව්‍යාපෘතිය විසින් කොන්ත්‍රාත්කරුවන්ගේ මුදල් ප්‍රවාහ කළමනාකරණය තුළ ඇති ගැටළු මැඩපැවැත්වීම සඳහා එස්ක්‍රෝ (ESCROW) නැමැති මූල්‍ය පහසුකමක් සකස්කිරීමට මාර්ග සංවර්ධන අධිකාරියේ මැදිහත් වීමෙන් දේශීය වාණිජ බැංකු අතර පැවති සාකච්ඡාවකින් පසුව යෝජනා කර තිබුණි. ඒ සඳහා මාර්ග සංවර්ධන අධිකාරියේ සභාපති, කොන්ත්‍රාත්කාර සමාගම් 04 ක නියෝජිතයන් සහ දේශීය වාණිජ බැංකු සමඟ එස්ක්‍රෝ ණය පහසුකම් සඳහා ගිවිසුම් අත්සන් කර තිබුණි. තවද, ඒ සඳහා ණය සැපයීමේ නියෝජිතායතනයේ (ADB) අනුමැතිය ලබාගැනීමේ සාක්ෂි විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. මෙසේ ණය පහසුකම් සපයන ලද කොන්ත්‍රාත්කරුවන්ගේ දුර්වල කාර්යසාධනය හා මුදල් කළමනාකරණ ගැටළු හේතුවෙන් පසුකාලීනව එම කොන්ත්‍රාත්කාර සමාගම් අතුරින් කොන්ත්‍රාත්කරුවන්

යෝජකයාගේ අයකිරීම් (Employer’s claim) හා වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරකම් ප්‍රතිපූර්ණය කර ගැනීම සඳහා ඇපකර (Guarantee) මුදල් අයකර ගැනීමට බැංකු වෙතින් ඉල්ලා සිටීමෙන් පසුව කොන්ත්‍රත්කරුවන් විසින් වාරණ නියෝග ලබා ගැනීම මත ඇතිවූ නීතිමය තත්ත්වයන් නිසා මේ දක්වා අයකිරීම් සිදු කර නොතිබුණි.

	දෙදෙනෙකුට අදාල කොන්ත්‍රාත් පැකේජ 10 ක කොන්ත්‍රාත් ගිවිසුම් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් අවසන් කර තිබුණි. ඒ අනුව, කොන්ත්‍රාත්කරුවන් තෝරාගැනීමේදී අදාල කාර්යය ඉටුකිරීමේ ශක්‍යතාවය පිළිබඳ සැලකිල්ලට ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.				
3	මාර්ග පුනරුත්ථාපන වැඩ වල නිරතවී සිටින කොන්ත්‍රාත්කරුවන්ට රු.මිලියන 12,656 ක මුදලක් වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ලෙස ගෙවා තිබුණද 2019 නොවැම්බර් 30 දින වන විටත් රු.මිලියන 3,522 ක මුදලක් කොන්ත්‍රාත්කරුවන්ගෙන් ආපසු අයකර ගැනීමට ව්‍යාපෘතිය අපොහොසත් වී තිබුණි. වැඩසටහනේ මාර්ග පැකේජ අංක KU 01, KU 02, KU 03 සහ KU 05 සඳහා වූ කොන්ත්‍රාත් ගිවිසුම් ප්‍රමාණ පත්‍රයන්ට අනුව කොන්ත්‍රාත්කරුගේ සැලසුම සඳහා වෘත්තීය හානිපූරණ වන්දි රක්ෂණයක් ලබාදීම, අත්තිකාරම් ගෙවීම සඳහා බැංකු ඇපකරයක් ලබාදීම සඳහා එකවර ගෙවීම (Lump sum) ක්‍රමය යොදා ගනිමින් කොන්ත්‍රාත්තුවේ සඳහන් මුළු වටිනාකම වශයෙන්	2022	කොන්ත්‍රාත් ගිවිසුම් කොන්දේසිවලට අනුකූල නොවීම හේතුවෙන් වූ අලාභයන් අදාල පාර්ශව වෙතින් අයකරවා ගැනීමට කටයුතු කල යුතුය.	කොන්ත්‍රාත් ලියකියවිලි පිළියෙල කිරිමේදි කාර්යසාධන සුරැකුම්පත් සඳහා කරන ගෙවීම් අයිතම යටතේ අලාභයක් සිදුව නොමැති බවත් මෙම අයිතමය වෙනම වැඩ ප්‍රමාන පත්‍රවල (BOQ) පෙන්නුම් නොකරන ලද කොන්ත්‍රාත්කරු පොදුකාර්ය පිරිවැය යටතේ එම වටිනාකම ලබා ගැනිමට කටයුතු කරනු ඇත. මේ පිළිබඳ විශේෂඥ මතය CIDA ආයතනය මඟින් ලබා ගන්නා ලදි.	කොන්ත්‍රාත්කරුව න්ගෙන් අදාල මුදල් මේ දක්වා අයකර ගැනිම් අවසන්කර නොමැත.

	රු.මිලියන 61.8 ගෙවා තිබුණි. කෙසේවෙතත්, ඉහත සඳහන් පැකේජයන්ට අදාලව දීර්ඝ කරන ලද කොන්ත්‍රාත් කාලය වෙනුවෙන් විචලතා නියෝගයන් යොදාගනිමින් එම අයිතම් සඳහා රු.මිලියන 4.7 ක් පසුව ගෙවීම් කර තිබුණි.				
4	ඉදිරිපත් කළ ප්‍රශ්නාවලි සඳහා ග්‍රාමීය ජනතාව ලබා දුන් පිළිතුරුවලට අනුව මාර්ග ගුණාත්මක බවින් යුතුව සකස් කලද මෙම මාර්ගය පිළිසකර කිරීම නිසා අධික වේගයෙන් රථ වාහන ධාවනය කිරීම හේතුවෙන් සහ පුනරුත්ථාපනය කරන ලද මාර්ගයේ මීටර් 3 ක් වූ පළල ප්‍රමාණවත් නොවීම හේතු කොටගෙන මාර්ගය භාවිත කරන්නන් අතර රථ වාහන අනතුරු සිදුවීමේ ප්‍රවණතාවයේ වැඩිවීමක් පැවතුණු බව ප්‍රදේශයේ ජනතාවගෙන් නියැදි පදනම මත රැස්කර ගත් තොරතුරුවලින් සනාථ විය. කොන්ත්‍රාත් වටිනාකම රු. මිලියන 4,765.4 ක් වූ KU 04, PU 02 සහ PU 03 යන කොන්ත්‍රාත් පැකේජවල වැඩ කොටස් මේ වන තෙක් සම්පූර්ණ නොකිරීම හේතුවෙන් හා මාර්ග ප්‍රමිතියෙන්	2022	කොන්ත්‍රාත් ඉදිකිරීම් කටයුතු අතරමඟ නවතා ඇති අනාරක්ෂිත ඉදිකිරීම් කඩිනමින් සම්පූර්ණ කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කල යුතුය.	කොන්ත්‍රාත් නිම කිරිමේ විධාන නිකුත් කළ KU 03, KU 05, PU 02 හා PU 03 යන කොන්ත්‍රාත් පැකේජ වල අනාරක්ෂිත හා අවදානම් ස්ථාන යථා තත්ත්වයට පත්කිරිම නිම කරන ලදි. තවද මේ වන විට KU 03, KU 04, KU 05, PU 02 හා PU 03 යන කොන්ත්‍රාත් පැකේජයන් සඳහා නැවත මිල ගණන් කැඳවා කොන්ත්‍රාත් ප්‍රදානය කර මාර්ග පුනුරුත්තාපන කටයුතු නිම කෙරෙමින් පවතී.	මේ දක්වා සියළු ඉදිකිරිම් අවසන් කර නොමැති බැවින් නිර්දේශය ක්‍රියාත්මක වී නොතිබුණි.

	තොරවීම නිසා මාර්ග භාවිතා කරන රථවාහන සහ මගීන්ගේ ආරක්ෂාව ඉතා අවදානම් තත්ත්වයකට පත්ව ඇති බව නිරීක්ෂණය විය. එම කොන්ත්‍රාත් අතරින් මාර්ග 03 කට අදාලව එවැනි ඉතා අනතුරු සහිත ස්ථාන කිහිපයක් හඳුනා ගත හැකි වූ අතර එමගින් සිදුවිය හැකි ජීවිත හානි හා දේපළ හානි මගින් සමාජ ගැටළු නිර්මාණය වීමේ ඉඩකඩ පැවතුණි.			
5	කොන්ත්‍රාත්කරු විසින් 2022 මාර්ග පුනරුත්ථාපන වැඩ නියමිත පරිදි නිමනොකර කොන්ත්‍රාත් ගිවිසුම් කඩකරන ලද කුරුණෑගල දිස්ත්‍රික්කයේ කොන්ත්‍රාත් පැකේජ KU04 සහ KU05 සහ පුත්තලම දිස්ත්‍රික්කයේ PU 02 සහ PU03 පැකේජයන්ට අදාලව සපයන ලද ප්‍රශ්නාවලි 20 කට ප්‍රදේශයේ වෙසෙන ග්‍රාමීය ජනතාව විසින් ලබාදෙනලද ප්‍රතිචාරවලට අනුව පැහැදිලි වන්නේ, මාර්ගය සංවර්ධනය කර අතරමඟ නවතා දැමීම හේතුවෙන් මාර්ගය භාවිතා කල නොහැකි තත්ත්වය එනම් වැසිකාලයට මඩවීම, පායන කාලයට දූවිලිසහිතවීම යනාදිය, බෝක්කු නිසිපරිදි පුනරුත්ථාපනය කර අවසන් නොකිරීම	කොන්ත්‍රාත් ඉදිකිරීම් කටයුතු සම්පූර්ණ නොකර අතරමඟ නවතා දමා ඇති අවස්ථාවන් හඳුනාගෙන එමගින් ඇතිවිය හැකි පාරිසරික හා සමාජ ගැටළු අවම කරගැනීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කල යුතුය.	KU 04, KU 05, හා PU 02 පැකේජයන්ද, KU 03 හා PU 03 පැකේජයන් නව කොන්ත්‍රාත් සමාගම් යටතේ සියළු හදිසි සහ අත්‍යාවශ්‍ය වැඩකටයුතු ප්‍රමාදයකින් තොරව සිදු කෙරෙමින් පවති. කෙසේ වුවද, පැමිණිල්ලක් ඉදිරිපත් වුවහොත් අදාල කොන්ත්‍රාත් සමාගම වෙත ලිඛිතව දැනුම් දෙනු ලැබේ. තවද, සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත් සමාගම් අතර එළඹ ඇති	මේ දක්වා සියළු ඉදිකිරීම් අවසන් කර නොමැති බැවින් නිර්දේශය ක්‍රියාත්මක වී නොතිබුණි.

හේතුවෙන් අනාරක්ෂිතව පැවතීම නිසා මාර්ග අනතුරු බහුලවීම සහ නිසි පරිදි සකස් නොකරන ලද කාණු තුළ වැසිවතුර එකතුවී ඩෙංගු වසංගත තත්ත්වයන් ඇතිවීමේ අවධානමක් මෙන්ම මාර්ගය භාවිතාකරන්නන්ට දැඩි අපහසුතාවයන්ට මුහුණදීමට සිදුවී ඇති බව තහවුරු විය.

තවද, ABC මිශ්‍රණ යොදා මාර්ග තලය සකසා ඉන් ඉදිරියට වැඩ නවතා දමා තිබූ මාර්ගවලින් නිකුත් වන දූවිලි නිසා සිදුවන වායු දූෂණය සහ අවට නිවෙස්වලට ප්‍රදේශවාසීන්ගේ සෞඛ්‍යයට දැඩි බලපෑම් ඇති වී තිබීම.

අඩක් නිමකරන ලද ඉදිකිරීම් හේතුවෙන් මාර්ගය දෙපස නිවෙස්වලට සහ ව්‍යාපාරික ස්ථානවලට ප්‍රවේශවීමේ අපහසුව නිසා ප්‍රදේශවාසීන්ගේ දෛනික කටයුතුවලට අහිතකරව බලපෑ අවස්ථා කිහිපයක් නියැදි පරීක්ෂාවේ දී අනාවරණය වීම..

කොන්ත්‍රාත්කරුවන්ගේ යන්ත්‍රෝපකරණ වැඩබිම් තුල සහ ප්‍රදේශවාසීන්ගේ නිවෙස්වල ගාල්කර තිබීම මත ග්‍රාමීය ජනතාවගේ දෛනික කටයුතුවලට බාධා ඇතිවී තිබුණි.

එකඟතාවයන්ට අනුව යම් ගෙවීමක් අතපසු කර තිබේ නම් ඒ සම්බන්ධයෙන් නිත්‍යානුකූල පියවර ගැනිමට සැපයුම්කරුවන් හට හැකියාව පවති.

2.15 කඳුරට නවගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය මඟින් වතුකර ප්‍රජාවට නිවාස පහසුකම් ලබාදීමේ ව්‍යාපෘතියේ කාර්යසාධනය

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
1	නව ජීවන වතු නිවාස වැඩසටහන පිළිබඳව 2009 වර්ෂයට අදාළ මාර්ගෝපදේශයේ අංක 7.2 යටතේ ප්‍රතිලාභීන් තෝරාගැනීමේදී වැවිලි මානව සංවර්ධන භාරයේ හා වතු නිවාස සමූපකාර සමිතියේ සහභාගිත්වයෙන් යුතු කමිටුවක් මඟින් නිර්ණායක 07 ක් මත පදනම්ව සිදුකල යුතු වුවත් ප්‍රතිලාභීන් තෝරා ගැනීමේදී එවැනි කමිටුවක් පත් කිරිමට කටයුතු කර තිබූ බවක් අනාවරණය නොවූ අතර ප්‍රතිලාභීන් තෝරාගැනීමේදී නිවැරදි ක්‍රමවේදයන් අනුගමනය කල බවට සාධාරණ තහවුරුවක් ලබාගත හැකිවන පරිදි අමාත්‍යාංශය විසින් නිසි අධීක්ෂණය කර නොමැති අතර ඒ සම්බන්ධව පරීක්ෂා කිරිමට ප්‍රතිලාභීන්ගේ ලැයිස්තු හැර වෙනත් ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය.	2022	නිවාසලාභීන් තෝරාගැනීමේදී නිවැරදි නිර්ණායක අනුව තෝරාගත් බවට අමාත්‍යාංශ නිලධාරින් තහවුරු කර ගත යුතුවීම හා එම අවස්ථාවේදීම ණය පදනම පිළිබඳව පැහැදිලි කොට එම සේවකයන් සමඟ අවශ්‍ය කොන්දේසි සහිතව ගිවිසුම් ගත විය යුතු විම .	අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කරනු ලබන නිවාස වැඩසටහන් ක්‍රියාත්මක කරනුයේ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය යටතේ පවතින වතු සමාගම්වලට අයත් ඉඩම් වල වන බැවින් ඉදිරියේදී නව නිවාස ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී ප්‍රතිලාභීන් තෝරාගැනීමට අදාළ නිර්ණායක හඳුන්වා දීම හා වතු සමාගම් සහ වැවිලි මානව සංවර්ධන භාරය සම්බන්ධීකරණය කර ගනිමින් කමිටුවක් මඟින් සිදු කිරීමට වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය දැනුවත් කිරීමට සටහන් කර ගන්නා ලදි.	2024.09.19 දින ණය අයකිරීමේ ගිවිසුම සඳහා නීතිපති දෙපාර්තමේන්තුවේ නිර්දේශ ලැබී ඇත. මෙම මාර්ගෝපදේශය ඉදිරියේදී ප්‍රතිලාභීන් වෙත ලබා දෙනු ලබන නිවාස ව්‍යාපෘතීන් සඳහා භාවිතා කිරීමට අපේක්ෂිත ය.

				මෙය 2023/08/31 දිනැතිව විගණනය වෙත ඉදිරිපත් කිරීම සඳහා යොමු කර ඇති බව වාර්තා කරමි. ඒ අනුව, අමාත්‍යාංශය හා වැවිලි මානව සංවර්ධන භාරය එක්ව නිවාස ඉදිකිරීමේ මාර්ගෝපදේශ හා ණය අයකිරීමේ මාර්ගෝපදේශ සකස් කරන ලදි. ණය අයකිරීමේ ගිවිසුම 2022.02.15 දින නීතිපති දෙපාර්තමේන්තු වේ නිර්දේශ ලබා ගැනීමට යොමුකරන ලදී.	
2	2015 නොවැම්බර් 11 දිනැති හා අංක අමප/15/1644/739/004 දරන අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි නිවාස ඉදිකිරීම සඳහා රු.650,000 ක ප්‍රතිපාදනයෙන් රු.340,000 ක් 4% ක ණයක් ලෙස හා රු.310,000 ක ආධාර ලෙස ලබාදී මට ද , ඉන් පසු නැවතත් 2017 පෙබරවාරි 21 දිනැති හා	2022	ප්‍රතිලාභීන්ගෙන් ණය අයවූ ප්‍රමාණය හා අයවිය යුතු ප්‍රමාණය එක් එක් ප්‍රතිලාභියා වශයෙන් වෙන්කර හඳුනාගැනිමට හැකි වන අයුරින් ණය නැවත අයකරගැනීම සම්බන්ධයෙන් නිසි පරිදි මුදල් රෙගුලාසි 501 (ඇ) හා 502 (ආ) පරිදි අමාත්‍යාංශය විසින් පොත් පත් නඩත්තු කළ යුතුවීම	එම කාලය තුල නිවසක් සඳහා අනුමැතිය ලබා දී ඇති රු.1,000,000.00 න් ප්‍රාරම්භක කටයුතු සඳහා රු.50,000.00 ක මුදලක් වෙන් කර ඇති අතර ඉතිරි වටිනාකම වන රු.950,000.00න් 52%ක් (රු.494,000.00)	2015 වර්ෂයේ සිට 2024.10.25 දින දක්වා නිවාස ව්‍යාපෘති 57 ක් නිවාස ඒකක 1,159 කින් රු.101,232,647 ක් අයකර ගෙන ඇත. 2015 වර්ෂයයට පසු ඉදිකොට ප්‍රතිලාභීන් වෙත භාර දී ඇති නිවාස ව්‍යාපෘති 5 කින්

අංක අමප/17/0306/739/002 දරන අමාත්‍ය මණ්ඩල තීරණය යටතේ නිවසක් රු.1,000,000 ක වටිනාකමින් එනම් රු.480,000ක් ප්‍රදාන ලෙසත් රු.520,000ක් ණය ලෙසත් ලබා දෙන ලෙසටත් අනුමතවී තිබුණි. නමුත් අමාත්‍යාංශය මඟින් නිවාස ඉදිකිරීම සඳහා 2017 වර්ෂයේ පිළියෙල කර ඇති මඟපෙන්වීම අනුව නිවසක වටිනාකමෙන් රු.494,000 ක් 4% ක පොලී අනුපාතයක් යටතේ ණය පදනමෙන් වන අතර ඉතිරි රු.506,000 ක් අමාත්‍යාංශය විසින් දරණු ලබන බවට දක්වා තිබුණි. ඒ අනුව අමාත්‍ය මණ්ඩල තීරණය හා මඟපෙන්වීමේ වෙනසක් විගණනයට නිරීක්ෂණය විය. තවද සේවක වතුනිවාස සමුපාකාර සමිති එලෙස අමාත්‍යාංශයට ණයගෙවීම ආරම්භකල යුත්තේ කුමන දිනක සිටද යන්න මඟපෙන්වීමේ හෝ ගිවිසුම් තුල සඳහන් වී නොතිබුණි. අමාත්‍යාංශය තුල ණය හා පොලිය අයකරගැනීම සම්බන්ධව විධිමත් වාර්තා පවත්වා ගෙන නොයන අතර ඒ අනුව ණය හා පොලිය අයකිරීම නිසි පරිදි සිදු	හා මේ දක්වා ණය අයවීම් සම්පූර්ණ කර ඇති බවට දැනුවත්වීමට ඒ බව ඔවුන් වෙත දැන්විය යුතු වීම.	ගණනය කර ඇති අතර එම මුදල නිවසේ සම්පූර්ණ වටිනාකම වන රු.1,000,000.00 න් අඩුකර ලැබෙන මුදල රු.506,000.00 ලෙස ගණනය කොට ඇති බව ලිපි ගොනු පරික්ෂාවේදී නිරීක්ෂණය විය. තවද, (i).2017 වර්ෂයට පෙර වැවිලි මානව සංවර්ධන භාරය විසින් අයකරන ලද ණය පිළිබඳ තොරතුරු ගෙන්වා ගැනීමට 2023.05.11, 2023.06.07, 2024.03.20 දිනැතිව වැවිලි මානව සංවර්ධන භාරය වෙත ලිපි යොමුකර ඇත. (ii) 2017 වර්ෂයෙන් පසු අමාත්‍යාංශය විසින් අයකර ගනු ලබන නිවාස ණය වාරික පිළිබඳ තොරතුරු පරිගණක ගත කොට පවත්වාගෙන යනු ලැබේ.	ණය අයකිරීම් ආරම්භ වී ඇත. 2024.10.25 දිනට නිවාස ව්‍යාපෘති 97 කින් අය වී ඇති ණය ප්‍රමාණය රු.6,147,392 ක් 2024 ඔක්තෝම්බර් 25 වන විට අයකර ගෙන තිබුණි.

	නොවන බව විගණනයේ දී නිරීක්ෂණය විය.			
3	නුවරඑළිය කලාපයේ නියැදි පරීක්ෂාවට අනුව ප්‍රතිලාභින් වෙත නිවාස 235 ක් ඉදිකිරීම් සඳහා දැරූ පිරිවැයෙන් කොටසක් ණය පදනම මත ලබාදුන් බවට අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කර ප්‍රතිලාභීන් සමඟ ගිවිසුම් අත්සන් කර ඇති නමුත් ඒවා වලංගු, නීත්‍යානුකූල ගිවිසුම් නොවන බව නිරීක්ෂණය විය. තවද ණය අයකර ගැනීමට අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව අවශ්‍ය කිසිදු පියවරක් ද ගෙන නොතිබුණි.	2022	අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කරනු ලබන නිවාස වැඩසටහන් ක්‍රියාත්මක කරනුයේ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය යටතේ පවතින වතු සමාගම්වලට අයත් ඉඩම් වල වන බැවින් ඉදිරියේදී නව නිවාස ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී ප්‍රතිලාභීන් තොර්රාගැනීමට අදාළ නිර්ණායක හඳුන්වා දීම හා වතු සමාගම් සහ වැවිලි මානව සංවර්ධන භාරය සම්බන්ධීකරණය කර ගනිමින් කමිටුවවක් මඟින් සිදු කිරීමට වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය දැනුවත් කිරීමට සටහන් කර ගන්නා ලදි.	2024.09.19 දින ණය අයකිරීමේ ගිවිසුම සඳහා නීතිපති දෙපාර්තමේන්තුවේ නිර්දේශ ලැබී ඇත. මෙම මාර්ගෝපදේශය ඉදිරියේදී ප්‍රතිලාභීන් වෙත ලබා දෙනු ලබන නිවාස ව්‍යාපෘතීන් සඳහා භාවිතා කිරීමට අපේක්ෂිතය.
4	හැටන් කලාපයේ පරීක්ෂා කල නිවාස 370 ක නියැදිය අතරින් නිවාස 08 ක් වත්තේ සේවය නොකරන පුද්ගලයන්ට ලබාදී තිබීමෙන් මෙම නිවාස වලට අදාළව ණය	2022	2016.09.28 දිනට පෙර ණය හා පොලිය අයකර ගැනීම සම්බන්ධයෙන් වැවිලි මානව සංවර්ධන භාරය	වතු සමාගම් විසින් සිදුකරනු ලබන ණය අයකර ගැනීමේ තොරතුරු විමසීම්

	අයකර ගැනීම් කටයුතු ගැටළු සහගත බව නිරීක්ෂණය වූ අතර, ප්‍රතිලාභීන් වතු සේවකයන් වුවද ඔවුන්ගෙන් ණය හා පොලිය අයකර ගැනීම සම්බන්ධයෙන් එක් එක් ප්‍රතිලාභියාගෙන් මෙතෙක් අයවූ ප්‍රමාණය හා අයවිය යුතු ප්‍රමාණය කොපමණද යන්න සම්බන්ධ කිසිදු තොරතුරක් අමාත්‍යාංශය සතු නොවීම හේතුවෙන් මෙම ණය හා පොලිය අයකර ගැනීම සම්බන්ධයෙන් පසු විපරම් හා අවශ්‍ය වන ක්‍රියාමාර්ග මේ දක්වා අමාත්‍යාංශය මඟින් ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.		විසින් කටයුතු කර ඇති අතර 2016.09.28 දින සිට අමාත්‍යාංශය මඟින් සෘජුවම ප්‍රතිලාභීන්ගෙන් ණයවාරික අය කර ගැනීමට අවශ්‍ය පියවර ගෙන ඇති අතර පසු විපරම් කටයුතු ද සිදු කරයි. ණය හා පොලිය අය කිරීම සම්බන්ධයෙන් යාවත්කාලීන තොරතුරු ඔබගේ සමාංකාංග එෆ්එල්එස්/සී/MWSEID/02/2024/2024/Info/02 හා 2024.10.16 දිනැති තොරතුරු කැඳවීමේ ලිපියට පිළිතුරු වශයෙන් මාගේ සමාංකාංග MWS – EID/03/Gov. Audit/Calling Info/2024/(fl.08) හා 2024.10.22 දිනැති ලිපිය මඟින් ද යොමු කර ඇත.	අනුව නැවත වැවිලි මානව සංවර්ධන භාරය වෙත ලිපි යොමු කර ඇත.
5	2016 දෙසැම්බර් 31 දක්වා වූ නිවාස ඉදිකිරීම් මහපෙන්වීම් හී 9.2 ඡේදය ප්‍රකාරව අයකරන මුදල සෑම මසකම නිසියාකාරව අයකර එවීම වතු අධිකාරිත්වයේ හා වතු	2022	2017 වර්ෂයට පෙර වැවිලි මානව සංවර්ධන භාරය විසින් අයකරන ලද ණය පිළිබඳ තොරතුරු	2024.11.04 දිනැතිව නැවත ලිපියක් වැවිලි මානව සංවර්ධන භාරය වෙත යොමුකර ඇත.

සේවක නිවාස සමුපකාර සමිතියේ වගකීම වන බව හා එම මුදල් මාසිකව ගෙන්වා ගෙන ඊළඟ මස 15 දිනට පෙර රජයේ ඒකාබද්ධ අරමුදලට බැරකිරීම පිණිස සෘජුවම අමාත්‍යාංශය වෙත එවිය යුතු වන බව දක්වා ඇති නමුත්, නිවාස ලබාදීම සඳහා සෘජුවම සම්බන්ධවන්නේ හා ප්‍රතිලාභීන් තෝරා ගැනීම සිදු කරන්නේ වැවිලි මානව සංවර්ධන භාරය වන බැවින් හා ඉහත ආයතන අමාත්‍යාංශය විසින් නිසිපරිදි දැනුවත්කර නොතිබුණු බැවින්, එසේ අයකරගත් ණය මුදල් වැවිලි මානව සංවර්ධන භාරය වෙතට එකතුකර ගන්නා බව නිරීක්ෂණය විය. වැවිලි මානව සංවර්ධන භාරයේ වාර්ෂික වාර්තාවේ අවසන් ගිණුම් අනුව එසේ ණය එකතුකර අමාත්‍යාංශයට නොගෙවූ 2015 දෙසැම්බර් 31 දිනට රු.30,853,120 ක් හා 2016 දෙසැම්බර් 31 දිනටරු. 37,747,494 ක්ද 2017 දෙසැම්බර් 31 දිනටරු.33,251,133 ක් විය.ඉහත ශේෂයට අමතරව 2018 වර්ෂය තුල වැවිලි මානව සංවර්ධන භාරය රු.4,974,314 ක ණය නැවත අයකරගෙන ඇතිබව දක්වා ඇත.අමාත්‍යාංශයට නොගෙවූ මුදල් පිළිබඳ අප විසින් 2016 වර්ෂයේ

ගෙන්වා ගැනීමට 2023.05.11,2023.06.07,2024.03.20 දිනැතිව වැවිලි මානව සංවර්ධන භාරය වෙත ලිපි යොමුකර ඇත.

	සිට පෙන්වාදුන් නමුත් 2016, 2017 හා 2018 වර්ෂයන්හි අමාත්‍යාංශයට අයකරගත හැකිවී ඇත්තේ පිළිවෙලින් රු.7,588,525 ක්, රු.7,472,296 ක් හා රු.7,204,751 ක් පමණක් බව නිරීක්ෂණය විය. ඒ අනුව අමාත්‍යාංශය වෙනුවෙන් එකතු කරගත් 2018 දෙසැම්බර් 31 දින වන විට අමාත්‍යාංයේ ආදායමට නොලැබුණු ශේෂය රු. 31,020,696 ක් බව වැවිලි මානව සංවර්ධන භාරයේ අවසන් ගිණුම් අනුව දැක්වේ.			
6	නිවාස ඉදිකිරීම සඳහා ලබාදෙන ණය මුදල් සඳහා 4%ක පොළියක් අය කරන බවට දක්වා ඇති නමුත් එම පොළිය අයකිරීම, අංක 261/2017 හා 2017දෙසැම්බර් 21 දිනැති රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තු චක්‍රලේඛය අනුව රාජ්‍ය ආදායම් පිළිබඳ වාර්තාවක් හා හිඟ ආදායම් වාර්තාවක් 2011 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වාම පිළියෙල කොට ඉදිරිපත් කර නොමැත.	2022	“වතුකර ප්‍රජාව සඳහා නිවාස ඉදිකිරීම - එක් නිවාසයක් සඳහා වෙන් කරන මුදල රු.650,000.00 සිට රු.1,000,000.00 දක්වා වැඩි කිරීම” යන කරුණට අදාලව අමප/17/0306/739/002 හා 2017 මාර්තු මස 01 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව එක් නිවසක් සඳහා ඇස්තමේන්තු කරනු ලබන මුදල රු.1,000,000.00 දක්වා වැඩි කිරීමටත්,රු.480,	ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි.

				000.00 ක් ප්‍රදානයන් ලෙසත් ,ඉතිරි රු.520,000.00 වසර 15 කින් ප්‍රතිලාභීන්ගෙන් අයකර ගන්නා ණය මුදලක් ලෙස ලබාදීමටත් අනුමැතිය ලබාදී ඇති නමුත් ණය පොලියක් අයකිරීමට තීරණයක් ලබාදී නොමැති බැවින් මෙම නිවාස ණය සඳහා පොලියක් අයකර නොමැත.එම නිසා ආදායම් වාර්තා සහ හිඟ ආදායම් වාර්තා සකස් කර නොමැති බව කාරුණිකව දන්වා සිටිමි.	
7	ශ්‍රී ලංකාවේ වැවිලි කලාපයේ නව ගම්මාන සංවර්ධනය උදෙසා වැවිලි කලාපය සඳහා අංක 32 දරන 2018 ඔක්තෝබර් 04 දිනැති පාර්ලිමේන්තු පනත මඟින් හා 2018 ඔක්තෝබර් 05 දිනැති ගැසට්පත්‍රය මඟින් නව ගම්මාන සංවර්ධන අධිකාරිය නමින් අධිකාරියක් පිහිටුවීමට කටයුතු කර තිබුණි. එහි කාර්යයභාරයන්ද එවකට කඳුරට නවගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා	2022	එකම කාර්යය ඉටුකිරීමට අමාත්‍යාංශයට අමතරව නව අධිකාරියක් පිහිටුවා තිබීම ප්‍රායෝගික නොවන බැවින් එය නැවත සමාලෝචනයට ලක් කල යුතු වීම	2015/09/25 දිනැති අංක 1933/13 දරන අති විශේෂ ගැසට් පත්‍රය අනුව කඳුරට නව ගම්මාන යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය පිහිටුවා ඇති අතර එම ගැසට් පත්‍රිකාව අනුව අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යයන් ලෙස පහත සඳහන්	අමාත්‍යාංශය වෙත පැවරී ඇති කාර්යභාරයන් ,පනතේ විධිවිධාන ප්‍රකාරව මෙම අධිකාරිය වෙත පැවරී ඇති බලතල අනුව යමින් වඩාත් කාර්යක්ෂමව ක්‍රියාක්මක කිරිමට හැකිවන පරිදි එම ආයතනික ව්‍යුහය ශක්තිමත් කොට,ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පියවර මේ වන

සංවර්ධන අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යභාර්යයන්ම වී තිබූ අතර එය ස්ථාපිත කර 2020 දෙසැම්බර් 31 දක්වා රු. 8,835,016 ක් වැය කර ඇති නමුත් එමඟින් කිසිදු කාර්යයක් ඉටුවී නොමැතිවීම මෙන්ම වතු අධිකාරිය සමඟ සම්බන්ධීකරණ කටයුතු කිරීමේදී අමාත්‍යාංශයට නොමැති හැකියාවක් මෙම අධිකාරියට තිබීමට ඉඩකඩක් නොමැතිවීමද හේතුවෙන් මෙම අධිකාරිය පිහිටුවීම මඟින් රජයට අමතර වැය බරක් පමණක් දැරීමට සිදු වන බව ද නිරීක්ෂණය කෙරේ.	කාර්යයන් හඳුනා ගෙන ඇත. 1.රජයේ හා පෞද්ගලික වැවිලි සමාගම් වල සේවය කරන ඉඩම් අහිමි පේලි නිවාස වල ජීවත්වන ජනතාව උදෙසා නව ගම්මාන /නගර නිර්මාණය කිරීම. 2.වතු අංශයේ ප්‍රජාව සවිබල ගැන්වීම සඳහා ජීවනෝපාය උත්පාදන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම. 3.වැවිලි ප්‍රජාව ආර්ථික,සමාජයීයව හා සංස්කෘතිකමය වශයෙන් නඟා සිටුවීම සඳහා මූලික පහසුකම් ඇතුළු අනෙකුත් අවශ්‍යතා සම්පූර්ණ කිරීමට පියවර ගැනීම. 4.ග්‍රාමීය වතු අංශයන්හි යටිතල පහසුකම් සංවර්ධනය. ඒ අනුව අමාත්‍යාංශය වෙත පවරා තිබූ එකී කාර්යයන් ක්‍රියාත්මක කිරීම එවකට අමාත්‍යාංශය යටතේ ඇති 1.වැවිලි මානව	විට ගනිමින් පවතී.

සංවර්ධන භාරය හා 11.ප්‍රජා ශක්ති මෙහෙයුම් ඒකකය මඟින් සිදුවන බව පාර්ලිමේන්තුව වෙත වාර්තා කිරීම. (2017 කාර්යසාධනය (ප්‍රගතිය)හා ඉදිරි වැඩසටහන් - 2018 අයවැය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාව)

2.16 කොළඹ නගරය සහ අවට ප්‍රවේශ මාර්ගයන්හි රථවාහන තදබදය අවම කිරීම සඳහා අදාළ රාජ්‍ය ආයතනයන් විසින් සිදුකරන කාර්යභාරය ඇගයීම

	විගණන නිරීක්ෂණය	**වාර්තාවේ වර්ෂය**	**විගණකාධිපති නිර්දේශය**	**විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග**	**වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය**
1	**මාර්ග සංවර්ධන ප්‍රතිපත්තිය** ශ්‍රී ලංකාවේ මාර්ග සංවර්ධනය විධිමත් කිරීම සඳහා ආංශික මාර්ග ප්‍රතිපත්තියක් සකස් වෙමින් පවතින අතර එය කෙටුම්පත් අවධියේ පවතින බව නිරීක්ෂණය විය. එහිදී එක්සත් ජාතීන්ගේ සංවිධානයේ 2030 න්‍යාය පත්‍රය අනුව තිරසර සංවර්ධන අරමුණු 9 (සවිමත් යටිතල පහසුකම් ගොඩනැගීම, පරිපූර්ණ හා තිරසර කාර්මීකරණය ප්‍රවර්ධනය කර නව්‍යකරණය දිරිගැන්වීම) තිරසර සංවර්ධන අරමුණු 11 (නගර සහා ජනාවාස පරිපූර්ණ , ආරක්ෂිත සවිමත් සහ තිරසර ලෙස සකස් කිරීම), තිරසර සංවර්ධන අරමුණු12 තිරසර පරිභෝජන සහ නිෂ්පාදන රටාවන් සහතික කිරීම, තිරසර සංවර්ධන අරමුණු 13 දේශගුණික විපර්යාස සහ ඒවායේ බලපෑම් වලට එරෙහිව කඩිනමින් ක්‍රියාත්මක වීම හා මාර්ග	2022	ජාතික භෞතික සැලැස්මට අනුකූලව නාගරික ප්‍රවාහන හා මහා මාර්ග යන ක්ෂේත්‍ර වල සැලසුම් මෙන්ම එම ක්ෂේත්‍රයන්ට අදාළ පළාත් පාලන ආයතනවල සැලසුම් එකිනෙක ඒකාබද්ධ කර ගැසට් නිවේදනයක් මඟින් නීතිගත කර, එම සැලසුම් සමගාමීව නිසි කලට ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම	මේ වන විට සකසා ඇති ආංශික මාර්ග ප්‍රතිපත්ති කෙටුම්පත අධ්‍යනය කර වැඩිදියුණු කිරීම, උපදේශන සේවාවක් හරහා සිදු කර ගැනීමට තීරණය වී ඇත. එය ICDP (Inclusive Connectivity & Development Project) ව්‍යාපෘතියේ ප්‍රතිපාදන මගින් සිදු කිරීමට අවශ්‍ය කටයුතු සිදු වෙමින් පවතී. මෙහිදී මාර්ග සංවර්ධන ප්‍රතිපත්ති සැකසීමේදී, අවශ්‍ය කරන තිරසාර සංවර්ධන අරමුණු වෙන් වෙන් වශයෙන් හඳුනාගෙන එයට ඇතුලත් කිරීමට අවශ්‍ය කරන දායකත්වය	ආංශික මාර්ග සංවර්ධන ප්‍රතිපත්තිය වර්තමානය වන විටද කෙටුම්පත් තත්ත්වයේ පවතී.

	සංවර්ධනයට අදාල ඉලක්කයන් ඉටු කර ගැනීම සඳහා වූ දායකත්වය හඳුනාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.			උපදේශන සේවාව වෙත ලබා දීමට කටයුතු කරනු ලැබේ	
2	**ජාතික ප්‍රවාහන ප්‍රතිපත්තිය** 1991 නොවැම්බර් මාසයේ 27 වන දින අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද ප්‍රවාහන ප්‍රතිපත්තිය 2009 ඔක්තෝබර් 14 දින සංශෝධනය කර තිබුණි. එය යාවත්කාලීන කිරීමේ අරමුණින් වැඩමුළු පැවැත්වීම, කෙටිකාලීන උපදේශක ගාස්තු, මහජන විමසුම් සම්මන්ත්‍රණ, පුවත්පත් දැන්වීම් ආදිය ඇතුළු ප්‍රතිපත්ති සකස් කිරීමේ ක්‍රියාවලිය සඳහා ජාතික ප්‍රවාහන කොමිෂන් සභාවේ අරමුදල් වලින් රුපියල් මිලියන 2.5 ක් වෙන්කර තිබුණි. එසේ වුවද ජාතික ප්‍රවාහන ප්‍රතිපත්තිය කෙටුම්පත් සඳහා මහජන අදහස් ලබා ගැනීම, පුවත්පත් දැන්වීම් එළ කිරීම හා එහි පරිවර්ථන ගාස්තු වෙනුවෙන් රු.334,735 ක් වැය වී තිබුණි. ඒ අනුව 2009 වර්ෂයේ සිට 2022 ජූලි 18 දින වන විටත් වසර 12 කට අධික කාලයක් ප්‍රතිපත්ති යාවත්කාලීන කිරීම සඳහා ගත වී තිබුණද	2022	ජාතික ප්‍රවාහන ප්‍රතිපත්තියක අවශ්‍යතාවය නිසි පරිදි හඳුනා ගැනීමෙන් බහු විධ අංශ ඇතුළත් තිරසාර ප්‍රවාහන පද්ධතියක් උදෙසා සුදුසු ප්‍රවාහන ප්‍රතිපත්තියක් කඩිනමින් අනුමත කිරීම.	සාමාජිකයින් 09 දෙනෙකුගෙන් සමන්විත විශේෂඥ කමිටුවක් ප්‍රවාහන අමාත්‍යාංශ ලේකම් විසින් 2020.03.02 දින පත් කරන ලද අතර දැනට බලාත්මක ප්‍රවාහන ප්‍රතිපත්තිය යාවත්කාලීන කොට සැකසු ජාතික ප්‍රවාහන ප්‍රතිපත්තිය - 2019 කෙටුම්පත ඉහත විශේෂඥ කමිටුව මඟින් පුළුල් විශ්ලේෂණයකට ලක් කොට "සෞභාග්‍යයේ දැක්ම" නැමැති එවකට පැවති රජයේ ජාතික ප්‍රතිපත්ති රාමුව සමඟ දක්වන අනුකූලතාව සොයා බලා ඉදිරිපත් කළ නිර්දේශයන් සහිත කමිටු වාර්තාව, 2020.08.23 වන	මෙම ප්‍රවාහන ප්‍රතිපත්ති කෙටුම්පත 2024.03.21 දින ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව සමාලෝචනය සඳහා ඉදිරිපත්කරන ලදි. ඉන්පසු 2024.05.10 දින ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව විසින් සිදුකලයුතු සංශෝධනයන් අමාත්‍යාංශය වෙත යොමුකර තිබූ අතර එම සංශෝධන සිදුකර ජාතික ගොඩබිම් ප්‍රවාහන ප්‍රතිපත්තිය යාවත්කාලීනකර අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබාගැනීම සඳහා නැවතත් ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව වෙත 2024.07.09 යොමු කරන ලදි

	ජාතික ප්‍රවාහන ප්‍රතිපත්තිය තවදුරටත් කෙටුම්පත් අවධියේ පවතින බව නිරීක්ෂණය විය.			දින පිළියෙල කොට අවසන් කරන ලදි. මෙම කෙටුම්පත 2022.07.22 වන දින අමාත්‍ය මණ්ඩල අනුමැතියට ඉදිරිපත් කරන ලදද එහි පැවති අඩුපාඩු හේතුවෙන් එම කෙටුම්පතට අනුමැතිය හිමි නොවුනි. මෙම කෙටුම්පත් නැවතත් පෙර කී පාර්ශවකරුවන් සමඟ සාමාලෝචනයකර 2023.04.04 දින MT/30/2023 අංක දරන අමාත්‍ය මණ්ඩල සංදේශයක් මඟින් අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය පිණිස ඉදිරිපත් කරන ලදි.	
3	**ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය** 2011-2020 ජාතික භෞතික සැලසුම අනුව පරිසර හිතකාමී හා සුව පහසු ප්‍රවාහන සේවයක් සැපයිය හැකි බස් රථ පොදු ප්‍රවාහන සේවය සඳහා යොදා ගත යුතුය. මගී ප්‍රවාහන කළමණාකරණ අමාත්‍යාංශය වෙත	2022	මගී ප්‍රවාහනය සඳහා උසින් අඩු පාපුවරු (LOW bed) සහිත, ඉහළ ධාරිතාවයෙන් යුතු, වායුසමණය කරන ලද බස් රථ හඳුන්වාදීම. (දුර ගමන් බස් රථ මෙන් කෙටි ගමන් බස් රථ වලද පහසුකම් සලසා දීම.)	වායු සමීකරණය කල පතුල පහත් ඩීසල් බස්රථ 80ක් මිළදී ගැනීම සඳහා 2019 ජූලි මාසයේදී අමාත්‍යමණ්ඩල පත්‍රිකාවක් මගින් අනුමැතිය ලබා ගෙන ප්‍රසම්පාදන කටයුතු සිදු කොට	මගී හිතකාමී සුවපහසු නවීන බස්රථ ගෙන්වීම සිදු වී නොතිබුණි.

ඉදිරිපත් කරන ලද ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ ක්‍රියාකාරි සැලැස්ම අනුව එවැනි බස්රථ 327 ක් සඳහා වෙන් කළ ප්‍රතිපාදනය රු.මිලියන 3695 ක් විය. එය මිලදී ගැනීමට අපේක්ෂිත මුළු බස් රථ සංඛ්‍යාවෙන් සියයට 28 ක් වූ අතර ඉතිරි සියයට 72 ම සාමාන්‍ය බස්රථ මිලදී ගැනීමට සැලසුම් කර තිබුණි. එසේ වුවද පසුව මගීන් පෞද්ගලික ප්‍රවාහනයෙන් පොදු ප්‍රවාහනය සඳහා ආකර්ශණය කර ගැනීමේ අරමුණින් සංශෝධනය වූ ක්‍රියාකාරි සැලැස්ම අනුව සුවපහසු බස්රථ 4089 ක් හා සාමාන්‍ය බස්රථ 925 ක් මිළදී ගැනීමට අපේක්ෂා කර තිබුණි. එසේ තිබියදී සුවපහසු බස්රථ මිළදී ගැනීමට යෝජනා වූ ව්‍යාපෘති 11කින් ක්‍රියාත්මක කළහැකි වූයේ ව්‍යාපෘති 2ක් පමණකි. ඉන් බස් රථ 250 ක් පමණ නාගරිකව යෙදවීමට තීරණය වී තිබූ අතර එමඟින් බස්නාහිර පළාත තුළද බස් රථ සංඛ්‍යාවක් ධාවනය කරවීම සැලසුම් විය. මෙලෙස වරින් වර ක්‍රියාකාරි සැලැස්ම සංශෝධනය වීම හා ඉලක්ක කරන ලද බස්රථ සංඛ්‍යාව ප්‍රායෝගික නොවීම හේතුවෙන් අපේක්ෂා කරන ලද ඉලක්කය වෙත ළඟා

සැපයුම්කරුවකු තෝරා ගන්නා ලද අතර, කොන්ත්‍රාත් ප්‍රදානයට පෙර රුපියල් මිලියන 1500 ක ප්‍රතිපාදනය 2020 වසර සඳහා වෙන්කර ගැනීමට අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කලද ඊට අනුමැතිය නොලැබුණු බැවින් අදාල ප්‍රසම්පාදනය අත්හිටු වීම සිදුවිය. මගී හිතකාමී සුවපහසු නවීන බස්රථ 2000ක් උපයාගෙවීමේ පදනම මත ශ්‍රීලංගමයට ලබා දීමට කැමති අයෝජකයන්ගෙන් 2019 ඔක්තෝම්බර් මාසයේදී අභිලාෂයන් කැඳවා 2020 ජූනි වන විට ආයෝජකයන් 07 ක් මූලිකව තෝරා ගත්ත ද ඉදිරි පියවර ගැනීම සඳහා එම ව්‍යාපෘතිය පිළිබඳව ශක්‍යතා අධ්‍යයනයක් සිදු කර එහි ප්‍රතිඵල අමාත්‍ය

වීමට නොහැකි වී තිබුණු අතර 2019 වසරේදී සුඛෝපභෝගී බස් රථ 9 ක් පමණක් මිලදී ගැනීමට හැකි වී තිබුණි.

මණ්ඩලයට ඉදිරිපත් කොට නොතිබූ බැවින් 2020 දී පත් වූ නව රජය විසින් එම ව්‍යාපෘතිය පිළිබඳ ඉදිරි කටයුතු සිදු නොකරන ලදී. 2020 අවසානයේදී එවක ජනාධිපතිවරයා විසින් ලබා දුන් උපදෙස් මත පතුල පහත් ඩීසල් බස්රථ 200 ක් මිලදී ගැනීම සඳහා 2021 වසරේ ජනවාරි මාසයේදී ප්‍රසම්පාදන ක්‍රියාවලියක් ආරම්භ කෙරුණු අතර, එය අවසන සැපයුම්කරුවකු තෝරා ගන්නා ලදුව කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා අමාත්‍යමණ්ඩල අනුමැතිය ඉල්ලන ලදී. එහෙත් 2021 ජුලි මාසයේදී ප්‍රවාහනය සඳහා විදුලි වාහන භාවිතය උනන්දු කර වීමට රජය විසින් ගත් ප්‍රතිපත්තිමය තීරණයක් මත ඩීසල් බස්රථ වෙනුවට ඉදිරියේදී විදුලි

බස්රථ ලබා ගැනීමට කටයුතු කරන මෙන් උපදෙස් ලැබිණ. 2023 වසරේදී රජය හා පෞද්ගලික අංශයේ හවුල් ව්‍යාපාරයක් ලෙස ධාවන කිලෝමීටරයක් සඳහා එකඟවන නිශ්චිත මිලක් ගෙවීමේ පදනමෙන් නාගරික සේවා සඳහා පතුල පහත් නවීන පහසුකම් යුතු විදුලි බස්රථ 200 ක් ලබා ගැනීමට යෝජනා කැඳවන ලද අතර, එමගින් තෝරා ගත් ආයෝජකයෙකු හට අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත 2024 පෙබරවාරි මාසයේදී කොන්ත්‍රාත් ප්‍රදානය සිදු කරන ලදී. එහෙත් අදාල ආයෝජකයා විසින් අවශ්‍ය කාර්යය සාධන සුරක්ෂණය නියමිත හා පසුව දීර්ඝ කල කාල සීමාව තුලද ලබා දීමට අපොහොසත් වුයෙන් 2024 ජුලි

මාසයේදී එම ව්‍යාපෘතිය අතහැර දැමීමට සිදු විය. අමාත්‍යමණ්ඩල අනුමැතිය සහිතව සැපයුම්කරුගේ ණය මත මාසික වාරික 60 කින් ආපසු ගෙවීමේ පදනමින් නාගරික Park and Ride සේවය සඳහා වායු සමීකරණය කල නවීන පහසුකම් වලින් යුතු ආසන 34 -35 බස්රථ 50ක් , නාගරික සේවා සඳහා වායු සමනය කල නවීන පහසුකම් වලින් යුතු පතුල පහත් බස්රථ 150ක් සහ අධිවේගී මාර්ග වල ධාවනය සඳහා වායු සමනය කල නවීන පහසුකම් වලින් යුතු බස්රථ 200ක් ශ්‍රීලංගමයට ලබා ගැනීම සඳහා 2024 ජූලි මාසයේදී ලංසු ආරාධනා සිදු කොට 2024 සැප්තැම්බර් 19 දින ලංසු කැඳවීම අවසන් කලද ඒ සඳහා කිසිදු ලංසු කරුවකු ඉදිරිපත් නොවීය.

4	**ප්‍රවාහන ව්‍යාපෘතිය සඳහා සූදානම් වීම (Transport Project Preparatory Facility)** දුම්රිය සේවය කාර්යක්ෂම කිරීමේ අරමුණින් කොළඹ නගරාසන්න ප්‍රදේශයේ මගී දුම්රිය සේවයක් ස්ථාපිත කිරීම සඳහා මූලපිරීමේ කාර්යයන් සඳහා ආසියානු සංවර්ධන බැංකු ණය අරමුදලෙන් හා රජයේ ඒකබද්ධ අරමුදලින් පිළිවෙලින් රු.මිලියන 1,456.5 ක හා රු.මිලියන 9,798.4 ක අරමුදල් යොදාගෙන වසර 06 ක් ඇතුළත නිම කිරීම සඳහා මෙම ව්‍යාපෘතිය 2016 වර්ෂයේදී ආරම්භ කර තිබුණි. මෙහි ප්‍රධාන අරමුණ වන්නේ කොළඹ නගරාසන්න ප්‍රදේශයේ මගී දුම්රිය සේවයක් ස්ථාපිත කිරීම සඳහා ශක්‍යතා අධ්‍යයන වාර්තාවක් සකස් කිරීම පමණක් විය. මෙම ශක්‍යතා අධ්‍යයන වාර්තාවේ යෝජිත දුම්රිය මාර්ග ඉදිකිරීමට අවශ්‍ය කටයුතු කඩිනමින් ආරම්භ කිරීම වඩා ඵලදායක වුව ද එම දුම්රිය මාර්ග ඉදිකිරීමට අවශ්‍ය කටයුතු නිසි කළ ආරම්භ නොකිරීමෙන් එතෙක් මෙම ව්‍යාපෘතිය සඳහා දරන ලද රු.මිලියන 4,327 වියදම නිෂ්කාර්ය වන බව නිරීක්ෂණය විය.	2022	අදාල ව්‍යාපෘති නිසි පරිදි ක්‍රියාත්මක කිරීමට සකස්කරන අධ්‍යයන හා උපදේශන සේවා ලබා ගැනීම වෙනුවෙන් දරනු ලබන අධික වියදමට සාපේක්ෂව ඒවායේ ඵලදායීතාවය නිසි ලෙස සැලකිල්ලට ගැනීම හා ණය කොන්දේසි පිලිබඳ විශ්ලේෂනය සලකා බැලීම.	පිළියෙල කරන ලද සැලසුම් අතුරින් කැළණිවැලි දුම්රිය මාර්ගය මරදාන සිට පාදුක්ක දක්වා සංවර්ධනය සඳහා රජයේ ප්‍රමුඛතාවය මත අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන ලබාගැනීම සඳහා සැලසුම් පිළියෙල කරන අතරතුරම ආසියානු සංවර්ධන බැංකුව හා ශ්‍රී ලංකා රජය කටයුතු කරන ලද අතර, එහි ප්‍රතිඵලයක් ලෙස කැළණිවැලි දුම්රිය මාර්ගය වැඩිදියුණු කිරීමේ අදියර 01 ලෙස අ.එ.ජ.ඩොලර් බිලියන 1ක මුදලක් ආසියානු සංවර්ධන බැංකු Pipeline ව්‍යාපෘති ලේඛනයට ඇතුළත් කර තිබිණි.	ප්‍රවාහන ව්‍යාපෘති සැකසීමේ පහසුකම (TPPF) යටතේ පිළියෙල කරන ලද සැලැස්මෙහි සඳහන් කැළණිවැලි දුම්රිය මාර්ගය වැඩිදියුණු කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා 2021.07.19 දිනැති අංක අමප/21/1097/312/021 දරණ අමාත්‍ය මණ්ඩල තීරණයෙන් මේවන විට අනුමැතිය ලබාදී ඇත. ඉහත අරමුදල් අහිමි වීමත් සමඟ රටෙහි පවතින තත්වය අනුව නැවත අරමුදල් ප්‍රභවයන් හඳුනා ගත නොහැකි වීම නිසා ව්‍යාපෘති ක්‍රියාත්මක වී නැත

2017 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා දරන ලද තථ්‍ය පිරිවැය පහත පරිදි වේ.

වර්ෂය	ආසියානු සංවර්ධන බැංකු ණය	ඒකාබද්ධ අරමුදල	එකතුව
	රු.(000')	රු.(000')	රු.(000')
2017	115,070	88,470	203,540
2018	371,390	693,450	1,064,840
2019	368,910	784,910	1,153,820
2020	509,150	1,396,000	1,905,150
එකතුව	**1,364,520**	**2,962,830**	4,327,350

5 **කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය (Railway efficiency improvement project)**

පවතින දුම්රිය සේවය වැඩි දියුණු කිරීමේ අරමුණින් උප ව්‍යාපෘති 17ක් ක්‍රියාත්මක කිරීම සඳහා ආසියානු සංවර්ධන බැංකු ණය අරමුදලෙන් හා රජයේ ඒකබද්ධ අරමුදලින් පිළිවෙලින් රු.මිලියන 28,232 ක හා රු.මිලියන 5,646.4 ක අරමුදල් යොදාගෙන වසර 05 ක් ඇතුළත නිම කිරීම සඳහා මෙම ව්‍යාපෘතිය 2019 වර්ෂයේදී ආරම්භ කර තිබුණි. මේ යටතේ සංවර්ධන කාර්යයන් 32 ක් ඉටුකිරීමට අපේක්ෂා කළ අතර 2020 දෙසැම්බර් 31 වන විට උප ව්‍යාපෘති 5ක් පමණක් ක්‍රියාත්මක කිරීම සඳහා කටයුතු ආරම්භ කර ඇති බවත් නිරීක්ෂණය විය.

2019 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා ආසියානු

අදාල ව්‍යාපෘති නිසි පරිදි ක්‍රියාත්මක කිරීමට සකස්කරන අධ්‍යයන හා උපදේශන සේවා ලබා ගැනීම වෙනුවෙන් දරනු ලබන අධික වියදමට සාපේක්ෂව ඒවායේ ඵලදායීතාවය නිසි ලෙස සැලකිල්ලට ගැනීම හා ණය කොන්දේසි පිලිබඳ විශ්ලේෂනය සලකා බැලීම.

2019 වර්ෂයේ දී අවසන් කල අමාත්‍ය මණ්ඩල අනුමැතීන් සඳහා යොමුකරන ලද කොන්ත්‍රාත් දෙකකට අදාලව 18.03.2020 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණි.ඉන් එක් කොන්ත්‍රාත්තුවක් 30.04.2020 දින ප්‍රදානය කලද දුම්රිය දෙපාර්තමේන්තු වේ වෘත්තීය සමිති ඇතිකල විරෝධය මත ගිවිසුම් අත්සන් කිරීම ප්‍රවාහන අමාත්‍යාංය විසින් තාවකාලිකව අත්හිටුවන ලදි. අනෙක් කොන්ත්‍රාත්තුව ප්‍රදානයන සඳහාද 15.07.2020 අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබුනද භාණ්ඩාගාර

මේ වන විට ව්‍යාපෘතිය මගින් සැලසුම් කල ප්‍රසම්පාදන කටයුතු වලින් 95% නිමකර ඇත. යෝජිත කාර්යයන් අතුරින් 07 ක් මේවන විට අවසන් කර දුම්රිය දෙපාර්තමේන්තුව වෙත බාරදී ඇති අතර අනෙකුත් සියළුම කටයුතු ක්‍රියාත්මක වෙමින් පවතී.

සංවර්ධන බැංකු ණය හා ඒකාබද්ධ අරමුදලින් රු. මිලියන 505 ක පිරිවැයක් දරා තිබුණි. විස්තර පහත පරිදි වේ.

වර්ෂය	ආසියානු සංවර්ධන බැංකු ණය	ඒකාබද්ධ අරමුදල
	රු.(000')	රු.(000')
2019	84,030,000	1,640,000
2020	409,990,000	9,560,000
එකතුව	**494,020,000**	**11,200,000**

ලේකම් ගේ අංක ERD/IRCPRS/ GEN/10 සහ 08.07.2020 දිනැති චක්‍ර ලේඛයේ උපදෙස් මත සියලු කොන්ත්‍රාත් ප්‍රදානයන්, ගිවිසුම් අත්සන් කිරීම අත්හිටුවන ලදි. 2020 නොවැම්බර් මාසයේදී මහා භාණ්ඩාගාරයේ ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් ව්‍යාපෘතිය පිළිබඳව පැවැත්වූ සාකච්ඡාවේ ප්‍රතිඵලයක් වශයෙන් 05.11.2020 දින නැවත ව්‍යාපෘති කටයුතු ආරම්භ කිරීමට අවසර ලබාදෙන ලදි. ඒ අනුව 2020 නොවැම්බර් මාසයේදී එක් ගිවිසුමක් අත්සන් කරන ලදි. ව්‍යාපෘතියට අදාල උප ව්‍යාපෘති අතුරින් කාර්යයන් 11 ක ප්‍රසම්පාදන කාර්යයන් 2020 වර්ෂය තුල සිදු කරමින් පැවතියත් COVID - 19 වසංගත තත්ත්වය

				හේතුවෙන් ප්‍රසම්පාදන ක්‍රියාවලිය නියමිත කාලය තුල අවසන් කරගත නොහැකි විය.	
6	**කාර්යාල හා පාසල් ප්‍රවාහන සේවා වැඩිදියුණු කිරීම** බත්තරමුල්ල ප්‍රදේශයේ ආයතනවල සේවය කරන නිලධාරීන් කොළඹ ප්‍රධාන දුම්රිය ස්ථාන සිට බත්තරමුල්ල දක්වා කාර්යාල ප්‍රවාහන සේවාවක් ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය විසින් ක්‍රියාත්මක කිරීම මගින් රජයේ නිලධාරීන් ප්‍රවාහනය කිරීම සම්බන්ධයෙන් වර්තමානයේ වැඩි ප්‍රවණතාවයක් ඇති වී තිබෙන අතර අධි වේගී මාර්ගවල මෙන්ම අනෙකුත් මාර්ග සඳහා ආයතනික මට්ටමින් හා පෞද්ගලික මට්ටමින් එම සේවාවන් ආරම්භ කර ඇත. සහනදායී ගාස්තු අයකරමින් සිදු කෙරෙන මෙම ප්‍රවාහන ක්‍රමය මගින් කාර්යාල සේවකයන් සඳහා කාර්යක්ෂම සේවාවක් සැපයෙන නමුදු ඒ පිළිබඳ නියාමනයක් තුළින් එය තවදුරටත් පුළුල් කිරීමේ හැකියාව සැලකිල්ලට ගෙන නොතිබුණි. තවද මෙම සේවාව කාර්යාල	2022	බත්තරමුල්ල ප්‍රදේශයේ රජයේ ආයතනවල නිලධාරීන් හා එම ආයතනවල සේවය ලබා ගැනීම සඳහා පැමිණෙන මහජනතාව ප්‍රධාන දුම්රිය පොළවල්වල සිට බත්තරමුල්ල දක්වා පොදු මගී ප්‍රවාහන සේවා ස්ථාපිත කිරීම හා පහසුකම් වැඩිදියුණු කිරීම.	බත්තරමුල්ල ප්‍රදේශයේ රාජ්‍ය ආයතන වල නිලධාරීන් හා එම ආයතන වල සේවය ලබා ගැනීමට පැමිණෙන මහජනතාව පොදු මගී ප්‍රවාහන සේවා ස්ථාපිත කිරීම හා පහසුකම් වැඩිදියුනු කිරීම සඳහා දීර්ඝ කාලයක සිට උත්සාහ දැරීමක් සිදු කලද මගීන් නංවා ගැනීමට පහසු ස්ථානයක් (Touch and Go) සකස් කිරීමට සුදුසු ස්ථානයක් නොමැති වීම ප්‍රධාන ගැටළුවක් වී ඇත. මේ සම්බන්ධයෙන් නාගරික සංවර්ධන අධිකාරිය සමග අවස්ථා කීපයකදීම සාකච්ඡා පවත්වන ලද අතර ඒ සඳහා යෝජිත ස්ථානය	මෙයට අදාලව පාර්ලිමේන්තුවේ ආංශික අධීක්ෂණ කාරක සභාවේදී සාකච්ඡා කරන ලද අතර මගීන් නංවා ගැනීමට සුදුසු ස්ථානයක් ලෙස තලංගම ඩිපෝව යෝජනා කල නමුත් එයට බත්තරමුල්ල කාර්යාල පරිශ්‍රයේ සිට පවතින දුර ප්‍රමාණය වැඩි බැවින් එම යෝජනාව ක්‍රියාත්මක කිරීම ගැටළුකාරී තත්ත්වයක් මතු වී ඇත.

සේවකයින්ට මෙන්ම සේවා සපයා ගනු ලබන ජනතාව සඳහාද ව්‍යාප්ත කිරීමේ හැකියාව සැලකිල්ලට ගෙන නොතිබුණි.		මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතියක් සඳහා වෙන් කර ඇති බවත් එම කාර්යය සඳහා යෝජනා කැඳවා ඇති බවත් එම අධිකාරිය ප්‍රකාශ කර ඇත.

2.17 රජයේ ආයතන සඳහා ගොඩනැගිලි අවශ්‍යතා සපුරා ගැනීම හා උපයෝජනය.

	විගණන නිරීක්ෂණය	**වාර්තාවේ වර්ෂය**	**විගණකාධිපති නිර්දේශය**	**විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග**	**වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය**
1	**ගොඩනැගිලි තක්සේරු කිරිම, වටිනාකම නිර්ණය කිරීම, ගොඩනැගිලි ලේඛණගත කිරීම.** 2013 ජුනි 24 දිනැති රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ GFS/02 චක්‍රලේඛය ප්‍රකාරව රජයේ ඉඩම් හා ගොඩනැගිලි තක්සේරු කිරීම සඳහා 2021 දෙසැම්බර් 31 දිනය වන විට ගොනු 7528 ක් ලැබී තිබුණු අතර ඉන් ගොනු 6625 ක කටයුතු ඉටු කර තිබුණද තව දුරටත් තක්සේරු කරමින් පවතින ගොනු සංඛ්‍යාව 352 ක් බව නිරීක්ෂණය විය. දේපළ තක්සේරු කිරීමකින් තොරව ගොනු 551 ක් වසා දමා තිබු අතර ඒසඳහා අදාළ පිඹුරුපත් සහ අයිතිය සනාථ කිරීමේ ලේඛන නොමැතිවීම, ඉඩම්වල පිඹුරුපත් හා ගොඩනැගිලි	2022	තක්සේරු දෙපාර්තමේන්තුව මගින් රාජ්‍ය ආයතනවලට අයත් ගොඩනැගිලි තක්සේරු කළ පසුව අදාළ ආයතනවල ගිණුම්කරණ පද්ධතියට එම වටිනාකම් ඇතුළත් කර ගොඩනැගිලිවල වටිනාකම යාවත්කාලීනව පවත්වාගෙන යාමට කටයුතු කිරීම	තක්සේරු කිරීම් සඳහා ඉල්ලීම් ලැබී තිබුණ ද දේපළවලට අදාල පිඹුරු පත්,අයිතිය සනාථ කිරීමේ ලේඛණ හා ගොඩනැගිලි සැලසුම් ආදිය නොමැති අවස්ථාවල දී එම ලේඛණ ඉදිරිපත් කරන ලෙස අදාල ආයතන ප්‍රධානින් දැනුවත් කර ඒවා ලබාගැනීමට කටයතු කිරීම හා විවිධ අවස්ථාවල අමාත්‍යාංශ වෙනස්වීම මත දේපළවල අයිතිය ආයතන අතර මාරුවීමේදී ඒ සම්බන්ධයෙන් රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ දී පවත්වනු ලබන ප්‍රගති සමාලෝචන රැස්වීම්වලදී දැනුවත් කිරිම	2024 සැප්තැම්බර් 30 දිනය වන විට ඉඩම් හා ගොඩනැගිලි තක්සේරු කිරීම සඳහා ඉල්ලීම් 8990 ක ප්‍රමාණයක් ලැබී තිබුණු අතර එම ඉල්ලීම් වලින් ගොනු 7823 ක තක්සේරු කටයුතු අවසන් කර තිබුණි.නොවැලැක්විය හැකි හේතු මත වසා දමා තිබූ ගොනු ප්‍රමාණය 625 ක් වන අතර ලිපිගොනු 542 ක තක්සේරු කටයුතු තව දුරටත් සිදුකෙරෙමින් පවතින බව නිරීක්ෂණය විය.

	සැලසුම් ලැබී නොතිබීම, ගොඩනැගිලිවලට ඇතුළුවීමට අවසර නොදීම,අදාළ දේපළ නිවැරදිව පිහිටීම හඳුනාගත නොහැකි වීම හා ඉල්ලුම්කාර ආයතනවලට දේපලේ පිහිටීම පිළිබඳ අවබෝධයක් නොමැතිවීම, දේපළ වල අයිතිය වෙනස්වීම, අයිතිය වෙනස් වූ ආයතන මගින් තක්සේරු දෙපාර්තමේන්තුව වෙත නොදැන්වීම නිසා දේපළේ අයිතිය තහවුරු කර වාර්තා කිරීමට නොහැකිවීම, එක් එක් අමාත්‍යාංශ වරින් වර වෙනත් අමාත්‍යාංශ හා සම්බන්ධ වන බැවින් දේපළවල අයිතිය කුමන අමාත්‍යාංශය වෙත ඇතිදැයි යන්න නිශ්චිතව හඳුනාගත නොහැකිවීම ආදී හේතු බල පා තිබුණි.	
2	**අතරමග නවතා දමා ඇති ඉදිකිරීම්** රාජ්‍ය ආයතනවල ඉඩකඩ අවශ්‍යතාවය සපුරා ගැනීමේ අරමුණින් ඉදිකරන ගොඩනැගිලි නිශ්චිත කාල සීමාව තුළ ඉදිකිරීම සඳහා	2022

ප්‍රමාණවත් ප්‍රතිපාදන නොමැති වීම ඉදිකිරීම් දුර්වලතා ඉදිකිරීම් නතර කිරීම් සඳහා තීරණ ගැනීමේදී සිදු වී ඇති අඩුපාඩු යන හේතූන් මත අතරමග නතර කර තිබුණි. **උදාහරණ කිහිපයක් පහත දැක්වේ.**				
I. මහවැලි අධිකාරිය විසින් නේවාසික පහසුකම් සැපයීම සඳහා රඹකැන්ඔය කලාපයේ මහඔය කඳවුරු පරිශ්‍රයේ iv ශ්‍රේණියේ නිල නිවාසයක් ඉදිකිරීමට රු.4,843,183 ක් වූ කොන්ත්‍රාත්තුවක් ප්‍රදානය කර තිබූ අතර භෞතික ප්‍රගතිය සියයට 20 ක් වන විට හා රු.1,414,556 ක පිරිවැයක් දරා තිබියදී එම ඉදිකිරීම අතරමග නවතා දමා තිබුණි.			රඹකැන්ඔය කලාපයේ මහඔය කඳවුරු පරිශ්‍රයේ iv ශ්‍රේණියේ නිල නිවාසයක් ඉදිකිරීමට අදාළ ඉතිරි වැඩ නිම කිරීම සඳහා ඇස්තමේන්තු සකස් කර ටෙන්ඩර් පටිපාටියට යොමු කළද රටේ පැවති මූල්‍යමය හිඟය සමඟ ගොඩනැගිලි ඉදිකිරීම මුදල් ප්‍රතිපාදන වෙන් වෙන් නොවූ බැවින් එහි ඉදිකිරීම් කටයුතු ඉදිරියට කරගෙන යන ලදී.	රඹකැන්ඔය කලාපයේ මහඔය කඳවුරු පරිශ්‍රයේ iv ශ්‍රේණියේ නිල නිවාසය 2024 වර්ෂයේදී ප්‍රතිපාදන ලැබී ඇති බැවින් නේවාසිකාගාරයේ ඉතිරි වැඩ කරගෙන යමින් පවති.
II. මහවැලි අධිකාරියට අයත් වලව විශේෂ බල ප්‍රදේශය ඇඹිලිපිටිය - මුරවැසිහේන යන ලිපිනයෙහි නේවාසික ව්‍යාපාර කළමනාකරණ කාර්යාලයේ		පවතින ආර්ථික අර්බුදය හමුවේ නව ගොඩනැගිලි ඉදිකිරීම සීමා වී ඇති බැවින් ගොඩනැගිලි අවශ්‍යතා සපුරා ගැනීමේදී හා පවත්නා ගොඩනැගිලි භාවිතයේදී ආර්ථිකභාවයෙන්	ඉදිකිරීම් සිදු කිරීමට කොන්ත්‍රාත්කරු අපොහොසත් වීම නිසා ඉදිකිරීම් වැඩ අත්හිටුවා කොන්ත්‍රාත් ගිවිසුම අවසන් කර තිබුණි. මහවැලි අධිකාරියට අයවිය යුතුව තිබූ	2024 වර්ෂයේදී ප්‍රතිපාදන ලැබී ඇති බැවින් නේවාසිකාගාර ඉතිරි වැඩ කරගෙන යමින් පවතී.

ඉදිකිරීම් කටයුතු සඳහා රු. 14,757,550 ක් ඇස්තමේන්තු කළද, සහතික කරන ලද වැඩ ප්‍රමාණය රු.5,867,830 ක් හා භෞතික ප්‍රගතිය සියයට 85 ක් ව තිබියදී ප්‍රතිපාදන නොමැතිවීම මත කොන්ත්‍රාත්තුව 2021 දෙසැම්බර් 22 දින අවසන් කර තිබුණි.	යුතුව කටයුතු කිරීම	සංචලන අත්තිකාම් මුදල වන රු. 2,367,071 හා අමුද්‍රව්‍ය අත්තිකාරම වන රු.1,446,980 මුදල හා ඉදිරි වැඩ වලින් සියයට 25 ක මුදල එනම් රු.1,006,406 ක මුදලක් අයකර ගැනීමට කටයුතු කර තිබුණි. කොන්ත්‍රාත්කරුට රු.1,171,924 ක් ගෙවීමට ඉතිරි වී තිබුණද කොන්ත්‍රාත්කරුගෙන් සී කලාපය වෙත අයවීමට තිබූ සංචලන අත්තිකාරමක් පියවීමට කටයුතු කර තිබුණි.	
III. වී අලෙවි මණ්ඩලයේ මැද්දවත්ත ගබඩාව අලුත්වැඩියා කටයුතු සඳහා රු.14,069,468 ක් ඇස්තමේන්තු සහිතව 2017 නොවැම්බර් 01 දින ගිවිසුම්ගතව වැඩ ආරම්භ කර 2019 අප්‍රේල් 10 දින වන විට රු.5,193,866 ක් ගෙවීම් කර තිබුණි.		දැනට වී ගබඩා පහසුකම් වල හිඟ තාවයක් නොපවතින බැවින් හා විශ්ව විද්‍යාලයට ගොඩනැගිල්ල ලබා දීමට අමාත්‍යාංශ මට්ටමින් සාකච්ඡා වූ බැවින් ගබඩා පහසුකම් තවදුරටත් භාවිතා කරන්නේද නැතහොත් එය විශ්විද්‍යාලයට ලබා දෙන්නේද යන්න තීරණයක් ගනිමින් පවතී.	මේ වන තෙක් තීරණයක් ගෙන නොතිබුණි.
IV. කොත්මලේ වාර්මාර්ග හා ජල කළමනාකරණ ජාත්‍යන්තර පුහුණු ආයතනය සඳහා		අලුත්වැඩියා කටයුතු නියමිත කාල රාමුව තුළ සිදුකිරීමට අසමත් වූ බැවින් කළ වැඩ කොටස	රු.මිලියන 1.9 ක් යටතේ නව ඇස්තමේන්තුවක් සකස් කර මිල ගණන් කැඳවීම්

රිවර්සයිඩ්, මාවතුර දේශන ශාලාව, රථගාල හා රියදුරු නිල නිවාස රුපියල් 9,900,000 ක පිරිවැයකින් ඉදිකිරීමට ඇස්තමේන්තු කර තිබියදී ඉදිකිරීම් කටයුතු නතර කර තිබුණි.		සඳහා පමණක් ගෙවීම් කර කොන්ත්‍රාත්තු අවසන් කර තිබුණි. මෙම ගොඩනැගිල්ල වසර ගණනක් අත්හැර දමා තිබීම මත ආරම්භයේදී සැලසුම් කළ පරිදිම මහල් සහිත ව මෙහි ඉදිකිරීම් අඛණ්ඩව කරගෙන යාමට ගැටලුවක්ව පවතින බව වාර්තා කර තිබුණි.	කර ඇති අතර එහි වැඩ කොටස් මෙම වර්ෂය තුළ ආරම්භ කිරීමට සැලසුම් කර තිබුණි.
V. අනුරාධපුර ශික්ෂණ රෝහලේ හදිසි අනතුරු හා හදිසි ප්‍රතිකාර ඒකකය ඉදිකිරීම, සඳහා පෞද්ගලික කොන්ත්‍රාත්කරුවෙකු සමග ගිවිසගෙන තිබුණද ඉදි කිරීම් කටයුතු සිදු කළ කොන්ත්‍රාත්කරු විසින් ඉදිකිරීම පැහැර හැරීම නිසා 2020 පෙබරවාරි මාසයේදී ඉදිකිරීමේ භෞතික ප්‍රගතිය සියයට එකක්ව තිබියදී ගොඩනැගිලි ඉදිකිරීම් කටයුතු නවතා දමා තිබුණි. කොන්ත්‍රාත්කරුගේ අසතුටුදායක වැඩ ප්‍රගතිය මත මෙම ගිවිසුම අවලංගු කර අත්තිකාරම් හා කාර්යසාධන ඇපකරවල වටිනාකම වූ රු.81,653,603 ක්		දැනට පවතින මූල්‍ය තත්ත්වය මත සම්පූර්ණයෙන්ම ඉදිකිරීම් කටයුතු සිදුකළ යුතු ගොඩනැගිලි ආරක්ෂිතව වැඩ නැවැත්වීමටත් ඒවා ආරම්භ කිරීම 2026 වර්ෂය දක්වා කල් දැමීමටත් තීරණය කර තිබුණි.	ගොඩනැගිල්ලෙහි වැඩ කොටසක් හෝ ආරම්භ කර ඇති සහ ඉදි කිරීම්වල කොටසක් හෝ ප්‍රයෝජනයට ගත හැකි ඉදි කිරීම් 2025 වර්ෂයේ සෞඛ්‍ය අමාත්‍යංශය වෙත වෙන් කර ඇති අයවැය ප්‍රතිපාදන තුළ කළමණාකරණය කර නිම කිරීමටත් තීරණය කර ඇත.

අයකර ගෙන තිබුණි.			
VI. අනුරාධපුර ශික්ෂණ රෝහලේ හෙද නිලධාරීන්ට නේවාසික පහසුකම් ලබාදීම සඳහා ඉදිකිරීම් ආරම්භ කළ ඇස්තමේන්තුගත පිරිවැය රු.139,000,000 ක් වූ ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතුවල භෞතික ප්‍රගතිය සියයට 60 ක්ව තිබිය දී 2018 වර්ෂයේදී කොන්ත්‍රාත්කරු විසින් ඉදිකිරීම කටයුතු නැවැත්වීම හේතුවෙන් 2019 මාර්තු 17 දින කොන්ත්‍රාත් ගිවිසුම අවලංගු කර තිබුණි.		මෙම ගොඩනැගිල්ලෙහි කොන්ත්‍රාත්තු අවසන් කර ඇති අතර නැවත ඇස්තමේන්තු කර 2025 වර්ෂයේදී නිම කිරීමට සැලසුම් කර ඇත.	2025 වර්ෂයේ වැඩ ආරම්භ කිරීමට ප්‍රසම්පාදන කටයුතු මේ වන විට අවසන් කර ඇත.
VII. අනුරාධපුර ශික්ෂණ රෝහලේ Linear Accelerator Unit ඉදිකිරීම සඳහා ඇස්තමේන්තුගත පිරිවැය රු.286,000,000 වූ අතර කොන්ත්‍රාත්තුවේ භෞතික ප්‍රගතිය සියයට 15 ක්ව තිබියදී බිල්පත් ගෙවීම ප්‍රමාදවීම මත 2019 වර්ෂයේදී ඉදිකිරීම් කටයුතු නතර කර තිබුණි.		2024.08.12 දින පැවති ජාතික මෙහෙයුම් කමිටුවේ දී මෙම ඉදිකිරීමේ වැදගත්කම අවධාරණය කර තිබේ.	Linear Accelerator යන්ත්‍ර සවි කිරීමට අවශ්‍ය බිම් මහලේ වැඩකටයුතු මේ වන විට ආරම්භ කර ඇත. 2025 වර්ෂයේ එම යන්ත්‍ර සවි කිරීමට සැලසුම් කර ඇත.

VIII. සෞඛ්‍ය අමාත්‍යාංශයේ වෛද්‍ය සැපයීම් අංශයේ වැලිසර ගබඩා පහසුකම් ඇති කිරීම සඳහා ඉදිකිරීම් කටයුතු ආරම්භ කළද පාදම් කණු ගිලා බැසීම නිසා ඉදි කිරීම් කටයුතු නතර කරන විට රු.67,189,923 ක මුදලක් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි.	මෙම ඉදිකිරීම ඉදිරියට කරගෙන යාම සම්බන්ධයෙන් නැවත භූ තාක්ෂණ වාර්තාවක් ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් ඉල්ලුම් කර තිබුණි.	බිල්පත් සම්බන්ධයෙන් ආදළ කොන්ත්‍රාත්කරු සමඟ බේරුම්කරණ ක්‍රියාවලිය සඳහා මේ වන විට යොමු වී තිබුණි.

2.18 රජයේ නොවන පාසල් සම්බන්ධයෙන් වන නියාමන ක්‍රියාවලිය

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
1	**2016 යෝජිත සාමාන්‍ය අධ්‍යාපන ප්‍රතිපත්තිය** ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් අවසන් වරට 2016 වර්ෂයේදී ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සඳහා යෝජනා සකස් කර ප්‍රසිද්ධියට පත්කර තිබුණ ද විගණන දිනය වන විටත් එය අනුමත ප්‍රතිපත්තියක් ලෙස අධ්‍යාපන පද්ධතියට එක් වී නොතිබුණි. එහෙත් එහි ඇති යෝජනා සලකා අවශ්‍යතාවය පරිදි ඇතැම් ප්‍රතිසංස්කරණ අධ්‍යාපන අමාත්‍යාංශය විසින් සිදු කර තිබුණි. රජයේ අනුමත පෞද්ගලික පාසල්, ජාත්‍යන්තර පාසල්, ආගමික පාසල් වැනි අධ්‍යාපනික ආයතනවල පවත්නා අඩුපාඩු සම්බන්ධයෙන් වාර්තාව තුළ සාකච්ඡා කෙරෙන විගණන නිරීක්ෂණයන් පිළිබඳ සැලකීමේදී, සමස්ත අධ්‍යාපනය සඳහාම සකස් කල අනුමත අධ්‍යාපන ප්‍රතිපත්තියක් පොදු නීතියක් බවට පත් වී	2022	අධ්‍යාපනයේ ගුණාත්මකභාවය සංවර්ධනය, අධ්‍යාපන සැලසුම්කරණය හා කළමනාකරණය, ඉගෙනුම් පරිසරය යනාදී කරුණු පිළිබඳ අවධානයට ලක්කරමින් සමස්ත අධ්‍යාපනය සඳහාම යාවත්කාලීන කරන ලද අධ්‍යාපන ප්‍රතිපත්තියක් සකස්කර පොදු නීතියක් බවට පත් කිරීම.	පෞද්ගලික පාසල් ශාඛාවට අදාළව සකස් කිරීමට කටයුතු සිදු කරමින් පවතී.	අධ්‍යාපනයේ ගුණාත්මකභාවය සංවර්ධනය, අධ්‍යාපන සැලසුම්කරණය, ඉගෙනුම් පරිසරය යනා දී කරුණු පිළිබඳ අවධානයට ලක් කරමින් සමස්ත අධ්‍යාපනය සඳහාම යාවත්කාලීන කරන ලද අධ්‍යාපන ප්‍රතිපත්තියක් සකස් කර නැත.

	නොතිබීම ද, එම පද්ධතියෙහි පවත්නා අඩුපාඩු නිවැරදි කරගත නොහැකි වීමට හේතුවක් වී ඇති බව නිරීක්ෂණය කෙරේ.				
2	අධ්‍යාපන අමාත්‍යාංශය මගින් ජාත්‍යන්තර පාසල් නියාමනය 1961 අංක 8 දරන උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධිවිධාන) පනතේ 25 වගන්තිය අනුව වයස අවුරුදු 5-14 වයස් සීමාවේ පසුවන දරුවන් සඳහා අධ්‍යාපනය ලබාදෙන පෞද්ගලික පාසල් ආරම්භ කළ නොහැකිබව දක්වා ඇත. ඒ හේතුවෙන් සමාගම් පනත යටතේ සමාගමක් වශයෙන් හෝ ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේ ආඥා පනත යටතේ තනි පුද්ගල හෝ හවුල් ව්‍යාපාර වශයෙන් මෙම ජාත්‍යන්තර පාසල් නම් ආයතන විශේෂය ලියාපදිංචි කෙරේ. ඒ අනුව ජාත්‍යන්තර පාසල්, අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි ආයතන නොවන හෙයින් ඒවා නියාමනය කිරීමේ නෛතික බාධාවන් පවතින බව අධ්‍යාපන අමාත්‍යාංශයේ පෞද්ගලික පාසල් අංශයේ අධ්‍යක්ෂකගේ 2020 ජූලි මස අංක ED/03/10/01 දිනැති ලිපියෙන් දන්වා ඇත. මේ	2022	1961 අංක 8 දරන උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධිවිධාන) පනතෙහි 25 වන වගන්තිය අනුව අවුරුදු 5-14 වයස් සීමාවේ පසු වන දරුවන් සඳහා අධ්‍යාපනය ලබා දීමට පෞද්ගලික පාසල් ආරම්භ කල නොහැකි බව දක්වා ඇතත්, අධ්‍යාපන අමාත්‍යාංශයේ මැදිහත්වීමකින් තොරව ව්‍යාපාරික ආයතන ලෙස ජාත්‍යන්තර පාසල් ද, ආගමික පාසල් ලෙස මද්‍රසා පාසල් ද පවත්වාගෙන ගෙන යන බැවින් පනත සක්‍රීයව බලාත්මක කිරීමට අවශ්‍ය කඩිනම් ක්‍රියාමාර්ග ගැනීම.	ජාත්‍යන්තර පාසල් නියාමනය සම්බන්ධයෙන් යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා නෛතික රාමුව සංශෝධනය කිරීමට කටයුතු කළ යුතු ආකාරය සම්බන්ධයෙන් සහ ඉදිරි කටයුතු පිළිබඳව වාර්තාව සකස් කිරීම සඳහා කමිටුවක් පත් කර ඇත.	ජාත්‍යන්තර පාසල් නියාමනය සම්බන්ධයෙන් යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා අදාළ නෛතික රාමුව සංශෝධනය කිරීමේ කටයුතු සිදු කළ යුතුව ඇත.

	හේතුව නිසා අධ්‍යාපනයේ ගුණාත්මකභාවය බැහැර කරමින් ව්‍යාපාරික පරමාර්ථයෙන් එම ආයතන පවත්වාගෙන යාමට ඉඩකඩ ලැබී තිබුණු අතර ඒ හේතුවෙන් අධ්‍යාපනයේ ප්‍රමිතිය සියලු පාසල් අතර ඒකාකාරීව පවත්වාගෙන යාමට ඇති ඉඩකඩ ඇහිරී තිබුණි.				
3	රජයේ අනුමත පෞද්ගලික පාසල් පරිපාලන රජයේ අනුමත පෞද්ගලික පාසල්වල පරිපාලනය කළමනාකාරීත්ව භාරයක් මගින් සිදු කෙරන අතර මෙම පාසල් බොහොමයක් ආගම් කේන්ද්‍ර කරගත් ඒවා වන අතර යම් යම් ආගමික නිකායන්ගේ මැදිහත්වීම සෘජුවම හෝ වක්‍රාකාරයෙන් පාසල් පරිපාලනයට සම්බන්ධ වේ. ඒ අනුව ශිෂ්‍යයන් පාසලට ඇතුලත් කර ගැනීම, ගාස්තු අය කිරීම, විනය ක්‍රියාමාර්ග ගැනීම, ගුරුවරුන් සම්බන්ධ කටයුතු යනාදී ලෙස සියළුම අවස්ථාවන්වලදී එම පාසලේ කළමනාකාරීත්වයේ හා අදාල ආගමික නිකායේ මැදිහත්වීමෙන් සිදුවන බවත්, එවැනි අවස්ථාවලදී අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රමාණවත්	2022	අමාත්‍ය මණ්ඩල තීරණයකින් ද උපදෙස් ලබා දී ඇති පරිදි රජයේ අනුමත පෞද්ගලික පාසල් සඳහා ශිෂ්‍යයන් පාසලට ඇතුලත් කර ගැනීම, ගාස්තු අය කිරීම, විනය ක්‍රියාමාර්ග ගැනීම, ගුරුවරුන් සම්බන්ධ කටයුතු, ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය අධීක්ෂණය යනාදී සියළු අවස්ථාවන්වලදී අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රමාණවත් මැදිහත් වීමක් සිදුවිය යුතු බැවින් ඒ සඳහා විධිමත් මාර්ගෝපදේශන සකස්කර ගැසට් මගින් ප්‍රකාශයට පත් කිරීම.	රජයේ අනුමත පෞද්ගලික පාසල් නියාමනය, පවතින නීති රීති සංශෝධනය කිරීම සහ ශ්‍රී ලංකා පෞද්ගලික පාසල් ගුරු සේවයට නව ගුරු භවතුන් පත් කිරීම පිළිබඳ අමාත්‍ය මණ්ඩල සංදේශයක් සකස් කිරීම සඳහා කමිටුවක් පත් කර ඇත.	රජයේ අනුමත පෞද්ගලික පාසල් නියාමනය සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රමාණවත් මැදිහත්වීමක් සිදු විය යුතු වුවද ඒ සඳහා අවශ්‍ය පවතින නීති රීති රාමුව සංශෝධනයට අදාළ කටයුතු සිදු වී නොතිබුණි.

	මැදිහත් වීමක් සිදු නොවන බවත් නිරීක්ෂණය විය.				
4	ශාඛා පාසල් ආරම්භ කිරීම 2018 වර්ෂය වන විට රජයේ අනුමත පෞද්ගලික පාසල් 08 ක ශාඛා පාසැල් 09ක් අධ්‍යාපන අමාත්‍යාංශයේ නිසි අනුමැතියකින් තොරව ආරම්භ කර පවත්වා ගෙන ගොස් තිබුණි. පසුව එම ශාඛා පාසල් 09 සඳහා ඒ දක්වා ලබා ගෙන තිබූ ගුරු වැටුප් සඳහා අනුමැතිය ලබා ගැනීමටත්, ඉදිරියේදී එම ශාඛා පාසල්වලට ගුරු වැටුප්, අදාළ ගුරු සේවක සංඛ්‍යා ගණනයට අනුව ලබා දීමටත් කැබිනට් මණ්ඩලය වෙත යෝජනා ඉදිරිපත්කර තිබුණි. එහිදී 2018 මැයි 23 දිනැති අංක අමප/18/0850/742/017 දරන අමාත්‍ය මණ්ඩල තීරණය හා එයට යා කර ඇති නිරීක්ෂණවලට අනුව, ඉදිරියේ දී යම් පෞද්ගලික මව් පාසලක් විසින් දිවයිනේ යම් ස්ථානයක ශාඛා පාසලක් ආරම්භ කිරීමේදී එක් මව් පාසලක් සඳහා උපරිමය ශාඛා පාසල් 05ක් වන පරිදි අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ලබා දෙන නිර්ණායකවලට යටත්ව පූර්ව අනුමැතිය ලබා දීමට අනුමත කර	2022	රජයේ අනුමත පෞද්ගලික පාසල්වල ශාඛා පාසල් ආරම්භ කිරීමට ලබා දී තිබූ කැබිනට් මණ්ඩල අනුමැතියට අනුව, ඉදිරියේදී යම් මව් පාසලක් විසින් දිවයිනේ යම් ස්ථානයක ශාඛා පාසලක් ආරම්භ කිරීමේ දී අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ලබා දෙන නිර්ණායකවලට යටත්ව පූර්ව අනුමැතිය ලබා දිය යුතු බැවින්, ඒ සඳහා අවශ්‍ය නිර්ණායක සකස් කිරීම.	ශාඛා පාසල් ආරම්භ කිරීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය මගින් සකස් කරනු ලැබ ඇති නිර්ණායක අනුව කටයුතු කර ඇත.	ශාඛා පාසල් ආරම්භ කිරීම අධ්‍යාපන අමාත්‍යාංශය මගින් දැනටමත් සකස් කරන ලද නිර්ණායක අනුව කටයුතු කරනු ලැබ ඇති අතර ඒ සඳහා තව දුරටත් සංශෝධන සකස් කිරීම සඳහා කමිටු තීරණ ගැනීමට නියමිතය.

	තිබුණි. ඒ අනුව 2020 දෙසැම්බර් 31 දිනට මව් පාසල් 8 ක් විසින් ශාඛා පාසල් 10 ක් පවත්වා ගෙන ගොස් තිබුණි.				
5	**ජාත්‍යන්තර පාසල් හා පෞද්ගලික පාසල් විධිමත් කිරීම පිළිබඳ කමිටුව** 1980 දශකයේ සිට මෙරට පාසල් පද්ධතිය තුළ ක්‍රියාත්මක වන ජාත්‍යන්තර පාසල් හා පෞද්ගලික පාසල් විධිමත් කිරීම සඳහා 2013/ED/E/13 හා 2013 ජුනි 03 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගේ නිර්දේශ සමඟ සලකා බැලීමෙන් අනතුරුව මෙම කරුණ පිළිබඳ අධ්‍යයනය කර අමාත්‍ය මණ්ඩලය වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා කමිටුවක් පත් කර තිබුණි. එම කමිටුව විසින් මෙම පාසල්වල ඉගෙනුම ලබන දරුවන්ට මව්බස, ආගම හා ඉතිහාසය යන විෂයයන් ඉගෙනීම අනිවාර්යය කිරීම, අධ්‍යාපන අමාත්‍යාංශය මගින් නියාමන හා අධීක්ෂණ ක්‍රියාවලියක් ස්ථාපනය කිරීමට හැකිවන පරිදි 1961 අංක 8 දරන උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධි විධාන) පනතේ 25 වගන්තිය සංශෝධනය	2022	මෙරට පාසල් පද්ධතිය තුළ ක්‍රියාත්මක වන ජාත්‍යන්තර පාසල් හා පෞද්ගලික පාසල් විධිමත් කිරීම සඳහා 2013/ED/E/13 හා 2013 ජුනි 03 දින ඉදිරිපත් කරනු ලැබූ අමාත්‍ය මණ්ඩල සංදේශය අනුව පත්කල නිලධාරි කමිටුව 2013 අගෝස්තු 28 දින සාකච්ඡා කර එකඟතාවයට එළඹි කරුණු පිළිබඳව කඩිනම් අවධානය යොමුකර අවශ්‍ය පියවර ගැනීම.	ජාත්‍යන්තර පාසල් නියාමනය සම්බන්ධයෙන් යෝජනා ක්‍රියාත්මක කිරිම සඳහා ජාත්‍යන්තර පාසල් පිළිබද නෛතික රාමුව සංශෝධනය කිරීමට කටයුතු කල යුතු ආකාරය සම්බන්ධයෙන් සහ ඉදිරි කටයුතු පිළිබඳව සමස්ත වාර්තාව සකස් කිරීම සඳහා කමිටුවක් පත් කර ඇත.	ජාත්‍යන්තර පාසල් නියාමනය සම්බන්ධයෙන් යෝජනා ක්‍රියාත්මක කිරිම සඳහා අදාළ නෛතික රාමුව සංශෝධනය කල යුතුව පවතී.

කිරීම, අධ්‍යාපනික ක්‍රියාවලිය ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියේ පොදු රාමුව තුළ සිට නියාමනය කිරීමට හැකි වන පරිදි අධ්‍යාපන අමාත්‍යාංශයේ පෞද්ගලික පාසල් අංශය, ලේකම් කාර්යාලයක් (Secretariat) බවට පරිවර්තනය කර ව්‍යවස්ථාපිත බලතල පැවරීම, සත්‍ය වශයෙන්ම ක්‍රියාත්මක වන පාසල් සංඛ්‍යාව පිළිබඳ තොරතුරු ලබා ගැනීමේ හැකියාවක් නොමැති නිසා එම පාසල්වල ඉගෙනුම ලබන දරුවන්ද ජාතික අධ්‍යාපන පද්ධතියේ ඉගෙනුම ලබන දරුවන් වශයෙන් නියෝජනය වන ක්‍රමවේදයක් සැකසීම, ජාත්‍යන්තර පාසල් හා පෞද්ගලික පාසල්වල කටයුතු ප්‍රමිතියකට අනුව විධිමත් කිරීම, භෞතික හා මානව සම්පත්වල ගුණාත්මකභාවය හා ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේ ගුණාත්මකභාවය මත එකී පාසල් ශ්‍රේණිගත කිරීමේ ක්‍රමයක් හඳුන්වා දීම, මෙම පාසල්වල අධ්‍යාපනය ලබන ලාංකික සිසුන් වෙනුවෙන් දේශීය විෂය මාලාව ආශ්‍රිතව පන්ති ක්‍රියාත්මක කරන්නේ නම්, ජාතික අධ්‍යාපන ආයතනය විසින්

නිර්දේශිත විෂයමාලාව හා උපදෙස් පිළිපැදීම, ජාත්‍යන්තර පාසල් හා පෞද්ගලික පාසල්, පොදු ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති හා ප්‍රමිතීන්ට ද අනුකූලව කටයුතු කිරීම සහතික කිරීම පිණිස රෙගුලාසි මාලාවක් සැකසීම වැනි නිර්දේශයන් ලබා දී තිබුණි.

2.19 ශ්‍රී ලංකාවේ බෝ නොවන රෝග වැළැක්වීම හා පාලන ක්‍රියාවලිය නියාමනය

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්විමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
1	**දුම්කොළ හා මධ්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය** දුම්කොළ හා මධ්‍යසාර පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් හඳුනාගෙන ක්‍රියාත්මක කිරීම ඇතුළු කාර්යයන් සඳහා 2006 අංක 27 දරන දුම්කොළ හා මධ්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය පනත සම්මත කර තිබුණද දුම්කොළ පිළිබඳ ජාතික ප්‍රතිපත්ති පිළියෙල කර නොතිබුණි	2022	දුම්කොළ පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් පිළියෙල කර ක්‍රියාවට නැංවීම	දුම්කොළ සම්බන්ධයෙන් වන ජාතික ප්‍රතිපත්තියක් මත යෝජනාව සහ ඊට අදාළ නිර්දේශ "රට තුල සීඝ්‍රයෙන් පැතිර යන මත්ද්‍රව්‍ය උවදුර වහා පාලනය කර මුලිනුපුටා දැමීමේ යාන්ත්‍රණය සොයා බැලීමට සහ හඳුනාගැනීමට සඳහා වන පාර්ලිමේන්තු තේරීම් කාරක සභාව" වෙත ඉදිරිපත් කර ඇත.	රට තුළ සීඝ්‍ර ලෙස පැතිරෙමින් පවතින මත්ද්‍රව්‍ය උවදුර වහා පාලනය කොට මුලිනුපුටා දැමීම සඳහා ක්‍රියාත්මක කළ යුතු ක්‍රමවේද පිළිබඳව කරුණු සොයා බලා ඒ පිළිබඳ නිරීක්ෂණ හා නිර්දේශ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවේ වාර්තාව තුළට මෙම නිර්දේශයන් ඇතුළත් කර ඇත.
2	ශ්‍රී ලංකාව තුල ළමයෙකු යන්න පිළිබඳව අර්ථ ගැන්වීමේදී, කම්කරු නීතියට අනුව වයස අවුරුදු 16 ට අඩු පුද්ගලයෙකු ළමයෙකු සේ සලකා තිබු නමුදු ළමුන් සහ තරුණ පුද්ගලයන් සඳහා වන 1939 ආඥා පනත (children and young	2022	සෞඛ්‍යයට අහිතකර ආහාර වර්ග ප්‍රචාරණය තහනම් කිරීමට අවශ්‍ය පියවර ගැනීම හා පාසල් යන වයසේ දරුවන් අහිතකර ආහාර වර්ග ප්‍රචාරණ දැන්වීම් සඳහා යොදා ගැනීම වළක්වාලීමට අවශ්‍ය පියවර ගැනීම.	2022 ආහාර (ලේබල්කිරීමේ හා ප්‍රචාරය කිරීම) රෙගුලාසියේ 16 වන වගන්තියට අනුව වයස අවු.12 ට අඩු දරුවන් ප්‍රචාරය සඳහා යොදා ගැනීම තහනම් කර ඇත. එම	දරුවන් ප්‍රචාරණ කටයුතු සඳහා යොදා ගැනීම සමබන්ධ නියාමන ක්‍රියාවලියනක් වර්තමානය වන විටද ක්‍රියාත්මක නොවේ.

	persons ordinance) ප්‍රකාරව වයස අවුරුදු 14 ට අඩු අයවලුන් ළමයින් සේ සලකා තිබුණි. වර්තමානයේ ආහාර සහ පාන වර්ග සම්බන්ධයෙන් විකාශනය කෙරෙන විවිධ වෙළඳ දැන්වීම් සඳහා ළමුන් බහුල වශයෙන් උපයෝගී කර ගන්නා බව රූපවාහිනී වෙළඳ දැන්වීම් නැරඹීමේදී නිරීක්ෂණය වූ කරුණක් විය. නූඩ්ල්ස්, බිස්කට්, චොක්ලට්, මාගරින් වැනි විවිධ ආහාරයන් සම්බන්ධයෙන් මෙම තත්ත්වය නිරීක්ෂණය විය. දරුවන් යොදා ගෙන සිදු කරනු ලබන ප්‍රචාරණ දැන්වීම් සඳහා වර්තමානයේදී නිශ්චිත වයස් සීමාවන් නොමැති අතර, ප්‍රචාරණ දැන්වීම් ප්‍රචාරණය කිරීමට පෙර අනුමැතිය ලබා ගැනීමේ ක්‍රමවේදයක්ද නොමැති බව නිරීක්ෂණය විය.			නියෝගය 2024.01.01 දින සිට ක්‍රියාත්මක වීමට තිබූ නමුත් පසුව එය 2025.01.01 දක්වා ක්‍රියාත්මක කිරීම අමාත්‍යවරයා විසින් කල් තබා ඇත.	
3	**2019 ආහාර (සීනි, ලුණු සහ මේදය සඳහා වර්ණ සංකේතවත් කිරීමේ) නියෝග** වර්තමානය වන විට ශ්‍රී ලංකාව තුළ ඉහළ යමින් පවතින බෝනොවන රෝග තත්ත්වයන් අතර, ප්‍රමුඛස්ථානයක් ගන්නා හෘද රෝග, දියවැඩියාව, අධික කොලොස්ටරෝල් වැනි රෝග තත්ත්වයන්	2022	ලුණු සීනි සහ මේදය සම්බන්ධයෙන් හඳුන්වා දී ඇති වර්ණ සංකේත ක්‍රමය සම්බන්ධ නියෝගයෙහි ක්‍රියාත්මකභාවය පිළිබඳ ඇගයීම් සිදු කිරීම.	ලුණු සීනි සහ මේදය සම්බන්ධයෙන් පාට සංකේත පිළිබඳ සමීක්ෂණයක් සිදු කර ඇත.	නියෝග ක්‍රියාත්මක කරවීම දිගින් දිගටම කල් දමා තිබුණි.

උදෙසා දායක වන ආහාරමය සාධක ලෙස අධික සීනි, ලුණු සහ මේද පරිභෝජනයන් හඳුනාගෙන තිබේ. සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් 1980 අංක 26 දරන ආහාර පනත යටතේ ආහාරවල අඩංගු සීනි, ලුණු සහ මේද ප්‍රමාණයන් සම්බන්ධයෙන් පාලනයක් සඳහා වර්ණ සංකේත ක්‍රමයක් නව නියෝගයක් ලෙස හඳුන්වා දී තිබුනද එකී නියෝගයෙහි ක්‍රියාත්මකභාවය සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

I. අංක 2119/3 සහ 2019 අප්‍රේල් මස 17 දිනැති ගැසට් පත්‍රයෙහි ප්‍රකාශිත පරිදි මෙම නියෝගය 2019 ජුනි මස 01 දින සිට ක්‍රියාත්මක විය යුතුවේ. මෙම වර්ණ සංකේත ක්‍රමය ක්‍රියාත්මකවීමට අදාළව 2019.05.24 දින අංක PA/EOH/FCAU/43/2017 අංකය යටතේ විධාන අංක 01 ලෙස සඳහන් කරමින් එවකට වැඩ බලන සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් විධානයක් නිකුත් කර තිබේ. ඒ අනුව

2019.06.01 දිනෙන් පසුව නිෂ්පාදනය කරනු ලබන ඝන හා අර්ධ ඝන ආහාරවල වර්ණ සංකේතවත් කිරීම නිසි අයුරින් සිදු කිරීම සඳහා අදාළ බල ප්‍රදේශ තුළ සිටින නිෂ්පාදකයින්ට මඟ පෙන්වීම බලයලත් නිලධාරීන් විසින් සිදු කළ යුතුවීම.

II. 2019 ජුනි මස 01 දින සිට ක්‍රියාත්මකවීමට නියමිතව තිබූ මෙම ආහාර (සීනි, ලුණු සහ මේදය සඳහා වර්ණ සංකේතවත් කිරීමේ) නියෝග සෑම ඝන හා අර්ධ ඝන ආහාර ද්‍රව්‍යයක් සම්බන්ධයෙන්ම ක්‍රියාත්මක විය යුතුය. එසේම කිසිදු තැනැත්තෙකු විසින් නියෝගවල 1 වන උපලේඛනයේ පරිදි නිශ්චිතව දක්වා ඇති සීනි ප්‍රමාණය, ලුණු ප්‍රමාණය හෝ මේද ප්‍රමාණය අන්තර්ගත වන යම් ඝන හෝ අර්ධ ඝන ආහාරයක් නියෝගවල නිශ්චිතව දක්වා ඇති ආකාරයෙන් ලේබල් කර ඇත්නම් මිස ඇසුරුම් කිරීම, විකිණීම, විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීම හෝ ප්‍රචාරණය කිරීම නොකළ යුතු බව දක්වා තිබීම.

4	ප්‍රාථමික සෞඛ්‍ය සේවා සඳහා නිදන්ගත ශ්වසන රෝග කළමනාකරණය සඳහා වන මාර්ගෝපදේශ සංග්‍රහයේ දක්වා ඇති කළමනාකරණ මූලධර්ම therapeutic options ලෙස රෝගීන් සඳහා ප්‍රජාපාදක වූ පුප්පුෂීය පුනරුත්ථාපන වැඩසටහන් (Community based out patient pulmonary rehabilitation programme) පැවැත්විය යුතු බව හඳුනාගෙන තිබුණද ශ්වසන රෝගීන් සඳහා පුනරුත්ථාපන වැඩසටහන් පැවැත්වීම සඳහා ප්‍රමාණවත් උපකරණ හා කාර්යය මණ්ඩලය රෝහල් තුල නොමැති වීම හේතුවෙන් රෝගීන් සඳහා භෞතික චිකිත්සක ව්‍යායාම සිදු කිරීමේ හැකියාව අඩු මට්ටමක පැවතුණි. වැලිසර ශ්වසන රෝග පිළිබඳ ජාතික රෝහල තුළ වාර්ෂික ප්‍රසම්පාදනයට ඇතුළත් කළ Multifunction Electrical Postural Drainage Bed 03 ක්, Multi para Monitor 03 ක්, Treadmill 01 ක් අවශ්‍යව පැවති බවත් නිරීක්ෂණය වීම.	2022	ශ්වසන ජාතික රෝහලට අවශ්‍ය උපකරණ ඖෂධ හා කාර්ය මණ්ඩලය ලබාදීම.	වාර්ෂික ප්‍රසම්පාදනයට ඇතුළත් කර ඇත.	2024 නොවැම්බර් මස 11 වන දිනට තවදුරටත් Multifunction Electrical Postural Drainage Bed 03 ක්, Multi para Monitor 03 ක්, Treadmill 01 ක් සැපිරිය යුතුව ඇත.

2.20 බහාලුම්ගත ජංගම ඩීසල් විදුලිජනක යන්ත්‍ර මිලදී ගැනීමේ කාර්යසාධනය

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
1	ලංවිම ජාතික පද්ධති පාලන මධ්‍යස්ථානයේ දත්ත සහ කැලණිතිස්ස විදුලි බලාගාරයේ පවත්වාගෙන යනු ලබන ජනක යන්ත්‍ර 50 ට අදාල විදුලිය බිඳවැටීම් වාර්තා අනුව , කොන්ත්‍රාත්කරු විසින් ඉටුනොකරන ලද අතපසුවීම්, අඩුපාඩු, සැලසුම්කරණයේ දුර්වලතා හේතුවෙන් සිදුවූ යන්ත්‍ර බිඳවැටීම් හා නැවැත්වීම් වල බලපෑම නිසා 2022 ජනවාරි සිට අප්‍රේල් මාසය දක්වා කාලය තුල ලංකා විදුලිබල මණ්ඩලයට රුපියල් මිලියන 1,263 ක ඇස්තමේන්තුගත මූල්‍ය අලාභයක් සිදුව ඇති බව 2022 මැයි 22 දිනැති ප්‍රධාන නීති නිලධාරී ඇමතු නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (තාප බලාගාර) ලිපියෙහි දක්වා තිබුණි. ඉහත කරුණු සියල්ලම සලකා බැලීමේදී ජනක යන්ත්‍ර නිරන්තරයෙන් කාර්මික දෝෂයන්ට ලක්වන බවත් ඒ හේතුවෙන් ඒවා උපරිම බලාගාර සාධකයකින් භාවිතා කිරීමේ අවස්ථාව	2023	ජනක යන්ත්‍රයන්හි දැනට පවතින දෝෂ නිවැරදි කර ගනිමින් ඒවායේ නඩත්තු කටයුතු විධිමත්ව පවත්වාගෙන යාමට කටයුතු කල යුතුය.	2024 ඔක්තෝම්බර් 21 දින වන විට විවිධ කාර්මික දෝෂ හේතුවෙන් හම්බන්තොට හා මතුගම ස්ථාපිත කොට ඇති ජනක යන්ත්‍ර 5ක් විවිධ අක්‍රිය තත්ත්වයේ පවතින අතර ඉන් එක් යන්ත්‍රයක් 2022 මාර්තු මස 01 දින සිට එහි ඩීසල් එංජිමේ වූ දෝෂයක් හේතුවෙන් අක්‍රිය තත්ත්වයේ පවතී. මේ වන විට එම දෝෂ නිවැරදි කිරීමට අවශ්‍ය අමතර කොටස් ප්‍රසම්පාදනය කරමින් නඩත්තු කටයුතු සිදු කරමින් පවතී.	යන්ත්‍ර ධාවනයේදී වරින් වර දෝෂ පැන නගින අතර එසේ හඳුනා ගන්නා දෝෂ සඳහා පිළියම් යොදමින් ඒවා යථා තත්ත්වයට පත් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරයි.

මණ්ඩලයට අහිමි වී ඇති බවත් දෝෂ වගකීම් කාලය තුල කොන්ත්‍රාත්කරු විසින් එම දෝෂ නිවැරදි කිරීම සඳහා ලබා දුන් දායකත්වය අවම මට්ටමක පැවති බවත් නිරීක්ෂණය කෙරේ.

2.21 බන්ධනාගාරය තුල පවත්නා තදබදය කළමනාකරණය කිරීම පිලිබඳ කාර්යසාධන විගණනය

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
1	මත්ද්‍රව්‍ය වැරදි වැඩිවීම රටේ අනෙකුත් අපරාධ ක්‍රියාකාරකම් වැඩිවීමට සෘජුවම බලපායි. තවද මත්ද්‍රව්‍ය වැරදිකරුවන්ගෙන් බොහෝමයක් මත්ද්‍රව්‍ය භාවිතය, සන්තකයේ තබා ගැනීම, මිලදී ගැනීම, විකිණීම සම්බන්ධයෙන් බන්ධනාගාර ගත වූවන් වේ. ඒ අනුව ශ්‍රී ලංකාවේ බන්ධනාගාරගත රැඳවියන්ගෙන් විශාල ප්‍රමාණයක් මත්ද්‍රව්‍ය සඳහා වන වැරදි වලට සම්බන්ධ වූවන් වෙති. ලංකාවේ 2022 දෙසැම්බර් 31 දිනට බන්ධනාගාර රැඳවියන් සංඛ්‍යාව 26,176 ක් වන අතර ඉන් සියයට 53 කට අධික පිරිසක් එනම් 13,794 ක් මත්ද්‍රව්‍ය වැරදි හා සම්බන්ධ වන රැඳවියන් වේ. මත්ද්‍රව්‍ය වැරදි සම්බන්ධයෙන් රැඳවියන් 4,406 දෙනෙකු සිරකරුවන් වන අතර 9,388 දෙනෙකු සැකකරුවන් වේ.	2023	1. 2022 අංක 41 දරන විෂ වර්ග, අබිං සහ අන්තරාදායක ඖෂධ වර්ග සංශෝධන පනතේ 54 වන වගන්තිය අනුව අධිකරණය මඟින් බන්ධනාගාර ගත කරන සැකකරුවන්ට අදාලව පොලිස් දෙපාර්තමේන්තුව විසින් රස පරීක්ෂක දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කරන නියැදි (Sample) වලට අදාල රස පරීක්ෂක වාර්තා අධිකරණයට අප්‍රමාදව ඉදිරිපත් කිරීම. 2. අපරාධ යුක්ති දාම ප්‍රවේශයේ පවතින ආයතන අතර සහයෝගිතා යාන්ත්‍රණය වැඩිදියුණු කිරීම සහ හැකිතාක් නවීන තාක්ෂණය උපයෝගී කර ගැනීම. 3. බන්ධනාගාර කළමනාකරණයට	රස පරීක්ෂක වාර්තා ප්‍රමාදවීම හේතුවෙන් රක්ෂිත බන්ධනාගාරගතව සිටින සැකකරුවන් ඇප මත මුදාහැරිමට අදාලව 1991 අංක 08 දරන රිමාන්ඩ් භාරයේ සිටින සිරකරුවන් මුදවා හැරීමේ පනත යටතේ ඔවුන්ට ඇප ලබා දීමට අදාලව අදාල ආයතන මගින් එම සැකකරුවන්ගේ තොරතුරු සමග අදාල අධිකරණයන්ගේ අවධානය සඳහා යොමු කරන අතර, රස පරික්ෂක වාර්තාවන් කඩිනමින් ලබා දිම බන්ධනාගාර දෙපාර්මේන්තුවේ පාලනයෙන් බැහැරව පවතී. මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන්	මෙම තත්වය බන්ධනාගාර දෙපාර්තමේන්තුවට පාලනය කල නොහැකි තත්වයක් වුවද අධික තදබදය වැලැක්වීමට ගත හැකි සරල ක්‍රියා මාර්ග ක්‍රියාත්මක කිරීමට සම්බන්ධිත ආයතනයක් හා බන්ධනාගාර දෙපාර්තමේන්තුව මෙතෙක් විධිමත් ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි.

පහසු වන පරිදි සමාජ ආරක්ෂණයට හානියක් නොවන සේ මත්ද්‍රව්‍ය වැරදි හා සම්බන්ධ නීති සංශෝධනය කිරීම පිළිබඳව අවධානය යොමු කිරීම.	චෝදනා ලබා රිමාන්ඩ් බන්ධනාගාර ගත වන ප්‍රමාණය ඉහළ යාම පිළිබඳව අදාල අංශ දැනුවත් කිරීමට කටයුතු කර ඇත. එසේම මෙම ගැටළුව සඳහා බන්ධනාගාරයෙන් පරිබාහිර විකල්ප ආයතන ඇති කිරීම සම්බන්ධයෙන්ද අවධානය යොමු කළ යුතු බව අදාල සාකච්ඡා වලදී දැනුවත් කර ඇත. බන්ධනාගාර ගතවන පුනරුත්ථාපන ලාභීන් අතරින් යම් පිරිසක් පුනරුත්ථාපන කාර්යාංශය යටතේ පාලනය වන සේනපුර සහ කන්දකාඩු පුනරුත්ථාපන මධ්‍යස්ථාන වෙත අධිකරණ නියෝග මත ඇතුලත් කරන අතර අධිකරණ මගින් බොහෝ අවස්ථාවලදී රුඳවියන් සුදුසු පුනරුත්ථාපනයට යොමු කරන ලෙසට නියෝග

				කරන අවස්ථාවලදී බන්ධනාගාර ආයතනවල ක්‍රියාත්මක වන අමදිවි රිද්ම පුනරුත්ථාපන ක්‍රියාවලිය සඳහා රැඳවියන් යොමු කරනු ලබන බවද දන්වමි.	
2	වැලිකඩ බන්ධනාගාර සංකීර්ණය හොරණ ප්‍රදේශයේ නැවත ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතිය නාගරික සංවර්ධන අධිකාරිය, නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය හා බන්ධනාගාර දෙපාර්තමේන්තුව ඒකාබද්ධව සිදු කරනු ලබයි. මෙම ව්‍යාපෘතියට අදාල පාරිසරික බලපෑම ඇගයීමේ වාර්තාව, සැලසුම් හා නිර්මාණ කටයුතු, අභ්‍යන්තර මාර්ග, ජලය හා විදුලිය ඇතුළු යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ කටයුතු සියයට 30 ක් පමණ නිම කර ඇත. කෙසේ නමුත් මුදල් අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද අංක 03/2022 හා 2022.04.26 දිනැති චක්‍රලේඛය අනුව මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තාවකාලිකව අත්හිටුවා ඇත.	2023	තාවකාලිකව ක්‍රියාත්මක කිරීම අත්හිටුවා ඇති වැලිකඩ බන්ධනාගාර සංකිර්ණය සුදුසු ප්‍රදේශයක ස්ථාපිත කිරීම.	මෙම ව්‍යාපෘතිය නාගරික සංවර්ධන අධිකාරිය මගින් ක්‍රියාත්මක කරනු ලැබූ ව්‍යාපෘතියකි. මුදල් අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද අංක 03/2022 චක්‍රලේඛය අනුව මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තාවකාලිකව අත්හිටුවා ඇත.	මෙම ව්‍යාපෘතිය නාගරික සංවර්ධන අධිකාරිය මගින් ක්‍රියාත්මක කරනු ලැබූ ව්‍යාපෘතියක් වන අතර බන්ධනාගාර දෙපාර්තමේන්තුව විසින් කිසිදු පිරිවැයක් දරා නොමැත. මුදල් අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද අංක 03/2022 චක්‍රලේඛය අනුව මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තාවකාලිකව අත්හිටුවා ඇත.

3	බන්ධනාගාර ධාරිතාවය ඉක්මවා රැඳවියන් ප්‍රමාණය වැඩිවෙත්ම රැඳවියන් හට ප්‍රමාණවත් පරිදි සනීපාරක්ෂක පහසුකම් ලබා දීම දුෂ්කර වේ. 2023 අප්‍රේල් 30 දින වන විට බන්ධනාගාර 27 ක වැසිකිළි 187 ක හිඟයක් පැවති අතර, දැනට තිබෙන වැසිකිලිවලින්ද 287 ක් අළුත්වැඩියා කල යුතු තත්ත්වයේ පැවතුණි.	2023	බන්ධනාගාරවල අබලන්ව ඇති සනීපාරක්ෂිතභාවයෙන් හා ආරක්ෂිතභාවයෙන් අඩු ගොඩනැගිලි ප්‍රතිසංස්කරණය කිරීම හෝ නව ගොඩනැගිලි ඉදි කර රැඳවියන්ගේ මානුෂික අවශ්‍යතා ඉටු කිරීම.	නව වැසිකිළි 106 ක් ඉදිකිරීම සඳහා හා වැසිකිළි 166 ක් අලුත්වැඩියා කිරීම සඳහා අනුමැතිය ලබා දී ඇත.	එම ප්‍රමාණය සඳහා අවශ්‍ය ප්‍රතිපාදන නිකුත් කර ඇත. මීට අමතරව සුලු අලුත්වැඩියා සිදු කර අදාල සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කර නිම කිරීම සඳහා 1303 වැය ශීර්ෂය යටතේ ඉටු කර ගන්නා ලෙස බන්ධනාගාර අධිකාරී වෙත උපදෙස් ලබා දී ඇත. වැඩකටයුතු 90% කට වඩා ඉටු කර ඇත.
4	සිරකරුවන් විධිමත් පරිදි පුනරුත්ථාපනය කිරීමට නොහැකි වූ විට ඔවුන් නැවත නැවත බන්ධනාගාර වීම වැළැක්විය නොහැක. බන්ධනාගාරවල සිටින සිරකරුවන්ගෙන් වැඩි පිරිසක් මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහිවූවන් නිසා ඔවුන් සඳහා අවශ්‍ය ප්‍රතිකාර කිරීම් හා විධිමත් පුනරුත්ථාපන වැඩසටහන් බන්ධනාගාර පද්ධතිය තුල ක්‍රියාත්මක කල යුතුය.එසේම බන්ධනාගාරයෙන් නිදහස ලැබූ පසුවද මොවුන් ප්‍රජා සේවාවන්ට කිසිදු සම්බන්ධයක් නොමැති නම් සහ අඛණ්ඩව රැකවරණය මොවුන්ට නොලැබේ	2023	රැඳවියන්ගේ ශ්‍රමය හා දැනුම සාමාජයීය වශයෙන් ඵලදායී කාර්යය සඳහා යොමු කරවීම වර්ධනය කිරීම.	විගණන නිරීක්ෂණ හා එකඟ වන නමුත් මෙම ක්‍රියා දාමය රජයේ මත්ද්‍රව්‍ය මර්ධන ප්‍රත්පත්තිය මත තීරණය වන ක්‍රියාවලියක් බැවින් බන්ධනාගාර දෙපාර්තමේන්තු වේ පාලනයෙන් පරිබාහිර කටයුත්තකි. බන්ධනාගාර වෙතින් මෙම සිරකරුවන් පුනරුත්ථාපන මධ්‍යස්ථාන වෙත යොමු කිරීම සිදු කරන අතර, බන්ධනාගාර	මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූවන්ට ප්‍රතිකාර කිරීම හෝ මත්ද්‍රව්‍යට ඇබ්බැහිවූවන් පුනරුත්ථාපනය කිරීම බන්ධනාගාරගත කිරීමෙන් පමණක් සිදු කළ නොහැක. මත්ද්‍රව්‍ය භාවිතා කරන්නන් අපරාධකරුවන් ලෙස සැලකිය නොහැකි අතර ඔවුන්ට ප්‍රතිකාර ලබාදීමට බන්ධනාගාර දෙපාර්තමේන්තු වෙන් පරිභාහිර ආයතන ව්‍යුහයක් තුළ වෛද්‍ය

	නම් නැවතත් මත්ද්‍රව්‍ය භාවිතය සඳහා පෙළඹීමේ සම්භාවිතාවයක් පවතී. එබැවින් මොවුන් නැවත නැවත සිරගත වීම සිදු විය හැක. ශ්‍රී ලංකාවේ බන්ධනාගාර ගත වූ සිරකරුවන්ගෙන් සැළකිය යුතු සංඛ්‍යාවක් නැවත නැවත සිරගත වූ සිරකරුවන් වේ.		තුලද අමදිව් රිද්ම වැනි පුනරුත්ථාපන වැඩසටහන් සිදු කරනු ලබයි. මේ සම්බන්ධව පත් කර ඇති කාර්යසාධන බලකා හා අනෙකුත් ප්‍රතිපත්තිමය තීරණ ගන්නා සාකච්ඡාවලදී ද නුවත් කිරීමට කටයුතු කර ඇත.	පහසුකම්ද සහිතව පුනරුත්ථාපන කටයුතු සිදුවිය යුතුය. මේ සඳහා පුනරුත්ථාපන කාර්යාංශය, ප්‍රජා විශෝධන දෙපාර්තමේන්තුව වැනි ආයතන ස්ථාපිත කර තිබුණත් මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූවන් බන්ධනාගාරවලට යොමුකිරීම දිගින් දිගටම සිදු වේ.
5	බන්ධනාගාර තදබදය ඉහල යාමත් සමඟ රැඳවියන් ප්‍රමාණය වැඩිවීම නිසා සිරකරුවන් පුනරුත්ථාපනය කිරීමට තිබෙන භෞතික හා මානව සම්පත් හිඟතාවය මත සිරකරු ශ්‍රමය පුද්ගලික අංශයේ ව්‍යාපෘතිවල යෙදවීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය 2020 මැයි 14 දිනැති අංක 20/0792/207/025 යටතේ අනුමැතිය ලබී තිබුණි. නමුත් පෞද්ගලික සමාගම්වල සේවයේ යෙද වූ සිරකරුවන්ට ඒ සඳහා අදාල ක්ෂේත්‍රයේ මාස 03 ක පුහුණුවක්, වෘත්තීය මට්ටමේ සහතිකයක් (NVQ) ලබා දීමත්, විදේශීය රැකියා සඳහා විදේශීය භාෂා පුහුණුවක් ලබා දී නොතිබුණි			වැරදිකරුවන් කර බන්ධනාගාරගත කරනු ලබන රැඳවියන් බන්ධනාගාර දෙපාර්තමේන්තුව යටතේ ඇති විවෘත වැඩකඳවුරු, කර්මාන්ත අංශයන්, බන්ධනාගාරවල නඩත්තු කටයුතු, එදිනෙදා බන්ධනාගාරය තුළ සිදුකළ යුතු ක්‍රියාවලින් (ආහාර සැකසීම ආදී) කාර්යයන් වල යොදවා ඔවුන්ගේ ශ්‍රමය ඵලදායී ලෙස පවතින සම්පත් භාවිතා කරමින් උපයෝජනය කිරීමට කටයුතු කර ඇත.
6	කාලීන අවශතාවයන්ට ගැලපෙන පරිදි රැඳවියන් පුනරුත්ථාපනය කර යහපත් පුරවැසියන් ලෙස සමාජගත කිරීමට අවශ්‍ය සමාජ පසුබිම සැකසීම		ලංකාවේ බන්ධනාගාර ආයතනවල රැඳවිය හැකි රැඳවි ධාරිතාවය මෙන් දෙගුණය	රැඳවියන්ට

බන්ධනාගාරයේ ප්‍රධාන කාර්යයන් අතරින් එකකි. එහිදී, අධ්‍යාපනය, කාර්යයක නිරත වීම වැනි අර්ථවත් ක්‍රියාකාරකම් සහ වෙනත් වැඩසටහන් වෙත රැඳවියන් යොමු කිරීම හා සාධනීය බන්ධනාගාර පරිසරයක් නිර්මාණය කර රැඳවියන්ගේ ශක්තිය නිර්මාණාත්මක වෘත්තීන් වෙත යොමු කිරීමෙන් පසුව සමාජයට නැවත ඇතුලත් කිරීම සඳහා සුදානම් කිරීමට සහය වීමක් ඇති වන පරිදි පුනරුත්ථාපන කටයුතු පවත්වාගෙන යා යුතුය. නමුත් බන්ධනාගාර තදබදය හමුවේ රැඳවියන් පුනරුත්ථාපනයේදී ගැටළු මතු වේ.

ඉක්මවන පමණ ජනගහනයක් බන්ධනාගාරවල රඳවාගැනීමට සිදුව ඇති නිසා පුනරුත්ථාපන ක්‍රියාවලිය පමණක් නොව බන්ධනාගාරවල සමස්ත ක්‍රියාවලියම ඉතා අභියෝගාත්මක වී ඇත. එසේ වුවද අධික තදබදයක් සහිත තත්ත්වයක් තුළ වුවද බන්ධනාගාර දෙපාර්තමේන්තු වේ අරමුණු වන අත්අඩංගුවේ තබාගැනීම, රැඳවියන්ට රැකවරණය ලබාදීම හා ඔවුන් පුනරුත්ථාපනය කිරීම යන ක්‍රියාවලිය හැකි උපරිම මට්ටමෙන් සිදුකිරීමට බන්ධනාගාර දෙපාර්තමේන්තුව වෙහෙසෙමින් සිටී.

වෘත්තීය පුහුණු අවස්ථා ලබාදීමත්, ඔවුන්ගේ ශ්‍රමය වඩාත් ඵලදායී ලෙස උපයෝජනය කිරීමත්, නූතන තාක්ෂණික ක්‍රමවේදයන් සමඟ වෘත්තීය පුහුණු ලබාදීමත් යන අරමුණු සහිතව ක්‍රියාත්මක කරන ලද එක් ව්‍යාපෘතියක් ලෙස රාජ්‍ය හා පුද්ගලික අංශය එක්ව සිදුකරන ව්‍යාපෘති පෙන්වාදිය හැකිය. (Private Public Partnership Project). එහෙත් විදේශ රැකියා හා විදේශ භාෂා පුහුණු ලබාදී NVQ මට්ටමේ සහතිකපතක් ලබාදීමේ අරමුණෙන් ක්‍රියාත්මක කරන ලද වටරැක ව්‍යාපෘතිය පැවති කොවිඩ් වසංගත තත්ත්වය හා ආර්ථික අර්බුධකාරී තත්ත්වය නිසා මේ වන විට නතර කර ඇත. මත්ද්‍රව්‍ය වැරදි

සඳහා අත්අඩංගුවට ගෙන ඇති සැකකරුවන් සංඛ්‍යාව අධික වීම හේතුවෙන් බන්ධනාගාරවල ධාරිතාවය ඉක්මවා රැඳවියන් රඳවා ඇත. මෙහෙදී සිරකරුවන් හා සැකකරුවන් වෙන්කොට තබා නොමැති අතර පුනරුත්ථාපන ක්‍රියාවලිය සිරකැවන්ට පමණක් සිදු කලද එම සිරකරුවන්ද පුනරුත්ථාපන වැඩසටහන් වලින් පසුව සැකකරුවන් සමඟ නැවත රඳවා ඇති බැවින් ඡේදයේ දක්වා ඇති පරිදි මේ වන විටත් විධිමත් පුනරුත්ථාපනයක් සිදු නොවේ.

2.22 ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ බස්රථ ඇණිය උපරිම ධාරිතාවයෙන් උපයෝජනය කිරීම.

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
1	27 නොවැම්බර් 1991 මණ්ඩලය දින අමාත්‍ය විසින් අනුමත කරන ලද තිපත්තියවාහන ප්‍රප් 14 ඔක්තෝබර් 2009 දින සංශෝධනය කර එය .තිබුණි යාවත්කාලීන කිරීමේ අරමුණින් වැඩමුළු කෙටිකාලීන ,පැවැත්වීම ,උපදේශක ගාස්තු ,මහජන විමසුම් ,පුවත්පත් ,ණසම්මන්ත්‍ර දැන්වීම් ආදිය ඇතුළු තිප්‍රපත්ති සකස් කිරීමේ ක්‍රියාවලිය සඳහා ජාතික ප්‍රවාහන කොමිෂන් සභාව යටතේ තිබෙන අරමුදල් වලින් රුපියල් මිලියන ක් වෙන් 2.5 .කර තිබුණි එම මුදලින් ඉහත කරුණු සඳහා රු 334,135.ක් වැය කර තිබුණද 2009 මාර්තු 2023 වර්ෂයේ සිට විටත් වසර දින වන 01 ක කාලයක් ගතව 15 තිබුනද ජාතික ප්‍රවාහන ප්‍රතිපත්තිය තවදුරටත් කෙටුම්පත් අවස්ථාවේ පවතින බව නිරීක්ෂණය විය.		නොවැම්බර් මස 1991 ,අනුමත කරන ලද 2009ඔක්තෝබර් සංශෝධනය කරන ලද ජාතික ප්‍රවාහන ප්‍රතිපත්තිය පිළියෙල කිරීම කඩිනම් කිරීම.	පිළිතුරු ලබාදී නොමැත .	මේ දක්වා ජාතික ප්‍රවාහන ප්‍රතිපත්තිය සකස් කිරීමට කටයුතු කර නොමැත.
2	පනතේ පූර්විකාවේ (ඇ) වගන්තිය අනුව සමාජීය			පිළිතුරු ලබා දී නොමැත.	මේ දක්වා කිසිදු වැඩපිළිවෙලක්

	එහෙත් වශයෙන් අවශ්‍ය ලාභ නොලබන ගමන් මාර්ග සේවා සහ ගමන්වාර බස් රථ මගින් වාහනයට අදාළ මගී ප්‍ර මාණවත්ප්‍රබස් සේවාවක් මෙහෙයවීම සඳහා විධිවිධාන සැලැස්වීමත් එම සේවා සපයන්නන් අතර යහපත් තරඟයක් ඇති කර අසාධාරණ සහ ලාභ නොලබන තරඟකාරීත්වය වැලැක්වීමට අවශ්‍ය කටයුතු සහ වැඩ පිළිවෙලක් සකස් කළ යුතු වුවත්කොමිෂන් , සභාව විසින් ඒ සඳහා .කටයුතු කර නොතිබුණි				ක්‍රියාවට නගා නොමැත.
3	ශ්‍රී ලංගම කාර්මික කොට්ඨාශය මගින් ප්‍රාදේශික හරහා බස් රථ ම බස්ක් හා මධ්‍ය 5,918 රථ කාර්යාලයේ සහ අධි සුඛෝපභෝගී සංචාරක වාහන සේවයේ බස් රථප්‍ර ක් වශයෙන් එකතුව 85 ක් 6,003 බස් රථ දෛනිකව සේවයට ලබා දීමට සැලසුම් කර තිබුණද කාර්මික කොට්ඨාශය මගින් ධාවනයට ලබා දීමට සමත්ව ඇති බස් රථ ප්‍රමාණය ක් 5,118 බව 85.26 හෙවත් සියයට .විය නිරීක්ෂණය	2023	1. ටයර් නැවත පිරවීමේ කර්මාන්ත ශාලාවේ ධාරිතාවය ඉහළ නංවා මණ්ඩලීය බස් රථ ඇණිය සඳහා අවශ්‍ය ටයර් නැවත පිරවුම්)Rebuild(හා පෙරසවි)Recapකිරීම (යාමාර්ග සඳහා ක්‍රි .ගැනීම 2. ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් මගී ප්‍රවාහන අවශ්‍යතා සපුරාලීම පිණිස විද්‍යාත්මකව තීරණය කරනු ලබන පොදු කාලසටහනක් මත මගී ප්‍රවාහන අවශ්‍යතා සපුරාලීම.	රියදුරු හා කොන්දොස්තර හිඟය, විශාල අළුත්වැඩියාවන් සඳහා බස් රථ නතර කිරීමට සිදුවීම, එන්ජින් කට්ටල නොමැති වීම, සුළු කාර්මික දෝෂ, හදිසි අනතුරු, ටයර් හා බැටරි නොමැතිවීම යන කරුණු මත බස් රථ නැවතී ඇති අතර සේවක හිඟය මෙය යථාවත් කිරීමට බාධා වී ඇත.	මේ දක්වා ඒ සඳහා නිසි විසඳුම් ලබා දීමට කළමනාකරණය අසමත්ව ඇත.

4	බස් රථ ඇණිය මුළුමනින්ම ධාවනයට යෙදවීමට ප්‍රධාන බාධකය බවට මණ්ඩලයේ පවතින රියදුරු ප්‍රමාණය ක් 7,786 හා කොන්දොස්තර බලපා 7,768 මාණයප්‍ර .ඇති බව නිරීක්ෂණය විය දීර්ඝ කාලයක සිට රියදුරු සහ කොන්දොස්තර මහතුන් අළුතින් බඳවා නොගැනීම මෙම තත්ත්වයට හේතු වී ඇති බව වැඩිදුරටත් .නිරීක්ෂණය විය		බස් රථවල ඉන්ධන දහනය පිළිබඳ තත්ත්ව පරීක්ෂණයක් නිරන්තරව සිදු කිරීම හා රියදුරු හා කොන්දොස්තර මහතුන්ගේ හිහය මඟහරවා විධිමත් පරිදි රාජකාරී චක්‍ර සකස් කිරීම .	රියදුරු හා කොන්දොස්තර හිහය මගහරවා ගැනීමට ඇති බාධකය මේ සඳහා බලපා ඇත.	රියදුරු හා කොන්දොස්තර හිහය මගහරවා ගැනීම සඳහා නව බඳවා ගැනීම් සිදුකරමින් පවතී.
5	පවත්නා බස් රථ ඇණියෙහි ආයු කාලය වසර ක් ඉක්මවා 15 ධාවනය නොවන ටාටා වර්ගයේ බස් රථ ක් 630 ලේලන්ඩ් වර්ගයේ බස් ක් වෙනත් 425 රථ ක් 50 වර්ගවල බස් රථ වශයෙන් එකතුව බස් රථ වක් ක සංඛ්‍යා 1,105 මෙම බස් ,පවතින අතර රථ කිසිඳු ආරක්ෂක පියවරකින් තොරව .තා තිබුණිඩිපෝවල නව මෙම බස් රථ වලින් ධාවනයට එක් කළ හැකි බස් රථ මොනවාද යන්න පිළිබඳව සොයා බලා ඒවායෙහි තත්ත්ව වාර්තාවක් ගෙන අළුත්වැඩියා කටයුතු සිදු කිරීමට හෝ භාවිතයට ගත නොහැකි ගර්හිත බස් රථ අපහරණය කිරීමට කිසිඳු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.		මූලාා ප්‍රතිපාදන නිසි පරිදි උපයෝජනය කරමින් හා ප්‍රාදේශීය වැඩපොළ හා ඩිපෝ මඟින් පැරණි අමතර කොටස් හා බස්රථ අළුත්වැඩියා කිරීම හා කාර්මික අංශයේ කාර්යය මණ්ඩලය නිසි පරිදි උපයෝජනය කිරීම	දැනුම සහ නිපුනතාවය නොමැති කාර්යමණ්ඩලය ක් පැවතීම තුළ අවශ්‍ය තත්ත්ව වාර්තා නිසි පරිදි ලබා ගෙන බස් රථ අලුත් වැඩියා හා අපහරණ කටයුතු සිදු කිරීමට නොහැකි වී ඇත.	මෙම තත්ත්වය සඳහා දැනටද සාධනීය විසඳුමක් ලබාදීමට කටයුතු කර නොමැත.

6	බස් රථ පුනරුත්ථාපනය සඳහා වර්ෂයේ මහා 2022 භාණ්ඩාගාරය විසින් 750.මි.රුක් ලබා දී ඇති අතරමෙම මුදල් , උපයෝජනය කර පුනරුත්ථාපනය කර ධාවනයට එක් කරන ලද බස් රථ පිළිබඳ කිසිදු වාර්තාවක් මණ්ඩලය එම ,සතුව නොමැති අතර 606.31.මි.මුදලින් රුක් ගමනාගමන මණ්ඩලය විසින් හා රු 143.මි.ක් ලක්දිව ඉංජිනේරු ආයතනය මගින් වියදම් කර තිබූ නමුත් නිෂ්පාදනයක් ලෙස පුනරුත්ථාපනය කරන ලද බස් රථ කිසිවක් නිරීක්ෂණය නොවුණි . භාණ්ඩාගාරය මගින් බස් රථ පුනරුත්ථාපනය සඳහා ලබාදී තිබූ 750.මි.රුක මුදල මණ්ඩලය හා ලක්දිව ඉංජිනේරු ආයතනය හා එක්ව පුනරාවර්ථන වියදම් සඳහා වැය කර ඇති බව නිරීක්ෂණය විය.		මූල්‍ය ප්‍රතිපාදන නිසි පරිදි උපයෝජනය කරමින් හා ප්‍රාදේශීය වැඩපොල හා ඩිපෝ මගින් පැරණි අමතර කොටස් හා බස් රථ අළුත්වැඩියා කිරීම හා කාර්මික අංශයේ කාර්යය මණ්ඩලය නිසි පරිදි උපයෝජනය කර ගැනීම.	ප්‍රාග්ධන වැය යටතේ ඇති මුදල පුනරාවර්තන වැය යටතේ ගිණුම්ගත කර බස් රථ පුනරුත්තාපනය ට වැය කර ඇති නමුත් ඒවා ප්‍රාග්ධනගත කිරීමට කටයුතු කර නැත.	මෙම ගිණුම් ක්‍රමවේදය මේ දක්වා වෙනස් කර නොමැති අතර භාණ්ඩාගාර ප්‍රාග්ධන ප්‍රතිපාදන තවමත් පුනරාවර්ථන වැය යටතේ ගිණුම්ගත කර ලාභයට ගැලපීම් කරනු ලබයි.
7	වර්ෂය සඳහාද මහා 2023 භාණ්ඩාගාරය විසින් 2020.මි.රුක මුදලක් බස් රථ පුනරුත්ථාපනය සඳහා වෙන්කර තිබුණද එම මුදල උපයෝගී කරගෙන පුනරුත්ථාපනය කර ධාවනයට එක් කරන ලද බස් රථ පිළිබඳව ප්‍රමාණ ඇතුළත් විස්තරයක් හා එම මුදලින් අත්තිකාරම් ලබා ගැනීම පිළිබඳ			ප්‍රාග්ධන වැය යටතේ ඇති මුදල් පුනරුත්තාපන වැය යටතේ ගිණුම්ගත කර බස් රථ පුනරුත්තාපනය ට වැය කර ඇති නමුත් ඒවා ප්‍රාග්ධනගත කිරිමට කටයුතු කර නැත.	මෙම ගිණුම් ක්‍රමවේදය මේ දක්වා වෙනස් කර නොමැති අතර භාණ්ඩාගාර ප්‍රාග්ධන ප්‍රතිපාදන තවමත් පුනරාවර්ථන වැය යටතේ ගිණුම්ගත කර ලාභයට ගැලපීම් කරනු ලබයි.

	මාසික වාර්ථා අමාත්‍යංශය හරහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවට හා භාණ්ඩාගාර මෙහෙයුම් දෙපර්තමේන්තුවට යවා නොතිබුණිදැනට මෙම . මුදල බස් රථ පුනරුත්ථාපනය සඳහා නොව පුනරාවර්ථන වියදම් සඳහා භාවිතා කරන බව නිරීක්ෂණය මේ හේතුවෙන් .විය වර්ෂයේ ධාවනයට 2023 එක් කරන ලද බස් රථ ඇණිය පිළිබඳව සත්‍ය තොරතුරු ලබා ගැනීමේ නොහැකියාවක් පැන නැගී ඇත .				
8	ගමනාගමන මණ්ඩලයට අයත් සියළුම ඩිපෝ පරිශ්‍රයන්හි සහ ප්‍රාදේශීය වැඩපල වල ඇති අංගනවල ඉන්ධන හා ලිහිසි තෙල් අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා පිළිගත් අනුමත ක්‍රමවේදයක් භාවිතා කළ යුතු අතර 2008 ඒ සඳහා , - දිනැති අංක 25 ජනවාරි 16/1533දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් හා 47 අංක 1980 දරණ ජාතික පාරිසරික ම පනත අනුව මධ්‍ය රිසර අධිකාරියෙන් ප යක් ලබා ගත බලපත්‍ර නමුත් .යුතුව ඇත මණ්ඩලයට අයත් ප්‍රාදේශික හි දත්ත 12 දේශික අනුව එකී ප්‍රා වලට අයත් ඩිපෝ සහ කින් 111 වැඩපලවල්	2023	බස් රථ සඳහා දුම් පරීක්ෂණ වාර්තා හා පාරිසරික බලපත්‍ර කාලීනව ලබා ගැනීම.	ඩිපෝ කිහිපයක් හැර බොහොමයක් ඩිපෝවන් පාරිසරික බලපත්‍ර ලබාගෙන නොමැත. යම් ඩිපෝ ප්‍රමාණයක් සඳහා පාරිසරික බලපත්‍ර ඉල්ලුම්කර ඇත.	මේ දක්වා බොහෝ ඩිපෝවන් පනතේ විධිවිධාන පරිදි පාරිසරික බලපත්‍ර ලබාගෙන නොමැත.

	ඩිපෝ සහ වැඩපලවල් මාණයක් ක ප්‍ර 51 ලබා පාරිසරික බලපත්‍ර ගෙන නොතිබූ අතර පරිසරයට ව්‍යඅපද්‍ර හානිකර නොවන ලෙස ද සිදුකර බැහැර කිරීම .නොතිබුණි		
9	ගමනාගමන මණ්ඩලය සතු රථ ඇණියේ බස් රථ විශාල සංඛ්‍යාවක ආදායම් බලපත්‍ර ලබා ගැනීමේදී ඉදිරිපත් කළ යුතු වායු විමෝචන සහතික දුම් පරීක්ෂණ) ලබා ගෙන (සහතික ,නොතිබූ අතර පරීක්ෂාවට භාජනය කළ දේශිකයේ මහනුවර ප්‍රා ඩිපෝ07 කට අයත් බස් රථ 566 ක ප්‍රමාණයෙන් බස් රථ ක් සඳහා 226 වායු විමෝචන සහතික ලබා ගෙන නොතිබුණි . නිසි පරිදි දුම් සහතික ලබා නොගැනීම මත බස් රථ වලින් දහනය කරන ඉන්ධන මගින් පිටකරන අහිතකර වායු එනම් Co,S වැනි බැර ලෝහ පරිසරයට එකතු වීම මගින් හා අහිතකර වායු විමෝචනය මගින් පරිසර දූෂණය වීමක් සිදු විය හැකි බව නිරීක්ෂණය විය .	පැරණි බස් රථ වලින් සිදුවන වායු විමෝචනය හේතුවෙන් දුම් පරීක්ෂණවලදී මෙම බස් රථ අසමත් වන බැවින් වායු විමෝචන පරීක්ෂාවකින් තොරව එම බස් රථ ග්‍රාමීය මාර්ගවල ධාවනයට යෙදවීමට කටයුතු කර ඇත.	වායු විමෝචන මධ්‍යස්ථාන පිහිටුවීමට අවශ්‍ය උපකරණ ලබාදී තිබියදීත් එම කටයුතු සම්පූර්ණ කිරීමට මණ්ඩලය මේ දක්වා කටයුතු කර නොමැත.

2.23 අපනයන කෘෂිකාර්මික බෝග නිෂ්පාදනය හා ප්‍රවර්ධනය සම්බන්ධ රාජ්‍ය ආයතනවල කාර්යභාරය ඇගයීම

	විගණන නිරික්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
1	අපනයන කෘෂිකර්මය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක අවශ්‍යතාවය අපනයන කෘෂිකාර්මික බෝග බහු වාර්ෂික බෝග වන අතර නිෂ්පාදනය හා ප්‍රවර්ධනය කිරීම සඳහා දිගු කාලීන වැඩපිළිවෙලක් සකස් කර වගා සැලැස්මක් අනුව ක්‍රියාවට නැංවීම අවශ්‍ය කෙරේ.	2023	අපනයන කෘෂිකාර්මික බෝග ප්‍රවර්ධනය කිරීම සඳහා අපනයන කෘෂිකර්මය පිළිබඳ ප්‍රතිපත්තියක් ද ඇතුළත් කර කෘෂිකාර්මික ප්‍රතිපත්තියක් සකස් කිරීම	අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විවිධ අමාත්‍යාංශය යටතට පත්වීම හා ඒ අනුව අදාළ රේඛීය අමාත්‍යාංශ විෂය පථයට ගැළපෙන පරිදි වැඩසටහන් හා ක්‍රියාත්මක සැලැස්ම වරින් වර වෙනස් කිරීමට භාජනය වී ඇත. අවසන් වරට දෙපාර්තමේන්තුව අයත්ව තිබූ කෘෂිකර්ම හා අමාත්‍යාංශයේ විෂය පථයට අනුකූල වන පරිදි 2025-2030 මාර්ග සිතියමක් සකස් කර කෙටුම්පත කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයට ඉදිරිපත් කිරීමට කටයුතු කර තිබුණි. කුරුඳු සංවර්ධන	අමාත්‍යාංශයේ විෂය පථය අනුව වෙනස් වන වැඩසටහන් අනුව අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කටයුතු සිදුවන අතර කෘෂිකර්ම ප්‍රතිපත්තිය තුළ අපනයන කෘෂිකාර්මික ප්‍රතිපත්තියක් සකසා ක්‍රියාවට නැංවීම සිදු නොවන බව නිරීක්ෂණය කරයි.

			කටයුතු 2023 වර්ෂයේ සිට කරුදූ සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් සිදුකරනු ලබයි.	
2	1992 අංක46 දරන 2023 අපනයන කෘෂිකර්මාන්තය ප්‍රවර්ධන පනත සංශෝධනය කිරීම අපනයන කෘෂිකාර්මික බෝග පිළිබඳ අර්ථ දැක්වීම ප්‍රායෝගික නොවීම. අධ්‍යක්ෂවරයා යන තනතුර සඳහන් වී තිබුණද අධ්‍යක්ෂක ජනරාල් තනතුර ක්‍රියාත්මක වීම, බීජ හා රෝපණ ද්‍රව්‍ය හැසිරවීම පිළිබඳ බීජ පනත යටතේ අපනයන කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් බලයලත් නිලධාරියෙකු ලෙස නම්කර නොතිබීම ආදී දුර්වලතාවයන් ඇතුළු කරුණු 26 ක සංශෝධන ඇතුලත්ව අපනයන කෘෂිකර්මාන්ත ප්‍රවර්ධන (සංශෝධන) පනත සකස් කර තිබුණද නීත්‍යානුකූලව පනත සංශෝධනය කිරීමට අදාල ඉදිරි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	1992 අංක 46 අපනයන කෘෂිකර්මාන්තය ප්‍රවර්ධන පනත අපනයන කෘෂිකාර්මික බෝග ප්‍රවර්ධනය උදෙසා වඩා ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ සාධනීය සංශෝධන පනතට ඇතුළත් කර කඩිනමින් බලාත්මක කිරීම	අපනයන කෘෂිකාර්මික ප්‍රවර්ධන පනත සංශෝධනය කිරීම අදියර 2 ක් යටතේ සංශෝධනය කිරීමට අදහස් කරන අතර පළමු අදියර යටතේ තනතුරු නාම වෙනස්වීම සහ අපනයන කෘෂිකාර්මික බෝග අර්ථ දැක්වීමට අදාල සංශෝධන සඳහා කැබිනට් අනුමැතිය ලැබී තිබුණි. ඒ අනුව අදාල සංශෝධනයන් නීති කෙටුම්පත් ප්‍රසම්පාදන දෙපාර්තමේන්තු වට යොමුකර තිබෙන අතර අනුමැතිය ලැබුණු පසු කැබිනට් අනුමැතියකින් පාර්ලිමේන්තුවට ත් ඉදිරිපත් කළ යුතුය.	අපනයන කෘෂිකාර්මික ප්‍රවර්ධන පනත තුල පවතින දුර්වලතා ඉවත්කර පනත සංශෝධනය කිරීම සිදුවී නොතිබුණි.

3	අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් කෘෂිකාර්මික බෝග පිළිබඳ ප්‍රමිති සකස් කර බීජ සහතික කිරීමේ සේවයට ලබා දී තිබුණි. 2003 අංක 22 දරන බීජ පනත සම්මත වී වසර 20 කට ආසන්න කාලයක් ගත වී තිබුණද එම ප්‍රමිති ප්‍රකාශයට පත්කිරීම සඳහා කටයුතු කර නොතිබුණි.	2023	අපනයන කෘෂිකාර්මික බෝග වලට අදාළ බීජ හා රෝපණ ද්‍රව්‍ය සහතික කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික දැනුම හා හැකියාව අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සතු වන බැවින් ඒ සඳහා අවශ්‍ය නීතිමය බලය අපනයන කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ලැබෙන පරිදි අදාල නීතිමය සංශෝධන ඇති කිරීම.	අපනයන කෘෂිකාර්මික බෝග පිළිබඳ ප්‍රමිති සකස් කර බීජ සහතික කිරීමේ සේවයට ලබාදී තිබුණි.	බීජ පනත භාවිතා කර වසර 20 කට ආසන්න කාලයක් ගත වී ඇතත් අපනයන කෘෂිකාර්මික බෝග සම්බන්ධ ප්‍රමිති ප්‍රකාශයට පත් කර නොතිබුණි.

2.24 තිරසර සංවර්ධන ඉලක්ක ක්‍රියාත්මක කිරීම - ශ්‍රී ලංකාවේ ශක්තිමත් සහ සුවපහසු ජාතික මහජන සෞඛ්‍ය පද්ධතිය (තිරසර සංවර්ධන ඉලක්ක 3 (ඇ) සම්බන්ධ)

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
1	"සියලු වයස්වල සැමට යහපැවැත්ම ප්‍රවර්ධනය කරන අතරම යහපත් සෞඛ්‍ය සහ දිගු කාලීන පැවැත්ම සහතික කිරීම" තිරසර සංවර්ධන පිළිබඳ ජාතික ප්‍රතිපත්ති හා උපාය මාර්ග කෙටුම්පතට අනුව, ප්‍රතිපත්තියේ 03 වන අරමුණ ලෙස හඳුනාගෙන ඇති අතර 2030 වනවිට "ජාත්‍යන්තර සෞඛ්‍ය රෙගුලාසි (IHR) මූලික ධාරිතා දර්ශකය වැඩි කිරීම සහ හදිසි සෞඛ්‍ය සූදානම සියයට 70 දක්වා වැඩි කිරීම", ඉලක්කය එකි ප්‍රතිපත්තියේ 3 (ඇ) ලෙස හඳුනාගෙන තිබුණි. මෙම ප්‍රතිපත්තිය 2020 වර්ෂයේදී රාජ්‍ය ආයතන, විද්වතුන් සහ සිවිල් සමාජ ඇතුළු පාර්ශ්වකරුවන් සමඟ සාකච්ඡා කර කෙටුම්පත් කර තිබුණද, 2022 වසර වන තෙක්, අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීම සඳහා ප්‍රතිපත්ති සහ උපායමාර්ග කෙටුම්පත් ඉදිරිපත් කර නොතිබුණි. එසේ වුවද වත්මන් ජාතික		තිරසර සංවර්ධන ජාතික ප්‍රතිපත්තියක් සහ උපාය මාර්ගයක් සැකසීමේ ක්‍රියාවලිය කඩිනම් කළ යුතු බව.	අමාත්‍ය මණ්ඩල තීරණ අංක අමප/20/2064/3 10/017 හා 2021.01.04 දිනැති තීරණය අනුව ස්ථාපිත කරන ලද ජාතික මෙහෙයුම් කමිටුව 2021.02.17 වන දින රැස්වූ අතර මේ පිළිබඳව සාකච්ඡා කර මෙම කෙටුම්පත තවදුරටත් අධ්‍යයනය කිරීම සඳහා ක්‍රමවේදයක අවශ්‍යතාවය එහිදී පෙන්වා දෙන ලදී. මෙම ජාතික ප්‍රතිපත්තිය හා උපාය මාර්ග කෙටුම්පත සංශෝධනය කිරීම සඳහා වන තාක්ෂණික කමිටුවක් පත් කිරීමට යෝජනා වුවද ඊට අදාළ ක්‍රියාමාර්ග මේ දක්වා ගෙන	තිරසර සංවර්ධන ප්‍රතිපත්තිය අවසානාත්මක තත්ත්වයට පත් කිරීමට කටයුතු කර නැත.

	සන්දර්භය සහ ප්‍රමුඛතා පිළිබිඹු වන පරිදි තිරසර සංවර්ධනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සහ උපාය මාර්ගය සංශෝධනය කිරීමට තීරණයක් ගෙන ඇති බව තිරසර සංවර්ධන කවුන්සිලය විසින් විගණනයට ප්‍රකාශ කර තිබුණි.		නොමැත.	
2	**ජාතික සෞඛ්‍ය සභාව** "2000 වසර වන විට සැමට සෞඛ්‍යය"යන ඉලක්කය සපුරා ගැනීමේ අරමුණු ඇතිව 1980 පෙබරවාරි 07 වැනි දින ලෝක සෞඛ්‍ය සංවිධානය සමඟ අග්‍රාමාත්‍යවරයා සහ සෞඛ්‍ය අමාත්‍යවරයා විසින් සෞඛ්‍ය සංවර්ධනය සඳහා වූ ප්‍රඥප්ති අත්සන් තබා තිබුණද එකී කාර්යයේ ප්‍රධාන අරමුණයේ ඉලක්කය සාක්ෂාත් කර ගැනීම සඳහා ප්‍රධාන ප්‍රවේශය ලෙස ප්‍රාථමික සෞඛ්‍ය සේවාව විධිමත්ව පවත්වා ගනීම සඳහා ජාතික සෞඛ්‍ය සංවර්ධන ජාලයේ ප්‍රමුඛතම ආයතනය වන ජාතික සෞඛ්‍ය සභාව 1980 නොවැම්බර් මාසයේදී අග්‍රාමාත්‍යවරයාගේ සභාපතිත්වය යටතේ ස්ථාපනය කර තිබූ නමුදු ජාතික මෙන්ම උප ජාතික මට්ටම්වලදී අන්තර් ආංශික	ජාතික සෞඛ්‍ය සභාව කඩිනමින් නැවත ස්ථාපිත කිරීම සහ ජාත්‍යන්තර සෞඛ්‍ය රෙගුලාසි (HR) මෙහෙයුම් කමිටුව සමඟ සෞඛ්‍ය කවුන්සිලයේ අඛණ්ඩ හරහා 3 (ඇ) ඉලක්කය සම්බන්ධයෙන් ප්‍රධාන පාර්ශවකරුවන් විසින් සිදු කරන ක්‍රියාකාරකමක් සඳහාම සහයෝගයෙන් කටයුතු කළ යුතු බව.	2023 මැයි 19 දින අග්‍රාමාත්‍ය ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් පැවති තිරසර සංවර්ධන අරමුණු සඳහා වන ජාතික මෙහෙයුම් නිලධාරීන්ගේ අනු කමිටුවේ රැස්වීම අදාල සියළු පාර්ශවයන්ගේ (අමාත්‍යාංශ 16ක් හා තිරසාර සංවර්ධන සභාව) සහභාගීත්වයෙන් සිදුවිය. එහිදී මාතෘ මරණ අනුපාතිකය, ළමා මරණ අනුපාතිකය, ක්ෂය රෝගය, ඩෙංගු රෝගය හා බරවා රෝගය ඇතුලත් යාවත්කාලීන දත්ත අනුව ලබා ඇති පසුබෑම පිළිබඳව සාකච්ඡා කරන	ජාතික සෞඛ්‍ය සභාව ස්ථාපිත කිරීම වර්තමානය වන විටද සිදු වී නොමැත.

	සහයෝගීතාව සඳහා දේශපාලන කැපවීම සහතික කිරීම සඳහා වූ පළමු විධිමත් යාන්ත්‍රණය එකී සභාව වුවද එම සභාව මඟින් අරමුණු හා ඉලක්ක සපුරා ගැනීම සඳහා අපේක්ෂිත කැපවීම ලැබී නොතිබුණි.. (i) ජාතික සෞඛ්‍ය සභාව සෞඛ්‍ය ගැටලු ඉහළම මට්ටමින් සාකච්ඡා කිරීම සඳහා වැදගත් වේදිකාවක් වුවද, එය 2004 සිට රැස් වී නොමැති අතර ජාතික මට්ටමින් මෙන්මඋප ජාතික මට්ටමින් අන්තර් අංශ සහයෝගීතාව සඳහා දේශපාලන කැපවීම සහතිකකිරීම සඳහා විධිමත් යාන්ත්‍රණයක් නොමැති වීමට එය හේතු වී ඇත. (ii) ජාතික සෞඛ්‍ය සභාව වැනි ඉහළ මට්ටමේ සෞඛ්‍ය සංවර්ධන ආයතනයක් නොමැති වීම හේතුවෙන් විවිධ ජාතික මෙහෙයුම් කමිටු සහ ජාතික කාර්ය සාධක බලකාය කලින් කලට පිහිටුවා තිබුණි. උදා: Covid-19 ය සාධක බලකාය, එන්නත් කාර්ය සාධක බලකාය.		ලද අතර, එම එක් එක් අංශ වලට අදාල සවිස්තරාත්මක වාර්තාවක් එහිදී එළඹී එකඟතාවට අනුව තිරසාර සංවර්ධන සභාවට ඉදිරිපත් කිරිමට කටයුතු කරන ලදී.	
3	රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ තොරතුරු වලට අනුව, 2022 මාර්තු 31 වැනි දින වන විට ශ්‍රී	එන්නත් ඇතුළු සෑම මිලදී ගැනීමක් සඳහාම ප්‍රසම්පාදන මාර්ගෝපදේශ	විගණකාධිපති නිර්දේශ අනුව එන්නත් ඇතුළු සෑම මිලදී	විගණනය විසින් ඉල්ලා ඇති කොවිඩ් - 19 එන්නත මිලදී

ලංකාව විවිධ වර්ගයේ එන්නත් මාත්‍රා 42,829,630 ක් මිල දී ගෙන ඇත.

මිලදී ගැනීමේ විස්තර

එන්නත් වර්ගය	මිලදී ගත් ප්‍රමාණය	ඒකක පිරිවැය (ඇ.ඩො.)	එන්නත් පිරිවැය (රු.මිලියන)	භාණ්ඩ ප්‍රවාහන පිරිවැය (රු.මිලියන)	මුළු පිරිවැය (රු.මිලියන)
සයිනෝෆාම්	23,000,000	15	39,179	324	39,503
ඇස්ට්‍රා සෙනෙකා (කොවිෂීල්ඩ්)	500,000	7	533	1	534
ෆයිසර්	18,999,630	5	26,034	-	26,034
ස්පුට්නික් v මොඩර්නා	330,000	7	667	35	702
එකතුව	42,829,630	10	විස්තර නැත		667,773

ජනාධිපති ලේකම් කාර්යාලයේ එන්නත් කිරීමේ විස්තර දත්ත පුවරුව (Dash Board) අනුව, 2022 සැප්තැම්බර් 20 දිනට මුළු එන්නත් කල යුතු ජනගහනයෙන් 17,655,390 (අවුරුදු 12 ට වැඩි) ක සඳහා ලබා දී ඇති කොවිඩ් - 19 එන්නත් සංඛ්‍යාව පහත පරිදි විය.

එන්නත් කරන ලද මාත්‍රාව	සංඛ්‍යාව	ප්‍රතිශතය (සියයට)
පළමු මාත්‍රාව	17,128,086	97 (වයස අවුරුදු 12ට වැඩි ජනගහනයෙන්)
දෙවන මාත්‍රාව	14,675,454	83 (වයස අවුරුදු 12 ට වැඩි ජනගහනයෙන්)
බූස්ටර්	8,172,153	56 (මුළු එන්නත් කර ඇති සංඛ්‍යාවෙන්)

කොවිඩ් - 19 එන්නත

අනුගමනය කල යුතු අතර ඖෂධ සඳහා කාර්යක්ෂම බඩු තොග පාලන ක්‍රමයක් හඳුන්වා දිය යුතු බව.

ගැනීමක් සඳහාම ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කර නියමිත කාලය තුල ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීමට හා ඖෂධ සඳහා කාර්යක්ෂම බඩු තොග පාලන ක්‍රමයක් අනුගමනය කිරීමට කටයුතු කරන ලෙස අතිරේක ලේකම් (ප්‍රසම්පාදන), නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (වෛද්‍ය සැපයීම්) හා සභාපති (රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව) වෙත උපදෙස් ලබා දී ඇත.

ගැනීම සම්බන්ධයෙන් මිලදී ගෙන ඇති අවස්ථා ගණන, ප්‍රසම්පාදන දැන්වීම ලබා දුන් ආකාරය, ලංසුකරුවන් සංඛ්‍යාව, ලංසුකරුවන් තෝරා ගැනීමේ පදනම ආදී තොරතුරු කඩිනමින් ලබා දෙන ලෙසද අතිරේක ලේකම් (පාලන)II වෙත හා අතිරේක ලේකම් (ප්‍රසම්පාදන) දැණුවත් කර ඇත.

මිලදී ගැනීම සම්බන්ධයෙන් මිලදී ගෙන ඇති අවස්ථා ගණන, ප්‍රසම්පාදන දැන්වීම ලබා දුන් ආකාරය, ලංසුකරුවන් සංඛ්‍යාව, ලංසුකරුවන් තෝරා ගැනීමේ පදනම ආදී තොරතුරු විගණනය සඳහා ඉල්ලා සිටියද, විගණනය සඳහා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව (SPC) විසින් අදාළ තොරතුරු සපයා නොතිබුණි.